327 වන කාණ්ඩය - 02 වන කලාපය
தொகுதி 327 - இல. 02
Volume 327 - No. 02

2026 ජූනි 10 වන බදාදා
2026 யூன் 10, புதன்கிழமை
Wednesday, 10th June, 2026

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**
අධිවේගී තැපැල් මඟින් න්‍යාය පුස්තකය සහ න්‍යාය පත්‍රය පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට යැවීමේ පිරිවැය අවම කිරීම [තීරුව 249]

**රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව** [තීරුව 250]

**ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා** [තීරුව 250]

**ගරු අග්‍රාමාත්‍යතුමියට යොමු කළ ප්‍රශ්න** [තීරු 252-267]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 267-296]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
හජ් වන්දනාකරුවන් මුහුණ දුන් දුෂ්කරතා [තීරුව 296]
වඩමාරච්චි මුහුදේදී ධීවරයින් අතුරුදහන් වීම [තීරුව 299]

**සුරේෂ් සලේ මහතා අත්අඩංගුවට ගැනීම සහ රඳවා තබා ගැනීම:**
මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 301]

**වරප්‍රසාද:**
2026.06.08 දින "BBC NEWS SINHALA" වෙබ් අඩවියේ පළ කරන ලද ලිපිය [තීරුව 308]
ප්‍රමාණවත් ආරක්ෂාව ලබා දීම [තීරුව 313]

**පළාත් සභා ඡන්ද විමසීම කුමන මැතිවරණ ක්‍රමය යටතේ පැවැත්විය යුතු ද යන්න සොයා බලා වාර්තා කිරීමටත්, ඒ පිළිබඳව සිය යෝජනා සහ නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන විශේෂ කාරක සභාව:**
කාලය දීර්ඝ කිරීම [තීරුව 317]

**ශ්‍රී ලංකා මහ බැංකු පනත:**
රීති [තීරු 321-412]

**අත්‍යවශ්‍ය මහජන සේවා පනත:**
යෝජනා සම්මතය [තීරුව 412]

**කල්තැබීමේ යෝජනාව:**
සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ගැටලු [තීරු 413-426]

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புகள்:**
விரைவு அஞ்சல்மூலம் பாராளுமன்ற உறுப்பினர்களுக்கு ஒழுங்குப் புத்தகத்தையும் ஒழுங்குப் பத்திரத்தையும் அனுப்புவதற்கான செலவைக் குறைத்தல் [ப: 249]

**அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை** [ப: 250]

**துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்** [ப: 250]

**மாண்புமிகு பிரதம அமைச்சரிடம் விடுக்கும் வினாக்கள்** [ப: 252-267]

**வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப: 267-296]**

**தனி அறிவித்தல் மூல வினா:**
'ஹஜ்' யாத்திரிகர்கள் எதிர்கொண்ட சிரமங்கள் [ப: 296]
வடமராட்சி கடற்பரப்பில் மீனவர்கள் காணாமற்போனமை [ப: 299]

**சுரேஷ் சலே அவர்களின் கைதும் தடுத்துவைத்தலும்:**
பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சரினது கூற்று [ப: 301]

**சிறப்புரிமை:**
2026.06.08ஆம் திகதி "BBC NEWS SINHALA" இணையத்தளத்தில் வெளியிடப்பட்ட கடிதம் [ப: 308]
தகுந்த பாதுகாப்பு வழங்குதல் [ப: 313]

**மாகாண சபைத் தேர்தல்கள் எந்தத் தேர்தல் முறைமையின்கீழ் நடத்தப்பட வேண்டும் என்பதை ஆராய்ந்து அறிக்கையிடுவதற்கும், அது தொடர்பான முன்மொழிவுகளையும் விதப்புரைகளையும் சமர்ப்பிப்பதற்குமான தெரிகுழு:**
கால நீடிப்பு [ப: 317]

**இலங்கை மத்திய வங்கிச் சட்டம்:**
விதிகள் [ப: 321-412]

**அத்தியாவசிய பொதுச் சேவைகள் சட்டம்:**
தீர்மானம் [ப: 412]

**ஒத்திவைப்புப் பிரேரணை:**
சுகாதாரத்துறையிலுள்ள பிரச்சினைகள் [ப: 413-426]

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Minimization of Cost of Sending Addendum and Order Paper by Speed Post to Members of Parliament [Col. 249]

PUBLIC FINANCE COMMITTEE REPORT [Col. 250]

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS [Col. 250]

QUESTIONS POSED TO HON. PRIME MINISTER [Cols. 252-267]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 267-296]

QUESTION BY PRIVATE NOTICE:
Hardships Faced by Hajj Pilgrims [Col. 296]
Disappearance of Fishermen at Vadamarachchi Sea [Col. 299]

ARREST AND DETENTION OF SURESH SALLAY:
Statement by Minister of Public Security and Parliamentary Affairs [Col. 301]

PRIVILEGE:
Article Published on "BBC News Sinhala" Website on 08.06.2026 [Col. 308]
Provision of Adequate Security [Col. 313]

SELECT COMMITTEE TO LOOK INTO AND REPORT TO PARLIAMENT ON THE MATTER OF SELECTING THE ELECTORAL SYSTEM UNDER WHICH THE PROVINCIAL COUNCIL ELECTIONS SHOULD BE HELD AND SUBMIT ITS PROPOSALS AND RECOMMENDATIONS IN THAT REGARD:
Extension of Time [Col. 317]

CENTRAL BANK OF SRI LANKA ACT:
Rules [Col. 321-412]

ESSENTIAL PUBLIC SERVICES ACT:
Resolution [Col. 412]

ADJOURNMENT MOTION:
Issues in Health Sector [Cols. 413-426]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2026 ජුනි 10වන බදාදා***
*2026 யூன் 10, புதன்கிழமை*
*Wednesday, 10th June, 2026*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### අධිවේගී තැපැල් මඟින් න්‍යාය පුස්තකය සහ න්‍යාය පත්‍රය පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට යැවීමේ පිරිවැය අවම කිරීම
### விரைவு அஞ்சல்மூலம் பாராளுமன்ற உறுப்பினர்களுக்கு ஒழுங்குப் புத்தகத்தையும் ஒழுங்குப் பத்திரத்தையும் அனுப்புவதற்கான செலவைக் குறைத்தல்
### MINIMIZATION OF COST OF SENDING ADDENDUM AND ORDER PAPER BY SPEED POST TO MEMBERS OF PARLIAMENT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2026.05.08 දින පැවති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී අධිවේගී තැපැල් මඟින් පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය සහ පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය බෙදා හැරීමේදී දැරීමට සිදු වන පිරිවැය අවම කර ගැනීම සඳහා අධිවේගී තැපැල් මඟින් මෙම ලිපිලේඛන තවදුරටත් ලබා ගැනීමට අපේක්ෂා කරනු ලබන ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත ලබා ගැනීමට තීරණය කරන ලදී.

ඒ අනුව, ඔබගේ සභා මේසය මත තබා ඇති ආකෘති පත්‍රයේ ඔබගේ කැමැත්ත සටහන් කර පාර්ලිමේන්තුවේ මහ ලේකම් වෙත ලැබීමට සලස්වන මෙන් සියලුම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිමි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

- Order made by the Minister of Finance, Planning and Economic Development under Section 10A of the Customs Ordinance (Chapter 235) as amended by Act, No. 83 of 1988 and published in Gazette Extraordinary No. 2488/56 of 15th May, 2026; and
- Order made by the Minister of Finance, Planning and Economic Development under Section 10A of the Customs Ordinance (Chapter 235) as amended by Act, No. 83 of 1988 and published in Gazette Extraordinary No. 2488/69 of 17th May, 2026. - [The Hon. (Dr.) Harini Amarasuriya]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
## PUBLIC FINANCE COMMITTEE REPORT

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Hon. Speaker, on behalf of the Chairman of the Committee on Public Finance, I present the Report of the Committee on Public Finance on the -

(i) Rules under Section 105 read with Sections 106 and 78(b) of the Central Bank of Sri Lanka Act, No. 16 of 2023 (Published in Gazette Extraordinary No. 2479/54 of 12th March, 2026); and

(ii) Rules under Section 105 read with Sections 7(1)(c) and Part VI of the Central Bank of Sri Lanka Act, No. 16 of 2023 (Published in Gazette Extraordinary No. 2492/10 of 09th June, 2026),

which were referred to the said Committee.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
## SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) ஜனக சேனாரத்ன)
(The Hon. (Dr.) Janaka Senarathna)

ගරු කථානායකතුමනි, විද්‍යා, තාක්ෂණය සහ ඩිජිටල් පරිණාමනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) 2022 වර්ෂය සඳහා නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනයේ වාර්ෂික වාර්තාව;

(ii) 2020, 2021 සහ 2022 වර්ෂ සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තා;

[ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මහතා]

(iii) 2021 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝටෙක්නොලොජිහි වාර්ෂික වාර්තාව; සහ

(iv) 2022/2023 වර්ෂය සඳහා සී/ස ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ (පුද්ගලික) සමාගමේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු හේමාලි වීරසේකර මහත්මිය (නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය)**
(மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர - குழுக்களின் பிரதித் தவிசாளர்)
(The Hon. (Mrs.) Hemali Weerasekara - Deputy Chairperson of Committees)
ගරු කථානායකතුමනි, වත්තල, දෙවටගහවත්ත, ජාතික නිවාස, අංක 47/ඩී/1 යන ලිපිනයෙහි පදිංචි ජේ.එම්.එස්. මෙත්තානන්ද මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු රත්න ගමගේ මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரத்ன கமகே - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Rathna Gamage - Deputy Minister of Fisheries, Aquatic and Ocean Resources)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) අක්මීමන, ඉහළගොඩ, රජගහවත්ත, දෙවන පිවිසුම, ක්වීන්ස් වේ, අංක 440/බී යන ලිපිනයෙහි පදිංචි කේ.ජී. චමිලා ඉරෝෂිනී මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) රත්ගම, මාවඩවිල, අංක 295 බී යන ලිපිනයෙහි පදිංචි එස්.එච්.ජේ. සිරිවර්ධන මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipuna Arachchi)
ගරු කථානායකතුමනි, මඩපාත, මාකන්දන, පුවක්ගස් වත්ත, අංක 101/1 යන ලිපිනයෙහි පදිංචි ඒ.ඩී. කමල් සරත් මහතා සහ වෙනත් අයෙකුගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු අශෝක ගුණසේන මහතා**
(மாண்புமிகு அசோக குணசேன)
(The Hon. Ashoka Gunasena)
ගරු කථානායකතුමනි, යටිගල්ඔළුව, දෙහෙල්ගමුව යන ලිපිනයෙහි පදිංචි ජේ.ඒ. සුරේඛා ජයසිංහ මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු ධර්මප්‍රිය දිසානායක මහතා**
(மாண்புமிகு தர்மப்பிரிய திசாநாயக்க)
(The Hon. Dharmapriya Dissanayake)
ගරු කථානායකතුමනි, කුරුණෑගල, ඉඳුල්ගොඩකන්ද, නිකතැන්න වත්ත යන ලිපිනයෙහි පදිංචි ඊ.ජේ.පී. එදිරිසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ගරු අග්‍රාමාත්‍යතුමියට යොමු කළ ප්‍රශ්න
## மாண்புமிகு பிரதம அமைச்சரிடம் விடுக்கும் வினாக்கள்
## QUESTIONS POSED TO HON. PRIME MINISTER

**ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා**
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)
ගරු කථානායකතුමනි, මා ගරු අග්‍රාමාත්‍යතුමියගෙන් අසන ප්‍රශ්නය මෙයයි.

ලංකාවේ විදුලිබල උත්පාදනය සඳහා වැය වන අධික පිරිවැය අවම කර ගැනීමට නම් සූර්ය සහ සුළං වැනි පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් වෙත කඩිනමින් යොමු විය යුතුව ඇත. වත්මන් රජය විසින් මෙම ස්වාභාවික බලශක්තිය ජාතික පද්ධතියට එක් කිරීමේදී පවතින තාක්ෂණික බාධාවක් වූ "විදුලිය ගබඩා කිරීමේ නොහැකියාව" මඟ හරවා ගැනීම සඳහා මහා පරිමාණ බැටරි බලශක්ති ගබඩා පද්ධති - Battery Energy Storage System, BESS - ස්ථාපනය කිරීමට පියවර ගෙන ඇත.

1. ශ්‍රී ලංකාවේ සමස්ත විදුලි උත්පාදනයෙන් පුනර්ජනනීය බලශක්ති ප්‍රතිශතය ඉහළ නැංවීම සඳහා වත්මන් රජය සතු ඉලක්කයන් සහ උපාය මාර්ගික සැලැස්ම කුමක්ද?

2. සූර්ය සහ සුළං බලයෙන් නිපදවන විදුලිය, ප්‍රධාන විදුලිබල පද්ධතියට බාධාවකින් තොරව අවශෝෂණය කර ගැනීම සඳහා අලුතින් හඳුන්වා දීමට නියමිත බැටරි බලශක්ති ගබඩා පද්ධති - BESS - ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතියේ වත්මන් ප්‍රගතිය කුමක්ද?

3. මෙම බැටරි පද්ධති තාක්ෂණය ලංකාවට හඳුන්වා දීම සඳහා දේශීය හෝ විදේශීය ආයෝජන සහ මූල්‍ය ආධාර ලබාගෙන ඇත්තේ කෙසේද?

4. මෙම නවීන තාක්ෂණික ක්‍රමවේදය හරහා ඉදිරියේදී ජනතාවට සහ කර්මාන්තශාලාවලට අඩු පිරිවැයකින්, විශ්වසනීය සහ ගුණාත්මක විදුලි සැපයුමක් ලබා දීමට හැකි වන්නේ කෙසේද?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)
ගරු කථානායකතුමනි, ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මන්ත්‍රීතුමා විසින් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු මෙසේයි.

1. 2030 වන විට ජාතික විදුලි උත්පාදනයෙන් සියයට 70ක් පුනර්ජනනීය ප්‍රභවයන්ගෙන් ලබා ගැනීමට ඉලක්ක සකසා ඇති අතර, එම ඉලක්ක ළඟා කර ගැනීම සඳහා අවශ්‍ය සැලසුම් සකස් කර ක්‍රියාත්මක කරමින් පවතී. ඒ අනුව ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ පුනර්ජනනීය සංවර්ධන සැලැස්ම (2025-2030) අනුව, සුළං බලශක්තිය මෙගාවොට් 1,274ක් හා සූර්ය බලශක්තිය මෙගාවොට් 2,071ක් ජාතික විදුලි පද්ධතියට එකතු කිරීමට සැලසුම් කර ඇත. තවද,

- දිගුකාලීන ජනන සැලැස්මට යටත්ව, විවිධ ප්‍රසම්පාදන ක්‍රම යටතේ පුනර්ජනනීය බලශක්තිය වැඩි වශයෙන් ජාතික විදුලි පද්ධතියට අවශෝෂණය කිරීම සඳහා සැලසුම් කර ඇත.
- පුනර්ජනනීය බලශක්තිය උකහා ගැනීම උදෙසා ජාතික සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ පද්ධතිය පුළුල් කිරීමට කටයුතු කරමින් පවතී.
- තවද, පුනර්ජනනීය බලශක්තිය ප්‍රශස්ත ලෙස උකහා ගැනීම සඳහා බලශක්ති ගබඩා කිරීමේ පද්ධති හඳුන්වා දීමට නියමිතය.

ගරු කථානායකතුමනි, මේක තමයි අපේ ආණ්ඩුව විසින් අරගෙන තිබෙන වැදගත්ම පියවර. අපි පුනර්ජනනීය බලශක්තිය කොච්චර නිෂ්පාදනය කළත් ගබඩා කිරීමේ පහසුකම් හරියට තිබුණේ නැත්නම් අපට ඒකෙන් නිසි ප්‍රයෝජනය ගන්න බැහැ. මම හිතන විධියට, ඒක අපි ගත්ත තීරණාත්මක පියවරක් වෙනවා.

ඒ යටතේ බැටරි බලශක්ති ගබඩා පද්ධති 160 MW සඳහා දැනට ප්‍රසම්පාදන කටයුතු අවසන් කර පවතී. එසේම, බැටරි බලශක්ති පද්ධති (Battery Energy Storage System) 250 MW සහ 50 MW සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කිරීම සඳහා 2026.03.30 දින අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත.

තවද, Pumped Hydro Storage හඳුන්වා දීමට නියමිතය.

- දැනට පවතින ජල විදුලි බලාගාරවල ස්ථාපිත ධාරිතාව පුළුල් කිරීම සඳහා අධ්‍යයනය සිදු කරමින් පවතී.

2.

| ව්‍යාපෘතිය | ප්‍රගතිය |
|---|---|
| 5 MW/10 MWh හම්බන්තොට බැටරි බලශක්ති ගබඩා පද්ධතිය (Battery Energy Storage System - BESS) | නියමු (Pilot) ව්‍යාපෘතිය සාර්ථකව ආරම්භ කර ක්‍රියාත්මක කර ඇත. |
| 160 MW/640 MWh BESS ව්‍යාපෘතිය, දිවයින පුරා පිහිටි ග්‍රිඩ් උප පොළ 16ක් ආශ්‍රිතව මෙගාවොට් පැය 640 ක ධාරිතාවකින් යුක්ත බැටරි බලශක්ති ගබඩා පද්ධති 16ක් ස්ථාපනය කිරීම. | ප්‍රසම්පාදන කටයුතු අවසන් කර මේ වන විට ඉදිකිරීම් ආරම්භ කර ඇත. |
| 50 MW/200 MWh පවතින සූර්ය බල ව්‍යාපෘති සමඟ සම්බන්ධිත BESS. දැනට ක්‍රියාත්මක සූර්ය බලාගාරවලට බැටරි බලශක්ති ගබඩා පද්ධති එක් කිරීමේ ව්‍යාපෘතිය | ජාතික පද්ධති ක්‍රියාකරු (National System Operator - NSO) විසින් ප්‍රසම්පාදන ලේඛන සකස් කරමින් පවතී. මේ යටතේ මෙගාවොට් පැය 200 බැටරි බලශක්ති පද්ධතියක් දැනට පවතින බලාගාරවලට එකතු කිරීමට නියමිතය. |
| 250 MW/1000 MWh ස්වාධීන (Standalone) BESS ව්‍යාපෘතිය | ජාතික පද්ධති ක්‍රියාකරු (NSO) විසින් ප්‍රසම්පාදන ලේඛන සකස් කරමින් පවතී. පෞද්ගලික අංශයේ ආයෝජන මත ක්‍රියාත්මක වේ. |
| 100 MW/100 MWh කොලොන්නාව BESS ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ මෙගාවොට් පැය 100ක ධාරිතාවයෙන් යුතු බැටරි බලශක්ති ගබඩා පද්ධතිය | ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු වෙමින් පවතී. |
| 100 MW/400 MWh දකුණු කලාපීය (Southern) BESS ව්‍යාපෘතිය | ආසියානු සංවර්ධන බැංකුව (ADB) සමඟ එක්ව යෝජනා ඉදිරිපත් කිරීම සඳහා ඉල්ලීම (Request for proposals - RFP) සකස් කිරීමේ කටයුතු සිදු වෙමින් පවතී. |

3.
- ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) ණය පහසුකම් යටතේ 100 MW/100 MWh කොලොන්නාව බැටරි බලශක්ති ගබඩා පද්ධති (BESS) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරමින් පවතී.
- ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) ප්‍රදාන යටතේ 100 MW/400 MWh දකුණු කලාපීය BESS ව්‍යාපෘතිය සඳහා යෝජනා ඉදිරිපත් කිරීම සඳහා ඉල්ලීම් (RFP) ලේඛන සකස් කිරීම ද සිදු කරමින් පවතී.
- දකුණු කොරියානු රජයේ ප්‍රදානයක් ලෙස මෙගාවොට් පැය 10ක ධාරිතාවයකින් යුක්ත බැටරි බලශක්ති ගබඩා පද්ධතියක් (Battery Energy Storage System - BESS) හම්බන්තොට ඉදිකර ඇත.
- 160 MW/640 MWh ව්‍යාපෘති පෞද්ගලික අංශයේ ආයෝජන මත ක්‍රියාත්මක වේ.

4.
- සූර්ය බලශක්තිය පද්ධතියට එක් කිරීමේදී පද්ධතියේ ඇති විය හැකි අස්ථාවරත්වය වළක්වා ගැනීමට හැකි වේ.
- සූර්ය හා සුළං වැනි පුනර්ජනනීය බලශක්ති ප්‍රභව වඩා කාර්යක්ෂමව භාවිත කිරීමට හැකි වේ.
- ඉහළ පිරිවැය සහිත හදිසි විදුලි නිෂ්පාදන අවශ්‍යතාව අඩු වේ.
- විදුලි ජාලයේ විශ්වසනීයත්වය හා ගුණාත්මකභාවය වැඩි වේ.
- නිවැරදි ප්‍රසම්පාදන ක්‍රියාවලියක් යටතේ තෝරා ගත් බැටරි බලශක්ති ගබඩා පද්ධති ව්‍යාපෘති සහ හොඳින් ව්‍යුහගත කරන ලද බලශක්ති ගබඩා සේවා ගිවිසුම් - Energy Storage Agreements- ක්‍රියාත්මක කිරීමෙන් විදුලිබල ගාස්තු පහළ දැමීමේ හැකියාව පවතී.

මේ සියල්ලම අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් අපි දුන්නු පොරොන්දු. දැන් ඒවා ක්‍රියාත්මක වෙමින් පවතිනවා කියන එකත් මම අවධාරණය කරන්න කැමැතියි.

**ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා**
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)

පිළිතුර ලබා දුන්නාට ස්තුතියි, ගරු අගමැතිතුමියනි. ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ශ්‍රී ලංකාවේ බලශක්ති ගැටලුව පිළිබඳව අපේ රටේ පාර්ලිමේන්තුවේ වත්මන් විපක්ෂයේ මන්ත්‍රීවරුන් පසුගිය කාල පරිච්ඡේදයේ විශාල ඝෝෂාවක් නඟනවා අපි දැක්කා. ගරු අග්‍රාමාත්‍යතුමියනි, ඔවුන්ට බලය තිබුණු කාල වකවානුවේ 2015-2034 වශයෙන් සැලසුම් තිබුණා; 2018-2037 වශයෙන් සැලසුම් තිබුණා. ඒ විධියට විශාල සැලසුම් ප්‍රමාණයක් ඔවුන් හදලා තිබුණා. ඒවාට "සූර්ය බල සංග්‍රාමය" වාගේ වචන පවා දාලා තිබුණා. නමුත්, අපේ රටේ සුළං බලශක්තිය, ජල බැටරි, solar energy systems වර්ධනය කිරීම සඳහා, ඒ හදලා තිබුණු සැලසුම්වලට අනුව ක්‍රියාත්මක වෙලා තිබුණේ නැහැ. උදාහරණයක් විධියට ගත්තොත්, 2024 වන විට මෙගාවොට් 200ක pumped storage එකක් හදන්න තිබුණා. ඒවා කිසිවක් සඳහා මැදිහත් වෙලා තිබුණේ නැහැ; solar energy system එකේ මෙගාවොට් එකක් හෝ ගබඩා කරන්න බැටරි පද්ධති හදලා තිබුණේ නැහැ. ගරු අග්‍රාමාත්‍යතුමියනි, එහි ප්‍රතිඵලයක් විධියට පසුගිය මාසවල දහවල් කාලයේ නොමිලයේ ලැබෙන සූර්ය බලශක්තිය මාර්තු මාසයේදී ගිගාවොට් පැය 6.5ක් පද්ධතියෙන් ඉවත් කිරීමට සිදු වෙලා තිබෙනවා. ඒකේ වටිනාකම ලෙස රුපියල් මිලියන 170ක පමණ දළ ඇස්තමේන්තුවක් තිබෙනවා. ඒ වාගේම, battery storage නොමැති වීම නිසා අප්‍රේල් මාසයේ

[ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා]

ගිගාවොට් පැය 24ක් පද්ධතියෙන් ඉවත් කිරීමට සිද්ධ වෙලා තිබෙනවා. එහි වටිනාකම රුපියල් මිලියන 635ක් ලෙස ඇස්තමේන්තු කර තිබෙනවා. මේ විධියට ගත්තාම, මීට පෙර පාලන කාල වකවානුවල සිටි ආණ්ඩු විසින් අනාගතය දිහා බලලා battery storage පද්ධති ස්ථාපිත නොකිරීම නිසා ඉතා විශාල හානියක්, මූල්‍යමය පාඩුවක් රටක් විධියට දරන්න අපට සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා මට ඔබතුමියගෙන් අහන්න තිබෙන්නේ, ඔබතුමිය වත්මන් ආණ්ඩුව විධියට ගන්නා මේ ක්‍රියාමාර්ගය තුළ ව්‍යාපාරික ක්ෂේත්‍රයටත්, සාමාන්‍ය නේවාසික මිනිසුන්ටත් ගෙවන්න සිදු වන විදුලි පිරිවැය අපට කවදා වනකොට යම් සහනදායී තැනකට ගෙන යන්න පුළුවන්ද සහ විදුලි බිල අඩු කිරීම සඳහා යම් කාල රාමුවක් වත්මන් ආණ්ඩුවට තිබෙනවාද කියන කාරණයයි.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, මා ඉදිරිපත් කළ පිළිතුර අනුව පැහැදිලිවම පෙනෙනවා අපේ මේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ එක අරමුණක් වන්නේ, ක්‍රමානුකූලව විදුලි බිල අඩු කිරීමයි කියලා. ගරු කථානායකතුමනි, අපේ ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ විධියටම සැලසුම් තිබිලා තියෙනවා මීට කලින්. නමුත්, ඒවා හරියට ක්‍රියාත්මක වෙලා නැහැ. 2023 සිට අපි ආණ්ඩුව ලබා ගන්නා කාලය දක්වා මෙගාවොට් 1,400ක් තමයි පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගෙන් අපි ලබාගෙන තිබෙන්නේ. අපේ ආණ්ඩුව ආවාට පසුව, මේ අවුරුදු එකහමාර තුළ එය මෙගාවොට් 2,800 දක්වා වැඩි කරලා තිබෙනවා. එහෙම නේද ගරු අමාත්‍යතුමනි?

ඒ කියන්නේ, ඒගොල්ලන්ගේ ආණ්ඩුව 2023 සිට කරපු දේ අපි අවුරුදු එකහමාරකින් කර තිබෙනවා. ඒ කියන්නේ, පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගෙන් ලබා ගන්නා විදුලිය අපි මෙගාවොට් 1,400කින් වැඩි කරලා තිබෙනවා. ගරු කථානායකතුමනි, ඒ කාලයේ සැලසුම් නම් තිබිලා තියෙනවා. එක එක නම් ගම්වලින් සැලසුම් ගණනාවක් තිබෙනවා. එක එක ව්‍යාපෘතිවල නම් තිබෙනවා. නමුත්, ක්‍රියාත්මක වීම ඉතාම හෙමින් තමයි සිද්ධ වෙලා තිබෙන්නේ කියන කාරණය අපි සංඛ්‍යාලේඛනවලිනුයි පෙන්නුම් කරන්නේ.

ගරු කථානායකතුමනි, බලශක්ති ක්ෂේත්‍රය කියන්නේ එක රැයකින්, දෙකකින් වෙනස් කරන්න පුළුවන් ක්ෂේත්‍රයක් නොවෙයි. එය සැලසුම් සහගතව ඉලක්කවලට යා යුතු ක්ෂේත්‍රයක්. අපි මේ පසුගිය අවුරුදු එකහමාර තුළ කළ වැඩවලින් පෙන්වා තිබෙනවා, බලාපොරොත්තු වන ඉලක්කවලට අප ළඟා වෙනවා කියලා.

**ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා**
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)

ගරු අග්‍රාමාත්‍යතුමියනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

2023 වසරේදී එවකට පැවැති රජය ඉන්දියානු ආයෝජකයෙකු සමඟ ඇති කරගත් ගිවිසුමක් මත - අදානි සමාගම සමඟ ඇති කරගත් ගිවිසුමක් මත - විදුලි ඒකකයක් ඩොලර් ශත 8.25කට - රුපියල් 25කට ආසන්න මුදලකට - ලබා ගන්න රටට ඉතාම අවාසිදායක කොන්දේසි යටතේ ගිවිසුම්ගත වෙලා තිබුණා. වත්මන් රජය බලයට පත් වුණාට පසුව ඒ ආයෝජන නැවත කැඳවලා ප්‍රසම්පාදන ක්‍රියාවලියක් යටතේ තරගකාරී මිල කැඳවීමක් කරලා විදුලි ඒකකයක් ඩොලර් ශත 4.65කට - රුපියල් 14කට - අඩු කර ගන්න සමත් වෙලා තිබෙනවා, දේශීය ආයෝජකයෙකු සම්බන්ධ කර ගනිමින්. රටට මෙහෙම වාසි සහගත තත්ත්වයන් යටතේ පුනර්ජනනීය බලශක්තිය යොදා ගැනීමට ආණ්ඩුව කටයුතු කරද්දී විපක්ෂය මහා සෝෂාවක් නඟනවා අපි දැක්කා, "ලංකාවට ආපු ආයෝජන ඉවත් වෙනවා. මාර විනාශයක්; මාර damage එකක්. ආයෝජකයන් රඳවා ගන්න ආණ්ඩුව සමත් වෙලා නැහැ" යනාදිය කියමින්. විශේෂයෙන්ම ඒ හඬ නැඟුවේ ආර්ථික ඔස්තාර් මහත්වරු. ගරු අග්‍රාමාත්‍යතුමියනි, හැම ආයෝජනයක්ම රමණීය ආයෝජන නොවෙයි කියලා අපි දන්නවා. සමහර ආයෝජන තිබෙනවා, රටේ ආර්ථිකයට මරණීය තුවාල ඇති කරන. එම ව්‍යාපෘතියත් රටට රමණීය නොවෙයි, මරණීය තුවාල ඇති කරන්න ක්‍රියාත්මක වුණු එකක්. මේ අදානි ව්‍යාපෘතිය ඉවත් වීම නිසා රටේ ආර්ථිකයට පාඩුවක් සිදු වුණා කියලා ලොකු සාකච්ඡාවක් විපක්ෂය අරගෙන ගියා. ඒ ව්‍යාපෘතිය ඉවත් වීම නිසා මන්නාරම කොණ්ඩච්චි ප්‍රදේශයේ දේශීය ව්‍යාපාරිකයෙකු සම්බන්ධ කර ගනිමින් නව ව්‍යාපෘතියක් වර්තමානයේ ක්‍රියාත්මක වෙනවා. ඒ තිබුණු ව්‍යාපෘතිය වෙනස් කරලා නව ව්‍යාපෘතියක් ඇති වීම නිසා රටට ඇති වෙලා තිබෙන වාසිදායක තත්ත්වය මොන වාගේද කියලා මම ඔබතුමියගෙන් දැනගන්න කැමැතියි.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, ගරු විදුලිබල අමාත්‍යතුමා එයට පිළිතුරක් සපයනවා.

**ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் வலுசக்தி அமைச்சரும்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation and Minister of Energy)

ගරු මන්ත්‍රීතුමා, මන්නාරම සුළං විදුලි බලාගාරය මෙගාවොට් 50ක ධාරිතාව තිබෙන සුළං විදුලි බලාගාරයක්. එහි ඉදිකිරීම් කටයුතු මේ වනකොට අවසන් අදියරේ තිබෙන්නේ. අපි බලාපොරොත්තු වනවා, 2026 අවුරුද්ද අවසානය වනකොට මේක ජාතික විදුලිබල පද්ධතියට එකතු කරන්න පුළුවන් වෙයි කියලා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද? Standing Order එකේ number එක කියන්න.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)

Standing Order No. 91(a). ගරු කථානායකතුමනි, අපරාදේ නේ, වෙලාව. මම ඉක්මනට අහන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

වෙලාවේ ප්‍රශ්නයක් නැහැ. ඔබතුමා Standing Order එක කියන්න.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Standing Order No. 91(a).

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කටට එන Standing Order අංක කියන්න එපා. Standing Order No. 91(a)වල තිබෙන්නේ වෙන එකක්.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
කථානායකතුමනි, මම ඒක බලන්න එපායැ. සාක්කුවේ තිබෙනවායැ, අංකය. පොඩ්ඩක් ඉන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ප්‍රශ්නය අහන්න. *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Sir, I want just a small clarification. The Hon. Prime Minister agreed. - *[Interruption.]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
No, no. ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා ප්‍රශ්නය අහන්න. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Sir, it is a small clarification that I seek.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ගරු කථානායකතුමනි, පැහැදිලි කිරීමක්.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Sir, it is just a small clarification. - *[Interruption.]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා ප්‍රශ්නය අහන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම ප්‍රශ්නය අහන්නද? ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමනි, හරිද? මම අවස්ථාව ගන්නද? *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒක සුජීව සේනසිංහ මන්ත්‍රීතුමාගෙන් නොවෙයි අහන්න ඕනෑ මගෙන්. ඔබතුමා ප්‍රශ්නය අහන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
හොඳමයි, කථානායකතුමනි. *[බාධා කිරීම්]*

ගරු කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමියගෙන් මම මේ ප්‍රශ්නය අහනවා.

(අ) එක් එක් පළාත් සභාව සම්බන්ධයෙන් වෙන වෙනම, එහි නිල කාලය අවසන් වූ දිනය, මැතිවරණය පැවැත්වීමට නියමිතව තිබූ දිනය සහ රජය දැන් එවැනි මැතිවරණයක් පැවැත්වීමට අදහස් කරන දිනය දැනුවත් කරන්නේද?

(ආ) හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා මැතිවරණ කල් දැමීමෙන් ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්මවලට පටහැනිව කටයුතු කළ බව එතුමිය පිළිගන්නේද?

(ඇ) අගමැතිනිය සහ ජනතා විමුක්ති පෙරමුණ /ජාතික ජන බලවේගය විපක්ෂයේ සිටියදී එවැනි කල් දැමීම්වලට දැඩි ලෙස විරුද්ධ වූයේද? එසේ නම් එතුමියගේ රජය දැන් පළාත් සභා මැතිවරණ නොපවත්වන්නේ මන්ද?

(ඈ) පළාත් සභා මැතිවරණ කල් දැමීමට රජය ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන තිබේද?

(ඉ) රජය අපකීර්තියට පත් කිරීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව හිතාමතාම එම මැතිවරණ පැවැත්වීම මගහරමින් සිටින බව එතුමිය විශ්වාස කරන්නේද?

(ඊ) මහජන මුදල් ඉතිරි කරගැනීම සඳහා පළාත් සභා මැතිවරණ කල් දමන ලෙස ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ලෝක බැංකුව උපදෙස් දී තිබේද?

(උ) තවදුරටත් ප්‍රමාද නොකර පළාත් සභා සහ මැතිවරණ පවත්වන ලෙස විදේශ රජයන් රජයට බල කර තිබේද?

ස්තුතියි, ගරු කථානායකතුමනි.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා විසින් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු මෙසේයි.

(අ)

| # | පළාත් සභාව | නිල කාලය අවසන් වූ දිනය |
|---|---|---|
| 1. | සබරගමුව | 2017.09.26 |
| 2. | නැගෙනහිර | 2017.09.30 |
| 3. | උතුරු මැද | 2017.10.01 |
| 4. | මධ්‍යම | 2018.10.08 |
| 5. | වයඹ | 2018.10.10 |
| 6. | උතුරු | 2018.10.24 |
| 7. | දකුණ | 2019.04.10 |
| 8. | බස්නාහිර | 2019.04.21 |
| 9. | ඌව | 2019.10.08 |

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය]

මැතිවරණ පැවැත්වීමට නියමිතව තිබූ දිනය

1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 10(1) වගන්තිය අනුව පළාත් සභාව විසුරුවා හැරීමෙන් හෝ නිල කාලය අවසන් වීමෙන් පසුව සතියක් ඇතුළත ඡන්ද විමසීම පිළිබඳ දැන්වීම මැතිවරණ කොමිෂන් සභාව විසින් ප්‍රකාශයට පත් කළ යුතුය. නමුත් පළාත් සභා ඡන්ද විමසීම පැවැත්වීම සඳහා බලාත්මක වූ නීතියක් නොමැති තත්ත්වයක් තුළ මැතිවරණ කොමිෂන් සභාව මෙම දැන්වීම නිකුත් නොකරන ලදී.

රජය එම මැතිවරණය පැවැත්වීමට අදහස් කරන දිනය

2017 අංක 17 දරන පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනතෙහි 3(අ) වගන්තිය යටතේ හඳුන්වා දී ඇති නව විධිවිධාන මඟින් ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සීමා නිර්ණය කිරීමේ කමිටුවක් මඟින් මැතිවරණයට අදාළව මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කිරීම හා මැතිවරණ කොට්ඨාස ගණන තීරණය කිරීම සම්බන්ධ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු අතර, එම වාර්තාවට පාර්ලිමේන්තුවේ අනුමැතිය ලැබීමෙන් පසුව පළාත් සභා ඡන්ද විමසීම පැවැත්වීමට හැකියාව ඇත.

මේ දක්වා මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණ කටයුතු අවසන්ව නොමැති බැවින්, 2017 අංක 17 දරන පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනතේ විධිවිධාන ප්‍රකාරව පළාත් සභා ඡන්ද විමසීම පැවැත්වීමට නොහැකි වී ඇත. ඒ අනුව පළාත් සභා මැතිවරණය මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය අවසන් කිරීමෙන් පසු 2017 අංක 17 දරන පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනතෙහි විධිවිධාන ප්‍රකාරව පවත්වන්නේද, එසේ නැතහොත් මෙම පනතේ ඉහත විධිවිධානයට සංශෝධනයක් ගෙන එමින් පැරණි ක්‍රමයට පළාත් සභා මැතිවරණය පවත්වන්නේද යන්න සොයා බලා වාර්තා කිරීමටත්, ඒ පිළිබඳව වන යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පහත පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත වන පරිදි පත් කර ඇත.

| | | |
|---|---|---|
| i. | ගරු විජිත හේරත් මැතිතුමා | - සභාපති |
| ii. | ගරු මුනීර් මුලාෆර් මැතිතුමා | - සාමාජික |
| iii. | ගරු නීතිඥ සුනිල් වටගල මැතිතුමා | - සාමාජික |
| iv. | ගරු අරුන් හේමචන්ද්‍ර මැතිතුමා | - සාමාජික |
| v. | ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා | - සාමාජික |
| vi. | ගරු මනෝ ගනේසන් මැතිතුමා | - සාමාජික |
| vii. | ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මැතිතුමා | - සාමාජික |
| viii. | ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මැතිතුමා | - සාමාජික |
| ix. | ගරු සමන්මලී ගුණසිංහ මැතිතුමිය | - සාමාජික |
| x. | ගරු ධර්මප්‍රිය විජේසිංහ මැතිතුමා | - සාමාජික |
| xi. | ගරු චන්දන සූරියආරච්චි මැතිතුමා | - සාමාජික |
| xii. | ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මැතිතුමා | - සාමාජික |

ඉහත කමිටුව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන යෝජනා හා නිර්දේශ ඇතුළත් වාර්තාව අනුව ඉදිරි කටයුතු සිදු කිරීමට කටයුතු කරනු ඇත.

(ආ) ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමාගේ පක්ෂයේ නායකයා ප්‍රජාතන්ත්‍රවාදීද, නැද්ද කියන නිගමනය මම ගත යුතු නැහැ කියා මම හිතනවා. ඒක එතුමා හොඳින් දන්නවා; රට හොඳින් දන්නවා. මම හිතන විධියට, පක්ෂය තුළ එතුමා ක්‍රියා කළ විධිය අනුව රනිල් වික්‍රමසිංහ මහතාගේ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේද පිළිබඳව එතුමාට වඩා වෙන කවුරුවත් දන්නේ නැතුව ඇති. ඒක නිසා මම ඒ පිළිබඳ තීරණයක් ගත යුතු නැහැ. රවී කරුණානායක මැතිතුමාටම ඒ නිගමනයට එන්න පුළුවන් කියලා මම හිතනවා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මගේ මතය නොවෙයි, ඔබතුමියගේ මතය -

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
මගේ මතය මෙතැනට වැඩක් නැහැ. ඔබතුමාගේ පක්ෂයේ නායකයා නේ. ඔබතුමාගේ පක්ෂ නායකයා පිළිබඳව මගේ opinions දෙන්න අවශ්‍ය නැහැ. මම හිතන විධියට, ඒක සදාචාරාත්මක නැහැ, ගරු කථානායකතුමනි. එතුමාටම ඒ ගැන තීරණයකට එන්න කියමු.

(ඇ) නීතියට අනුකූලව පැවැත්විය යුතු හා පැවැත්විය හැකි මැතිවරණ සියල්ල පවත්වනු ලැබේ. කිසිදු මැතිවරණයක් නොපැවැත්වීමට රජය තීරණය කර නොමැත.

(ඈ) නැත.

(ඉ) නැත.

(ඊ) නැත.

(උ) නැත.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමිය අගමැතිනිය නේ. ඒ නිසා එහෙම කියන්න බැහැ නේ. ගරු කථානායකතුමනි, මේ අවස්ථාවේ දී ගරු අගමැතිතුමියගෙන් මේ පිළිබඳවත් මා අහන්න කැමැතියි. නීත්‍යනුකූලව තුනෙන් දෙකක බලයක් සහිත ආණ්ඩුවක් තිබෙන, මැතිවරණ පවත්වන්න ඕනෑ කියලා හැම වෙලාවේම කථා කරන ඔබතුමියලාගේ මතයට මා ගරු කරනවා. නමුත් මේ සම්බන්ධයෙන් ඔබතුමන්ලා ක්‍රියා නොකරන්නේ ඇයි? සල්ලිත් තිබෙන නිසා ක්ෂණිකව මේ මැතිවරණය පවත්වන්න කටයුතු කරන්න පුළුවන් නේද? ඒ විතරක් නොවෙයි. ගරු අගමැතිතුමියත් දන්නවා ඇති, අපේ කීර්තිමත් හිටපු කථානායක ගරු කරු ජයසූරිය මහතා සභාපතිවරයා වශයෙන් කටයුතු කළ "සාධාරණ සමාජයක් සඳහා වන ජාතික ව්‍යාපාරයේ" මහලේකම් සුනිල් ජයසේකර මහතා වාර්තාවක් ඉදිරිපත් කර තිබෙනවා, මේ රටේ පසුගිය මහ මැතිවරණයේ දී සියයට 31.8ක් ඡන්දය දීලා තිබුණේ නැහැ කියලා. එය පළාත් සභා ඡන්ද විමසීම කුමන මැතිවරණ ක්‍රමය යටතේ පැවැත්විය යුතු ද යන්න සොයා බලා වාර්තා කිරීමටත්, ඒ පිළිබඳව සිය යෝජනා සහ නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවට ඉදිරිපත් කරන්න පුළුවන්.

ගරු කථානායකතුමාගේ අවසරය පරිදි එම වාර්තාව සභාගත කරන්නට මා බලාපොරොත්තු වෙනවා. 2024 පාර්ලිමේන්තු මැතිවරණයේදී ලක්ෂ 53ක් තමන්ගේ ඡන්ද අයිතිය පාවිච්චි කර තිබුණේ නැහැ. ඒක නිසා මම අගමැතිනියට මේ ප්‍රශ්නය ඉදිරිපත් කරමින්, එම විශේෂ කාරක සභාවෙන් ඉල්ලීමක් කරනවා. කරුණාකරලා මේ කාරණයත් උපුටා ගෙන, පුළුවන් තරම් ඉක්මනට අපට මේ මැතිවරණය පවත්වන්න පුළුවන්ද කියලා බලන්න. ඒ විතරක් නොවෙයි. අගමැතිනිය උතුරට ගිය වෙලාවේ ලස්සනට ඇහුවා නේ, අපෙන් අහලාද මැතිවරණය තිබ්බේ කියලා. ඇයි අනේ! අපෙන් අහලාද මේ මැතිවරණය කල් දැම්මේ?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, මැතිවරණ කල් දැමීමේ සංස්කෘතියක් තිබෙන පක්ෂයක සාමාජිකයෙක් මගෙන් මේ ප්‍රශ්නය අහන එක system change එකේ ලකුණක් කියලා අපටත් පිළිගන්න පුළුවන්. අපි මේ අවුරුදු එකහමාර තුළ මැතිවරණ දෙකක් පවත්වා තිබෙනවා. ඒක නිසා අපට මැතිවරණවලට ඉදිරිපත් වීම පිළිබඳව කිසිම සැකයක් නැහැ. නමුත් මෙතැන නීතිමය ප්‍රශ්නයක් තිබෙනවා. මෙතැන කමිටුවක් පත් කරලා තිබෙනවා. ඔබතුමාට පුළුවන් ඒ කමිටුවට අදහස් හා යෝජනා ඉදිරිපත් කරන්න. පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව විසින් ගන්නා තීරණය අනුව ඉතාම ප්‍රජාතන්ත්‍රවාදී විධියට අපි ක්‍රියාත්මක වෙනවා. අපි නීත්‍යනුකූලව වැඩ කටයුතු කරනවා මිසක්, ප්‍රජාතන්ත්‍රවාදය කියන නාමය අපට අවශ්‍ය, අවශ්‍ය විධියට වෙනස් කර කර වාසියක් එන විධියට පාවිච්චි කරන්න අපේ අදහසක් නැහැ, ගරු කථානායකතුමනි.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, අගමැතිනිය ලස්සනට උත්තරයක් දුන්නා. මේ රටට නිදහස ලබා දුන්නේ එක්සත් ජාතික පක්ෂයේ ඩී.එස් සේනානායක මැතිතුමා.

ඒ වාගේම ජේ.ආර්. ජයවර්ධන මහතා මේ රටට විවෘත ආර්ථිකය හඳුන්වා දුන්නා වාගේම අද ඔබතුමන්ලා පූජා පවත්වමින් ඒක ඉදිරියට ගෙනැල්ලා කටයුතු කරමින් ඉන්නවා. මේ රටේ බංකොලොත්භාවයක් ඇති වුණු වෙලාවේ මහ බැංකුවේ සිටින කාර්ය මණ්ඩලය සහ අධිපති ඒ බංකොලොත්භාවය ප්‍රකාශ කළාම, රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා තමයි මේ රට ඒ බංකොලොත්භාවයෙන් එළියට ගෙනාවේ. එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරන පුද්ගලයෙකු වශයෙන් මා පළමු ප්‍රශ්නයෙන් ඇහුවා වාගේ මහවැලියේ ජලය මඟින් සහ වික්ටෝරියා, කොත්මලේ ජලාශ තුළින් ඒකකයක් රුපියල් 2.50 ගණනේ මෙගාවොට් 900ක් නිෂ්පාදනය කිරීමේ හැකියාව තිබෙනවා. මුදල් ඇමති වශයෙන් මමයි, අජිත් පී. පෙරේරා මැතිතුමායි එක්සත් ජාතික පක්ෂ පාලනය තුළින් පුනර්ජනනීය බලශක්තිය හරහා මෙගාවොට් 2,800ක් ලබා දුන්නා. ඒ අවස්ථාවේ අපි හැම මැතිවරණයක්ම පැවැත්වූවා. පසුව මහ බැංකු අධිපති මේ රටේ බංකොලොත්භාවය ප්‍රකාශ කරපු නිසා මැතිවරණ කල් දමන්න සිදු වුණා. මම කිව්වා, ඒක වැරැද්දක් කියලා. මා සහ විපක්ෂයේ සියලුදෙනාම මේ ආණ්ඩුවෙන් එක කාරණයක් අහනවා. මොකද, ඔබතුමන්ලා ආවේ system change එකක් කරන්න නේ. නමුත් දැන් system maintenance එකක් නේ කරගෙන යන්නේ. ඉතින්, ඒ සම්බන්ධයෙන් අපි ඒකමතිකව කරුණු ඉදිරිපත් කරන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය ඉක්මනින් අහන්න. ඔබතුමා දැන් විනාඩි දෙකක කාලයක් ගත්තා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ප්‍රශ්නය අහන්න එපාද, ගරු කථානායකතුමනි?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමා ප්‍රශ්නය අහන්න දැන් විනාඩි දෙකක කාලයක් ගත්තා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නයක් අහන වෙලාවට ඔබතුමා ඒක අදාළ කර ගන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

නැහැ, නැහැ. ඒක හැම එකකටම අදාළයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

අගමැතිතුමියට අගෞරව කරන්න එපා. එතුමිය හොඳට උත්තර දෙනවා. මෙතුමිය රටේ අගමැතිනිය නේ.

මම අහන්නේ මේකයි. එක්සත් ජාතික පක්ෂය මෙච්චර වැඩ කරලා තිබෙන නිසා, මේ සම්බන්ධයෙන් අපි ඉතාම ඕනෑකමින් ඉල්ලන්නේ, ජනතාවගේ අයිතිය හැම අවස්ථාවකදීම ඒගොල්ලන්ට පෙන්වා දෙන්න පුළුවන් වන විධියට පුළුවන් තරම් ඉක්මනට මැතිවරණයක් පවත්වන්න කියන එකයි. ඒ යෝජනාව ගෙනැල්ලා, ඒක පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකේ සහයෝගයෙන් අපි එකමුතුව සහ සහයෝගයෙන් ශීඝ්‍රව සම්මත කර ගනිමුද?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, මෙතුමා දැන් ලොකු හැල්ලක් කියෙව්වා නේ, ඒගොල්ලන් කරපු දේවල් ගැන. ඒ කරපු දේවල් එච්චර සාර්ථක වෙච්ච නිසා නේ, ජනතාව පසුගිය මැතිවරණ දෙකකදී ඒ system එක පරද්දලා අපේ system එක දිනෙව්වේ. ඒ ජනතා තීන්දුවෙන් අපට හොඳ නිගමනයකට එන්න පුළුවන්, මෙතුමා කියපු කාර්යයන්වල සාර්ථකත්වය ජනතාවට දැනුණේ කොහොමද කියන එක ගැන.

ගරු කථානායකතුමනි, අපි මේ සම්බන්ධව කමිටුවක් පත් කරලා තිබෙන්නේ. මේ පවතින ක්‍රමය තුළ ප්‍රශ්න තිබෙනවා කියන එක විපක්ෂයත් ඉදිරිපත් කරලා තිබෙනවා. පරණ ක්‍රමය අනුව අපි මැතිවරණය පැවැත්වූවොත්, කොට්ඨාසයකට මන්ත්‍රීවරයෙක් පත් කරන්න බැහැ, කාන්තා නියෝජනයක් තහවුරු කරන්න බැහැ, තරුණ නියෝජනයක් තහවුරු කරන්න බැහැ. මේ දේශපාලන සංස්කෘතිය තුළ දූෂණය ඇති කරන්න විශාල ලෙස බලපෑ මනාප ක්‍රමය අපට වෙනස් කරන්න බැහැ. මේ සියල්ල තුළ ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කරන්න ඕනෑය කියලා නිකම් මැතිවරණයක් පවත්වන එක නොවෙයි කරන්න ඕනෑ. මැතිවරණ ක්‍රමය තුළ ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු වන නිර්ණායක, නැත්නම් ඒ මැතිවරණ ක්‍රමය අපි වෙනස් කරන්න ඕනෑ. ඒ සඳහා තමයි අපි මේ උත්සාහ කරන්නේ. ඒ හරහා අද දවසට ගැළපෙන විධියට මේ මැතිවරණ ක්‍රමය තුළ තිබෙන අඩුපාඩු නිවැරදි කරගෙන අපි මැතිවරණයකට යමු. කිසිම ප්‍රශ්නයක් නැහැ. ඔබතුමන්ලා ඒ කමිටුවේ වැඩ ඉක්මන් කරන්න අපට උදවු කරන්න. අපි මැතිවරණය පවත්වන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා ඊළඟ ප්‍රශ්නය.- *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Sir, Standing Order No. 38(7) under "Questions to be Asked from the Prime Minister" states, I quote:

> "After the Prime Minister has answered any question, the Member who asked the question may ask two supplementary questions. Any other Member of Parliament with the permission from the Member asking the question may ask one or more of the supplementary questions:"

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
You ask, Hon. Member. Go ahead, no problem.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
After you, Hon. Karunanayake. Have you finished?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
You go ahead; you may ask the question.- *[Interruption.]*

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)
ප්‍රශ්න දෙකක් අහලායි පටන් ගත්තේ.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
It states that any other Member can ask questions.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අතුරු ප්‍රශ්න දෙකයි අහන්න පුළුවන්, ගරු මන්ත්‍රීතුමනි. කාලය නාස්ති කරන්නේ නැතිව ඉන්න.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, කාලය නාස්ති කරන්න නොවෙයි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමනි, ඊළඟ ප්‍රශ්නය- *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමනි, ප්‍රශ්න 10ක් විතරක් අහන්න පුළුවන්. ඔබතුමා ඔය නාඩගම නටන්න එපා. වාඩිවෙන්න. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
එහෙම නොවෙයි. Sir, did you read the Standing Order? It states, "Any other Member of Parliament with the permission from the Member asking the question may ask one or more of the supplementary questions:"

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට සිංහල තේරෙන්නේ නැහැ නේ.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
සිංහලෙන් නොවෙයි, ඉංග්‍රීසියෙන් කථා කළේ මම.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඉංග්‍රීසියෙන් හෝ සිංහලෙන්,- *[බාධා කිරීම්]* ඒ ගරු මන්ත්‍රීතුමාගේ අවසරය මත ඔබතුමාට අතුරු ප්‍රශ්න එකක් අහන්නත් පුළුවන්, දෙකක් අහන්නත් පුළුවන්. දැන් අතුරු ප්‍රශ්න දෙක අහලා ඉවරයි. කරුණාකර ඔබතුමන්ලා වාඩිවෙන්න, මේ සභාවේ වැඩකටයුතුවලට බාධා කරන්නේ නැතිව. *[බාධා කිරීම්]*

ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමනි, මේ ඔබතුමාගේ වාරය. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Sir, it is very clear.- *[Interruption.]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මුජිබුර් මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නය අහන්න.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මම ප්‍රශ්නය අහනවා, ගරු කථානායකතුමනි. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
මට එක අතුරු ප්‍රශ්නයක් අහන්න පුළුවන්. අතුරු ප්‍රශ්න දෙකක් ඇහුවාට පස්සේ,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ සභාවේ කටයුතුවලට බාධා කරනවා නම් ඔබතුමාව මම එළියට යවනවා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Sir, one more question can be asked.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අතුරු ප්‍රශ්න දෙකයි අහන්න පුළුවන්. ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට අවවාද කරනවා. ඔබතුමා මේ සභාවේ කටයුතුවලට බාධා කරනවා නම් මම ඔබතුමාව එළියට දමනවා. *[බාධා කිරීම්]* අතුරු ප්‍රශ්න දෙකයි අහන්න පුළුවන්.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ඔබතුමාට එහෙම කරන්න බැහැ. මේකේ තිබෙන දේ පොඩ්ඩක් තේරුම් ගන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, නැහැ, ගරු මන්ත්‍රීතුමනි. මෝඩ විදියට හැසිරෙන්න එපා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
It clearly states - *[Interruption.]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මුජිබුර් මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
One more question can be asked.- *[Interruption.]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 38 (7)හි මොකක්ද තිබෙන්නේ? එහි මෙසේ සඳහන් වනවා:

"(7) අග්‍රාමාත්‍යවරයා විසින් යම් ප්‍රශ්නයකට පිළිතුරු ලබා දීමෙන් අනතුරුව ප්‍රශ්නය අසන ලද මන්ත්‍රීවරයා විසින් අතුරු ප්‍රශ්න දෙකක් අසනු ලැබිය හැකි ය. ප්‍රශ්නය අසනු ලබන මන්ත්‍රීවරයාගේ අවසරය ඇතිව, පාර්ලිමේන්තුවේ වෙනත් ඕනෑම මන්ත්‍රීවරයකුට එම අතුරු ප්‍රශ්නවලින් එකක් හෝ ඊට වැඩි ගණනක් අසනු ලැබිය හැකිය:"

අයියෝ, මොකක්ද මේ කරන්නේ? මේගොල්ලන් යවන්න ඕනෑ අර පොඩි බබාලාගේ පන්තියට. *[බාධා කිරීම්]* තේරෙන්නේ නැද්ද? ගරු කථානායකතුමනි, හොරට බුදියාගෙන ඉන්න කට්ටියට උගන්වන්න බැහැ. ඔබතුමා සභාවේ කටයුතු කරගෙන යන්න. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම දන්නේ නැහැ. මට සුජීව සේනසිංහ මන්ත්‍රීතුමාට අධ්‍යාපනය ලබා දෙන්න වෙනවා, මේක තේරුම් කරවන්න. *[බාධා කිරීම්]* ගරු මුජිබුර් මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමනි, මා ගරු අග්‍රාමාත්‍යතුමියගෙන් අසන ප්‍රශ්නය මෙයයි.

"Rebuilding Sri Lanka" ගිණුමට බැර වී තිබෙන මුදල් මෙතෙක් වියදම් කර නොමැති බව අනාවරණය වී ඇත.

01. "දිට්වා" සුළි කුණාටුවෙන් ආපදාවට පත් වූ පිරිසකට තවමත් සහන ලැබී නැති බව දන්නේද?

02. ව්‍යසන කළමනාකරණ පනතේ 11(1) වගන්තිය අනුව රට තුළ ව්‍යසන තත්ත්වයක් ප්‍රකාශයට පත් කරනුයේ ජනාධිපතිවරයායි. ඒ තුළ ආරක්ෂක ලේකම්වරයා ප්‍රකාශයට පත් කළ ගැසට් නිවේදනයේ නෛතිකභාවය පිළිගන්නේද?

03. ව්‍යසන කළමනාකරණ පනතේ 17වන වගන්තියට අනුකූලව අරමුදලක් ස්ථාපිත කිරීමට හැකියාව තිබියදී "Rebuilding Sri Lanka" නමින් අරමුදලක් පිහිටුවීමට කටයුතු කළේ මන්ද?

04. "Rebuilding Sri Lanka" අරමුදලේ සාමාජිකයින් කවුරුන්ද? ඔවුන් සිදු කළ කර්තව්‍යයේ ප්‍රගතිය කවරේද?

05. රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදී හෙළි වූයේ "Rebuilding Sri Lanka" නමින් අරමුදලක් නොමැති බවයි. ආපදාව සිදු වී මාස 7ක් වනවිටත් නීත්‍යානුකූලව පිහිටුවා නොමැති අරමුදලකට පරිත්‍යාගශීලීන්ගේ මුදල් ගැනීමට කටයුතු කළේ මන්ද?

06. ඉහත නමින් හඳුන්වන අරමුදලට මේ දක්වා ලැබී ඇති මුදල සහ එම මුදල් වියදම් නොකර භාණ්ඩාගාරයේ රඳවා ඇත්ද?

07. පිළිගත් දේශපාලන පක්ෂයක මහ ලේකම් විසින් පළාත් සභා මැතිවරණයට වෙන් කළ මුදල් ආපදා සහන සඳහා යොදා ගත් බවට කළ ප්‍රකාශය සත්‍යයක්ද? එලෙස වියදම් කළ මුදල් ප්‍රමාණය කොපමණද?

"පිළිගත් දේශපාලන පක්ෂයක මහ ලේකම්" කියන එක මම ඒ ප්‍රශ්නයට ඇතුළත් කළේ මේ නිසායි. ගරු කථානායකතුමනි, මම මෙතැනදී "ජනතා විමුක්ති පෙරමුණේ මහ ලේකම්" කියලා කිව්වාම මේක භාර ගත්තේ නැහැ; මේක හරවා යැව්වා, ඒක නැතිව එවන්න කියලා. ඒකයි මම නැවත ඇතුළත් කළේ "පිළිගත් දේශපාලන පක්ෂයක මහ ලේකම්" කියලා. මම දන්නේ නැහැ, ඒක හරවා එව්වේ ඇයි කියලා.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා මම සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### 2010 සිට පාසල් හැර ගිය ළමුන්: විස්තර
### 2010 தொடக்கம் மாணவர்களின் பாடசாலை இடைவிலகல்: விபரம்
### SCHOOL DROPOUTS SINCE 2010: DETAILS

26/2024

**1. ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)
අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා අතරමඟදී පාසල් හැර ගිය ළමුන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ළමුන් අයත් වන වයස් කාණ්ඩ කවරේද;

(iii) එම ළමුන් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ළමුන් පාසල් හැර යාමට බලපා ඇති පොදු හේතු කවරේද;

(v) ඒ සඳහා රජය මඟින් ලබා දෙනු ලබන විසඳුම් කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඉහත ගැටලුව සම්බන්ධයෙන් රජය විසින් විධිමත් අධ්‍යයනයක් සිදු කරනු ලබන්නේද;

(ii) නොඑසේ නම්, එවැනි අධ්‍යයනයක් කඩිනමින් සිදු කළ යුතු බව පිළිගන්නේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) 2010ஆம் ஆண்டு தொடக்கம் இதுவரை, பாடசாலைகளிலிருந்து இடைவிலகியுள்ள மாணவர்களின் எண்ணிக்கை ஆண்டு வாரியாக வெவ்வேறாக யாது;

(ii) மேற்படி மாணவர்கள் உள்ளடங்கும் வயதுப் பிரிவுகள் யாவை;

(iii) அத்தகைய மாணவர்களின் எண்ணிக்கை மாவட்ட வாரியாக வெவ்வேறாக யாது;

(iv) மாணவர்கள் பாடசாலைகளிலிருந்து இடைவிலகுவதில் செல்வாக்குச் செலுத்தியுள்ள பொதுவான காரணங்கள் யாவை;

(v) அது தொடர்பில் அரசாங்கம் வழங்கும் தீர்வுகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) அரசாங்கம் மேற்படி பிரச்சினை தொடர்பாக முறையான ஆய்வொன்றை மேற்கொள்ளுமா;

(ii) இன்றேல், அவ்வாறான ஆய்வொன்றைத் துரிதமாக மேற்கொள்ள வேண்டும் என்பதை ஏற்றுக்கொள்வாரா;

என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House the -

(i) number of school dropouts in each year from 2010 up to now, separately;

(ii) age groups to which the said school dropouts belong;

(iii) number of such school dropouts in each district, separately;

(iv) common reasons that have forced children to drop out of school; and

(v) solutions that will be provided by the Government to address this issue?

(b) Will she also inform this House -

(i) whether the Government is conducting a formal study on the above issue; and

(ii) if not, whether she accepts that such a study should be conducted urgently?

(c) If not, why?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) මෙම අමාත්‍යාංශයේ 2010-2017 දක්වා මුල් කාලය තුළ පාසල් හැර ගිය ළමුන් පිළිබඳ තොරතුරු මෙම අමාත්‍යාංශය සතුව නොමැත. 2018 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා වාර්ෂික පාසල් සංගණන දත්ත වාර්තාවලින් 1 ශ්‍රේණියේ සිට 10 ශ්‍රේණිය දක්වා එක් එක් ශ්‍රේණියට ඇතුළත් වූ ශිෂ්‍ය සංඛ්‍යා අනුව පාසල් හැර ගිය ළමුන් සංඛ්‍යා සහ ඇදහැලීමේ අනුපාත අන්තර්ජාතිකව පිළිගත් සමීකරණයක් අනුව ගණනය කරන ලද දත්ත පහත වගුව මඟින් ඉදිරිපත් කෙරේ.

| වර්ෂය | ඇදහැලී ඇති බවට ගණනය කරන ලද 1-10 ශ්‍රේණිවල ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|
| 2018 | 38,839 |
| 2019 | 41,503 |
| 2020 | 32,540 |
| 2021 | 25,492 |
| 2022 | 52,596 |
| 2023 | 50,345 |
| 2024 | 25,823 |

මෙතැනදී සැලකිය යුතු විශේෂ කරුණු වන්නේ මේවායි, ගරු කථානායකතුමනි. එක් පළාතක සිට තවත් පළාතක පාසලකට මාරු වීම, ජාත්‍යන්තර පාසල්වලට ඇතුළත් වීම සහ පවුලේ සාමාජිකයන් සමඟ පිට රටකට සංක්‍රමණය වීම යනාදී හේතුන් මත ඇතැම් සිසුන් පාසලෙන් ඉවත් වුවද, විධිමත් අධ්‍යාපනයක් ලැබිය හැක. එවැනි දත්ත මෙම ගණනය කිරීමේදී පැහැදිලිව ග්‍රහණය කර ගත නොහැක.

(ii) 1 ශ්‍රේණියේ සිට 10 ශ්‍රේණිය දක්වා ශ්‍රේණිය අනුව ඉහත ගණනය කිරීම සිදු කෙරේ. ඒ අනුව වයස අවුරුදු 5 සිට 15 දක්වා වූ වයස් කාණ්ඩයට අයත් වේ.

(iii) දිස්ත්‍රික්කය අනුව 1 ශ්‍රේණියේ සිට 10 ශ්‍රේණිය දක්වා ඇදහැලී ඇති බවට ගණනය කරන ලද ශිෂ්‍ය සංඛ්‍යාව ඇමුණුමෙහි දක්වා ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

(iv) ළමුන් පාසල් හැර යාමට අදාළ වන හේතු සහිත ප්‍රධාන තේමා පහත පරිදි වේ.

01. පෞද්ගලික හේතු
02. පාසල සම්බන්ධ හේතු
03. පවුල සම්බන්ධ හේතු
04. සමාජයීය හේතු
05. අනෙකුත් අධ්‍යයන කටයුතු සඳහා

(ප්‍රතිපත්ති හා සැලසුම් ශාඛාව මඟින් 2024, 2025 වර්ෂයේ සිදු කරන ලද "A Study on Trends of Irregular Attendance and School Dropouts of Students" නමැති අධ්‍යයනය මඟින් ඉහත තොරතුරු අනාවරණය කර ගන්නා ලදී.)

(v) අනිවාර්ය අධ්‍යාපන පනත මඟින් වයස අවුරුදු 5-16 අතර වයසේ දරුවන් අනිවාර්යයෙන්ම පාසල් අධ්‍යාපනය ලැබිය යුතු බව සඳහන් කර ඇත. ඒ අනුව නොවිධිමත් අධ්‍යාපන වැඩසටහන් හා ව්‍යාපෘති නිලධාරින් මඟින්, පාසල්වලින් ඇදහැලෙන දරුවන් හඳුනාගෙන ඔවුන් නැවත පාසල්ගත කිරීමේ වැඩසටහන්ද, දරුවන් පාසල්වලින් ඇදහැලීම වළක්වා ගැනීම සඳහා රජය විසින් මේ වනවිටත් සුබසාධන වැඩසටහන් ගණනාවක්ද ක්‍රියාත්මක කරනු ලැබේ.

ගරු කථානායකතුමනි, ඒවා කොච්චර සාර්ථකව කෙරෙනවාද කියන එක ගැන අපට කථා කරන්න පුළුවන්. නිලධාරි හිඟයත් ඒකට බලපානවා. වෙනත් සාධකත් බලපා තිබෙනවා. නමුත් ඒ ගැන අපි විශේෂ අවධානයක් යොමු කරලා තිබෙනවා. ඉදිරියේදී අපේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළිනුත් විශේෂයෙන්ම වයස අවුරුදු 14, 15, 16 වෙනකොට පාසල් පද්ධතියෙන් ඉවත් වන දරුවන් රඳවා ගැනීමට විශේෂ අවධානයක් යොමු කරලා තිබෙනවා.

(ආ) (i) සෑම මාස දෙකකට වරක් පාසල් කමිටුව මඟින් තම පාසල් පෝෂක ප්‍රදේශයේ පාසල් නොයන ළමයින්ගේ හා අතරමඟ අධ්‍යාපනයෙන් ගිලිහුණු සිසුන්ගේ තොරතුරු අධීක්ෂණ කමිටුවට වාර්තා කළ යුතුව ඇත. මාස තුනකට වරක් කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ මඟින් තම කොට්ඨාසයේ උක්ත ශිෂ්‍ය තොරතුරු කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයාටද, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් තම කලාපයේ උක්ත ශිෂ්‍ය තොරතුරු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයාටද වාර්තා කළ යුතු වේ. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරු විසින් සෑම වර්ෂයකම අවසානය වනවිට පළාතේ පාසල් නොයන ළමයි, අතරමඟ පාසල් හැර ගිය ශිෂ්‍ය තොරතුරු, පාසල්ගත කළ ළමුන් සංඛ්‍යාව, ඒ සඳහා ගත් ක්‍රියාමාර්ග ඇතුළත් වාර්තා සැපයීම කළ යුතු වේ.

එම ක්‍රියාවලියේ අඩුපාඩු තිබෙනවා, ගරු කථානායකතුමනි. ඒ නිසාම තමයි අපි අධ්‍යාපනය ඩිජිටල්කරණය කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කරලා තිබෙන්නේ. ඒකේ පළමුවැනි phase එක අපි මේ සතියේ සෙනසුරාදා ආරම්භ කළා. ඒ, ගුරුවරුන්ගේ තොරතුරු ඩිජිටල් පද්ධතියට එකතු කරන්න. දෙවැනි phase එකේදී දරුවන්ගේ තොරතුරුත් එම පද්ධතියට එකතු කරන්න අපි සැලසුම් කරලා තිබෙනවා. එතකොට අපට මීට වඩා හොඳින් දත්ත ලබා ගැනීමට හැකි වෙනවා.

(ii) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)

ගරු කථානායකතුමනි, පිළිතුරු ලබා දීම පිළිබඳව මම ගරු අග්‍රාමාත්‍යතුමියට ස්තුතිවන්ත වෙනවා. ඔබතුමිය පිළිතුරු ලබා දීම ආරම්භයේදීම කිව්වා, යම් කාල සීමාවකට අදාළ දත්ත නැහැ කියලා. ඇත්තටම අපි රටක් විධියට ඒ ගැන කනගාටු වෙන්න ඕනෑ. නිදහස් අධ්‍යාපනයෙන් පෝෂණය ලබන රටක අඩුම තරමින් පාසල් නොයන ළමුන්ගේ දත්ත ටික හරි තිබෙන්න ඕනෑ. ඉතිහාසයේ ආණ්ඩු කරපු හිටපු අධ්‍යාපන ඇමතිවරු සම්පූර්ණයෙන්ම ඒ වගකීම භාර ගන්න ඕනෑ. රටක පාසල් නොයන ළමුන්ගේ ලැයිස්තුව maintain කර ගන්න බැරි නම්, ඒ ළමයින්ට සාධාරණයක් ඉටු කරනවා කියන කාරණය ගැන අපට හිතන්නවත් බැහැ. ඒක හීනයක්.

මම ගරු අගමැතිතුමියගෙන් පළමුවැනි අතුරු ප්‍රශ්නය අහන්න කැමැතියි. මේ මොහොත වනවිට ඔබතුමිය කියපු කරුණුත් එක්කම ආර්ථික අපහසුතා නිසා තමන්ගේ පවුල නඩත්තු කර ගැනීමේ නොහැකියාව මත අපේ රටේ ළමයින්ගෙන් යම් ප්‍රමාණයක් පාසල් පද්ධතියෙන් එළියට යනවා. මේ රටේ තිබෙන සුබසාධන වැඩ පිළිවෙළක් වන "අස්වැසුම" වැඩසටහන ගත්තොත්, - ගරු අගමැතිතුමිය එකඟ වුණත් නැතත් - එය අවිධිමත් විධියට තමයි ක්‍රියාත්මක වෙන්නේ. ඒ දීමනාව ලැබිය යුතු මිනිස්සුන්ට ලැබෙන්නේ නැහැ. හැබැයි, ඒ දීමනාව නොලැබිය යුතු මිනිස්සු එය ලබා ගන්නවා. ඒක ඉතිහාසය පුරාම දේශපාලනීකරණය වෙලා ඉදිරියට ආවා. අදටත් ඒ ප්‍රශ්නය තිබෙනවා. අධ්‍යාපන අමාත්‍යාංශයත් මැදිහත් වෙලා ආර්ථිකමය කාරණා මත - සපත්තු දෙක ගන්න බැරිව, රෙදි කෑල්ල ගන්න බැරිව, පොත් ටික ගන්න බැරිව - පාසල් නොයන දරුවන් වෙනුවෙන් අඩුම තරමින් සුබසාධන වැඩසටහනක් යම් ක්‍රමවේදයකට අනුව හදන්න යම්කිසි පියවරක් තබන්න පුළුවන්ද, බැරිද කියලා මම ඔබතුමියගෙන් දැනගන්න කැමතියි.

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, ඒ සඳහා පළමුවැනි පියවර හැටියට අපි හරියට දත්ත ලබා ගත යුතුයි. ඒ ක්‍රියාවලිය තමයි අපි දැන් ආරම්භ කරලා තිබෙන්නේ. හැබැයි, අපට ඒ ක්‍රියාවලිය සම්පූර්ණ වෙනකම් ඉන්න බැරි නිසා තමයි අසම්පූර්ණ පද්ධතියක් තුළ හෝ අපි යම් මැදිහත්වීමක් කරන්නේ.

එහිදී හේෂා විතානගේ මන්ත්‍රීතුමා කියන අර දත්ත ප්‍රශ්නය තිබුණත්, සපත්තු බෙදා දීම, පෝෂ්‍යදායී ආහාර වේලක් ලබා දීම, සියලු දරුවන්ට uniforms ලබා දීම, සියලු දරුවන්ට පොත් ලබා දීම, සපත්තු ලබා දීම වාගේම ගැහැනු දරුවන්ට සනීපාරක්ෂක තුවා ලබා දීමේ වැඩසටහන අපි කරගෙන යනවා. ඒ වාගේම stationery දීමනාවත් අඩු ආදායම්ලාභී දරුවන්ට අපි ලබා දෙනවා. ඒක Aswesuma Programme එකෙන් තෝරලා තිබෙන පවුල්වල හැම ළමයෙකුටම ලැබෙනවා. ඒ හැරෙන්න, කුඩා පාසල්වල දරුවන් සියලුදෙනාටමත් ඒක ලැබෙන්න සලස්වා තිබෙනවා. ඒ target එක සියයට සියයක් perfect නැහැ කියන එක අපි පිළිගන්නවා. මේ දත්තවල තිබෙන ප්‍රශ්නය නිසාම තමයි අපි විශාල වැයමක් මේ අවුරුද්දේ දරන්නේ, ඒ පද්ධතියෙන් දත්ත හරියට ලබා ගැනීම සඳහා. එතකොට මේක තවත් target කරලා හරියටම දෙන්න පුළුවන්.

**ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)

මගේ ඊළඟ අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු අග්‍රාමාත්‍යතුමියනි. ඔබතුමියගේ ප්‍රතිපත්තිමය කාරණාවක් සම්බන්ධයෙන් මම මේක අහන්නේ. නව රජය පත්වෙච්ච වෙලාවේ කිව්වා, පාසල් තුළට දේශපාලනඥයන් ගෙන්වා ගැනීම නතර කරන්න කියලා. ප්‍රතිපත්තිමය වශයෙන් ඒකට මමත් එකඟයි. දේශපාලනඥයන් පාසල් තුළට ගිහිල්ලා දරුවන්ට දේශපාලනික වශයෙන් මැදිහත් වෙන ක්‍රියාකාරකම්වල නිරත වීම සුදුසු නැහැ. ඒ වාගේම නලින්ද ජයතිස්ස ඇමතිතුමාත් කිව්වා, "අපි කරන වැඩවලට උත්සව තියලා බෝඩ් ලෑලි ගහන්න ඕනෑ නැහැ. මේ අවසාන එක" කියලා. මට මතකයි, එතුමා රෝහලක් විවෘත කරන වෙලාවේ එවැනි ප්‍රකාශයක් කළා. නමුත් පසුගිය සතියේ මාධ්‍ය ආවරණයක් ලබා දුන්නා අම්බිකා මන්ත්‍රීතුමියගේ සිද්ධියක් සම්බන්ධයෙන්. මම ඒක සුළුකොට තකන්නේ නැහැ. අම්බිකා මන්ත්‍රීතුමිය, බැන්ඩ් එකක් ගහගෙන ගිහිල්ලා තමයි වැසිකිළියකට මුල් ගල් තියන්නේ. ඒක විය යුතු දෙයක්. නමුත් ගරු අග්‍රාමාත්‍යතුමියනි, එතුමිය ඒ කරපු ක්‍රියාවලිය ඔබතුමිය ගත්ත ප්‍රතිපත්තිමය ක්‍රියාවලියට, ඒ අදහසට විරුද්ධයි. එක්කෝ, ඒ ප්‍රතිපත්තිමය ක්‍රියාවලිය දැන් අයින් කරගෙන තිබෙනවාද, මන්ත්‍රීවරුන්ට පාසල් තුළට යන්න පුළුවන්ද, නැත්නම් ඔබතුමිය කියපු කාරණාවෙන් පරිබාහිරව ඒ මන්ත්‍රීතුමිය වැඩ කළාද?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, අපි ඒ ප්‍රකාශය කළේ පාසල් දරුවන්ව දේශපාලනිකව අවභාවිත කිරීමට විරුද්ධවයි. ඒ කියන්නේ පවත්වන පාසල් උත්සව දරුවන්ට සුදුසු විධියට නැතිව දේශපාලනය කිරීමට පාවිච්චි කරන එකට අපි විරුද්ධයි. එදාත් විරුද්ධයි; අදත් විරුද්ධයි. මම හිතන්නේ නැහැ අපේ මන්ත්‍රීවරු 159දෙනාගෙන් එක්කෙනෙක්වත් එහෙම කරනවා කියලා. හැබැයි, ප්‍රදේශයේ මන්ත්‍රීවරයෙකු ඒ අවට පාසලට ගිහිල්ලා නිරීක්ෂණයක් කිරීම, උත්සවයකට සහභාගි වීම අපි තහනම් කර නැහැ. නමුත්, පාසල් පද්ධතියත්, දරුවන්වත් දේශපාලනිකව අවභාවිත කරන එකට අපි විරුද්ධයි. ඒක කරන්න එපා කියන එක තමයි ගරු කථානායකතුමනි, අපි කියලා තිබෙන්නේ.

## ආබාධ සහිත පුද්ගලයින්ට ගෙවනු ලබන මාසික ජීවනාධාරය: විස්තර
## மாற்றுத்திறனாளிகளுக்கு வழங்கப்படும் மாதாந்த வாழ்வாதாரக் கொடுப்பனவு: விபரம்
## MONTHLY LIVING ASSISTANCE PAID TO PERSONS WITH DISABILITIES: DETAILS

1976/2026

**2. ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා**
(மாண்புமிகு சுகத் வசந்த த சில்வா)
(The Hon. Sugath Wasantha de Silva)

ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ආබාධ සහිත තැනැත්තන් සඳහා ලබාදෙන මාසික ජීවනාධාර මුදල කොපමණද;

(ii) මාසිකව ආබාධිත දීමනාව ලබන ආබාධිත තැනැත්තන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම දීමනාව සඳහා අලුතින් ඉල්ලුම් කළ හැකි ආබාධිත පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iv) පවුලක ආබාධ සහිත පුද්ගලයන් කිහිපදෙනෙක් සිටින විට, ඉන් ජීවනාධාරය ලබා ගැනීමේ හැකියාව ඇති පුද්ගලයන් ගණන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) (i) මාසික ජීවනාධාර ලබාදීමේදී සුදුස්සන් තෝරා ගැනීම සඳහා භාවිත කරනු ලබන නිර්ණායක කවරේද;

(ii) ඒ සඳහා අඩු ආදායම්ලාභීන්ගේ ආදායම් මට්ටම නිශ්චය කරන ක්‍රමවේදය කවරේද;

(iii) අස්වැසුම හෝ වෙනත් ජීවනාධාරයක් ලබන ආබාධ සහිත තැනැත්තෙකුට ආබාධිත දීමනාව ලබා ගැනීමට බාධාවක් තිබේද;

(iv) 2026 අයවැය මඟින් ආබාධිත දීමනාව ගෙවීම සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

(v) ආබාධිත දීමනාව අපේක්ෂිත පුද්ගලයන් පොරොත්තු ලේඛනයක රැඳී සිටීමට සිදුවන්නේද;

(vi) මාසයේ නිශ්චිත දිනයක දිවයින පුරා ආබාධිත දීමනාව ගෙවීම සඳහා නිශ්චිත වැඩ පිළිවෙළක් සකස් කිරීමේ හැකියාව තිබේද;

යන්නත් එතුමා සඳහන් කරන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மாற்றுத்திறனாளிகளுக்காக வழங்கப்படும் மாதாந்த வாழ்வாதாரக் கொடுப்பனவு எவ்வளவு என்பதையும்;

(ii) மாதாந்த மாற்றுத்திறனாளிக் கொடுப்பனவைப் பெறும் மாற்றுத்திறனாளிகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) மேற்படி கொடுப்பனவுக்காகப் புதிதாக விண்ணப்பிக்கக்கூடிய மாற்றுத்திறனாளிகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(iv) ஒரு குடும்பத்தில் பல மாற்றுத்திறனாளிகள் இருக்கும்போது, அவர்களுள் வாழ்வாதாரக் கொடுப்பனவைப் பெற்றுக்கொள்ளக்கூடிய நபர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) மாதாந்த வாழ்வாதாரக் கொடுப்பனவை வழங்கும்போது, தகுதியானவர்களைத் தெரிவு செய்வதற்காகப் பயன்படுத்தப்படும் அளவு கோல்கள் யாவை என்பதையும்;

(ii) அதற்காக குறைந்த வருமானம் ஈட்டுபவர்களின் வருமான மட்டத்தைத் தீர்மானிக்கும் முறையியல் யாது என்பதையும்;

(iii) 'அஸ்வெசும' அல்லது பிறிதேனும் வாழ்வாதாரக் கொடுப்பனவைப் பெறும் மாற்றுத்திறனாளி ஒருவருக்கு மாற்றுத்திறனாளிக் கொடுப்பன வைப் பெறுவதில் தடையேதும் உள்ளதா என்பதையும்;

(iv) 2026 பாதீட்டின்மூலம் மாற்றுத்திறனாளிக் கொடுப்பனவை வழங்குவதற்காக ஒதுக்கப் பட்டுள்ள நிதித்தொகை எவ்வளவு என்பதையும்;

(v) மாற்றுத்திறனாளி கொடுப்பனவை எதிர்பார்க்கும் நபர்கள் காத்திருப்புப் பட்டியலில் இருக்க நேரிடுமா என்பதையும்;

(vi) மாதத்தில் குறிப்பிட்ட தினத்தில் நாடளாவிய ரீதியில் மாற்றுத்திறனாளிக் கொடுப்பனவை வழங்குவதற்கு முறையான வேலைத்திட்டம் ஒன்றைத் தயாரிக்கும் சாத்தியம் உள்ளதா என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Rural Development, Social Security and Community Empowerment:

(a) Will he state -

(i) the amount of monthly living assistance paid for persons with disabilities;

(ii) the total current recipients of this allowance;

(iii) the number of new applicants eligible for the said allowance; and

(iv) whether multiple persons with disabilities in a family are entitled to receive such assistance?

(b) Will he also inform this House -

(i) the criteria for selecting eligible beneficiaries to give the monthly living assistance;

(ii) the method for determining low-income levels for this purpose;

(iii) whether the persons with disabilities who are beneficiaries of "Aswesuma" or other livelihood support face any obstacles in obtaining this allowance;

(iv) the total amount allocated by Budget, 2026 for the payment of disability allowance;

(v) whether applicants must remain on a waiting list; and

(vi) whether it is possible to formulate a specific mechanism to pay the disability allowance Islandwide on a fixed date each month?

(c) If not, why?

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)**

(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)

(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) දැනට මාසිකව ලබා දෙන මුදල රුපියල් 10,000.00යි. ඒ ප්‍රමාණය රුපියල් 10,000.00 දක්වා වැඩි කළේ 2025 අය වැයෙන්.

(ii) දැනට ලබා දෙන පුද්ගලයින් සංඛ්‍යාව 171,957යි. ඒ තත්ත්වය ගත්තාමත් ඇත්තටම 2025න් පසුව තමයි 40,000ක් පමණ වැඩි වුණේ. ඊට කලින් ලබා දුන්නේ 130,000කට පමණ.

(iii) දැනට මෙහි සීමාවක් අපි පවත්වාගෙන යන්නේ නැහැ, ගරු මන්ත්‍රීතුමනි. අපි අඛණ්ඩව ඉල්ලුම් පත්‍ර ලබා ගන්නවා. නමුත් ගැසට් නිවේදනයේ ඉදිරිපත් කරලා තිබෙනවා, ලක්ෂ දෙකක සීමාවක්. ඒ අනුව තමයි අය වැයෙන් වෙන් කරලා තිබෙන්නේ. ඉතින් ලබා ගන්නේ පුද්ගලයින් 171,000ක් පමණ නිසා තවත් පුද්ගලයින් 29,000කට පමණ ඉල්ලුම් කිරීමේ හැකියාවක් තිබෙනවා. ඉල්ලුම් පත්‍ර වැඩි වුණොත් අපි මේ සීමාව ඉවත් කිරීමට කටයුතු කරනවා.

(iv) මෙතෙකදී සීමාවක් නැහැ. එක පවුලක පුද්ගලයින් කිහිප දෙනෙක් හිටියත්, එක්කෙනෙක් හෝ දෙන්නෙක් හෝ පස් දෙනෙක් හෝ හිටියත් සියලු දෙනාටම මේ ජීවනාධාර මුදල ලබා දීම සඳහා අපි කටයුතු කරනවා, ගරු කථානායකතුමනි.

(ආ) (i) ප්‍රධාන වශයෙන් අපි භාවිත කරන්නේ සමාජ සේවා නිලධාරි හෝ වෛද්‍යවරයෙක් විසින් නිර්දේශ කරනු ලබන ආබාධිතභාවය පිළිබඳ නිර්ණායකය.

ඊළඟට, මේ වෙනකොට භාවිත කරන්නේ පවුලේ මාසික ඒකපුද්ගල ආදායම.

(ii) දැනට ආදායම් මට්ටම නිශ්චය කරන්න භාවිත කරන්නේ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරනු ලබන නිල දරිද්‍රතා රේඛාවයි. ඒ අනුව මේ වර්ෂයේ මුල තිබුණු දරිද්‍රතා රේඛාව අනුව ඒක පුද්ගල ආදායම මාසිකව රුපියල් 16,191ට වඩා අඩු සියලු දෙනා ආදායම් කාණ්ඩය යටතේ මේ ආධාර මුදල ලබා ගැනීමට සුදුසුකම් ලබනවා.

(iii) එවැනි බාධාවක් නැහැ. ඒ අනුව අස්වැසුම හෝ වෙනත් ආධාර ලබන ඕනෑම කෙනෙකුට ඊට අමතර වශයෙන් ආබාධ සහිත පුද්ගලයන් සඳහා ලබා දෙන ජීවනාධාර මුදල ලබා ගැනීමේ හැකියාවක් තිබෙනවා.

(iv) 2026 වර්ෂයේදී මෙම දීමනාව ගෙවීම සඳහා රුපියල් මිලියන 19,000ක් - බිලියන 19ක් - වෙන් කර තිබෙනවා.

(v) දැනට පොරොත්තු ලේඛනයක් අපි පවත්වා ගෙන යන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, මම දන්නවා, ගරු මන්ත්‍රීතුමා ඒ ප්‍රශ්නය අහන්නේ ඇයි කියලා. මීට කලින් ආබාධ සහිත පුද්ගලයින්ගේ මාසික

[ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා]

ජීවනාධාර මුදල ලබා ගැනීමේදී පොරොත්තු ලේඛනයක් පවත්වා ගෙන ගිහිල්ලා යම් සීමාවක් පවත්වා ගෙන ගියා. නමුත්, අපි 2025 වර්ෂයේ අප්‍රේල් මාසයේ සිට ඒ පොරොත්තු ලේඛනය අවසන් කරලා තිබෙනවා. නිරන්තරයෙන් අයදුම් පත්‍ර යොමු කරන්න පුළුවන්. අයදුම් පත්‍ර නිසි පරිදි යොමු කරලා නිර්දේශ ලැබෙනවා නම්, ඊළඟ මාසයේදී ජීවනාධාර මුදල ලබා දීම සඳහා අපි කටයුතු කරනවා.

(vi) ඔව්.

ඒ අනුව අපි 2026 වර්ෂය සඳහා කැලැන්ඩරයක් ප්‍රකාශයට පත් කරලා තිබෙනවා.

| අනු අංක | මාසය | දීමනා ගෙවිය යුතු දිනය |
|---|---|---|
| 1 | අප්‍රේල් | අප්‍රෙල් 9-10 |
| 2 | මැයි | මැයි 14-15 |
| 3 | ජූනි | ජූනි 15-16 |
| 4 | ජූලි | ජූලි 14-15 |
| 5 | අගෝස්තු | අගෝස්තු 13-14 |
| 6 | සැප්තැම්බර් | සැප්තැම්බර් 14-15 |
| 7 | ඔක්තෝබර් | ඔක්තෝබර් 13-14 |
| 8 | නොවැම්බර් | නොවැම්බර් 12-13 |
| 9 | දෙසැම්බර් | දෙසැම්බර් 14-15 |

ඒ සියලු දින පිළිබඳව අපි ප්‍රාදේශීය ලේකම් කාර්යාල දැනුවත් කරලා තිබෙනවා. උදාහරණයක් විධියට, සෑම මාසයකම 15වන දිනට පෙර, ඒ වාගේම 12වන දිනත් 15වන දිනත් අතර මෙම ජීවනාධාර මුදල ගෙවනු ලබනවා.

(ඈ) පැන නොනඟී.

**ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා**
(மாண்புமிகு சுகத் வசந்த த சில்வா)
(The Hon. Sugath Wasantha de Silva)

ගරු අමාත්‍යතුමනි, පිළිතුර ලබා දීම සම්බන්ධයෙන් බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. අපි දන්නවා, ආබාධ සහිත පුද්ගලයන් සමඟ සමීපව කටයුතු කරන ප්‍රාදේශීය නිලධාරියා වන්නේ සමාජ සේවා නිලධාරිතුමා බව. මධ්‍යම ආණ්ඩුවේ සමාජ සේවා නිලධාරින්ගේ ගමන් වියදම් දීමනාව රුපියල් 2,000කට සීමා වෙනවා. ඒ වාගේම තමයි, ඒ ඒ පළාත් සභාවල ගමන් වියදම් දීමනාවේ විෂමතාවක් තිබෙනවා. ඉතින්, මේ වාගේ අඩු මුදලකට තමන්ගේ කොට්ඨාසය තුළ ආබාධ සහිත පුද්ගලයන්ගේ දීමනාව සම්බන්ධයෙන් වැඩකටයුතු කිරීමේදී දුෂ්කරතාවක් තිබෙන බවට සමාජ සේවා නිලධාරින්ගේ මැසිවිල්ලක් තිබෙනවා. අනෙක් පැත්තෙන්, සමාජ සේවා නිලධාරින් දැන් විශ්‍රාම ගනිමින් ඉන්නවා, සේවයෙන් ඉවත් වෙමින් පවතිනවා. මේ සේවාව ස්ථාවර කිරීමේ අවශ්‍යතාවක් ද තිබෙනවා. ගරු අමාත්‍යතුමනි, සමාජ සේවා නිලධාරින්ගේ - විශේෂයෙන් මධ්‍යම ආණ්ඩුවේ - ගමන් වියදම් දීමනාව ඉහළ දැමීමට යම් පියවරක් ඉදිරි අය වැයේදී හෝ ගැනීමේ හැකියාව තිබෙනවාද? මොකද, ඒ නිලධාරින් ආබාධ සහිත පුද්ගලයන්ගේ මෙම ජීවනාධාර දීමනාව සම්බන්ධයෙන් සමීපවම කටයුතු කරනවා.

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)

ගරු කථානායකතුමනි, ලංකාවේ සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකටම පළාත් සභාවෙන් සහ මධ්‍යම ආණ්ඩුවෙන් අනුයුක්ත වෙලා ඉන්න සමාජ සේවා නිලධාරින් සමාජ සේවා කටයුතු පිළිබඳව සැලකිය යුතු දායකත්වයක් ලබා දෙනවා. නමුත් ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අහපු කාරණයට අදාළව ගත්තොත්, එනම් ජීවනාධාර දීමනාව ලබා ගැනීම සම්බන්ධ කාරණය ගත්තොත් පෙර තිබුණු කාර්යභාරයම දැන් අවශ්‍ය වෙන්නේ නැහැ. මොකද, දැන් අපි ඒක digitalize කරලා තිබෙනවා. අපි දැන් බොහෝදුරට දත්ත පද්ධතියට දත්ත එකතු කරගෙනයි යන්නේ. ඉතාම කෙටි කාලයක් තුළ එය අවසන් කරන්න පුළුවන් වෙයි. දැනටත් අපි සැලකිය යුතු ප්‍රමාණයක් අස්වැසුම දත්ත පද්ධතියට ඇතුළත් කරලා තිබෙනවා. තවමත් දත්ත ඇතුළත් කරලා නැති පුද්ගලයින්ගේ විස්තර දත්ත පද්ධතියට ඇතුළත් කිරීම හරහා ඒ වැඩ කටයුතු සම්පූර්ණයෙන්ම කාර්යක්ෂමව ඉටු කරන්න අපට පුළුවන් වෙනවා.

හැබැයි, සමාජ සේවා නිලධාරින් ඇතුළු එවැනි ක්ෂේත්‍ර නිලධාරින් ගණනාවක් ඉන්නවා, දැනට ගමන් වියදම් සහ කාර්යාල දීමනා ප්‍රමාණවත් නොවන. ඒ සම්බන්ධයෙන් අවශ්‍ය යෝජනා අපි මේ වනකොට ඉදිරිපත් කරලා තිබෙනවා. අපට ඒ සම්බන්ධයෙන් අනුමැතිය ලැබුණාට පසුව ඒ වැඩි කිරීම් සඳහා අවශ්‍ය කටයුතු කරනවා.

**ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා**
(மாண்புமிகு சுகத் வசந்த த சில்வா)
(The Hon. Sugath Wasantha de Silva)

ගරු අමාත්‍යතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ඇත්තෙන්ම උතුර, නැඟෙනහිර සහ මලෙයහම් ජනතාව අතර සිටින ආබාධිත පුද්ගලයන්ගේ තොරතුරු සහ දත්ත සම්බන්ධයෙන් ගත්තොත්, මේ ජීවනාධාර වැඩ පිළිවෙළ එක්ක යම්කිසි විෂමතාවක් තිබෙන බවයි අපේ අත්දැකීම. සමස්ත ලංකාවේම ආබාධ සහිත පුද්ගලයන්ගේ දත්ත රැස් කිරීමේ උත්සාහයක් සම්බන්ධයෙන් අය වැය ලේඛනයෙන් කියැවුණා; මුදල් වෙන් කිරීමක් කෙරුණා. ඒ සම්බන්ධයෙන් නිවැරැදි දත්ත, ඒ කියන්නේ ආබාධතාව, ඒ ඒ ආබාධිත වර්ග සහ ඔවුන්ගේ ආබාධිත බවේ තීව්‍රතාව පිළිබඳව සමස්ත තොරතුරු එකතු කර ගැනීමේ වැඩ පිළිවෙළක් අමාත්‍යාංශය සතුව තිබෙනවාද, ඒක මේ වසරේදී දියත් කිරීමට සූදානමක් තිබෙනවාද කියලා දැනගන්න සතුටුයි.

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)

ගරු කථානායකතුමනි, එතුමා අහන පරිදි, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව 2024 වර්ෂයට අදාළව කරනු ලැබූ සමීක්ෂණ අනුව දැනට ලංකාවේ වෙසෙන ආබාධ සහිත පුද්ගලයන්ගේ දත්ත දිස්ත්‍රික්ක මට්ටමින් එකතු කරලා තිබෙනවා. ඊට අමතරව ආබාධ සහිත පුද්ගලයින් පිළිබඳ වර්ගීකරණය සහ ඒ වර්ගීකරණයට අනුව දත්ත පද්ධතියක් සකස් කිරීමේ කටයුතු ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ අමාත්‍යාංශය ආරම්භ කරලා තිබෙනවා. අපි එම වැඩකටයුතු

විශේෂයෙන්ම ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයත්, ඒ වාගේම ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවත් එක්ක මේ වනකොට කරගෙන යනවා. මේ වර්ෂය අවසාන වනකොට එම දත්ත පද්ධතියේ වැඩ කටයුතු සාර්ථකව අවසන් කර ගැනීමට හැකියාවක් ලැබෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 3, ගරු චන්දන තෙන්නකෝන් මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Thank you, Sir.

I refer to Standing Oder No. 92(2) - "Points of Order" - which states, I quote:

> "(a) A member may in any proceedings question whether proper procedures have been or are being followed by making a point of order except at a time when a division is in progress.
>
> (b) In making a point of order, a member may not speak for more than one minute and may not speak on the question under consideration."

Sir, I raise a point of Order and I should have been given, at least, one minute to explain. And, you have no right to tell me, "එළියට දානවා".

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
That is not a point of Order.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
"එළියට දානවා" කියන්න ඔබතුමාට අයිතියක් නැහැ. ඔබතුමා කථානායක වශයෙන් කථානායකගේ කාර්යය කරන්න, Standing Orders අනුව.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා point of Order එකක් raise කළාම ඒක සම්පූර්ණයෙන් නිවැරැදියිද කියන එක - *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
I have to be given a minute.- *[Interruption.]*

It is stated here. You have to give me one minute to explain. You cannot decide whether it is true or not. You have to listen to me first.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චන්දන තෙන්නකෝන් මන්ත්‍රීතුමා, ප්‍රශ්නය අහන්න. - *[බාධා කිරීම්]* Hon. Sujeewa Senasinghe, please sit down.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ගෙදර වගේ නේ, වැඩ කරන්නේ. එහෙම වැඩ කරන්නේ කොහොමද? *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ මොළය පිළිබඳව - දැනුම පිළිබඳව - ප්‍රශ්නයක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමා; Standing Orders ගැන දැනුම පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ඔබතුමාට මේ - *[බාධා කිරීම්]* ඔබතුමාට ඕනෑ ඕනෑ ඒවා - *[බාධා කිරීම්]* මටත් කථා කරන්න, ඔබතුමා මට mike එක දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා දිගටම මේ සභාවේ කටයුතුවලට බාධා කිරීම තමයි කරන්නේ. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ඔබතුමාට තිබෙන්නේ, TV එකට - *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාටත් ඒ ප්‍රශ්නයම තමයි තිබෙන්නේ. *[බාධා කිරීම්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 77(1) යටතේ මෙසේ සඳහන් වෙනවා:

> "යම් මන්ත්‍රීවරයකු මූලාසනයේ අධිකාරිය නොතැකීම හෝ නිරන්තරයෙන් ම හිතාමතාම හෝ අන්‍යාකාරයෙන් පාර්ලිමේන්තුවේ වැඩකටයුතුවලට බාධා කිරීම මඟින් පාර්ලිමේන්තුවේ රීති අනිසි ලෙස භාවිතා කිරීමේ වරද කරනු ලැබූ විගසම කථානායකවරයා විසින්, එම මන්ත්‍රීවරයා නම් කරනු ලැබූ කවර හෝ අවස්ථාවක දී 'එම මන්ත්‍රීවරයාගේ පාර්ලිමේන්තු සේවය අත්හිටුවනු ලැබිය යුත්තේ ය' යනුවෙන් කරන ලද යෝජනාවක් මත (කිසිම සංශෝධනයකට කල් තැබීමකට හෝ විවාදයකට ඉඩ ලබා නොදී) කථානායකවරයා විසින් ප්‍රශ්නය වහාම විමසනු ලැබිය යුත්තේ ය."

දැන් මේ තුන්වන අවස්ථාව, ගරු කථානායකතුමනි. එම නිසා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඔබතුමා අප ඔක්කෝම වෙනුවෙන් සභාව පවත්වාගෙන යෑම කරන්න ඕනෑ. ස්ථාවර නියෝග මතු කරන්න පුළුවන් අයිතිය මන්ත්‍රීවරුන්ට තිබෙනවා. නමුත්, එතුමා අද දෙවතාවක්ම අදාළ නොවන ස්ථාවර නියෝග කිව්වේ. එම නිසා මෙතැන විකාරයක් කරන්න දෙන්න එපා. මේ දිගින් දිගට හිතා මතා බාධා කිරීම සම්බන්ධව කටයුතු කරන්න ඔබතුමාට ස්ථාවර නියෝග හැත්තෑහතේ සිට අසූ ගණන් දක්වාම බලය තිබෙනවා.

එය මන්ත්‍රීවරයෙකුට රීති ප්‍රශ්නයක් අහන්න කරන බාධාවක් නොවෙයි. අද උදේ ඉඳලා මේ මන්ත්‍රීවරයා බාධා කරපු තුන්වැනි වතාව මේ. ඒකයි අපි කියන්නේ. එහෙම නැතිව රීති ප්‍රශ්නයක් විනාඩියක් අහන එකේ ප්‍රශ්නයක් නැහැ. ඔය ඔක්කොම එකට තිබෙන්නේ; එකම පොතක තිබෙන්නේ.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය මතු වුණේ ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා අතුරු ප්‍රශ්නයක් අහන්න ගිය වෙලාවේ. එතුමා ඉතා පැහැදිලිව කිව්වේ මොකක්ද? ස්ථාවර නියෝග 38 (7) යටතේ මෙසේ සඳහන් වෙනවා:

> "අග්‍රාමාත්‍යවරයා විසින් යම් ප්‍රශ්නයකට පිළිතුරු ලබා දීමෙන් අනතුරුව ප්‍රශ්නය අසන ලද මන්ත්‍රීවරයා විසින් අතුරු ප්‍රශ්න දෙකක් අසනු ලැබිය හැකි ය.

ඒ දෙකම ඇහුවා.

> "ප්‍රශ්නය අසනු ලබන මන්ත්‍රීවරයාගේ අවසරය ඇතිව, පාර්ලිමේන්තුවේ වෙනත් ඕනෑම මන්ත්‍රීවරයකුට එම අතුරු ප්‍රශ්නවලින් එකක් හෝ ඊට වැඩි ගණනක් අසනු ලැබිය හැකි ය: ..."

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා, ඔබතුමා හොඳට සිංහල කියවා ගන්න.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
විනාඩියක් ඉන්න. එසේ වුවද,...-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අහගන්න. *[බාධා කිරීමක්]* අහගන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
මේක විතරයි. *[බාධා කිරීමක්]* ඔබතුමා කලබල වෙන්න එපා. අපි අවුරුදු විසි ගණනක් මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මට තිබෙන ප්‍රශ්නය ඒක තමයි. ඔබතුමා අවුරුදු විසිගණනක් ඉඳලාත්,- *[බාධා කිරීමක්]* ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා, මම කනගාටු වෙනවා. *[බාධා කිරීමක්]* මේක අහගන්න, ගරු මන්ත්‍රීතුමා. ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා, මම කියන එක අහගන්න. අතුරු ප්‍රශ්න දෙකක් අහන්න පුළුවන්, ප්‍රශ්නය අහපු මන්ත්‍රීතුමාට.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා. *[බාධා කිරීමක්]*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, ඉස්සෙල්ලා,- *[බාධා කිරීම්]*

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ඇයි ඒ පැත්තට විතරක් ඇහුම්කන් දෙන්නේ? මේ පැත්තටත් ඇහුම්කන් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් ඇහුම්කන් දුන්නා නේ. ඉඳගන්න, ගරු මන්ත්‍රීතුමා. *[බාධා කිරීමක්]*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
පොඩ්ඩක් ඉන්න, පොඩ්ඩක් ඉන්න. මේක අහගෙන ඉන්නකෝ. මම විපක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයාට කථා කරන්නම්කෝ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
මන්ත්‍රීතුමා, ඔය විධියට

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

එපා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, ඉස්සෙල්ලාම නැඟිට්ටා ස්ථාවර නියෝග 91 (අ) ගැන කියාගෙන. ස්ථාවර නියෝග 91 (අ) යටතේ මොකක්ද තිබෙන්නේ? එහි මෙසේ සඳහන් වනවා:

> "... සෑම මන්ත්‍රීවරයකු විසින්ම මන්ත්‍රීවරයාට වෙන්කරනු ලැබ තිබෙන ආසනයෙන් නැඟී සිට කථා කරනු ලැබිය යුත්තේ ය;"

තමන්ගේ ආසනයෙන් නැඟිටලා කථා කරන්න පුළුවන් කියන එක පදනම් කරගෙන ඉස්සෙල්ලා කිව්වා, ස්ථාවර නියෝග 91 (අ) යටතේ අවස්ථාව දෙන්න කියලා. එහෙම දෙන්න බැහැ නේ.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
බැරි නම් "බැහැ" කියලා කියන්න ඕනෑ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ඊළඟට, ස්ථාවර නියෝග 38(7). *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න. ඒවා basics; ඒවා කියන්න ඕනෑ නැහැ. *[බාධා කිරීමක්]* ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 38 (7) අනුව ඇසිය හැක්කේ අතුරු ප්‍රශ්න දෙකයි. *[බාධා කිරීමක්]* අතුරු ප්‍රශ්න දෙකක් කියලා කිව්වාම, ඒ අදාළ මන්ත්‍රීවරයාගේ කැමැත්ත මත ඕනෑම කෙනෙකුට ඕනෑ ඕනෑ ප්‍රශ්න අහන්න පුළුවන් කියලා කියනවා නම්- *[බාධා කිරීමක්]* අගමැතිනියගෙන් අසනු ලබන ප්‍රශ්නවලින් මුළු පාර්ලිමේන්තු කාලයම අවසන් වෙනවා.

අතුරු ප්‍රශ්න දෙකයි අහන්න පුළුවන්. ඒ මන්ත්‍රීවරයා කැමැති නම් එකක් හෝ දෙකක් අහන්න පුළුවන්. ඊට වඩා නැහැ. ගරු කථානායකතුමනි, මේක තේරුම් ගන්න පුළුවන් සරල දෙයක්. *[බාධා කිරීමක්]* ඔබතුමාට බැඳුම්කරයේ ඇත්ත නැත්ත කියන්න පුළුවන්. හැබැයි, මේක තේරුම් ගන්න බැහැ. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා, මේක අහගන්න.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ඒ වාගේ දෙයක් තේරුම් ගන්න පුළුවන්. හැබැයි, ප්‍රශ්නය දෙකයි අහන්න පුළුවන් කියලා තේරුම් ගන්න බැහැ. *[බාධා කිරීම්]*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, ඔබතුමාත් වාඩි වෙන්න. ඔබතුමාට තේරෙන්නේත් නැහැ, මේ ප්‍රශ්නය. *[බාධා කිරීම්]* මේක මම කියන්නේ. වාඩි වෙන්න, ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි. වාඩි වෙන්න. - *[බාධා කිරීම්]* සවන් දෙන්න. ඔබතුමා, misled. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාටත් මේක කියවාගන්න බැහැ, ඔබතුමාටත් තේරෙන්නේ නැහැ. *[බාධා කිරීම්]*

ගරු චන්දන තෙන්නකෝන් මන්ත්‍රීතුමනි, ඔබතුමා තුන්වැනි ප්‍රශ්නය අහන්න.

## අලි-මිනිස් ගැටුම: කුරුණෑගල දිස්ත්‍රික්කය
### யானை-மனித மோதல்: குருநாகல் மாவட்டம்
### HUMAN-ELEPHANT CONFLICT: KURUNEGALA DISTRICT

1989/2026

**3. ගරු චන්දන තෙන්නකෝන් මහතා**
(மாண்புமிகு சந்தன தென்னக்கோன்)
(The Hon. Chandana Thennakoon)
පරිසර අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ වන අලි ගහනය කොපමණද;

(ii) අවසන් වරට සිදු කළ වන අලි සංගණනය අනුව අලි ගහනයේ වර්ධනයක් සිදු වී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) අලි මිනිස් ගැටුම් වාර්තා වන දිස්ත්‍රික්ක කවරේද;

(ii) අලි මිනිස් ගැටුම හේතුවෙන් 2025 වර්ෂයේදී කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ සිදු වී ඇති වන අලි මරණ සංඛ්‍යාව සහ මරණයට පත් වී ඇති පුද්ගලයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ගල්ගමුව, ඇහැටුවැව, අඹන්පොළ සහ ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල වන අලි හැසිරීම්වල සුවිශේෂ ලක්ෂණ හඳුනා ගෙන තිබේද;

(iv) එසේ නම්, එම ලක්ෂණ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுற்றாடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையிலுள்ள காட்டு யானைகளின் எண்ணிக்கை யாது என்பதையும்;

[ගරු චන්දන තෙන්නකෝන් මහතා]

(ii) இறுதியாக மேற்கொண்ட காட்டு யானைகளின் கணக்கெடுப்புக்கு அமைய, யானைகளின் எண்ணிக்கையில் அதிகரிப்பு ஏற்பட்டுள்ளதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) யானை-மனித மோதல்கள் பதிவாகின்ற மாவட்டங்கள் யாவை என்பதையும்;

(ii) யானை-மனித மோதல்கள் காரணமாக 2025ஆம் ஆண்டில் குருநாகல் மாவட்டத்தில் இடம்பெற்றுள்ள காட்டு யானை இறப்புகளின் எண்ணிக்கை மற்றும் மனித உயிரிழப்புகளின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(iii) கல்கமுவ, எஹட்டுவெவ, அம்பன்பொல மற்றும் கிரிபாவ பிரதேச செயலாளர் பிரிவுகளில் காட்டு யானைகளின் நடத்தையில் ஏதேனும் தனித்துவமான பண்புகள் கண்டறியப்பட்டுள்ளனவா என்பதையும்;

(iv) ஆமெனில், மேற்படி பண்புகள் யாவை என்பதையும்;

அவர் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Environment:

(a) Will he inform this House -

(i) the total population of wild elephants in Sri Lanka; and

(ii) whether there has been an increase in the population of wild elephants as per the latest census of wild elephants?

(b) Will he state -

(i) the names of the districts from which human-elephant conflicts are reported;

(ii) separately, the number of wild elephant deaths and human fatalities that had occurred in the Kurunegala District due to human-elephant conflict in the year 2025;

(iii) whether any special characteristics of wild elephant behaviour have been identified in the Galgamuwa, Ehetuwewa, Ambanpola and Giribawa Divisional Secretaries' Divisions; and

(iv) if so, the nature of such characteristics?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 2024 වර්ෂයේදී වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද වන අලි සමීක්ෂණය අනුව වන අලි සංඛ්‍යාව 7,451කි.

(ii) ඔව්.

ගරු කථානායකතුමනි, 1993 වාර්තාවලට අනුව අලි සංඛ්‍යාව 1,967ක් ලෙස වාර්තා වෙලා තිබෙනවා.

- 2011 වසරේදී අපේ රටේ කරපු අලි සංගණනය අනුව අලි සංඛ්‍යාව 5,879ක් ලෙස වාර්තා වෙලා තිබෙනවා.
- 2024 සිදු කරන ලද අලි සමීක්ෂණය අනුව අලි සංඛ්‍යාව අවම වශයෙන් 7,451ක් සිටින බවට වාර්තා වෙලා තිබෙනවා.

අපේ රටේ අලි ගහනය සියයට 26.7ක වාගේ ප්‍රමාණයකින් වර්ධනය වෙලා තිබෙනවා. අපේ රටේ දළ සහිත අලින්ගේ - ඇතුන්ගේ - සංඛ්‍යාව සියයට 9.2කින් වැඩි වෙලා තිබෙනවා. ඒ අනුව අලි ගහනයේ වර්ධනයක් සිදු වෙලා තිබෙනවා.

(ආ) (i) අලි-මිනිස් ගැටුම දිස්ත්‍රික්ක 25න් 17කම පවතිනවා, ගරු කථානායකතුමනි. හම්බන්තොට, කුරුණෑගල, පුත්තලම, අනුරාධපුරය, පොළොන්නරුව, මොනරාගල, බදුල්ල, මාතලේ, මහනුවර, අම්පාර, මඩකලපුව, ත්‍රිකුණාමලය, රත්නපුරය, වවුනියාව, මන්නාරම, මුලතිව් හා කිලිනොච්චිය යන දිස්ත්‍රික්කවල අලි-මිනිස් ගැටුම් වාර්තා වෙලා තිබෙනවා.

(ii) 2025 වර්ෂයේදී අලි මිනිස් ගැටුම හේතුවෙන් කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ අලි මරණ 25කුත්, පුද්ගල මරණ 12කුත් වාර්තා වී තිබෙනවා.

(iii) ඔව්.

(iv) ඔව්. කහල්ල-පල්ලෙකැලේ අභය භූමියේ තැනිතලා භූමි ප්‍රදේශ සියල්ලම පාහේ අනවසරයෙන් අත්පත් කරගෙන ඇත. එසේ වුවද, වන අලින් සැලකිය යුතු ප්‍රමාණයක් ජනාවාස හා වගාබිම් ආශ්‍රිතව සැරිසරන බව නිරීක්ෂණය වේ. රක්ෂිතය වශයෙන් ඉතිරිව පවතින්නේ කහල්ල-පල්ලෙකැලේ අභය භූමිය තුළ පිහිටා ඇති කඳුකර ප්‍රදේශ පමණි. මෙම ප්‍රදේශය සාම්ප්‍රදායික වාසභූමි වශයෙන් භාවිත කරන වන අලි රංචුද ඇතුළුව වන අලින් 150ත්, 200ත් අතර ප්‍රමාණයක් වාසය කරයි. නිරන්තරයෙන් මෙම වන අලි ගහනය සඳහන් කර ඇති ප්‍රදේශ වෙත සංචරණය කරන බැවින් මෙම ප්‍රදේශවල නිරන්තර වන අලි-මිනිස් ගැටුම් වාර්තා වෙලා තිබෙනවා.

(ඇ) අදාළ නොවේ.

**ගරු චන්දන තෙන්නකෝන් මහතා**
(மாண்புமிகு சந்தன தென்னக்கோன்)
(The Hon. Chandana Thennakoon)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

අපි දන්නවා, අලි-මිනිස් ගැටුම කාලයක් තිස්සේ වර්ධනය වුණත් ඒවාට විසඳුම් හොයන්නේ නැතුව, ඒවා වැඩෙන්න හැරලා ඇති වූ ප්‍රශ්න බව. මම මුලින්ම ස්තුතිවන්ත වෙනවා, නව රජයේ අපේ විෂය භාර ඇමතිතුමාට. මොකද, එතුමාගේ මැදිහත්වීමෙන් අලි-මිනිස් ගැටුම පාලනය කිරීම සඳහා ක්‍රියාමාර්ග ගණනාවක් අරගෙන තිබෙන නිසා. ඒ වාගේම, පසුගිය කාලයේ අවිධිමත් ලෙස බඳවාගත්ත බහුකාර්ය සේවකයන් විදුලි වැට නඩත්තු සහායකයන් විධියටත් බඳවාගත්තා. ඒ එක්කම, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 5,000කට ආසන්න පිරිසක් මේ අලි-මිනිස් ගැටුම පාලනය කරන්න, කළමනාකරණය කරන්න යොදාගෙන

තිබෙනවා. නමුත් ගරු අමාත්‍යතුමනි, දැනට තිබෙන ප්‍රායෝගික තත්ත්වය අනුව මෙම නිලධාරින් උපරිම කාර්යක්ෂමතාවෙන් මෙම ක්‍රියාවලිය සඳහා යොදවා ගැනීමට යම් නෛතික බාධා මතු වෙලා තිබෙනවා. ඒ වාගේම, ප්‍රායෝගිකව මේ නිලධාරින් උපරිම කාර්යක්ෂමතාවෙන් සේවයට මැදිහත් වෙන්නේ නැති බව තමයි අපට පේන්නේ. ඒ නිසා මෙම නිලධාරින් උපරිම කාර්යක්ෂමතාවෙන් සේවයේ යොදවා ගැනීම සඳහා අමාත්‍යාංශය සතුව වැඩ පිළිවෙළක් තිබෙනවාද කියලා දැනගන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)

ගරු මන්ත්‍රීතුමනි, ඔව්. පරිසර අමාත්‍යාංශය ලෙසත්, ඒ වාගේම වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව ලෙසත් අපි අදාළ බඳවා ගැනීම් ටික සිදු කර තිබෙනවා. ඒ නිලධාරින්, විදුලි වැට නඩත්තු සහායකයන් නිසි ලෙස ඒ සඳහා යොදවා ගැනීම සඳහා අපි විශේෂ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර තිබෙනවා. විශේෂයෙන්ම අපි සඳහන් කරන්න ඕනෑ, පරිපාලනය සඳහා අවශ්‍ය නව බඳවා ගැනීම් කරන්න සිදුවෙලා තිබෙන බව. ඒ අනුව වන සත්ව අඩවි ආරක්ෂකයන් 149දෙනෙක් සහ වන සත්ව නියාමකයන් 381දෙනෙක් බඳවා ගැනීම සඳහා තරග විභාග පවත්වා දැනට ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් ඉන්නවා, විභාග දෙපාර්තමේන්තුවෙන්. මේ අයත් බඳවා ගත් පසුව අලිවැට සහායකයන් සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට බඳවා ගත්ත සිවිල් ආරක්ෂකයන් 5,000ට අදාළ පිරිසත් ඇතුළු මේ සියලු දෙනා හොඳින් හසුරුවා ගන්න අපට පුළුවෙන් වේවි. අපි ඉතා ඉක්මනින් - කෙටි කාලයක් තුළ - ඔවුන් නිශ්චිත ක්‍රමයක් යටතේ පරිපාලනය කරගන්න මැදිහත් වෙනවා. දැනට කිසියම් අඩුපාඩුවක් පවතින බව අපි පිළිගන්නවා. නමුත් ඉක්මනින්ම මේ අඩුපාඩුව සම්පූර්ණ කර නිසි ලෙස අලිවැට නඩත්තු කිරීමට සහ අලි-මිනිස් ගැටුම පාලනය කිරීමට ඔවුන් සම්බන්ධ කර ගැනීමටත් අපි අදහස් කරනවා.

ගරු මන්ත්‍රීතුමනි, පසුගිය කාලයේ අලි-මිනිස් ගැටුම කළමනාකරණය කිරීම සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට මානව සම්පතේ විතරක් නොවෙයි, භෞතික සම්පත්වල හිඟයකුත් තිබුණා. නමුත් පසුගිය වසරේදී අපට අවසර ලැබුණා, කැබ් රථ 100ක්, බයිසිකල් 181ක් සහ අත් ට්‍රැක්ටර් වාගේ දේවල් මිලදී ගන්න. එම මිලදී ගැනීම් කටයුතුත් අපි දැන් කරමින් තිබෙනවා. ඒ භෞතික සම්පත් ටිකත් සම්පාදනය වුණාට පසු ඉතා කෙටි කාලයක් තුළ මේ තිබෙන අඩුපාඩු ප්‍රමාණයත් අපට මඟ හැර ගන්න පුළුවන් වෙයි කියන විශ්වාසය අප තුළ තිබෙනවා.

**ගරු චන්දන තෙන්නකෝන් මහතා**
(மாண்புமிகு சந்தன தென்னக்கோன்)
(The Hon. Chandana Thennakoon)

ගරු කථානායකතුමනි, එම පිළිතුර ලබා දීම ගැන ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. අලි ගම්වදින කාරණය ගැන කථා කළොත්, විශාල වනාන්තරයක් ආසන්නයේ තිබෙන මායිම් ගම්මානවලට වනඅලි පැමිණෙන එක අපට තේරුම් ගන්න පුළුවන්. ඇමතිතුමනි, ඔබතුමාත් පෙර සඳහන් කළ පරිදි අපේ ප්‍රදේශය ගත්තොත්, ගල්ගමුව, ඇහැටුවැව, අඹන්පොළ, නිකවැරටිය සහ යාපහුවේ යම් කොටසක් ගත්තොත්, ඒ ප්‍රදේශවල විශාල වනාන්තර නැහැ. නමුත් ඒ පළාත්වල තිබෙන කුඩා වනාන්තරවලට ඔරොත්තු නොදෙන තරමට වනඅලි විශාල ප්‍රමාණයක් ඒ තුළ ජීවත් වෙනවා. ඒ වනඅලි හැම දාම මිනිසුන්ගේ වගා බිම්වලට එනවා; නිවාස කඩනවා; දේපළවලට හානි කරනවා. ඒ නිසා ඒ ජනතාවට විශාල තර්ජනයක් තිබෙනවා. ඔබතුමා ඒ වෙනුවෙන් කටයුතු කිරීම සඳහා අලුතින් වනජීවී කාර්යාල විවෘත කර, අලුතින් වාහන ලබා දීලා විශාල වශයෙන් මැදිහත්වීමක් සිදු කර තිබෙනවා. නමුත් මම දැන ගන්න කැමැතියි, එයින් එහාට ගිහිල්ලා වනාන්තර නොමැති ප්‍රදේශවල ජීවත් වන වනඅලි කළමනාකරණය සඳහා වන අලුත් විද්‍යාත්මක වැඩ පිළිවෙළක් ගැන අවධානය යොමු කර තිබෙනවාද කියලා.

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)

ගරු මන්ත්‍රීතුමා, විශේෂයෙන්ම ඔබතුමා කිව්ව කහල්ල පල්ලේකැලේ ප්‍රදේශයේ වනඅලි ගැටලුව සහ ඉඩම් ගැටලු ප්‍රමාණයක් පැවතුණා. අපි පසුගිය කාලයේ ඒ ඉඩම් ගැටලුවලටත් අවශ්‍ය පිළිතුරු ලබා දීලා තිබෙනවා. දැන් අපි මේ වනඅලි සැරිසරන සහ ඔවුන්ට නිදහස් කළ හැකි භූමි නිශ්චිත ලෙස හඳුනා ගෙන තිබෙනවා. ඉදිරි කාලයේ දී අපි බලාපොරොත්තු වෙනවා ඒ භූමි ප්‍රදේශ තුළ අලින්ගේ සුපෝෂණය සඳහා අවශ්‍ය තෘණ වර්ග ඇතුළු ආහාර වර්ග වැවෙන වට පිටාවක් හදන්න. ඒ වාගේම අලින්ට අවශ්‍ය ජල පහසුකම් සැපයීම සඳහා ඒ ප්‍රදේශවල වැව් ආදිය ප්‍රතිසංස්කරණය කරන්නත් අපි බලාපොරොත්තු වෙනවා. මේ ප්‍රදේශයේ වනඅලින්ගේ සංචරණය සඳහා නිශ්චිත අලි මංකඩකුත් අපි හඳුනා ගෙන තිබෙනවා. එම අලි මංකඩත් නිදහස් කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

ඊට අමතරව මේ ප්‍රදේශයේ අපි විදුලි වැට කිලෝමීටර 443ක පමණ ඉදි කරලා අවසන් කරලා තිබෙනවා. තවදුරටත් මේ ප්‍රදේශයට සිවිල් ආරක්ෂක භටයන් සහ සිවිල් ආරක්ෂක නිලධාරින් ලබා දෙන්න කටයුතු කිරීමට පියවර ගන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම දැනටමත් ක්‍රියාත්මක කරනු ලබන ජල ප්‍රභව වැඩිදියුණු කිරීම, අලුත්වැඩියා කිරීම, නව තෘණ භූමි ඇති කිරීම, පවත්නා තෘණ භූමි නඩත්තු කර පවත්වා ගෙන යෑම, වනඅලි වාසය කරන ස්ථානවල පැතිරී පවතින ආක්‍රමණශීලී ශාක වර්ග ඉවත් කිරීම වැනි ක්‍රියාමාර්ග අපි ඉදිරියේදීත් කරන්න බලාපොරොත්තු වෙනවා. අපි විශ්වාස කරනවා, මේ ක්‍රියාමාර්ගත් සමඟ මේ වනඅලි-මිනිස් ගැටුම දැන් තිබෙනවාට වඩා අවම කර ගන්න පුළුවන් වෙයි කියලා. ඒ අතර අපි මේ ක්‍රියාමාර්ගවලට විතරක් සීමා වෙලා නැහැ. තවත් අත්හදා බැලීම් සහ බිම් මට්ටමින් එන යෝජනා පිළිබඳවත් සැලකිලිමත් වෙමින් මේ වනඅලි-මිනිස් ගැටුම අවම කිරීම සඳහා අඛණ්ඩ මැදිහත් වීමක් කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 4, ගරු සුජීව දිසානායක මහතා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Sir, I am referring to Standing Order No. 91(h), which states, I quote:

[ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා]

"No Member shall make any imputation of improper motives against another Member, or make reference to personal affairs of another Member;"

Hon. Speaker, ඔබතුමාම කියනවා සුජීව සේනසිංහ මන්ත්‍රීතුමාට මොළේ නැහැ කියලා. ඒක කරුණාකරලා අයින් කර ගන්න. ඔබතුමා සුජීව සේනසිංහ මැතිතුමාට කියනවා ඇහුණා, "ඔබතුමාට මොළය නැහැ" කියලා. එහෙම කියන්න බැහැ නේ. කරුණාකරලා තරහා වෙන්නේ නැතිව ඒක අයින් කරන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කල්පනා කරලා කථා කරන්න එපායැ, ගරු මන්ත්‍රීතුමා. සභාව පටන් ගත්ත වෙලේ ඉඳන්ම එතුමා ස්ථාවර නියෝගවලට පිටින් නේ කථා කළේ, ගරු මන්ත්‍රීතුමා. *[බාධා කිරීමක්]* ඔබතුමා ඉඳගන්න. *[බාධා කිරීමක්]* මට තේරෙන විධියට ඔබතුමාටත් ඒ ප්‍රශ්නය තිබෙනවා වාගේ.

## හලාවත වැවිලි සමාගම: රාජ්‍ය ආයතනවලට ලබා දී ඇති ණය
## சிலாபம் பெருந்தோட்ட நிறுவனம்: அரச நிறுவனங்களுக்கு வழங்கிய கடன்
## CHILAW PLANTATIONS LIMITED: LOANS PROVIDED TO GOVERNMENT INSTITUTIONS

2036/2026

**4. ගරු සුජීව දිසානායක මහතා**
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)
වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) හලාවත වැවිලි සමාගම විසින් පසුගිය වසර 20ක කාලය තුළ වෙනත් රාජ්‍ය ආයතන සඳහා ණය මුදල් ලබාදී තිබේද;

(ii) එසේ නම්, එම රාජ්‍ය ආයතන කවරේද;

(iii) එම ණය මුදල් ලබාදී ඇති පදනම කවරේද;

(iv) එම ආයතන සඳහා ලබාදී තිබෙන ණය මුදල එක් එක් ආයතනය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) 2025.12.31 දින වනවිට එම ආයතනවලින් අය කරගෙන ඇති ණය මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) හිඟ ණය මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) එම හිඟ ණය මුදල් අය කර ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சிலாபம் பெருந்தோட்ட நிறுவனம் கடந்த 20 வருட காலப்பகுதியில் ஏனைய அரச நிறுவனங்களுக்குக் கடன் வழங்கியுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி அரச நிறுவனங்கள் யாவை என்பதையும்;

(iii) மேற்படி கடன் வழங்கப்பட்டுள்ள அடிப்படை யாது என்பதையும்;

(iv) மேற்படி நிறுவனங்களுக்கு வழங்கப்பட்டுள்ள கடன் ஒவ்வொரு நிறுவன ரீதியாக வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) 2025.12.31ஆம் திகதியாகும்போது மேற்படி நிறுவனங்களிடமிருந்து அறவிடப்பட்டுள்ள கடன் எவ்வளவு என்பதையும்;

(ii) நிலுவையிலுள்ள கடன் எவ்வளவு என்பதையும்;

(iii) மேற்படி நிலுவைக் கடன்களை அறவிடுவதற்கு எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Plantation and Community Infrastructure:

(a) Will he inform this House -

(i) whether the Chilaw Plantations Limited has provided loans to other government institutions during the past 20 years;

(ii) if so, the names of such government institutions;

(iii) the basis on which such loans were granted; and

(iv) the amount of the loan provided to those institutions, separately for each institution?

(b) Will he also inform this House the -

(i) amount of loans recovered from those institutions as at 31.12.2025;

(ii) total amount of outstanding loan balances; and

(iii) measures taken to recover those outstanding loan amounts?

(c) If not, why?

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

හලාවත වැවිලි සමාගම 2010 වර්ෂයේදී රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය යටතේ පැවති කාලයේ එම අමාත්‍යාංශයේ ලේකම්ගේ හා මහා භාණ්ඩාගාරයේ මැදිහත් වීමෙන් එම අමාත්‍යාංශයේ අනුබද්ධ ආයතන පහක් සඳහා කෙටි කාලීන මූල්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා රුපියල් මිලියන 105ක මුදලක් ණය වශයෙන් ලබා දී තිබෙනවා.

(ii) 1. ජනතා වතු සංවර්ධන මණ්ඩලය

2. රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය

3. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

4. සීමාසහිත ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන අපනයන සංස්ථාව

5. සීමාසහිත ඇල්කඩුව වැවිලි සමාගම.

(iii) මෙම ණය මුදල්, ණය ගිවිසුමකට අනුව ලබා දී ඇති අතර එම ආයතනවල අත්‍යවශ්‍ය කෙටි කාලීන ද්‍රවශීලතා අවශ්‍යතා සඳහා ලබා දී තිබෙනවා. මෙම ණය මුදල් සියයට අටක පොලිය අය කිරීමේ පදනම මත ලබා දීලා තිබෙන්නේ. ගිවිසුම්ගත ආයතන ගිවිසුමට අනුව වසර තුනක කාලයක් තුළ මෙම ණය මුදල හා පොලිය නැවත පියවීමේ පදනමින් තමයි ලබා දීලා තිබෙන්නේ.

(iv) ජනතා වතු සංවර්ධන මණ්ඩලයට රුපියල් මිලියන 40ක ණය මුදලකුත්, රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයට රුපියල් මිලියන 15ක ණය මුදලකුත්, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට රුපියල් මිලියන 20ක ණය මුදලකුත්, සීමාසහිත ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන අපනයන සංස්ථාවට රුපියල් මිලියන 10ක ණය මුදලකුත්, සීමාසහිත ඇල්කඩුව වැවිලි සමාගමට රුපියල් මිලියන 20ක ණය මුදලකුත් බැගින් ලබා දීලා තිබෙනවා.

(ආ) (i)
- ණය අය කර ගැනීම සඳහා අඛණ්ඩව උත්සාහ කළද මේ වන තෙක් කිසිදු ණය මුදලක් හෝ පොලියක් අය කරගෙන නොමැත.
- 2010 වර්ෂයේ සිට 2013 දක්වා උපචිත පදනම මත ලැබිය යුතු පොලී ආදායම ගිණුම්ගත කළද 2013 වර්ෂයේ සිට උපචිත පදනමින් පොලී ආදායම් ගිණුම්ගත නොකිරීමට තීරණය කර ඇත. එහෙත්, 2014 ගිණුම් වාර්තාවල අය විය යුතු ණය හා පොලිය සඳහා අඩමාන ණය වෙන් කිරීම සිදු කර ඇත.

(ii) 2025.12.31 දිනට හිඟ ණය හා පොලී මුදල් පහත පරිදි වේ.

| ආයතනයේ නම | ලබා දී ඇති ණය මුදල | ගිවිසුමට අනුව **2025.12.31** දිනට අය විය යුතු පොලිය | ලැබිය යුතු පොලිය හා ණය මුදල |
|---|---|---|---|
| ජනතා වතු සංවර්ධන මණ්ඩලය | රු.40,000,000.00 (රු. මිලියන 40) | රු. 49,227,397.26 (රු. මිලියන 49.23) | රු. 89,227,397.26 (රු. මිලියන 89.23) |
| ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව | රු. 20,000,000.00 (රු. මිලියන 20) | රු. 24,410,958.90 (රු. මිලියන 24.41) | රු. 44,410,958.90 (රු. මිලියන 44.41) |
| සී/ස ඇල්කඩුව වැවිලි සමාගම | රු. 20,000,000.00 (රු. මිලියන 20) | රු. 24,319,452.04 (රු. මිලියන 24.32) | රු. 44,319,452.04 (රු. මිලියන 44.32) |
| සී/ස ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාව | රු. 10,000,000.00 (රු. මිලියන 10) | - | රු. 10,000,000.00 (රු. මිලියන 10) |
| රාජ්‍ය සම්පත් සහ ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය | රු. 15,000,000.00 (රු. මිලියන 15) | - | රු. 15,000,000.00 (රු. මිලියන 15) |
| මුළු මුදල | රු. 105,000,000.00 (රු. මිලියන 105) | රු. 97,957,808.20 (රු. මිලියන 97.96) | රු. 202,957,808.20 (රු. මිලියන 202.96) |

සී/ස ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාවට වාගේම, රාජ්‍ය සම්පත් සහ ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයට පොලිය සකස් කර නොමැත. මෙම ආයතන දෙකට පොලිය සකස් කරන්න නොහැකි වීමට හේතුව තමයි, මෙම ණය මුදල් ලබා දෙනකොට අදාළ ගිවිසුම්වල නිසි ලෙස එළඹ නොතිබීමයි. ඒ අනුව, 2025.12.31 දිනට හලාවත වැවිලි සමාගමට අය විය යුතු මුළු මුදල රුපියල් මිලියන 202.96යි.

රාජ්‍ය සම්පත් සහ ව්‍යාවසාය සංවර්ධන අමාත්‍යාංශය හා සීමාසහිත ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාව විසින් අයවිය යුතු මිලියන 25ක ණය මුදල පියවීමේ වගකීම පැවරී ඇත්තේ රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව වෙතයි. එහෙත්, රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව සමඟ ඒ සම්බන්ධයෙන් ගිවිසුම්ගත වී නොමැති බැවින්, අයවිය යුතු පොලිය සඳහන් කර නොමැත.

(iii)
- මෙම ණය මුදල් අයකර ගැනීමට අවස්ථා ගණනාවක උත්සාහ දරමින් හලාවත වැවිලි සමාගම ණය ලබාගත් ආයතන දැනුවත් කරමින් ලිපි යොමු කර ඇත. එහෙත්, මෙම ණය මුදල වැවිලි සමාගමට අයකර ගැනීමට නොහැකි වී ඇත. ඒ අනුව, මේ වන විටත් අදාළ කරුණු සම්බන්ධව අමාත්‍යාංශයේ විගණන කමිටු රැස්වීම්වලදී සාකච්ඡා කරමින් පවතී.
- මෙතෙක් මෙම ණය මුදල් අයකර ගැනීමට නොහැකි වීම මත 2012 වර්ෂයේ ගිණුම් වාර්තා තුළ අඩමාන ණය ප්‍රතිපාදනද මේ සඳහා වෙන් කර ඇත.
- රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව ක්‍රියාකාරී මට්ටමක මේ වනවිට නොපැවතුණද, එම ණය මුදල් සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳව මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්තුමා වෙතින් 2026.02.05 දින ලිපියක් මඟින් උපදෙස් විමසා ඇත. එම ලිපිය ඇමුණුම ලෙස **සභාගත*** කරමි.
- ඒ අනුව, මෙම ණය මුදල් සම්බන්ධයෙන් හලාවත වැවිලි සමාගමේ විගණන කමිටුව හරහා රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 01/2021 (i) අනුව කටයුතු කරන ලෙස රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලබා දී ඇත. ඒ අනුව, මෙම ණය මුදල් කපා හැරීම සම්බන්ධයෙන් කටයුතු සිදු කරමින් පවතී.

(ඇ) අදාළ නොවේ.

**ගරු සුජීව දිසානායක මහතා**
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)

ගරු කථානායකතුමනි, පිළිතුරු ලබා දීම පිළිබඳව ගරු අමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු සුජීව දිසානායක මහතා]

මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. අමාත්‍යාංශය හැටියට සාම්ප්‍රදායික පොල් ත්‍රිකෝණයෙන් ඔබ්බට ගිහිල්ලා නව පොල් ත්‍රිකෝණයක් ගිය වසරේ උතුරු පළාත මුල් කරගෙන ආරම්භ කළා. හැබැයි, දැන් අපේ අමාත්‍යතුමා ඉදිරිපත් කළ ලේඛන අනුව රුපියල් මිලියන 202කට එහා දැවැන්ත ණය කන්දක් හලාවත වැවිලි සමාගම මේ මොහොත වනවිට දරාගෙන ඉන්නවා. ඒ නිසා ගරු අමාත්‍යතුමාගෙන් මම අහන්න කැමතියි, මෙවැනි තත්ත්වයක් තුළ ඔබතුමාගේ පැත්තෙන් හලාවත වැවිලි සමාගම හා සම්බන්ධ වතු සංවර්ධනය කිරීම සඳහා මේ වනවිට පියවර අරගෙන තිබෙනවාද, ඒ මොනවාද කියලා.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ගරු කථානායකතුමනි, හලාවත වැවිලි සමාගම සහ කුරුණෑගල වැවිලි සමාගම අප අමාත්‍යාංශය සතු පොල් වගාව මූලික කරගත් රාජ්‍ය වැවිලි සමාගම් දෙකක්. ඒ සමාගම් දෙක පසුගිය කාලයේ - ඉතිහාසයේ - යම් යම් අභියෝගවලට, අර්බුදවලට, බලපෑම්වලට ලක් වෙලා තිබෙනවා. ඒ නිසා ලාභය බොහොම හීන වෙලා, ඉඩම් අවභාවිත වෙලා ප්‍රශ්න ගණනාවකට මුහුණ දුන්නා. අපි මේ රටේ බලය ගන්න මොහොත වෙනකොටත් වැවිලි සමාගම් කිහිපයක පොල් වගාවට වසර හතරකට ආසන්න කාලයක් පොහොර යොදලා තිබුණේ නැහැ. දැන් හලාවත වැවිලි සමාගමත්, කුරුණෑගල වැවිලි සමාගමත් වතු නිසි ලෙස නඩත්තු කිරීමේ ක්‍රමවේද සකස් කරලා තිබෙනවා. අපි දන්නවා, ගසකින් අස්වැන්න ගන්න නම් ඒ ගසට හොඳින් සලකන්න ඕනෑ කියලා. ගහට පොහොර ටික වැටෙන්න ඕනෑ, වතුර ටික ලැබෙන්න ඕනෑ, රෝග මර්දනය සිද්ධ වෙන්න ඕනෑ. ඒ වාගේම නඩත්තුවත් වෙන්න ඕනෑ. දැන් ඒ කාර්යයන් හලාවත වැවිලි සමාගමෙන් නිසි ලෙස සිදුවීම ආරම්භ වී ඇති බව අපි දැනුම් දෙන්න කැමැතියි. ඒ වාගේම අපි රුසියානු රජයට ස්තුතිවන්ත වෙනවා, අපට රුසියානු රජයෙන් MOP පොහොර මෙට්‍රික් ටොන් 27,500ක් ප්‍රදානයක් හැටියට ලැබුණා. අපි ඒවා මේ රටේ පොල් වගාකරුවන්ට වාගේම වැවිලි සමාගම්වලටත් යම් යම් අනුපාතවලට ලබා දීලා තිබෙනවා.

ඒ වාගේම සමහර වතු ඌන උපයෝජිතව තිබුණා. අපි දැන් ඒවා නව වගාවලට පරිවර්තනය කරමින් ඉන්නවා. හලාවත වැවිලි සමාගමත් අලුත් පොල් වගාවන්ට යමින් සිටිනවා. ඒ වාගේම කජු වගාව ප්‍රවර්ධනය කරමින් තිබෙනවා. ඒ වාගේම TJC අඹ වගාව වැනි වගාවන්ට යමින් තිබෙනවා. සමහර ඌන උපයෝජිත ඉඩම් බදු ක්‍රමයට, කන්න ක්‍රමයට ගොවීන්ට ලබා දෙමින්, අපි ඒවා නිසි ලෙස පාවිච්චි කිරීම ආරම්භ කර තිබෙනවා. ඒ අනුව හලාවත වැවිලි සමාගමෙත්, අපේ යටතේ තිබෙන සියලුම සමාගම්වලත් ලාභය එක වසරක් තුළ හොඳ තැනකට අරගෙන ඇවිත් තිබෙන බව දැනුම් දෙන්න කැමැතියි.

**ගරු සුජීව දිසානායක මහතා**
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය ඉදිරිපත් කරන්නේ කුරුණෑගල වැවිලි සමාගම සම්බන්ධයෙන්. ගරු ඇමතිතුමනි, කුරුණෑගල වැවිලි සමාගම සතුව අක්කර 16,300ක බිම් ප්‍රමාණයක් තිබුණා. නමුත්, පසුගිය කාල වකවානුව තුළ සිදු කළ යම් යම් ක්‍රියාකාරකම් මත එම භූමි ප්‍රමාණය අඩු වුණා. විශේෂයෙන්ම රජයට ලබා දුන් ඉඩම් ද ඒ අතර තිබෙනවා. අපේ දිස්ත්‍රික්කයේම හිටපු වැවිලි කටයුතු අමාත්‍යවරයෙක් අක්කර 75ක් ගත්තා කියලා ප්‍රසිද්ධ රහසකුත් ඒ සම්බන්ධව තිබෙනවා. ඒ වාගේම අපේ පැත්තේම තවත් ප්‍රසිද්ධ විහාරස්ථානයකට තවත් අක්කර 25ක් ලබා දීලා තිබෙනවා. එවැනි විවිධ ක්‍රියාකාරකම් හරහා කුරුණෑගල වැවිලි සමාගම සතුව තිබුණු ඉඩම් අක්කර 16,300න් දැනට ඉතිරි වෙලා තිබෙන්නේ අක්කර 12,278යි. නමුත් ගිය අවුරුද්දේ අපේ අධ්‍යක්ෂ මණ්ඩලය හරහා අපට පුළුවන් වුණා, රුපියල් මිලියන 634ක විශේෂ ලාභයක් ලබාගන්න. ඒ ලාභයෙන් සියයට 20ක් විතර සේවකයින්ටත් දුන්නා. ගරු කථානායකතුමනි, නමුත් මේ වනකොට වැවිලි සමාගම විසින් බදු වර්ග 3ක්, විශේෂයෙන් මහා භාණ්ඩාගාරයට, ඒ වාගේම ලාභාංශයෙන් සියයට 20ක් ආදායම් බදු වශයෙන් අර ඉඩම් අක්කර 16,300ටම ගෙවනවා. හැබැයි, ආදායම ලබන්නේ ඉඩම් අක්කර 12,278කින්. ගරු කථානායකතුමනි, ඒ නිසා මම ගරු අමාත්‍යතුමාගෙන් අහනවා, මෙන්න මේ වැවිලි සමාගම මේ මොහොතේ මුහුණ දී තිබෙන මේ අර්බුදය, එහෙම නැත්නම් මේ වැවිලි සමාගම සතුව නැති ඉඩම් අක්කර 4,000කට ආසන්න ප්‍රමාණයකට බදු ගෙවන එක සම්බන්ධයෙන් ඔබතුමන්ලාගේ අමාත්‍යාංශය මේ මොහොතේ ගන්නා වූ පියවර මොකක්ද කියලා.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ගරු කථානායකතුමනි, රජයක් වුණාම රාජ්‍ය අවශ්‍යතා සඳහා යම් යම් අවස්ථාවලදී රජයේ ඉඩම් ලබා ගත යුතුව තිබෙනවා. අපි දන්නවා, "දිට්වා" ආපදාව ආවා, එමඟින් විශාල වශයෙන් අපේ රටේ ජනතාව අවතැන් වුණා කියලා. ඒ අයට ඉඩම් ලබා දීමේදී රජයේ ඉඩම් හැටියට මේ මොහොතේ ටිකක් වැඩිපුර පවතින්නේ අපේ වැවිලි සමාගම් සතු ඉඩම්, LRC ඉඩම් වාගේ ඉඩම්. පසුගිය දවස්වල ගරු ජනාධිපතිතුමාත් මැදිහත් වෙච්ච දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවලදී අපේ RPC එකට අදාළ සමාගම්වල ඉඩම්වලින් සහ මේ කියපු හලාවත වැවිලි සමාගමට අයත් ඉඩම්වලින් අපි යම් යම් ප්‍රමාණ රජයේ අවශ්‍යතාවලට ලබා දී තිබෙනවා. දැන් ගරු මන්ත්‍රීතුමා ඇත්තටම මේ ප්‍රශ්නය මතු කරන්නේ, අපට පෙර ඉතිහාසයේ මේ රටේ මේ වතු සමාගම්වල ඉඩම් විවිධ දේශපාලන අවශ්‍යතාවලට, දේශපාලනඥයන්ගේ හිතවතුන්ගේ අවශ්‍යතාවලට නිදහස් කර තිබීම සම්බන්ධයෙන්. මම මීට පෙරත් මේ පාර්ලිමේන්තුවේදී එවැනි අවස්ථා කිහිපයක් පෙන්වා දෙනු ලැබුවා. දේශපාලනඥයන්ගේ වුවමනා සඳහා අනීතික ලෙස අපේ රටේ මේ සමාගම් සතු යම් ඉඩම් ප්‍රමාණයක් අරගෙන තිබෙනවා. ඒවා සම්බන්ධව අපි දැන් නීත්‍යනුකූල ලෙස කටයුතු කරමින් ඉන්නවා. කුරුණෑගල වැවිලි සමාගමේත් එලෙස අනීතික ලෙස ලබා ගත් ඉඩම් නැවත ලබා ගැනීම සඳහා අදාළ නීති කාර්යයන් මේ මොහොත වනකොටත් සිදු වනවා. කොහොම නමුත්, කුරුණෑගල වැවිලි සමාගමට මුල් අවස්ථාවේදී දීපු ඉඩම්වලින් හෙක්ටෙයාර 1,604.39ක් මේ වනකොට වෙනත් පාර්ශ්වයන්ට දීලා තිබෙනවා. හලාවත වැවිලි සමාගමේත් ඒ වාගේම දීලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ මේ මොන ප්‍රශ්න තිබුණත්, අපි කුරුණෑගල වැවිලි සමාගම භාරගන්නකොට 2024දී බදු පෙර ලාභය තිබුණේ රුපියල් මිලියන 414යි. ගිය වසරේදී එම රුපියල් මිලියන 414 වර්ධනය කරගන්න අපට පුළුවන් වුණා. ගිය වසරේදී කුරුණෑගල වැවිලි සමාගම ලාභය වශයෙන් රුපියල් මිලියන 634.98ක් ලබා ගත්තා.

ඔබතුමාගේ මුල් ප්‍රශ්නය යොමු කරපු හලාවත වැවිලි සමාගම ගත්තොත්, හලාවත වැවිලි සමාගමේ 2024 වසරේදී ලාභය තිබුණේ රුපියල් මිලියන 219යි. හැබැයි අපි සතුටින් කියන්න කැමැතියි, 2025 වසරේදී අපි හලාවත වැවිලි සමාගමේ ලාභය රුපියල් මිලියන 650 දක්වා වර්ධනය කරගත් බව. අපි මේවා නිසි ලෙස නඩත්තු කරමින් පවත්වාගෙන යනවා. ඔබතුමා දෙවැනි අතුරු ප්‍රශ්නය ලෙස අහපු කුරුණෑගල වැවිලි සමාගම් සතු ඉඩම් යම් හිටපු දේශපාලනඥයෙකු හෝ ඔවුන්ගේ හිතවතුන් අනීතික ලෙස අරගෙන තිබෙනවා නම්, ඒ සඳහා නීතිය තදින්ම ක්‍රියාත්මක කරමින්, ඒවා නැවත අපේ සමාගම් වෙත ලබා ගැනීමට අදාළ කටයුතු ක්‍රමානුකූලව සිදු කරන බවත් මා දැනුම් දෙන්න කැමැතියි.

## පොළොන්නරුව මහ රෝහල සහ වැලිකන්ද මූලික රෝහල: කොවිඩ්-19 වසංගත කාලය තුළ ලැබුණු පරිත්‍යාග

பொலன்னறுவை பொது வைத்தியசாலை மற்றும் வெலிக்கந்தை ஆதார வைத்தியசாலை: கொரோனா பெருந்தொற்றுக் காலப்பகுதியில் வழங்கப்பட்ட நன்கொடைகள்

POLONNARUWA GENERAL HOSPITAL AND WELIKANDA BASE HOSPITAL: DONATIONS RECEIVED DURING COVID-19 PANDEMIC

2041/2026

**5.** ගරු පද්මසිරි බණ්ඩාර මහතා
(மாண்புமிகு பத்மசிரி பண்டார)
(The Hon. Padmasiri Bandara)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කොරෝනා වසංගත සමයේ වැලිකන්ද මූලික රෝහලට සහ පොළොන්නරුව මහ රෝහලට පරිත්‍යාගශීලීන් විසින් වෛද්‍ය උපකරණ සහ අනෙකුත් උපකරණ පරිත්‍යාග ලෙස ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම පරිත්‍යාගශීලීන්ගේ නම් සහ ලිපින කවරේද;

(iii) එසේ ලබා දුන් උපකරණ පිළිබඳ ලේඛනයක් තිබේද;

(iv) එසේ නම්, එම උපකරණ සහ ඒවායේ ප්‍රමාණ වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) එම උපකරණ රෝහල් ඉන්වෙන්ට්‍රියට (බඩු වට්ටෝරු පොතට) ඇතුළත් කර තිබේද;

(vi) එසේ නම්, ඒවාට අදාළ ඉන්වෙන්ට්‍රි අංක කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඉහත අ(iii)හි සඳහන් උපකරණ වෙනත් රෝහල් වෙත ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම රෝහල් සහ ලබා දුන් උපකරණ හා ඒවායේ ප්‍රමාණ කවරේද;

(iii) පරිත්‍යාග ලෙස ලැබුණු උපකරණ ප්‍රමාණය සහ මේ වන විට පවතින උපකරණ ප්‍රමාණය අතර ඌනතාවක් තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා හේතු කවරේද;

(v) ඉහත අ(i)හි සඳහන් රෝහල්වල එම කාල සීමාව තුළ සේවයේ යෙදී සිටි වෛද්‍ය අධ්‍යක්ෂවරුන්ගේ නම් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கொரோனா பெருந்தொற்றுக் காலப்பகுதியில் வெலிக்கந்தை ஆதார வைத்தியசாலைக்கும் பொலன்னறுவை பொது வைத்தியசாலைக்கும் கொடையாளர்களால் மருத்துவ உபகரணங்கள் மற்றும் ஏனைய உபகரணங்கள் நன்கொடையாக வழங்கப்பட்டுள்ளனவா என்பதையும்;

(ii) ஆமெனில், அந்தக் கொடையாளர்களின் பெயர்கள் மற்றும் முகவரிகள் யாவை என்பதையும்;

Furthermore, I wish to place before Parliament that prior to the above incident, I had already filed proceedings before the Magistrate's Court of Mallakam concerning death threats directed against me by certain Members of the Ilankai Tamil Arasu Kachchi and certain Pradeshiya Sabha members. At those proceedings, three separate voice recordings were produced and the preliminary investigation indicated that the voices matched those of the individuals responsible for making the threats. Those incidents demonstrate that the threats to my life and safety are real, serious and directly connected to my political activities.

In light of these circumstances, I respectfully submit that the continued failure to provide adequate security to me as a Member of Parliament constitutes a serious breach of Parliamentary Privileges and interferes with my ability to discharge my constitutional duties freely and without fear.

Accordingly, I seek leave to raise a Question of Privilege against -

1. the Hon. Anura Kumara Dissanayake, Minister of Defence;
2. the Hon. Deputy Minister of Defence; and
3. Mr. Priyantha Weerasooriya, Inspector General of Police

for their failure to ensure the provision of adequate security and protection to me as a duly elected Member of Parliament despite repeated warnings, representations, complaints and documented threats to my life and safety.

I respectfully request the Speaker to permit this matter to be taken up as an urgent Question of Privilege in Parliament today in order to safeguard the rights, Privileges, security and independence of Members of Parliament and to ensure that no Member is subjected to discrimination, intimidation or danger while carrying out his Parliamentary functions.

Sir, let me speak for a few more seconds. මේ Privilege Question එක මම Englishවලින් හදාගෙන ගියාම මට කිව්වා කපලා, කොටලා පොඩි කරගෙන එන්න කියලා, වේලාව යනවා වැඩියි කියලා. හැබැයි ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය කථා කළා විනාඩි 9ක්. ඒක සාධාරණයිද, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? අපි Privilege Question එකක් ලියලා දුන්නාම ඒකේ sentences වැඩියි කියලා අඩු කරගෙන එන්න කියනවා. ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය ඇවිල්ලා පාර්ලිමේන්තුවේ පත්තර කියවනවා. How does that happen, Sir? One day, you told me -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. (Dr.) Ramanathan Archchuna, your Question of Privilege will be submitted to the Committee on Ethics and Privileges.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Thank you, Sir.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Ravi Karunanayake, what is your point of Order?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Sir, my reference is only as a Member of Parliament. Had the Hon. (Dr.) Ramanathan Archchuna been asked to constrain it? because there is no time limit at all for asking a Question of Privilege. Had he been told to constrain it? Is that right or wrong?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Yes, I was told and it was returned.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Sir, what is sauce for the goose is sauce for the gander. You cannot allow a Government Member to read out one which runs into three, four pages and allow him to be told to constrain his. So, I, being a Member, ask that on behalf of my Colleague.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

I will ask that from the Secretary-General's Office. We will look into that matter, Hon. Ravi Karunanayake.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Please do, Sir,

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

I have no idea about that. I have here only what had been submitted and what the Hon. Member read out.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

And, ensure that it is recorded in Parliament that there is no such requirement.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, record වීමට මා මෙය කියන්න ඕනෑ. මම ඔබතුමාට කලින් දවසකත් මෙය කියලා තිබෙනවා. විශේෂයෙන්ම උදය වරුව තුළ - හවස් වරුවේ කථාවල නොවෙයි - මේ Parliament එකේ Standing Ordersවලින් දීලා තිබෙන වේලාවට වඩා, Standing Ordersවලට පිටින් වැඩිම වේලාව ගන්නේ ආණ්ඩු පක්ෂයද, විපක්ෂයද කියලා කථානායක කාර්යාලයෙන් තීරණය කරන්න ඕනෑ. ඔබතුමා ඒකත් mark කර ගන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Then, Motions at the commencement of Public Business.

## පාර්ලිමේන්තුවේ කටයුතු
## பாராளுமன்ற அலுவல்
## BUSINESS OF THE PARLIAMENT

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "න්‍යාය පත්‍රයේ ප්‍රධාන වැඩකටයුතුවල අංක 1 සහ 2 දරන විෂයයන් පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27 හි විධිවිධානවලින් නිදහස් විය යුතු ය."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පළාත් සභා ඡන්ද විමසීම කුමන මැතිවරණ ක්‍රමය යටතේ පැවැත්විය යුතු ද යන්න සොයා බලා වාර්තා කිරීමටත්, ඒ පිළිබඳව සිය යෝජනා සහ නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන විශේෂ කාරක සභාව
## மாகாண சபைத் தேர்தல்கள் எந்தத் தேர்தல் முறைமையின்கீழ் நடத்தப்பட வேண்டும் என்பதை ஆராய்ந்து அறிக்கையிடுவதற்கும், அது தொடர்பான முன்மொழிவுகளையும் விதப்புரைகளையும் சமர்ப்பிப்பதற்குமான தெரிகுழு
## SELECT COMMITTEE TO LOOK INTO AND REPORT TO PARLIAMENT ON THE MATTER OF SELECTING THE ELECTORAL SYSTEM UNDER WHICH THE PROVINCIAL COUNCIL ELECTIONS SHOULD BE HELD AND SUBMIT ITS PROPOSALS AND RECOMMENDATIONS IN THAT REGARD

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගගගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "පළාත් සභා ඡන්ද විමසීම කුමන මැතිවරණ ක්‍රමය යටතේ පැවැත්විය යුතු ද යන්න සොයා බලා වාර්තා කිරීමටත්, ඒ පිළිබඳව සිය යෝජනා සහ නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව විසින් නිරීක්ෂණය කරනු ලැබූ කරුණු, 2026 ජනවාරි මස 06 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව මඟින් නියම කර ඇති පරිදි පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා තවදුරටත් කාලය අවශ්‍ය වන බැවින්, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 102 ප්‍රකාරව එකී කාරක සභාවට ලබා දී ඇති කාලසීමාව, 2026 සැප්තැම්බර් 17 දින දක්වා දීර්ඝ කළ යුතු ය."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Hon. Deputy Speaker, may I?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Ravi Karunanayake, what is it?

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අගමැතිනියගෙන් අහපු ප්‍රශ්නයට එතුමිය බොහොම ඕනෑකමින් කිව්වේ ඒ ප්‍රශ්නය විසඳන්න සූදානම් කියලා. මම කාරක සභාවේ මන්ත්‍රීවරු එක්ක සාකච්ඡා කරනකොට එතුමන්ලා කියලා තිබෙනවා ආණ්ඩු පක්ෂයත් මේක ඉතාම ඉක්මනින් ගේන්න හදනවා, ඒගොල්ලනුත් පූර්ණ සහයෝගය දීලා අද හෙට වෙනකොට මේ කාරක සභාවේ කටයුතු අවසන් කරනවා කියලා. මේ කාරක සභාවේ කාලය දීර්ඝ කරන්න කිසිම අවශ්‍යතාවක් නැහැ. අද දුන්නු උත්තරයේ මේක තිබෙන්නේ, - *[බාධා කිරීමක්]*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Member, that Answer has already been given by the Hon. Prime Minister.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

විරුද්ධ වෙන්න පුළුවන්, පක්ෂ වෙන්න පුළුවන්; එච්චරයි.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Yes, Hon. Chief Opposition Whip?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළාත් සභා ඡන්ද විමසීම කුමන ආකාරයට පැවැත්විය යුතුද කියලා සොයා බලා වාර්තා කරන්න තමයි මේ විශේෂ කාරක සභාව මීට මාස කිහිපයකට පෙර පත් කළේ.

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

ඇත්තවශයෙන්ම ආණ්ඩුවට අර කලින් කිව්වා වාගේ එම මැතිවරණය ඉක්මනින් පැවැත්වීම සඳහා සැබෑ වුවමනාවක් තිබෙනවා නම්, කල් මැරීමේ අවශ්‍යතාවක් නැත්නම්, එම කමිටුව නියෝජනය කරන විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන් සූදානම්, ඉතා කඩිනමින් තමන්ගේ නිර්දේශ ලබා දීලා රජයට සහාය දෙන්න, මේ මැතිවරණ ඉක්මනින් පැවැත්වීම සඳහා. එම නිසා අපි කියනවා, සැප්තැම්බර් 17 දක්වා මේ කාරක සභාවට කල් දීම සුදුසු නැහැ කියලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
It has been noted.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් දන්නවා, එම කාරක සභාවේ කාර්යභාරය ගැන. එම කාරක සභාවේ කාර්යභාරය තමයි, පළාත් සභා ඡන්ද විමසීම කුමන මැතිවරණ ක්‍රමය යටතේ පැවැත්විය යුතුද යන්න සොයා බලා වාර්තා කිරීම. ඒ සඳහා තමයි පාර්ලිමේන්තුවේ මේ Motion එක අනුමත වෙලා තිබෙන්නේ. එම කාරක සභාවේ සභාපතිවරයෙක් සහ සාමාජිකත්වයක් තිබෙනවා. එම කමිටුව කථානායකතුමා මඟින් පාර්ලිමේන්තුවට දන්වන්න ඕනෑ, එතුමන්ලාගේ වාර්තාවේ කටයුතු අවසානයි, ඒ අනුව කටයුතු කරන්න කියලා. එහෙම නැතුව එක එක මන්ත්‍රීවරයා නැඟිටලා කියන විධියට කාරක සභාවකට කටයුතු කරන්න බැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග අනුව බැලුවොත්, කාරක සභාව ගරු කථානායකතුමාගේ අධීක්ෂණය සහ ආධිපත්‍යය සහිතව තමයි ක්‍රියාත්මක වෙන්නේ. එම කාරක සභාව නිසි පරිදි පාර්ලිමේන්තුවට වාර්තා කළාට පසුව ඊට අනුව ආණ්ඩුව පමණක් නොවෙයි, Election Commission එකත් කටයුතු කරයි. ඒ වාගේම අද උදේත් ගරු අගමැතිතුමිය මේ ගැන පැහැදිලි කළා. මැතිවරණ හා සම්බන්ධ පනත් හදන්න බැහැ, නිකම් පත්තර අච්චු ගහනවා වාගේ. එතකොට සංශෝධන 25, 50 ගේන්න වනවා. මැතිවරණ නොපැවැත්වූ නිසාත්, ප්‍රාදේශීය සභා මැතිවරණ ක්‍රියාවලිය බලහත්කාරයෙන් කල් දමපු නිසාත්, පළාත් පාලන ක්‍රියාවලිය නැතිව කටයුතු කරන්නම බැරි තත්ත්වය නිසාත් තමයි 2024දී අපි ආපු ගමන්ම මැතිවරණයකට ගියේ. ඒත්, පනත හදලා. ඒ වෙලාවේත් විවිධ සාකච්ඡා තිබුණා, මන්ත්‍රීවරුන් සංඛ්‍යාව වැඩියි කියලා. ඒ වෙලාවේ මන්ත්‍රීවරුන් සංඛ්‍යාව සංශෝධනය කරලා අපට මැතිවරණයට යන්න තිබුණා. අපි දන්නවා, මන්ත්‍රීවරුන් 9,000ක් වැඩියි කියලා. එහෙම වුණා නම් මොකද වෙන්නේ? එහෙම නම් තව කල් යනවා. හැබැයි ඇත්ත ප්‍රශ්නයක් තිබෙනවා, ප්‍රාදේශීය සභාවල ඉන්න මන්ත්‍රීවරුන් සංඛ්‍යාව ඇති ද, මදි ද කියලා. පළාත් සභා මැතිවරණය අප බලයට ඒමට පෙර අවුරුදු අටක් තිස්සේ ප්‍රමාද වෙමින් තිබෙන දෙයක්. හිතාමතා ආණ්ඩු පක්ෂවලින්ම ප්‍රමාද කළ දෙයක්. ඒ නිසා තමයි සියලු පක්ෂවලින් සමන්විත විශේෂ කාරක සභාවක් පත් කරලා එම කටයුත්ත කරගෙන යන්නේ. එම විශේෂ කාරක සභාවේ වාර්තාව නිසි පරිදි ගරු කථානායකතුමාට ඉදිරිපත් වුණාට පසුව පාර්ලිමේන්තුවේ එය සම්මත කරලා Election Commission එක මඟින් මැතිවරණය පවත්වයි. ඒක තමයි අපට කියන්න තිබෙන්නේ. එම නිසා මේ සම්බන්ධව වැරදි ලෙස විග්‍රහ කිරීම වැරදියි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Ramanathan Archchuna, what brings you to your feet?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I draw your attention to Standing Order Nos. 82 (2)(b), 83 and 91(h) as well. I do not want to read them completely. When one Member spoke, the Speaker said, "Hon. Sujeewa Senasinghe, ඔයාට මොළ නැහැ" කියලා. That is an improper word to be used in Parliament. If he cannot withdraw it, can you withdraw it?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Archchuna, I think the Hon. Member himself had raised that.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
No, Sir, he had not raised it. Sir, can you remove that word?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
He is not here.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
He did not raise that. You are supposed to remove that word from Hansard, Sir.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේක කෝලම් මඩුවක් කරන්න දෙන්නේ නැතුව සභාවේ කටයුතු කරගෙන යන්න කියලා. ඒ කියන විධියට කළොත්, මේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කථා ඔක්කෝම අයින් කරන්න වනවා. මේ මන්ත්‍රීතුමා මෙතැන කුණුහරුප විතරයි කථා කරන්නේ. *[බාධා කිරීම්]* මේ මන්ත්‍රීතුමා මුළු උතුරු පළාතටත් නින්දාවක්. *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, would you please sit down? I think the Hon. Sujeewa Senasinghe would look after that.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
*උතුරු පළාතටත් නින්දාවක්,- [බාධා කිරීමක්]* ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා කරුණාකරලා සභාවේ කටයුතු කරගෙන යන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order. Will it actually be removed or not? That is all I ask.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
That happened when the Hon. Speaker was there, and I think he had already instructed on that.

Notice of Motions and Orders of the Day.

Item Nos. 1 and 2 in today's Order Paper to be moved by the Hon. Prime Minister and Minister of Education, Higher Education and Vocational Education.

## ශ්‍රී ලංකා මහ බැංකු පනත: රීති
## இலங்கை மத்திய வங்கிச் சட்டம்: விதிகள்
## CENTRAL BANK OF SRI LANKA ACT: RULES

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)
Hon. Deputy Speaker, I move,

"That the Rules made by the Chairman of the Governing Board and Governor of the Central Bank of Sri Lanka, under Section 105 read with Sections 7(1)(c) and Part VI of the Central Bank of Sri Lanka Act, No. 16 of 2023 and published in Gazette Extraordinary No. 2492/10 of 09th June, 2026, which were presented on 09.06.2026, be approved.

(Cabinet approval signified.)"

Sir, I also move Item No. 2 - Resolution under the Essential Public Services Act - to be approved by the House.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
To start the Debate, the Hon. Bimal Rathnayake.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Sir, may I?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. (Dr.) Harsha de Silva?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Is the Item that the Hon. Prime Minister just moved on forced conversion?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
අද මේ සම්බන්ධයෙන් විවාදයක් තිබෙනවා, විවාදයේදී එය මතු කරන්න. *[බාධා කිරීමක්]* විවාදයේදී කථා කරන්න එපායැ, ඔබතුමා. ඔබතුමා කථා කළා නම් හොඳයි.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Is that the one, Sir? I just want to know the number.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
That is Item Nos. 1 and 2 on the Order Paper, Hon. (Dr.) Harsha de Silva.

The Hon. Bimal Rathnayake to start the Debate. You have 14 minutes.

[අ.භා. 12.01]

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

අද දවස පුරාම ප්‍රධාන කාරණා දෙකක් මේ පාර්ලිමේන්තුවේ සාකච්ඡා කරනවා. එකක්, Central Bank of Sri Lanka Act එක යටතේ ඉදිරිපත් කර තිබෙන රීති. රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා ඇතුළු සාමාජිකයන්ට අපි ස්තුතිවන්ත වනවා, රජයේ අවශ්‍යතාව සහ රටේ අවශ්‍යතාව තේරුම් ගෙන ආණ්ඩුවේ කටයුතුවලට මුල් තැන දෙන්න ඕනෑය කියන සම්ප්‍රදායයත් රකිමින්, මේ පිළිබඳව සාකච්ඡා කරලා එතුමන්ලාගේ තීරණය ලබා දීම සඳහා විශේෂයෙන්ම ඒ කමිටුව රැස්වීම පිළිබඳව.

[ගරු බිමල් රත්නායක මහතා]

මා හිතනවා, මුදල් අමාත්‍යාංශයේ රෙගුලාසි සහ Central Bank of Sri Lanka Act එක යටතේ ගෙනෙන රීති සම්බන්ධයෙන් වන කරුණු ආණ්ඩුව වෙනුවෙන් අපේ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය ඇමතිතුමා පැහැදිලි කරයි කියලා. මම මූලික වශයෙන්ම මේ කාරණය කියන්න කැමැතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අද අපි අත්‍යවශ්‍ය සේවා පිළිබඳව කථා වනවා. ඒ නිසා පොදු වැදගත්කමක් සහිත කරුණු දෙක තුනක් ගැන මට ලැබී තිබෙන වෙලාව තුළදී කථා කරන්න මම කැමැතියි.

අපේ ආනන්ද විජේපාල ඇමතිතුමා කරුණු රාශියක් ඉදිරිපත් කළා, සුරේෂ් සලේ නාට්‍යය පිළිබඳව. ඉතා පැහැදිලිව අපි කියන්න කැමැතියි, පාස්කු ප්‍රහාරය රාජපක්ෂලාගේ දේශපාලන වුවමනාවට සැලසුම් කළාය කියන එක සම්බන්ධයෙන් ඒ මොහොතේ දේශපාලනය පිළිබඳ සාමාන්‍ය විඥානයක් තිබෙන ඕනෑම කෙනෙකුට අමුතුවෙන් පරීක්ෂණ කරලා ඔප්පු කර ගන්න දෙයක් තිබුණේ නැහැ කියන එක. නමුත්, අපි එහෙම කිව්වාට ඒවාට දේශපාලන ආරෝපණ කරලා හරියන්නේ නැහැ. අපරාධමය කරුණුවලදී ඒවා විද්‍යාත්මක සාක්ෂි මත සැකයෙන් තොරව ඔප්පු කරන්න ඕනෑ. ඒ නිසා අද ඒ මහා පරිමාණ විනාශය පිළිබඳව අපේ පැත්තෙන් විතරක් නොවෙයි, පොදුවේ ගත්තාම, ගම්මන්පිලගේ පොත් දොරට වඩින තැන්වලට ගිහිල්ලා, මහ මොළකරුවා, ඒ කියන්නේ මිනීමරුවා වෙනුවෙන් ලියපු පොත් භාර ගන්න මට්ටමට මේ සමහර පක්ෂ පත් වෙලා තිබුණත්, මේ පක්ෂවල සමහර මන්ත්‍රීතුමන්ලා බෝම්බ ප්‍රහාරයෙන් පස්සේ, මේකේ පිටුපස ඉන්නේ රාජපක්ෂලාය කියලා කරපු ප්‍රකාශ ඕනෑ තරම් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වෙලාවේ මම කියන්න හිතුවා, manufacturing the situation කියන එක ගැන. මැතිවරණයක් දිනන්න හෝ තමන්ට දේශපාලන බලය පවත්වාගෙන යෑම පහසු කර ගැනීමට මුළුමහත් රටක, නැත්නම් සමාජයක තත්ත්වය වෙනස් කරන්න, ත්‍රස්තවාදය නැත්නම් මෙවැනි ආකාරයේ මහා පරිමාණ යුද්මය මට්ටමේ කුමන්ත්‍රණ කරලා තිබෙන්නේ ලංකාවේ විතරක් නොවෙයි. මේ ගැන මම කරුණු දෙක තුනක් කියන්න හිතුවා. සමහර අය හිතනවා, ආණ්ඩු එහෙම කරයිද කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කරුණු සොයා ගත් ප්‍රමාණයෙන් කෙටියෙන් මම ඔබතුමාට කියන්නම්, strategy of tension ගැන. 1969දී ඉතාලියේ තිබුණු යම් ආකාරයක දක්ෂිණාංශික ආණ්ඩුවක් විසින් එල්ල කරපු Piazza Fontana කියන බෝම්බ ප්‍රහාරය හේතුවෙන් මිලාන් නගරයේ 17දෙනෙකු මිය ගියා. ඒක far-right government එකක්. ඔබතුමාත් දන්නවා, 1968, 1969, 1970 කාලවලදී Europeවල තරුණ අරගළ නැඟී එමින් තිබුණු බව. ඒ නිසා ඒ ආණ්ඩුවට ඕනෑකම තිබුණා, ඒ වෙලාවේ නැඟී එන ඒ වමේ ව්‍යාපාරය මර්දනය කරන්න. ඒ සඳහා මොකක්ද කළේ? මේ බෝම්බය පිපිරුණාට පස්සේ ඉතාලි ආණ්ඩුව කෙළින්ම තීන්දු කළා, මේක කළේ වමේ ව්‍යාපාර, වමේ විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්, විශ්වවිද්‍යාල ආචාර්යවරුන් කියලා. එහෙම තීරණය කරලා, ඔවුන්ට විරුද්ධව විශාල මර්දනයක් කරන්න අවශ්‍ය නීති සියල්ලම ගෙනාවා. නමුත් පසුකාලීනව පැහැදිලිවම ඔප්පු වුණා, මේකට වමේ කණ්ඩායම්වත්, ප්‍රජාතන්ත්‍රවාදී කණ්ඩායම්වත්, කවුරුත්ම සම්බන්ධ නැහැ, ඒ, ආණ්ඩුවේ බලය පවත්වාගෙන යෑම සඳහා ඒ ආණ්ඩුවටම සම්බන්ධ වෙලා තිබුණු Italy's military intelligence agencies විසින් බව. මම කියන්නම් ඒ Ordine Nuovo, "new order" කියන එක ගැන. "A far-right neo-fascist group work hand in hand with elements of Italy's Military Intelligence Agencies - SID - and shadow networks. The intelligence services deliberately planted false evidence to frame the Left, creating a managed state of chaos to control electoral outcomes." ඒ නිසා මේක ගෝඨාභයලා, සලේලා හොයා ගත්ත එකක්ම නොවෙයි, ඊට කලින් සිදු වුණු දෙයක්. මම මේ උදාහරණයකට කිව්වේ ඉතාලියේ වෙච්ච සිදුවීම.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊට පසුව 1933දී සිද්ධ වුණු Reichstag Fire එක බොහොම ප්‍රසිද්ධ සිද්ධියක්. Reichstag කියන්නේ, ජර්මනියේ පාර්ලිමේන්තුව. 1933 පෙබරවාරි මාසයේ ජර්මනියේ පාර්ලිමේන්තුවට ගිනි තිබ්බා. ඒ වනකොට ඇඩොල්ෆ් හිට්ලර් Chancellor වෙලා බලයට ඇවිල්ලා මාසයයි. ඔහු මොකක්ද කළේ? ඔහු Dutch කොමියුනිස්ට්වාදියෙක් ඒකට වැරැදිකරු බවට පත් කළා. නෙදර්ලන්තයේ කොමියුනිස්ට්වාදියෙක් තමයි ඒකට වැරැදිකරු කළේ. ඒකෙන් පස්සේ මොකක්ද කළේ? ඒකෙන් පස්සේ සම්පූර්ණයෙන්ම Nazi Party එක කරපු දේ මෙන්න මේකයි: "The Nazi Party immediately declared that the fire was a proof of a massive, impending communist revolution. They used the collective panic to completely alter the public mindset."

ඒ වාගේම "collective panic" කිව්වාම මට මතක් වෙනවා, අපේ ඉලංගෙයි තමිළ් අරසු කච්චි පක්ෂයේ මන්ත්‍රීතුමන්ලා සාමාන්‍යයෙන් උතුරේ හමුදා කඳවුරු තිබෙනවාට එච්චර කැමැති වුණේ නැති බව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාස්කු ප්‍රහාරයෙන් පස්සේ ඉලංගෙයි තමිළ් අරසු කච්චි පක්ෂයේ මන්ත්‍රීතුමන්ලා ප්‍රථම වතාවට කිව්වා මට මතකයි, උතුරේ ආරක්ෂාව සම්බන්ධ ප්‍රශ්නයක් තිබෙනවා, ඔවුන්ට ආරක්ෂාව අවශ්‍යයි කියලා. ඒ කියන්නේ, collective panic එකක් ඇති කරලා ගෝඨාභය රාජපක්ෂ බලයට ගෙනෙන්න අවශ්‍ය situation එක මුළු ලංකාවේම manufacture කළා; ඒ situation එක ගොඩනැඟුවා.

හිට්ලර් මොකක්ද කළේ? ජර්මනියේ පාර්ලිමේන්තුව ගිනි තැබුවාය කියලා Dutch කොමියුනිස්ට්වාදියෙක් අල්ලාගෙන කිව්වා, communist revolution එකක් එන්න යන්නේ කියලා. ඊට පස්සේ පැය 24කින් "Hitler pressured the President into signing Reichstag Fire Decree." Reichstag Fire Decree කියලා decree එකක් අත්සන් කළා. එහෙම decree එකක් අත්සන් කරලා, he suspended basic liberties, banned opposition press and allowed the mass arrest of political rivals. ඊට පස්සේ ඔප්පු වුණා, ඒක සහමුලින්ම හිට්ලර් විසින් කරපු දෙයක් කියලා. Reichstag Fire එක ලෝක ප්‍රසිද්ධ සිදුවීමක්. ඒක අවුරුදු 100ක් විතර පරණ එකක් නේ.

මෑතකදී සිදු වුණු උදාහරණය විධියට Madrid train bombing සිද්ධිය ගන්න පුළුවන්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා දන්නවා, Spainවල Basque Country එක්ක යම්කිසි ප්‍රශ්නයක් තිබෙන බව. ඒ අනුව 2004 අවුරුද්දේ election එකට දවස් තුනක් තියලා - ටිකක් මෙහේ වාගේ - Madridවල train stationsවල බෝම්බ පිපිරෙව්වා. 2004 මාර්තු 11වැනි දා ඒ සිද්ධිය නිසා මිනිස්සු 193ක් මැරුණා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාස්කු ප්‍රහාරයෙන් මිය ගිය ප්‍රමාණයට වඩා 100ක් විතර අඩුවෙන්. එතකොට තිබුණේ Partido Popula කියලා දක්ෂිණාංශික conservative Government එකක්. ඒගොල්ලන් හිතුවා, ඒ සිදුවීම පාවිච්චි කරලා මැතිවරණය ලොකුවට කර ගන්න. ඒ නිසා ඒගොල්ලන් කිව්වා, ඒකට මුස්ලිම් අන්තවාදීන්ගේ සම්බන්ධකම් තිබෙනවා කියලා. So, the country voted for security. නමුත් ඒ රටේ ඒක backfire වුණා. ඒක ආණ්ඩුවේ popularity එක වැඩි කර ගන්න කරපු එකක් කියලා පැහැදිලිවම හොයා ගත්තා. 2001 අවුරුද්දේ Twin Tower ප්‍රහාරය ගැනත් එහෙම එකක් තිබෙනවා නේ. ඒක තමයි කළේ.

මේ රටේ පාස්කු ප්‍රහාරය අප්‍රේල් 21වැනි දා සිදු වුණා. අප්‍රේල් 23වැනි දා ගෝඨාභය රාජපක්ෂ මහතා declare කළා, එතුමා ජනාධිපති අපේක්ෂකයා වශයෙන් ඉදිරිපත් වෙනවා කියලා. අප්‍රේල් 21වැනි දා බෝම්බ පිපිරුණා. එතුමා ඊට දවස් දෙකකට පස්සේ declare කළා, ජනාධිපති අපේක්ෂක වශයෙන් එනවා කියලා. මම මේ කරුණු තුනම කිව්වේ මෙහෙම තමයි ඉතිහාසයේ සිදු වෙලා තිබෙන්නේ කියන එක පෙන්වන්නයි. මෙහෙම තමයි ඉතිහාසයේ සිදු වෙලා තිබෙන්නේ. පාස්කු ප්‍රහාරයෙන් කවුද අසරණ වුණේ කියන එක මම කිහිප වතාවක් කියා තිබෙනවා. පාස්කු ප්‍රහාරය නිසා මුළු ලංකාවේම ආර්ථිකය කඩාගෙන වැටුණා. මම හිතන විදියට, ලංකාව තවම ඒ නියම මට්ටමට ඇවිල්ලා නැහැ. ආර්ථික අර්බුදය, තෙල් අර්බුදය වුණත් පටන් ගන්න ආසන්න හේතුවක් වුණේ පාස්කු ප්‍රහාරය නිසා මහා පරිමාණ වශයෙන් සංචාරක කර්මාන්තය ඇතුළු ආර්ථිකයේ කඩා වැටීමයි. පාස්කු ප්‍රහාරය නිසා සිදු වුණු කඩා වැටීම තමයි ඊට පසුව දිගටම සිදු වුණේ.

ඊළඟට, මුස්ලිම් ජනතාව ගනිමු. ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමනි, ඔබතුමාත් ශ්‍රී ලාංකිකයෙක් තමයි. නමුත්, ඔබතුමා ඉපදෙන්නේ මුස්ලිම්වරයෙකු විදියට. ඔබතුමා ඇතුළු මුස්ලිම් ජනතාව සහමුලින්ම ත්‍රස්තවාදීන් බවට පත් වුණා, මේ රටේ. වේල් එකක් දමාගෙන යන්න බැරි, ඉෆ්තාර් උත්සවයක් කරන්න බැරි මට්ටමට පත් කළා. ක්‍රිස්තියානි ජනතාවට වෙච්ච හානිය ගැන අපි කවුරුත් දන්නවා. මේ රටේ සිදු වූ පාස්කු ප්‍රහාරය ගැන අපි ඇති තරම් මේ ගරු සභාවේදී කියලා තිබෙනවා. ඒක ජාතියේ හෘදය සාක්ෂියේ සිදුරක්. ඒ නිසා මේ ඇත්ත මිනීමරුවායි, මිනීමැරුමට සැලසුම් කරපු, - සලේ ජනාධිපති වෙන්න එන්නේ නැති බව කවුරුත් දන්නවා. ඔහුට "මහ මොළකරු" කියන වචනය පාවිච්චි කිරීම කොච්චර ඇත්තද කියන්න මම දන්නේ නැහැ. ඔහු ජනාධිපති අපේක්ෂකයකු විදියට තියා මම හිතන විදියට මැතිවරණයකටවත් එන්නේ නැහැ. ඒ වාගේම අපි දන්නවා, හිටපු යුද හමුදාපතිවරයෙකු වන ජනරාල් සරත් ෆොන්සේකා මැතිතුමා මේ සාක්ෂි එන්න කලින්, "මේකට පැහැදිලිවම මේ පුද්ගලයා සම්බන්ධයි" කියලා මේ පාර්ලිමේන්තුවේදීම කියා තිබෙන බව. ඒ නිසා අපි මේ කාරණය කියන්න කැමැතියි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මෙතැන පාස්කු ප්‍රහාරය පිළිබඳව දේවල් කීම මුළුමහත් රටක යුක්තියට, සාධාරණත්වයට සහ පැහැදිලිවම අධිකරණයට ඇහිලි ගැසීමක්. *[බාධා කිරීමක්]*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Memeber, please do not disturb. The Debate is going on. The Hon. Minister does not wish to be disturbed, is that not so? You can raise it later, Hon. Member.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ඒ නිසා අපි කියන්න කැමැතියි, මෙතැන පැහැදිලි ප්‍රශ්නයක් තිබෙන බව. ඝාතකයෝ, ඔත්තු බලපු කට්ටිය තමයි අද මේ මිනීමැරුම වෙනුවෙන් පෙනී සිටිමින් විශාල මතයක් ගොඩනගන්නේ. අපි මේ රටේ ජනතාවගෙන් ඉල්ලීමක් කරනවා. කාදිනල්තුමා වෙනුවෙන් සිරිල් ගාමිණී පියතුමා යම්කිසි ප්‍රකාශයක් කරනවා මම දුටුවා. මම කියන්නේ, මේක ශ්‍රී ලංකාවටම ලජ්ජාවක්. මේ මිනීමරුවෝ හා මිනීමැරුම සැලසුම් කරපු කට්ටිය ගැන අධිකරණය තුළ කරුණු ඔප්පු වෙද්දී සහ පැහැදිලිවම ගෝඨාභය රාජපක්ෂට travel ban එනකොට, එතෙක් ලෙඩ වෙච්ච නැති මේ පුද්ගලයා එක වතාවටම ලෙඩ වෙන්න පටන් ගත්තේ ඇයි කියලා අපි දැනගන්න කැමැතියි. *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Member, please do not disturb. I will give you time after he speaks.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

අද ඇමතිතුමා කිව්වා, සලේට සම්පූර්ණයෙන්ම health clinic එකක් තිබෙන්නේ කියලා. මම හිතන විදියට, මේ කෙටි කාලය තුළ ඔහුට specialistsලා විතරක් 6ක්ද, 7ක්ද මුණ ගස්වලා තිබෙනවා. ඒ නිසා අපි කියන්න කැමැතියි, අපි මේ රටේ දේශපාලන අභියෝගයක් භාර ගෙන තමයි මෙතැනට ආවේ කියන එක. මහින්ද රාජපක්ෂ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට ගෙන ගියොත් ගිනි තියා ගන්නවා කිව්වා. නමුත්, ගිනි කූරක්වත් ගැහුවේ නැහැ. මහින්ද රාජපක්ෂ ගෙන්වූවා, අල්ලස් කොමිසමට. රනිල් වික්‍රමසිංහත් අල්ලස් කොමිසමට ගියා. එතකොට මේගොල්ලනුත් පැනගෙන ගියා. රනිල් වික්‍රමසිංහ අත්අඩංගුවට ගත්තාම, රනිල්ලා නීතියට උඩින් ඉන්නවා කියලා හිතාගෙන මේගොල්ලොත් ගියා. එහෙම එකක් නැහැ. මේ රටේ හොර ප්‍රභූ තන්ත්‍රයක් හදාගෙන තිබෙනවා, නීතියට උඩින්. අපි හිටපු ජනාධිපතිතුමන්ලා ගත්තොත්, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා කලින් ඉඳලාම උසාවියට යනවා. එතුමාට ඒ ප්‍රශ්නය නැහැ නේ. රාජපක්ෂලාට, රනිල්ලාට විතරද ඒ ප්‍රශ්නය තිබෙන්නේ? හිටපු විධායක ජනාධිපති වෙන්න පුළුවන්, හිටපු ආරක්ෂක ලොක්කෝ වෙන්න පුළුවන්, හිටපු මහා පරිමාණයේ ව්‍යාපාරිකයෝ වෙන්න පුළුවන්. *[බාධා කිරීමක්]* මේ ආණ්ඩුවට ජන වරමක් තිබෙනවා, භය නැතුව වැඩ කරන්න. ඒ නිසා මේ කාරණය වෙනුවෙන් අපට නීත්‍යානුකූලව යන්න පුළුවන් උපරිම දුර ගිහිල්ලා, මේ මිනීමරුවන් සහ මිනීමැරුම සැලසුම් කරපු පුද්ගලයන් හොයා ගන්නවා කියන එකයි මම කිව්වේ.

2015න් පස්සේ හොරකම් කිරීම නිසා විශාල නඩු ප්‍රමාණයක් වැටුණා, මේ දූෂිතයන්ට විරුද්ධව. රාජපක්ෂලා හොරකම් කරපු බව ජනතාව 2018 අවුරුද්ද සහ 2019 අවුරුද්ද වනකොටත් දන්නවා. ඒ නිසා රාජපක්ෂලා හොඳයි කියලා මිනිස්සු අමුතුවෙන් තේරුම් අරගෙන හිටියේ නැහැ, 2019 අවුරුද්ද වනකොට. 2015දීත් රාජපක්ෂලා දැනගත්තා, එවකට අධිකරණ ක්‍රියාවලිය ගැන. යාළුවෝ අතර සාකච්ඡා වන අතරේ පවා අධිකරණ නිලධාරින්ගේ උනන්දුවෙන් යම් ප්‍රමාණයක් ගියා,- ඒ නිසා තමයි අද ශානි අබේසේකරට විරුද්ධව බෝඩ් ගහගෙන ඉන්නේ. අද විපක්ෂයේ ඉන්න මේගොල්ලන් ශානි අබේසේකර, රවී සෙනෙවිරත්න කියන අයට තමයි පහර දුන්නේ. ඒක තමයි ඇත්ත. අද අපි පැහැදිලිව කියන්න කැමැතියි, ඔය බොරු තර්ජනවලට, බොරු ගර්ජනවලට මේ ජාතික ජන බලවේගය ආණ්ඩුව භය වෙන්නේ නැහැ කියන එක.

ඒ විතරක් නොවෙයි, රජයේ නිලධාරින්ව අපි ඉතාම අගය කරනවා. අපි ආණ්ඩුවක්; දේශපාලන ව්‍යාපාරයක්. නමුත්, රජයේ නිලධාරින් කොන්ද කෙළින් තියාගෙන වැඩ කරන එක ගැන අපි ඒ අයට ගරු කරනවා. ඒ ගැන කෙළින් කියන්න කවුරුවත්

[ගරු බිමල් රත්නායක මහතා]

මෙතැන නැහැ. අද සම්පූර්ණයෙන්ම දැනුවත්ව හෝ නොදැනුවත්ව මිනීමරුවාගේ සාක්කුවේ ඉන්නේ මෙතැන ඉන්න සමහර

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මට සමාවෙන්න ඕනෑ, ඒ වචනය කිව්වාට. මෙතැනදී තනිකරම මිනීමරුවාට නොවෙයි පහර දුන්නේ, පසුගිය කාලයේ. ඒ නිසා තමයි විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මැතිතුමා ගම්මන්පිලගේ උත්සවයට ගියේ. ඒ උත්සවයට ගිහිල්ලා පසුව කිව්වා, එම උත්සවයේ ඡායාරූප සහ වීඩියෝ AI ඒවා කියලා. අද මේ උඩින් කරන දේවලුයි, යටින් කරන දේවලුයි ගැන අපට අදහසක් තිබෙනවා. පාස්කු ප්‍රහාරයේ මිනීමරුවොත් එක්ක එකතු වෙලා හරි මේ ආණ්ඩුවට ෂොට් එකක් දෙන්න පුළුවන් නම් ඒක තමයි මේගොල්ලන් සමහර දෙනෙකුගේ අරමුණ කියන එක මම අවසාන වශයෙන් කියන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව එකම එක කරුණක් කියන්න ඕනෑකම තිබෙනවා. අද ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ ගෙනෙන රීති පිළිබඳව කථා කරන නිසා විශේෂයෙන්ම මේ කාරණයත් මම කියනවා. දැන් රජයේ මුදල් පිළිබඳ කාරක සභාව "Rebuilding Sri Lanka" fund එක ගැන විශාල වැරදි මතයක් ගෙන යනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, Consolidated Fund කියලා එකක් තිබෙනවා. දැන් තිබෙන ප්‍රශ්නය තමයි "Rebuilding Sri Lanka" කියා අරමුදලක් පිහිටුවා නැහැ, ඒක නීති විරෝධියි කියලා නිලධාරින්ට තග දමලා කටින් අල්ලා ගන්න හදන එක. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හැම දෙයක්ම ප්‍රායෝගිකව තිබෙන්න පුළුවන්. හැබැයි, හැම දෙයක්ම නීත්‍යනුකූලව - legally - ඒ විධියටම නොතිබෙන්න පුළුවන්. මට වෙලාව නැතිවෙයි මේ ගැන කියන්න.

ඒකාබද්ධ අරමුදල කියලා එකක් තිබෙනවා. ඒකාබද්ධ අරමුදල කියලා account එකක් තිබෙනවාද? ඒ account එක තිබෙන්නේ Government Main Cash Book Account, නැත්නම් Treasury General Account වශයෙන්. එහෙම තමයි තිබෙන්නේ. එතකොට ඒක නීති විරෝධීද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මිනිස්සු ඕනෑ තරම් දේවල් කරනවා practice එකෙන්. ඒවා සියල්ලම නීති විරෝධී නැහැ. නීති විරෝධී ඒවාත් තිබෙනවා. ඒ, වෙන දේවල්. සරලව ගත්තොත්, මොකක්ද මේකේ අරමුණ? මේ රටේ ඕනෑ තරම් අරමුදල් හදා තිබෙනවා, හදිස්සියට. සුනාමි ආපු වෙලාවේත් හදා තිබෙනවා. Easter Sunday Attack එකෙන් පසුවත් fund එකක් හදා තිබෙනවා. දැන් මේ මූලා අරමුදල හදපු පනතක් පාවිච්චි කරගෙන,- *[බාධා කිරීමක්]* අපි ඒක දන්නවා. ලංකාවේ නීතිය තමයි. මොකක්ද, මේ fund එකේ අරමුණ? මේ fund එක ආණ්ඩුවටත් වඩා ඉල්ලුවේ මිනිස්සු. මිනිස්සු තමයි කිව්වේ "දිට්වා" ආපදාවෙන් පසුව ජනතාවට උදවු කරන්න කැමැතියි කියලා. අපි කාටත් මේ පාර්ලිමේන්තුවට පැමිණි පළමුවැනි දවසේම ව්‍යවස්ථාව දෙනවා, ස්ථාවර නියෝග දෙනවා. ඒවා කියවන්නත් ඕනෑ. ඕනෑම රටක පනතක් හදන්න ගත වෙන කාලයක් තිබෙනවා. මේ පනත හදාගෙන යනවා අපි. අපට තිබෙන්නේ traffic light system එකක්. "Rebuilding Sri Lanka" කියන fund එක නීත්‍යනුකූලව තිබෙන්නේ. ඒක Deputy Secretary to the Treasury යටතේ තිබෙන account එකක්. ඒක නීත්‍යනුකූලයි. *[බාධා කිරීමක්]* මෙහෙමයි. මම කියන්නම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ Treasury account එක නීත්‍යනුකූලයි. ලංකා ආණ්ඩුවට ඕනෑම වෙලාවක මිනිස්සුන්ට කියන්න පුළුවන්, ඔබට ලංකා ආණ්ඩුවේ කුමන හෝ කටයුත්තකට ලංකා ආණ්ඩුවේ Deputy Secretary to the Treasury යටතේ තිබෙන accountsවලට සල්ලි එවන්න පුළුවන් කියලා. ඒක කැමැත්තෙන් කරන දෙයක් මිස බලෙන් කරන දෙයක් නොවෙයි. එහෙම නැත්නම් නිකම් වුණත්, හේතුවක් ඕනෑ නැතිවත් ඉල්ලන්න පුළුවන්. ඒවා ඔක්කෝම Consolidated Fund එකට තමයි යන්නේ. මම ඒකයි අභියෝග කරන්නේ. Consolidated fund කියලාත් account name එකක් නැහැ. ඒකේ නම වෙනස්. EPF කියලා account එකක් තිබෙනවාද? එහෙමත් නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වෙලාව වැඩිපුර ගන්න හොඳ නැති නිසා මම කෙටියෙන් කියන්නම්. ඒකේ තිබෙන්නේ, මෙන්න මේ විධියට. Superintendent of the Employees' Provident Fund. එහෙම තමයි තිබෙන්නේ.

අපට තිබෙන අරමුණ, ඕනෑකම මොකක්ද? අපට ඕනෑකම තිබෙන්නේ මේ වචන අස්සේ දුවලා ජනතාවගේ තිබෙන කැමැත්ත විනාශ කරන්නද, එහෙම නැත්නම් මේ අරමුණ ඉටු කරගන්නද? ජනතාවට ඕනෑකමක් තිබුණා දිට්වාවලින් පසුව contribute කරන්න. ඒකට ආණ්ඩුව නීත්‍යනුකූල ගිණුමක් ආරම්භ කර තිබෙනවා. ඒ නීත්‍යනුකූල ගිණුමේ නම "Deputy Secretary to the Treasury Account". ඒක තමයි නම. හැබැයි, ඒක මිනිස්සුන්ට තේරෙන්නේ නැහැ. ඒ නිසා ආණ්ඩුව - අපි - ඒකට නමක් කියනවා. ඒ තමයි, "දිට්වා අරමුදල" කියන එක. මිනිස්සුන්ට කියන්න බැහැ නේ, භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් යටතේ තිබෙන ගිණුම කියලා. එහෙම කිව්වාම, මිනිස්සුන්ට මොකුත් තේරෙන්නේ නැහැ නේ. ඒ නිසා ඉතාම සරල දෙයක් කර තිබෙනවා, සද්චේතනාවෙන්. ඒකේ නීති විරෝධීභාවයක් නැහැ. ඒක සම්පූර්ණයෙන්ම නීත්‍යනුකූලයි. නමුත් නිලධාරින්ගේ කටින් අල්ලා ගන්න හදනවා, එහෙම ගිණුමක් නැහැ නේද, අරකද, මේකද කියලා. එහෙම කරන එක වැරදියි. අපි අර සුනාමි funds හොරකම් කළ ජාතියේ අය නොවෙයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දෙවැනි කාරණය මේකයි. මේ සල්ලි දැනට තිබෙන්නේ Consolidated Fund එකට අදාළව. මේවා මහජන මුදල්. එතකොට මේ මුදල් ලැබුණේ ඒ හේතුවට මිසක් වෙනත් දේකට නොවෙයි. ඒක නිසා පාර්ලිමේන්තුවේ අවසරයෙන් තොරව මේ මුදල් පාවිච්චි කරන්නත් බැහැ. මේ අරමුදල් මොන අරමුණට ආවත්, ඒවා Consolidated Fund යටතේ තමයි දැනට තිබෙන්නේ. එතකොට ඒ අරමුණින් භාවිත කරනවා නම්, අපි මෙතැනින් අවසර අරගෙන තමයි ඒ කටයුත්ත කරන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා දන්නවා අපි රුපියල් කෝටි 50,000ක් - බිලියන 500ක් - "දිට්වා" ආපදාව වෙනුවෙන් වෙන් කර තිබෙන බව. ඒ බිලියන 500ට කිසිම හානියක් නැහැ. තව අපට වියදම් කරන්න බැරි වෙයි කියන ප්‍රශ්නය තමයි අපට දැන් තිබෙන්නේ. මොකද, නිලධාරින් වැඩ කරන්න ඕනෑ. නීති රීති අනුව නේ ඒ වියදම් කරන්න වෙන්නේ. දැන් මේ බිලියන 10 හෝ බිලියන 11 හෝ, - ආණ්ඩුවේ ගිණුම් ගොඩක් තිබෙනවා නේ. ආණ්ඩුවේ ගිණුම් ගොඩක් තිබෙනවා. ආණ්ඩුව "දිට්වා" ආපදාවට අදාළ වියදම් එහෙමම කරගෙන යනවා. මේ කියන විධියට අර බිලියන 500 ඉවර වුණා නම්, මේ බිලියන 10 ගන්න එකේ කිසි ප්‍රශ්නයක් නැහැ. අපි එහෙම ද කරන්න ඕනෑ? තවම ඒ බිලියන 500වත් ඉවර නැහැ. මම ඒකයි කියන්නේ. මේක ගැන දන්නා අය දන්නවා. දැන් මේ කරන්න හදන්නේ සැකයක් ඇති කරන එක; confuse කරනවා. එහෙම confuse කරලා දිට්වා අරමුදලට ඩොලර් එකක් හරි එවන්න මිනිහෙක් ඉන්නවා නම්, ඒකට බාධා කරනවා. මම කියන්නේ ඒ මට්ටමට වැටෙන්න එපා කියලායි. අපි සුනාමි හොරු නොවෙයි, රාජපක්ෂලා වාගේ. හරිද?

"දිට්වා" ආපදාව වෙනුවෙන් මිනිස්සු ලංකාවට සල්ලි එවපු එක නීත්‍යනුකූලයි. ඒවා තිබෙන්නේ Deputy Secretary to the Treasuryගේ accountsවල. මිනිස්සුන්ට තේරෙන්න දමපු නම

තමයි "දිට්වා අරමුදල" කියන එක. එහෙම නම් ජනසවිය? එහෙම නම් සමෘද්ධිය? මම දන්නා තරමින් "සමෘද්ධි" කියලා තිබෙන්නේත් account එකේ නම නොවෙයි. අනෙක් එක, account එකක් නොවෙයි, accounts ගොඩක් තිබෙනවා හැම දේකටම. ඒ නිසා මම කියන්නේ මේකයි. මේකේ නම නොවෙයි ප්‍රශ්නය. මේක නීත්‍යානුකූලයි. ඒ පනතේ ක්‍රියාවලියක් තිබෙනවා. අපි traffic light system එකට ගියොත් දැන් අපි ඉන්නේ ඒ පනත් කෙටුම්පත Legal Draftsmanගෙන් අනුමත කර ගන්නා අවධියේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, මට වැඩිපුරත් එක්ක වෙලාව ලබා දීම පිළිබඳව. මට එතුමන්ලාට කියන්න තිබෙන්නේ කරුණාකරලා සද්භාවයෙන් කරන දේවල්වලට අකුල් හෙළන්න එපා කියන එකයි. අඩුපාඩුකම් පෙන්වා දුන්නාට කමක් නැහැ. "Rebuilding Sri Lanka" කියලා fund එකක් නැහැ, ඒක නීති විරෝධීයි කියලා campaign එකක් කරන මට්ටමට යන්න එපා කියන ඉල්ලීම කරමින් මගේ කථාව නතර කරනවා.

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. (Dr.) Ramanathan Archchuna? You have been standing for a long time.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I am drawing your attention to Standing Order No. 92(2)(b). එහි පැහැදිලිව තිබෙනවා, "Points of order shall take precedence over the question under consideration,..." කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඕනෑ එකක් කථා කරනකොට point of Order එකක් මතු කරන්න ඇහුවොත්, රීති ප්‍රශ්නයක් නම් ඔබතුමා අවස්ථාව දෙන්නම ඕනෑ. ඒක නෙමෙයි මගේ ප්‍රශ්නය.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Member, what is your concern here?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, my concern is with regard to Standing Order No. 91 (e) which states, "Every Member must confine his observations to the subject under discussion;" කිහිප වතාවක්ම මගේ mike එක off කරලා තිබෙනවා, "ඔබතුමා subject එකට අදාළ නැතිව කථා කරන්නේ" කියලා. කරුණාකර, ගරු සභානායකතුමාට කවුරු හෝ කියලා දෙන්නකෝ අනේ අද Telecommunication Levy එක ගැන කථා කරන්න කියලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Next speaker is the Hon. S.M. Marikkar. Hon. Marikkar, I might have to interrupt your speech due to suspension for lunch. So, I can let the next speaker, the Hon. Thurairasa Ravikaran, to speak now and then, you can speak after lunch uninterruptedly. Is that okay with you, Hon. Marikkar, if I call upon the Hon. Thurairasa Ravikaran?

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
Okay, Sir.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Thurairasa Ravikaran. You have seven minutes.

[பி.ப. 12.21]

**ගරු තුරෛරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்றைய விவாத விடயத்துக்கு வருவதற்கு முன்னர் ஒரு முக்கியமான விடயத்தைக் குறிப்பிட விரும்புகின்றேன். கிளிநொச்சி மாவட்டத்தின் உதயநகர் கிழக்குப் பகுதியைச் சேர்ந்த கணேஸ்குமார் சங்கீத்சன் என்னும் சொல்லிசைப் பாடகர் அண்மையில் பயங்கரவாதத் தடைச் சட்டத்தின்கீழ் கைது செய்யப்பட்டுச் சிறை வைக்கப்பட்டுள்ளார். இந்த நாட்டிலே தமது கருத்துகளைச் சுதந்திரமாக வெளிப்படுத்தியதற்காகக் காலத்துக்குக் காலம் இவ்வாறான கலைஞர்களும் படைப்பாளர்களும் ஊடகவியலாளர்களும் பயங்கரவாதக் குற்றத் தடுப்புப் பிரிவினரால் விசாரணைக்கு அழைக்கப்பட்டு அச்சுறுத்தப்பட்டுள்ளனர். பல படைப்புகள் வெளியீடு செய்ய முடியாமல் தடுத்து வைக்கப்பட்டுள்ளன. தற்போது இந்தக் கலைஞனுடைய கைது இடம் பெற்றிருக்கின்றது. இந்தச் சொல்லிசைப் பாடகர் கைது செய்யப்பட்டுச் சிறை வைக்கப்பட்டிருப்பதானது, கருத்துச் சுதந்திரத்தின்மீதான அடக்குமுறையினையே வெளிப்படுத்துகின்றது. இவ்வாறாக இந்த நாட்டில் ஓர் அடக்குமுறைக் கருவியாகப் பயங்கரவாதத் தடைச் சட்டம் பாவிக்கப்பட்டு வருகின்றது. எனவேதான், இந்த நாட்டுக்குப் பயங்கரவாதத் தடைச் சட்டம் தேவையில்லையென நாம் தொடர்ச்சியாக வலியுறுத்தி வருகின்றோம். இந்நிலையில் தற்போது பயங்கரவாதத் தடைச் சட்டத்தின்கீழ் கைது செய்யப்பட்டுத் தடுத்து வைக்கப்பட்டுள்ள சங்கீத்சன் உடனடியாக விடுதலை செய்யப்பட வேண்டுமென இந்த உயரிய சபையில் கோருவதுடன், இந்த நாட்டில் அடக்குமுறைக் கருவியாக உள்ள பயங்கரவாதத் தடைச் சட்டம் நீக்கப்பட வேண்டுமெனவும் வலியுறுத்திக் கேட்டுக் கொள்கின்றேன்.

அடுத்து, வட மாகாணக் கடற்றொழிலாளர்கள் தொடர்பில் ஒரு சிறு கருத்தைச் சொல்லுகின்றேன். முல்லைத்தீவு, மன்னார், கிளிநொச்சி, யாழ்ப்பாணம் என வட மாகாணத்தின் நான்கு மாவட்டங்களிலும் மிகவும் பாவப்பட்டவர்களாக இருக்கின்ற மீனவர்கள் இன்று மிகவும் மோசமான நிலைமைக்குத் தள்ளப்பட்டுள்ளார்கள். தடைசெய்யப்பட்ட, சட்டவிரோதச் செயல்களான சுருக்குவலை மீன்பிடி, வெளிச்சம்

[ගරු තුරෙයිරාසා රවිකරන් මහතා]

பாய்ச்சி மீன் பிடித்தல், 'டைனமைட்' வெடிவைத்து மீன் பிடித்தல் போன்ற தீய செயல்களால் வட பகுதியின் கடல் வளம் முற்றாக அழிந்து போகின்றது. இதனைத் தடுக்க வேண்டியவர்களான கடற்றொழில் திணைக்களத்தினரோ, கடற்படையினரோ செயலற்றவர்களாக இருக்கின்றார்கள். கடற்றொழில் திணைக்களத்தில் உள்ளவர்களிடம் கேட்டால், ஆளணிப் பற்றாக்குறை உள்ளதாகவும், இருக்கின்ற ஆளணிக்கு ஏற்பவே செயற்படுவதாகவும் சொல்கின்றார்கள். இந்தக் கோரிக்கைகளை நாங்கள் ஏற்கனவே கௌரவ கடற்றொழில் அமைச்சரிடமும் முன்வைத்திருக்கின்றோம். எனவே, தயவுசெய்து இந்த விடயத்தில் கவனம் செலுத்தி உரிய வகையில் அதனைச் சீர்செய்ய வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இலங்கை மத்திய வங்கிச் சட்டத்தின் கீழான விதிகள் மற்றும் அத்தியாவசிய பொதுச் சேவைகள் சட்டத்தின்கீழான தீர்மானம் என்பவற்றின்மீதான இன்றைய விவாதத்திலே, இந்த அவசரநிலை நாட்டின் தற்போதைய பொருளாதார நெருக்கடி நிலையின் ஒரு விம்பமாக வெளிப்பட்டு நிற்கின்றது. இலங்கையிலிருந்து பொருட்களை வெளிநாடுகளுக்கு ஏற்றுமதி செய்யும் ஏற்றுமதியாளர்கள் அதற்குப் பதிலாகப் பெறுகின்ற அமெரிக்க டொலர் உள்ளிட்ட அந்நியச் செலாவணியைக் கட்டாயமாக இலங்கைக்குள் கொண்டுவந்து, குறிப்பிட்ட காலக்கெடுவுக்குள் இலங்கை ரூபாயாக மாற்ற வேண்டும் என்ற கட்டுப்பாடு இந்த மத்திய வங்கிச் சட்டத்தின்கீழான விதிகள் ஊடாக மேலும் இறுக்கப்படுகிறது. ஒருபுறம் அந்நியச் செலாவணியின் கசிவை மேலும் குறைப்பதற்காகவும் அமெரிக்க டொலர் விநியோகத்தை அதிகரிக்கவும் ரூபாயை நிலைப்படுத்தவும் கையிருப்பை வலுப்படுத்தவும் மேற்கொள்ளப்படும் ஒரு முயற்சியாகவே இது அமைவதாக இருந்தாலும், மறுபுறம் இலங்கையில் வர்த்தகச் சுதந்திரம் மேலும் கடுமையான நெருக்கடிக்கு உள்ளாக்கப்படுவதையும் நாம் ஏற்றுக்கொள்ள வேண்டும்.

ஏற்றுமதிப் பெறுகைகளை நாட்டுக்குத் திருப்பி அனுப்புவதில் தற்போது இலங்கை மத்திய வங்கியால் கொண்டுவரப்பட்டுள்ள இப்புதிய கட்டுப்பாடுகள் உலக நாடுகளில் புதிதல்ல. ஆனால், இந்த நடவடிக்கை இவ்வாறான கடும் இறுக்க நிலைகளில் வர்த்தகப் பாய்ச்சல்களை மேற்கொள்ளும் ஆர்ஜென்டினா, எத்தியோப்பியா, நைஜீரியா, வியட்நாம், வங்காளதேசம் உள்ளிட்ட ஒரு சில நாடுகளின் வரிசையில் இன்றிலிருந்து இலங்கையும் இணைந்து கொள்கிறதோ என எண்ணவைக்கிறது. அந்நியச் செலாவணிக் கையிருப்பை வலுப்படுத்தும் தேவைப்பாடு தற்போது உள்ளபோதும், அதீத கட்டுப்பாடு ஏற்றுமதியாளர்களின் நம்பிக்கையைப் பலவீனப்படுத்தலாம். கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, பொருளாதார ரீதியாக வலுவான நாடுகள் ஒருபோதும் ஏற்றுமதியாளர்களை நெருக்கடிக்கு உள்ளாக்குவதில்லை. மாறாக, ஏற்றுமதியாளர்களை முடக்கும் நாடுகள் நிலையான பொருளாதார வளர்ச்சியைப் பெறுவதுமில்லை. இத்தகைய கட்டுப்பாடுகள், மாற்றுவழியற்ற ஒரு தற்காலிகத் தற்காப்பு நடவடிக்கையாக மட்டுமே இருக்க வேண்டும். அப்போதுதான் எதிர்காலத்தில் ஏற்றுமதிப் பாய்ச்சலை மேலும் விரிவுபடுத்த இயலும்.

ஒருபுறம் 185,000 மெற்றிக் தொன் அரிசியை கடந்த மூன்று பருவகாலங்களில் தேக்கிவைத்துத் தரமிழக்கச் செய்யும் நாம்தான் மறுபுறம் கையிருப்பிலுள்ள அமெரிக்க டொலரையும் கொடுத்து பொன்னி, பால் பொன்னி அரிசி வகைகளை இறக்குமதி செய்கின்றோம். 2026.04.21ஆம் திகதிய நிலவரப் படி, வட மாகாணத்தில் உள்ள 10 களஞ்சியசாலைகளில் 2025 சிறுபோக நெல் 5,729.072 மெற்றிக் தொன்னும், 32 களஞ்சியசாலைகளில் 2025/2026 பெரும்போக நெல் 16,913.496 மெற்றிக் தொன்னும் தேங்கிக் கிடந்து, தரமிழந்து செல்கின்றன. இன்னும் 3 மாதங்களுக்குள் மேற்படி களஞ்சியசாலைகளை வெறுமையாக்காதுவிட்டால், அடுத்துவரும் போக நெல் விளைச்சல்களின் சந்தைப்படுத்தல் களும் கேள்விக்குறியாகும். ஒருபுறம் இவ்வாறான உள்நாட்டு உற்பத்திகளை முறைமைப்படுத்துவதில் பலவீனப்படும் நாம், மறுபுறம் ஏற்றுமதியாளர்களை இறுக்கி நாட்டின் அந்நியச் செலாவணிக் கையிருப்பைத் தக்கவைக்கும் வழிகளைத் தேடுகிறோம்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Thurairasa Ravikaran, your time is up.

**ගරු තුරෙයිරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
Please give me one more minute, Sir.

வர்த்தகர்களைக் கட்டுப்படுத்தி அமெரிக்க டொலரை வாங்குவதைவிட, வெளிநாட்டு நாணயங்களை நாட்டுக்குள் கொண்டுவரும் வர்த்தகர்களுக்குச் சலுகைகளை வழங்குவது தொடர்பான சாத்தியப்பாடுகளை ஆராயலாம். இறக்குமதி களுக்குரிய பிரதியீடுகள் தொடர்பிலும் உள்ளூர் உற்பத்தியை வலுப்படுத்துவது தொடர்பிலும் ஆக்கபூர்வமான முடிவுகள் எட்டப்பட வேண்டும். உள்ளூரில் உற்பத்திகளை அதிகரிக்கும்போது, இறக்குமதிக்கான டொலர் தேவை தானாகவே குறையும். புலம்பெயர்ந்த மக்களின் முதலீடுகளை மேலும் ஈர்ப்பதற்குரிய வழிவகைகளை ஆராய்தல், தகவல் தொழில்நுட்பம், செயற்கை நுண்ணறிவு உள்ளிட்ட துறைகளிலான அறிவுசார் ஏற்றுமதிக்கான தளத்தைப் பாடசாலைகளில் இருந்து வலுப்படுத்தல் உள்ளிட்டவை நிலைபேறான அபிவிருத்தியை நிலைநிறுத்தும். திறன் வகுப்பறைச் சூழல், கணினியுடனான வகுப்பறைகள் என்பவற்றுக்கு மேலாக, இணையவலு குன்றிய நிலையில் உள்ள வகுப்பறைகளும் சீரான கற்றல், கற்பித்தல் செயற்பாடுகளுக்குச் சவாலாகின்றன என்பதைத் தெரிவித்துக் கொள்கின்றேன்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! The ongoing Proceedings of the House shall stay suspended till 1.00 p.m. for lunch.

*රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්,* ***අ.භා. 1.00ට*** *නැවත පවත්වන ලදී.*
*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று.*
*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Chathuranga Abeysinghe, please. You have 10 minutes.

[අ.භා. 1.00]

**ගරු චතුරංග අබේසිංහ මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்திப் பிரதி அமைச்சர்)
(The Hon. Chathuranga Abeysinghe - Deputy Minister of Industry and Entrepreneurship Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මාතෘකාව තමයි, විනිමය සම්බන්ධව ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ වන රීති. විශේෂයෙන්ම රටේ සමස්ත ආර්ථික තත්ත්වය පිළිබඳ සාකච්ඡා කරමින් තමයි අපි මේ කාරණය පිළිබඳව කථා කළ යුත්තේ.

අපි දන්නවා, වර්තමාන ආණ්ඩුව පසුගිය අවුරුදු එකහමාර ඇතුළත රටේ ආර්ථිකය ආකාර කිහිපයකින්ම ශක්තිමත් කර තිබෙන බව. මොකද, අපි ආර්ථිකයක් කියලා ගත්තාම, අපට විදේශීය ක්ෂේත්‍රයත් තිබෙනවා. ඒ කියන්නේ, ආනයන, අපනයන සහ ඩොලර් සම්බන්ධ ක්ෂේත්‍ර. තවදුරටත් කිව්වොත්, විදේශ විනිමය සම්බන්ධ ක්ෂේත්‍රය. ඊළඟට, දේශීය ආර්ථිකය තිබෙනවා. දේශීය ආර්ථිකය ගත්තොත්, අය වැය කළමනාකරණය කර ගැනීම, රජයේ ආදායම සහ වියදම කළමනාකරණය කර ගැනීම කියන ආර්ථික කටයුතු තිබෙනවා. ඊළඟට, අපි මූල්‍ය ක්ෂේත්‍රයේ ශක්තිමත්භාවය තේරුම් ගන්නේ, එහෙම නැත්නම් එහි තිබෙන ස්ථාවරත්වය තේරුම් කර ගන්නේ, පොලී අනුපාත, උද්ධමනය වාගේ කාරණාවලින්. සමස්තයක් විධියට මෙන්න මේ ක්‍රියාවලිය අපේ රටේ දැන් ඉතාම ශක්තිමත් ලෙස ක්‍රියාත්මක වෙනවා. ස්වාධීන ආයතනයක් විධියට ශ්‍රී ලංකා මහ බැංකුව, මහ බැංකු පනත යටතේ ඔවුන්ගේ කාර්යභාරය ඉෂ්ට කරනවා. ඒ වාගේම, භාණ්ඩාගාරය මූල්‍ය පද්ධතිය, ආදායම් වියදම් කළමනාකරණය කර ගනිමින් ශක්තිමත් ආර්ථික වර්ෂයක් 2025 දී නිර්මාණය කර ගත්තා. මේක කාටවත් deny කරන්න බැහැ. මොකද, ආර්ථිකය ගැන මෙතැන ගොඩක් භය හිතෙන කථා පවත්වන, ආර්ථිකය ගැන උපදෙස් දෙන අය දන්නවා, 1970 ඉඳලා ගත්තත් ලංකා ඉතිහාසයේ ශක්තිමත්ම ආර්ථික නිර්ණායක බිහි වුණේ 2025 වර්ෂයේ බව. ලංකා ආණ්ඩුවේ ආදායමින් වැඩි කොටසක් ණය පොලිය ගෙවන්න වැය වෙනවා කියලා අපි දන්නවා. එසේ ණය පොලිය ගෙවන්න වන හේතුව තමයි, කාලාන්තරයක් තිස්සේ අපේ අය වැයේ ප්‍රාථමික ගිණුමේ හිඟ ශේෂයක් පවත්වාගෙන යෑම. ඒ කියන්නේ, අපේ ආදායමට වැඩිය වියදම වැඩි නිසා අඛණ්ඩව ණය ගන්න සිද්ධ වුණා. එසේ ණය ගන්න සිද්ධ වීම තුළින් පොලියක් ගෙවීමට සිදු වෙනවා. ඒ නිසා රටේ ජනතාවට සුබසාධනය සපයන්න, රටේ සංවර්ධනයට ආයෝජනය කරන්න තිබුණු ධනය ඒ සඳහා වැය වෙනවා. විශේෂයෙන්ම අද වෙනකොට රුපියල් ට්‍රිලියන 2.5ක් විතර වැය වෙන්නේ ණය සහ පොලිය ගෙවන්න. ඉතින්, එම ප්‍රමාණය අඩු කරලා, ඒකෙන් සැහෙන ප්‍රමාණයක් අපේ ආදායමින්ම පියවා ගන්න පුළුවන් තත්ත්වයක් ඇති වීම නිසා දැන් රටේ ආර්ථිකය හොඳ දිශානතියකට යනවාය කියන විශ්වාසය ගොඩනැඟිලා අවසන්.

අපි විදේශීය අංශය ගත්තොත්, විදේශ ආදායම් ප්‍රමාණය අඛණ්ඩව වැඩි කර ගැනීම තමයි අපට අවශ්‍යව තිබෙන්නේ. ඒ සඳහා අවශ්‍ය සංචාරක ව්‍යාපාරය, ප්‍රේෂණ, අපනයන කියන මේ සියල්ලම අඛණ්ඩව වර්ධනය වන තත්ත්වයක් තමයි ලංකාවේ තිබුණේ.

අපනයන ප්‍රමුඛ ආර්ථිකයක් හදනකොට, ආර්ථිකය ප්‍රසාරණය වෙනකොට, දේශීය නිෂ්පාදනය වැඩි වෙනකොට, පුද්ගලයන් ආයෝජනය කරනකොට ආනයන සඳහා වන ඉල්ලුමත් වැඩි වන බව අපි හොඳින්ම දන්නවා. මොකද, ආනයනවලට තිබෙන ඉල්ලුම වැඩි නොවී අපනයන ප්‍රමුඛ ආර්ථිකයක් හදන්න බැහැයි කියන එක සියලුදෙනාම දන්නා කාරණයක්.

පසුගිය කාලයේ අපට ඇති වුණු තත්ත්වය ගත්තොත්, අපි ඉතාම සාර්ථකව මේ නිර්ණායක අනුව ආර්ථික කටයුතු කරගෙන යනකොට, ඒ ආර්ථික කටයුතුවලට පරිබාහිරව විදේශයේ සිද්ධ වුණු යුද තත්ත්වයක් නිසා අපට බාහිර කම්පනයක් ඇති වුණා. ඒ බාහිර කම්පනය ඇති වුණාට පස්සේ, ඒ බාහිර කම්පනයේ ප්‍රතිඵලයක් විධියට තමයි මේ වෙනකොට අපේ ආනයන බිල, එහෙම නැත්නම් ආනයන සඳහා දරන්න වන පිරිවැය, විශේෂයෙන්ම බලශක්ති ක්ෂේත්‍රය සඳහා යන ආනයන පිරිවැය ඉහළ ගිහිල්ලා තිබෙන්නේ. ඒ නිසා අපේ රට තුළ ඩොලර්වලට තිබෙන ඉල්ලුම වෙනදාට වඩා වැඩිවෙලා තිබෙනවා. මේ ක්‍රියාවලිය ඇතුළේ පසුගිය මාසය, මාස එකහමාර ගත්තොත් අපේ විදේශ විනිමය ක්ෂේත්‍රයේ විචල්‍යතාවක් ඇති වුණා. මේක තාවකාලික විචල්‍යතාවක් කියලා මහ බැංකුව ඉතා පැහැදිලිව පැහැදිලි කර තිබෙනවා.

ලංකාවේ විනිමය අනුපාතය දැන් කළමනාකරණය වෙන්නේ මීට කලින් ආණ්ඩුවලින් කළ විධියට නොවෙයි. ඔබ දන්නවා, අපේ රට බංකොලොත් වෙන්න බලපෑ ප්‍රධානම හේතුවලින් එකක් තමයි රාජ්‍ය ආදායම අහිමි කර ගැනීම කියන එක. දෙවැනි විශේෂ කාරණය තමයි, රුපියල් 218න් එහාට exchange rate එක යන්න දෙන්නේ නැහැ කියලා බලහත්කාරයෙන් අල්ලාගෙන, ලංකාවේ තිබුණ reserves ඔක්කෝම පුච්චා ගත්තා, එහෙම නැත්නම් විනාශ කර ගත්තා ඒ ආණ්ඩු. ඒ හරහා තමයි ඒ ආර්ථික අර්බුදය ඇති වුණේ. ඒ විනිමය අර්බුදය ඇති වුණේ. ඒ වැරැද්ද නැවත කරන්නේ නැහැ කියන නීතිමය ප්‍රතිපාදන යටතේ, ඒ වැරැද්ද නැවත කරන්නේ නැහැ කියන විනය යටතේ තමයි රට ඉස්සරහට යන්නේ. ඒ නිසා තමයි දැන් එකඟ වෙලා තිබෙන්නේ ඉල්ලුම හා සැපයුම මත ලංකාවේ විනිමය අනුපාතය තීරණය වෙන්නේ කියන එකට.

මේ ඉල්ලුම හා සැපයුම මත විනිමය අනුපාතය තීරණය වෙනකොට මහ බැංකුවට වගකීමක් තිබෙනවා, මේ ඉල්ලුම හා සැපයුම අතර යම් කිසි අවස්ථාවක අනවශ්‍ය විචල්‍යතාවක් ඇති වෙනවා නම් මැදිහත් වෙන්න. ඒ අනවශ්‍ය විචල්‍යතාවක් ඇති වෙනකොට විවිධාකාරයෙන් මහ බැංකුවට මේ වෙළෙඳ පොළට මැදිහත් වෙන්න පුළුවන්. මීට කලින් කළා වාගේ විනිමය එක තැනක හිර කරගෙන අපේ සමස්ත reserves නැති කර ගන්න ක්‍රමයක් නොවෙයි දැන් තිබෙන්නේ. ඔවුන් කාලයෙන් කාලයට විවිධ තීරණ ගන්නවා. ඒ අතරේ අපට පෙනෙනවා යම් කිසි කාලවල මහ බැංකුව වෙළෙඳ පොළෙන් ඩොලර් මිලදී ගන්නවා. යම් කිසි කාලවල වෙළෙඳ පොළට ඩොලර් නිකුත් කරනවා. පසුගිය කාලයේ ලෝකයේ තිබුණු වෙනස්කමත් එක්ක සමපේක්ෂණ චේතනාවෙන්, එහෙම නැත්නම් exchange rate එකට ඉස්සරහට මොකද වෙන්නේ කියන අපේක්ෂාව මත ආනයනකරුවන්, අපනයනකරුවන් සහ ඩොලර් ගනුදෙනු කරන්නන් විවිධ තීරණ ගන්න පටන් ගත්තා. ඒ තීරණ ගන්න පටන් ගැනීම තුළ තමයි අපේ විනිමය විචල්‍යතාවකට ලක් වෙන්න පටන් ගත්තේ. ඒ අනුව ගත්ත එක තීරණයක් තමයි අද මේ අවස්ථාවේ අපි මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේ.

ඔබතුමන්ලා දන්නවා, 2021දී ඒ විනිමය අර්බුදය වෙලාවේ විවිධාකාර බාධා, විවිධාකාර සීමා පනවලා තමයි ඒක සමනය කර ගන්න අවුරුදු ගණනක් ගියේ කියන එක. එතැනදී ගන්න එක ක්‍රියාමාර්ගයක් විධියට තමයි මේ අපනයනය කරන භාණ්ඩවලට එන ඩොලර් ප්‍රමාණය යම් කිසි කාල සීමාවක් තුළ නැවතත් රුපියල් බවට පත් කළ යුතුයි කියන නීතිය තිබෙන්නේ. තාවකාලික අවශ්‍යතාවක් නිසා තමයි මේ රීතිය දැන් මහ බැංකුව විසින් ඉදිරිපත් කරන්නේ. මේ ගැන ඉතාම පැහැදිලි අවබෝධයක් ලබා ගන්න ඕනෑ. අපනයනකරුවන්ට හානියක් නොවන ආකාරයේ ක්‍රියාවලියක් මෙතැන තිබෙන්නේ. අපනයනකරුවන්

[ගරු චතුරංග අබේසිංහ මහතා]

ගෙනෙන සියලු මුදල් ඊළඟ මාසයේ 10වැනි දා වෙනකොට convert කළ යුතුයි, එහෙම නැත්නම් රුපියල් බවට පත් කළ යුතුයි කියන නියමය නොවෙයි මෙතැන තිබෙන්නේ. ඔවුන්ගේ කාරණා සියල්ල ඉෂ්ට කරගත්තාට පස්සේ අතිරික්ත මුදලක් තිබෙනවා නම්, ඒ අතිරික්ත මුදල තමයි automatically නැති වෙන්නේ. ඊළඟ මාසයට ඔවුන්ට අවශ්‍ය අමුද්‍රව්‍ය ගෙන්වා ගන්න, අවශ්‍ය ඩොලර් වියදමක් කරගන්න, අවශ්‍ය ලාභාංශ ගෙවාගන්න, අවශ්‍ය විදේශ සංචාරයක් යන්න, ආයතනය ගෙවිය යුතු ඩොලර් ණයක් තිබෙනවා නම් ඒක පියවන්න - මේ සියලු දේවල්වලට - යන මුදල් අයින් කළාට පස්සේ යම් කිසි ප්‍රමාණයක් ඉතිරි වෙන්න පුළුවන්. අන්න ඒ ඉතිරි වෙන ප්‍රමාණය තමයි සෘජුවම, එහෙම නැත්නම් automatically බැංකු ක්ෂේත්‍රය මඟින් රුපියල් බවට පත් කරගන්නේ. මේකෙන් මහ බැංකුව බලාපොරොත්තු වෙනවා, ඩොලර් වෙළෙඳ පොළට, නැත්නම් ඩොලර් ඉල්ලුම් කරන අයට ඩොලර් ප්‍රමාණයක් ලබාගන්න. තාවකාලිකව ඇතිවෙච්ච විචල්‍යතාවට විසඳුමක් විධියට තමයි 2024දී ඉවත් කරපු මේ රීතිය නැවතත් ගෙනැල්ලා තිබෙන්නේ.

මහ බැංකුව සතුව මේවාගේ විවිධ tools තිබෙනවා. මහ බැංකුව ස්වාධීන ආයතනයක් විධියට විනිමය අනුපාතිකයේ විචල්‍යතාව අවම කරගන්න ඒ එක් එක් උපක්‍රම භාවිත කරනවා. මීට කලින් මේ රටේ ලොකු ප්‍රශ්නයක් ඇති වෙච්ච වෙලාවේ වෙළෙඳ පොළ පොලී අනුපාතිකය - interest rate එක - ඉතාම ඉහළ මට්ටමකට අරගෙන ගිහිල්ලා ආනයනය කිරීමේ හැකියාව සම්පූර්ණයෙන්ම ඉවත් කළා. ඒ වාගේම ආනයනය කරන භාණ්ඩ එකසිය ගණනක් ලංකාවට ගේන්න බැහැ කියලා තහනම් කළා. අපි මේ අවස්ථාවේ රජයක් විධියට කරන්නේ ආර්ථිකය අඛණ්ඩව තල්ලු කරගෙන යන ගමන්, ඇතිවන විවිධ කම්පනවලට, විචල්‍යතාවලට යම්කිසි adjustments කරමින්, යම් කිසි වෙනස්කම් කරමින් ආර්ථිකය අඛණ්ඩව ගලාගෙන යන්න අවස්ථාව දෙන එකයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වර්තමාන රජයටත්, මහ බැංකුවටත් හැකියාව ලැබිලා තිබෙනවා, මේ අර්බුදකාරී වසර ඇතුළේත් සියලු ආනයන අපනයන කටයුතු සිද්ධ කරමින්, නිෂ්පාදන ක්‍රියාවලිය අඛණ්ඩව සිද්ධ කරමින්, ලෝකයේ තිබෙන අර්බුදයටත් මුහුණ දෙමින් අඛණ්ඩව අපනයන ක්ෂේත්‍රය වැඩි කරගන්න. මැයි මාසයේ සංචාරක ක්ෂේත්‍රය නැවත පණ ගහලා 2025 වර්ෂයට වඩා සියයට නවයක වර්ධනයක් වාර්තා කරලා තිබෙනවා. අපි රටක් විධියට ඉදිරියට යන්නේ, මේ සියලු කාරණා සමස්තයක් විධියට බලමින්. ඒ නිසා එක් එක් කාරණා වියුක්තව සාකච්ඡා කරනවාට වඩා සාර්ව ආර්ථිකයේ ප්‍රතිඵල පිළිබඳව බලන්නත් අපි කටයුතු කරනවා. භාණ්ඩාගාරය මේ වෙනකොට ඉතාම ශක්තිමත්ව ආදායම් එකතු කරගනිමින් යනවා. මේ ක්‍රියාවලිය සමස්තයක් විධියට සිදුකරමින් අපි රටක් විධියට ශක්තිමත්ව අනාගතයට මුහුණ දෙමු කියා සඳහන් කරනවා. විශේෂයෙන්ම අපනයනකරුවන්ට අවශ්‍ය සහන සපයන්න, ඔබලාට අවශ්‍ය සහාය දෙන්න රජය බැඳී සිටිනවා. නමුත් කෙටිකාලීන අවශ්‍යතාවකට තමයි අපි මේ දේ සිද්ධ කරන්නේ කියන අවබෝධය ලබාගන්න කියන ඉල්ලීම මම කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. S.M. Marikkar. You have 11 minutes.

[අ.භා. 1.11]

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ කථාව ආරම්භයේදී මේ කාරණය කියන්න ඕනෑ. සභානායකතුමා එතුමාගේ කථාවේදී කිව්වා, "Rebuilding Sri Lanka" අරමුදල හරහා ආපදා සියල්ලටම මුදල් ලබා දුන්නා වාගේ කාරණයක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාට මනාප 12,000ක් ලැබුණු කොලොන්නාව ආසනයේ ගෙවල් 30,000ක් ගංවතුරට යට වුණා. හැබැයි, ගෙවල් 10,000කට එහා ප්‍රමාණයකට ඔප්පු නැහැ කියලා, අනවසර පදිංචිකරුවන් කියලා අද වෙනකම් නිවාස වන්දිය ගෙවලා නැහැ. මේක සාධාරණද? මේක හරිද? එහෙමද කිව්වේ? තහඩුවක් ගියත් ලක්ෂ 10ක් දෙනවා කියලා නේ කිව්වේ. මාලිමාවට ඡන්දය දුන් අයට තමයි මේ වන්දි මුදල් ලබා දීම කරන්නේ. මම ඊට වඩා ඒක ගැන කියන්නේ නැහැ.

මේ ආණ්ඩුවේ අකාර්යක්ෂමතාව ගැන මම කියන්න යන්නේ නැහැ. උදාහරණයක් ගත්තොත්, මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් අත්අඩංගුවට පත් වුණා. දැන් replacement එකක් දාගන්න බැහැ; තවම තනතුර හිස්. ඇමතිවරයෙක් ඉල්ලා අස්වුණා, අලුතින් ඇමතිවරයෙක් දාන්න බැහැ. ඉන්න කෙනෙක් දානවා, වැඩ බලන්න. මේ විධියට ආයතන ගණනාවකට කවුරුවත් පත් කරලා නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට පෙර කථා කළ නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා, රුපියල බලෙන් අල්ලාගෙන ඉන්නේ නැහැ ලු. හැබැයි, ඇඩ්වොකාටා ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරී ධනනාත් ප්‍රනාන්දු කියනවා, මැයි මාසයේ විතරක් ඇමෙරිකානු ඩොලර් මිලියන 220ක් සංචිතයෙන් එළියට දීලා තිබෙනවා, රුපියල අල්ලාගෙන ඉන්න කියලා. නියෝජ්‍ය ඇමතිතුමා මේ මොනවාද කියන්නේ කියලා මම දන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහා භාණ්ඩාගාරයේ වාර්ෂික වාර්තාව නිකුත් වෙලා තිබෙනවා. ආයතන 527ක් රජය යටතේ තිබුණාට මේ වාර්තා නිකුත් කරන්නේ ආයතන 51කට. ඉතුරු ආයතන 476ම වාර්තා නැහැ. මේ ආයතන 51 සංසන්දනය කෙරුවොත් මූල්‍ය විනය - fiscal discipline - තියාගෙන මේගොල්ලන් ගන්නවා කියපු ලාභය අරගෙන තිබෙන්නේ බිලියන 444යි. හැබැයි, රටේ අර්බුදයක් තිබෙන වෙලාවේත් බිලියන 445ක් අරගෙන තිබෙනවා. 2024 අවුරුද්දේ බිලියන 539ක් අරගෙන තිබෙනවා. දැන් මාර වැඩ්ඩෝ, ඇවිදින පුස්තකාල ඇවිල්ලා අරගෙන තිබෙන්නේ බිලියන 444යි. මේකේ return on investment අරගෙන බැලුවොත්, මොකක්ද පෙනෙන්නේ? ලංකාවේ asset base එකෙන් ට්‍රිලියන 16.5ක්, ඒ කියන්නේ දළ ජාතික නිෂ්පාදනයෙන් සියයට 50ක් රාජ්‍ය ආයතන සතුව තිබෙනවා. දැන් මේකේ return එක බැලුවාම බිලියන 444යි. Financial sector එකෙන් තමයි ආණ්ඩුව ලාභ ලබාගෙන තිබෙන්නේ. BoC, People's Bank, National Savings Bank ලාභ ලබලා තිබෙනවා. BoC එක බිලියන 120ක් ලාභ පෙන්වලා තිබෙනවා.

රාජ්‍ය ඒකාධිකාරය - monopoly - තිබෙන තැන්වල තමයි ලාභ ලබලා තිබෙන්නේ. තරගකාරිත්වය තිබෙන හැම තැනකම රාජ්‍ය ආයතන අකාර්යක්ෂමයි; පාඩුයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උදාහරණයක් විධියට මම මේ ආයතන ගැන ඔබතුමාට පැහැදිලිව කියන්නම්. ලංකා විදුලිබල මණ්ඩලය 2024දී බිලියන 141ක් ලාභයි. මෙතුමන්ලාගේ ආණ්ඩුව ආවාට පස්සේ වාර්ෂික වාර්තාව අනුව, බිලියන 30.23ක් පාඩුයි. ගිය අවුරුද්දේ බිලියන 30.23ක් පාඩුයි. ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් එක බිලියන

25.3ක් පාඩුයි. ආණ්ඩුව capital support එකක් දීලා තිබෙනවා, බිලියන 23.2ක. පසුගිය අවුරුද්දේ විතරක් SriLankan Airlines එකේ net loss එක බිලියන 48ක්. National Water Supply and Drainage Board එක පෙන්වනවා, බිලියන 31.6ක් ලාභයි කියලා. හැබැයි, ආණ්ඩුවෙන් Budgetary support එක අරගෙන තිබෙනවා; ආණ්ඩුවෙන් දීලා තිබෙනවා, බිලියන 45.6ක්. හරි විධියට බැලුවාම National Water Supply and Drainage Board එකේ net loss එක බිලියන 14ක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කටින් කොච්චර බතල කොළ හිටෙව්වත් මහා භාණ්ඩාගාරයේ වාර්ෂික වාර්තාවේ මේවා තිබෙනවා.

ඊළඟට ගන්නකෝ, construction industry එක. ගිය අවුරුද්දේ මිලියන 759ක් පාඩුයි. 2024දී මේ ආණ්ඩුව පෙරළන්න කලින් බිලියන 529ක් ලාභ ලැබුවා. වැඩ්ඩෝ, කිඩ්ඩෝ, පොරවල් ඔක්කෝම ආවාට පස්සේ ඒක බිලියන 444ට අඩු වෙද්දී, ඇත්ත වශයෙන්ම ඒ ලාභ ලබපු ආයතනවලට බිලියන 103ක Budgetary support එකක් දීලා තිබෙනවා. ඒ ලාභ ලබපු බිලියන 444න් levies and dividends වශයෙන් මහා භාණ්ඩාගාරයට ඇවිල්ලා තිබෙන්නේ බිලියන 56.5යි. එතකොට ඇවිල්ලා තිබෙන ලාභය බිලියන 47යි. මහා භාණ්ඩාගාරය බිලියන 103ක් දීලා බිලියන 56.5යි ඇවිල්ලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක අපේ ඇස් ඇරෙන්න ඕනෑ තත්ත්වයක්. මොකද දන්නවාද? පාඩු ලබන ආයතන මේ විධියට කරගෙන ගිහිල්ලා මේ රට කොහේටද ගෙන යන්නේ? ගිය අවුරුද්දේ උද්ධමනය බැලුවාම දළ වශයෙන් ඍණ දශම පහක් තිබුණා. මේ අවුරුද්දේ පෙබරවාරි වෙනකොට 1.6යි. මාර්තු 2.2යි. අප්‍රේල් වෙනකොට 5.4යි. මේක හතට ගියොත් මොකක්ද වෙන්නේ? කවුද ඒකට උත්තර දෙන්නේ? ඒකට උත්තර දෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම මම ඉතා පැහැදිලිව මේ කාරණයත් කියන්න ඕනෑ. අපේ නියෝජ්‍ය ඇමතිතුමා කියනවා, ඉන්ධනවලට වැඩි මිලක් ගෙවන්න වෙලාලු. මේ අවුරුද්දේ ජනවාරි මාසයේ සිට අප්‍රේල් මාසය දක්වා විතරක් ඇමෙරිකානු ඩොලර් බිලියනයක් ඉන්ධනවලට ගෙවන්න සිද්ධ වෙලා තිබෙනවා. හැබැයි, ගිය අවුරුද්දේ ඉන්ධන සඳහා සම්පූර්ණ අවුරුද්දටම වියදම් කළේ ඇමෙරිකානු ඩොලර් බිලියන 1.5යි. ලෝක වෙළෙඳ පොළේ ඉන්ධන මිල වැඩි වීම විතරක් නොවෙයි ඒකට හේතුව. බාල ගල් අඟුරු නිසා අවශ්‍ය මෙට්‍රික් ටොන් ප්‍රමාණය ගණනය කරගන්න බැරි නිසා ඒ ප්‍රමාණය එන්නේ නැති වීම තමයි හේතුව. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සභාපතිගේ කටින්ම පිට වුණා, තෙල් නැවක් සම්පූර්ණයෙන්ම ගෙනෙන්න වුණා කියලා ගල් අඟුරුවලින් නොලැබෙන විදුලිය ලබාගන්න. මැයි මාසයේ විතරක් ඇමෙරිකානු ඩොලර් මිලියන 521ක් තෙල්වලට වියදම් කරලා තිබෙනවා.

ඊළඟට, මම මේ කාරණය කියන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. IMF එක මේගොල්ලන්ට target එකක් දීලා තිබුණා අවුරුද්ද ඉවර වෙනකොට සංචිතය ඩොලර් බිලියන 9.5කට ගෙනයන්න ඕනෑ, ආර්ථික වර්ධන වේගය සියයට 4ක තබාගන්න ඕනෑ කියලා. හැබැයි, දැන් සංචිතය ඩොලර් බිලියන 8.65කට ගෙනයනවා කියලා කියනවා, ආර්ථික වර්ධන වේගය සියයට 3යි කියලා කියනවා. ඇත්ත වශයෙන්ම තව ඩොලර් බිලියන 2කට ආසන්න ප්‍රමාණයක් අවශ්‍යයි ඉලක්කයට. අලුත් ආදායම් මාර්ග නැතිව සෘජු විදෙස් ආයෝජන වශයෙන් එක ඩොලරයක් ඇවිල්ලා නැහැ. කොටස් වෙළෙඳ පොළට ආපු ඩොලර් මිලියන 10 විතරයි තිබෙන්නේ. එහෙම නම් කොහෙන්ද මේ ඩොලර් සංචිතය වැඩි කරන්නේ? මෙතැන පාරම් බෑවාට, social mediaවල සිංහලෙන් ලස්සන වචන හදලා සුරංගනා කථා පොත් මැව්වාට ආයෝජකයන් එන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. යටිතල පහසුකම් ක්ෂේත්‍රයේ ඕනෑ තරම් ආයෝජන අවස්ථා තිබෙනවා. හරි නම් අපේ රටේ ජනාධිපතිතුමා ලංකාවේ Chief Financial Officer වෙන්න ඕනෑ. ජනාධිපති කාර්යාලයේ වෙනම ඉඩ ප්‍රස්ථාවක් තිබෙන්න ඕනෑ නීති ලිහිල් කරලා, පගා ගෙවන්නේ නැතිව කෙළින්ම ආයෝජකයන්ට ආයෝජන අවස්ථාවලට chance එක ලබාගන්න. එහෙම වැඩ පිළිවෙළක් නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. කොහොමත් දැන් රජයට හැම ව්‍යාපාරයකින්ම - පෞද්ගලික අංශයේ ව්‍යාපාරවලිනුත් - කොටස් එනවා. මොකද, Corporate Tax එක සියයට 10ක් දාලා තිබෙනවා, VAT එක සියයට 18ක් තිබෙනවා. ඒ අනුව පෞද්ගලික අංශයෙනුත් ලාභ ලැබෙනවා. ඒ නිසා රාජ්‍ය ආයතනවල තිබෙන අකාර්යක්ෂමතා තේරුම් අරගෙන, ආණ්ඩුව තවදුරටත් සීනි විකුණන්නයි, තෙල් විකුණන්නයි, අරවා විකුණන්නයි, මේවා විකුණන්නයි යන්නේ නැතිව regulator විධියට ඉඳගෙන රාජ්‍ය ආදායම වැඩි කරගැනීම සඳහා කටයුතු කරන්න ඕනෑ. නීතියේ ආධිපත්‍යය පොළොවේ තහවුරු කරලා regulator වීම කළ යුතුයි කියන එක භාණ්ඩාගාරයේ මේ වාර්ෂික වාර්තාව බැලුවාම පෙනෙන කතන්දරයක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා සංචාරක කර්මාන්තය වැඩිවෙලාලු. ඒක පට්ටපල් බොරුවක්. අප්‍රේල් මාසයේ පැමිණි සංචාරකයන් ගණන 135,643ක් දක්වා - සියයට 22.3කින් - අඩුවෙලා තිබෙනවා. විදේශ ශ්‍රමිකයන්ගෙන් එන ප්‍රේෂණ තමයි ඩොලර් මිලියන 861ක් දක්වා වැඩිවෙලා තිබෙන්නේ. දැන් ඇමෙරිකානු tariff එකත් එක්ක අපේ රටේ අපනයනවලට තර්ජනයක් තිබෙනවා. ඒ නිසා දැන්වත් ඇහැරෙන්න. මේ තිත්ත ඇත්ත තේරුම් ගන්න. ඔය පරණ වාමාංශික මනස්ගාතවලින් වැඩක් නැහැ. ජනාධිපතිතුමා මේ ඇත්ත තේරුම් අරගෙන තිබෙනවා. මේක තේරුම් අරගෙන තිබෙන නිසා තමයි එතුමා කිව්වේ පාඩු ලබන රාජ්‍ය ආයතන වහන්නත් තව ගණනක් වියදම් කරන්න වෙනවා කියලා. පාඩු ලබන රාජ්‍ය ආයතන වහන්නත් තව ගණනක් වියදම් කරන්න වෙනවා කියන ඇත්ත එතුමා තේරුම් අරගෙන තිබෙනවා. මේ යථාර්ථය තේරුම් නොගත්තොත් අපේ රටේ ආර්ථිකයට විශාල පාඩුවක් සිද්ධ වෙනවා.

පාඩු ලබන රාජ්‍ය ආයතන ලෙස නම් කර තිබෙන මේ ආයතන 51න් විතරක් දැන් රුපියල් බිලියන 69.8ක් පාඩු ලබනවා. ඒකට budgetary support එකක් විධියට ආණ්ඩුවෙන් රුපියල් බිලියන 103ක capital එකක් දීලා තිබෙනවා. එතකොට ඔය ආයතන 51න් සිදු වන ඇත්ත පාඩුව රුපියල් බිලියන 172ක්. අර ලාභ ලබන ආයතනවල ලාභාංශයි, මේ පාඩු ලබන ආයතනවල සමස්ත පාඩුවයි බැලුවොත්, ඇත්ත වශයෙන්ම මේ ආයතන 51න් රුපියල් බිලියන 120ක පාඩුවක් සිදුවෙලා තිබෙනවා. ඒ නිසා දැන්වත් වෙළෙඳ ඒකාධිකාරය නැතිව, රාජ්‍ය ආයතනවලට ව්‍යාපාර කරන්න බැරි යථාර්ථය තේරුම් ගන්න. රජයේ මූලික කාර්යභාරය නීතියේ ආධිපත්‍යය රකිමින් regulator විධියට ආදායම් උපයනවා විනා, පොල්තෙල් විකුණලා, සීනි විකුණලා, එක එක පොඩි පොඩි දේවල් කරලා ආදායම් හොයන එක නොවෙයි කියන කාරණය නැවත නැවතත් මම කියනවා. මේ යථාර්ථය තේරුම් ගන්න කියන එක අපි ආණ්ඩුවට කියන්න කැමැතියි. මේ රුපියල් බිලියන 120ක් පාඩු වන මුදල තිබෙනවා නම් මාස 6කට අස්වැසුම දෙන්න පුළුවන්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එහෙම නැත්නම් දැන් අස්වැසුම ලෙස ගෙවන ගණන සියයට 50කින් වැඩි කරලා අවුරුද්දක් අස්වැසුම දෙන්න පුළුවන්. මේ තිත්ත ඇත්ත තේරුම් නොගෙන වෙන වෙන ඒවා කථා කරලා මේක කරන්න බැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. S.M. Marikkar, your time is up.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
මම ඉක්මනින් අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අවසාන වශයෙන් මම මේ කාරණය කියනවා. ඔයගොල්ලන්ට හොරු අල්ලන්නත් බැහැ, ආර්ථිකය හදන්නත් බැහැ. ඔබතුමන්ලාට තව අවුරුදු 3ක් තිබෙනවා නේ. අඩුම ගාණේ දැන්වත් මේ යථාර්ථය තේරුම් අරගෙන මේ රටේ ඩොලර් ආදායම් වැඩි කරලා ණය බර අඩු කරන්න. අනුර කුමාර දිසානායක මහත්තයා ජනාධිපති වනකොට තිබුණු ණය ප්‍රමාණය ඩොලර් බිලියන 93යි, දැන් ඒ ප්‍රමාණය ඩොලර් බිලියන 107.2යි. මේ මොකුත් කරලා නොවෙයි, ලොකු ලොකු දේවල් කරලා නොවෙයි, පිටකොටුවේ බස් ස්ටෑන්ඩ් එකේ ඉස්සරහ පාට කරලා, පිටුපස කොළවලින් වහලා. එම නිසා දැන්වත් මේ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා සාධනීය පියවර අරගෙන ආයෝජකයන්ගේ විශ්වාසය තහවුරු කරලා, ඔවුන්ට තිබෙන බාධා ලිහිල් කරලා, ඩොලර් ආදායම් වැඩි කර ගැනීමට අවශ්‍ය කටයුතු කරන ලෙස ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Nishantha Jayaweera. You have ten minutes.

[අ.භා. 1.23]

**ගරු නිශාන්ත ජයවීර මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிசாந்த ஜயவீர - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Nishantha Jayaweera - Deputy Minister of Economic Development)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින පාර්ලිමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කර තිබෙන 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ වූ රීති අදාළ වන්නේ අපනයන ඉපැයීම් ලංකාවට ගෙන ඒමේදීයි. අපි බලමු, මේ රීති මොනවාද කියලා. මෙතෙක් කාලයක් ඕනෑම අපනයනකරුවෙක් තමන්ගේ අපනයන වෙනුවෙන් කරන ඉපැයීම් මාස 6ක කාල සීමාවක් ඇතුළතදී ලංකාවට රැගෙන එන්න ඕනෑ. එලෙස මාස 6ක කාල සීමාවක් ඇතුළත රැගෙන එන එම අපනයන ඉපැයීම් විදේශ ව්‍යවහාර මුදල් විධියට තමන්ගේ බැංකු ගිණුමක තැන්පත් කරලා, ඒක උපරිම මාස 3ක - දවස් 100ක - වාගේ කාලයක් තබාගන්න පුළුවන්. එසේ තබාගෙන ලංකාවේ මුදල් බවට පරිවර්තනය කරන්න ඕනෑ. මෙන්න මේ ගෙන එන සංශෝධනය ඇතුළේ මාස 6ක කාලයක් තුළ ගෙනෙන්න ඕනෑ ඒ අපනයන ඉපැයීම් එක්කම, ලංකාවේ තමන්ගේ ගිණුමේ එම මුදල් තබාගන්න පුළුවන් කාල සීමාවත් යම් ප්‍රමාණයකින් අඩු කරනවා. මේ අඩු කරන්නේ ඒ සියලු අපනයන ඉපැයීම් නොවෙයි. ඒගොල්ලන්ට ලංකාවේ රුපියල් බවට පරිවර්තනය කරන්න වෙන්නේ තමන් ගෙනෙන අපනයන ඉපැයීම්වලින් කොටසක් පමණයි. ඒගොල්ලන්ට තම ඉපැයීම්වලින් අඩු කර ගන්න අවස්ථාව හම්බ වෙනවා, තමන්ගේ අපනයනය වෙනුවෙන් ආනයනයක් කරන්න ඉන්නවා නම්, ඒ ආනයනය වෙනුවෙන් දරන්න වන මුදල් ප්‍රමාණය. ඒක ඔවුන්ට තබාගන්න පුළුවන්. ඊට අමතරව කවුරු හරි කෙනෙක් විදේශයකින් ණයක් අරන් තිබෙනවා නම්, ඒ අරන් තිබෙන ණය වෙනුවෙන් විදේශවලට විදේශ මුදලින් ගෙවන්න වන ණය වාරික ප්‍රමාණයත් අඩු කර ගන්න පුළුවන්. ඊටත් අමතරව තමන් යටතේ විදේශීය ශ්‍රමිකයන් සේවයේ නියුක්ත වෙනවා නම්, ඒගොල්ලන්ට ගෙවන වැටුපත් මේකෙන් අඩු කර ගන්න පුළුවන්. ඊට අමතරව තමන් විදේශ ව්‍යවහාර මුදලින් ලාභාංශ ගෙවනවා නම් ඒ ප්‍රමාණයත් අඩු කර ගන්න පුළුවන්. ඊටත් අමතරව ලංකා රජය විසින් විදේශ ව්‍යවහාර මුදලින් නිකුත් කරන භාණ්ඩාගාර බිල්පත් ලබා ගන්න ඔවුන්ට වියදම් කරන්න පුළුවන්, ඔවුන් ගෙනෙන විදේශ විනිමය ප්‍රමාණයෙන් සියයට 10ක උපරිමයක්. ඊටත් අමතරව තමන්ගේ අපනයනයට සම්බන්ධව වෙනත් කවුරු හරි වක්‍ර සැපයුම්කරුවෙක් ඉන්නවා නම්, ඔහුට විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීමක් කරන්න තිබෙනවා නම්, ඒ මුදල් ප්‍රමාණයත් අඩු කර ගන්න පුළුවන්. ඔන්න ඔය මුදල් ප්‍රමාණ ටික අඩු කරලා ඉතිරි වන මුදල් ප්‍රමාණය, මුදල් ලැබෙන මාසයේ සිට ඊළඟ මාසයේ 10වැනි දා වනකොට තවදුරටත් එම මුදල් තිබෙනවා නම්, එම මුදල් ප්‍රමාණය රුපියල් බවට පරිවර්තනය කරන්න ඕනෑ. ඒක තමයි මේ නීතියෙන් කියැවෙන්නේ.

විශේෂයෙන්ම මේ රීති මහ බැංකුව විසින් ඉදිරිපත් කරන්න හේතුව තමයි, මේ දවස්වල පවතින මැද පෙරදිග අර්බුදය. විශේෂයෙන්ම අපි දන්නවා, මේ දිනවල අපේ රුපියල යම් ප්‍රමාණයකින් විචලනය වනවා කියලා. අපේ රුපියල විචලනය වීම අවම කරගන්න අවශ්‍ය එක් උපක්‍රමයක් විධියට මහ බැංකුව විසින් ගත්ත ක්‍රියාමාර්ගයක් විධියට තමයි මෙය පෙනෙන්නේ. ඊටත් අමතරව මහ බැංකුව විසින් මේ දිනවල කල්බදු පහසුකම් සීමා කරන්නත් කටයුතු කළා.

විශේෂයෙන්ම පසුගිය මාස කිහිපය ගත්තාම මැද පෙරදිග යුද්ධය හින්දා අපේ ආනයන බිල, එහෙම නැත්නම් ආනයන වියදම විශාල වශයෙන් වැඩි වුණු බව අපි කවුරුත් දන්නවා. 2025 වසරේ ජනවාරි මාසයේදී අපේ ආනයන වියදම ඇමෙරිකානු ඩොලර් මිලියන 1,786යි. නමුත්, 2026 වසරේ ජනවාරි මාසයේදී අපේ ආනයන වියදම ඇමෙරිකානු ඩොලර් මිලියන 1,800 ගණනකට ගියා. 2025 වසරේ පෙබරවාරි මාසයේදී අපේ ආනයන වියදම ඇමෙරිකානු ඩොලර් මිලියන 1,464යි. ඒක 2026 වසරේ පෙබරවාරි මාසයේදී ඇමෙරිකානු ඩොලර් මිලියන 1,834ක් දක්වා වැඩි වනවා. 2025 වසරේ මාර්තු මාසයේදී අපේ ආනයන වියදම ඇමෙරිකානු ඩොලර් මිලියන 1,637ක් වනවා. නමුත්, 2026 වසරේ මාර්තු මාසයේදී අපේ ආනයන වියදම ඇමෙරිකානු ඩොලර් මිලියන 2,134ක් දක්වා වැඩි වනවා. ඒ ආකාරයෙන් 2025 වසරට සාපේක්ෂව 2026 වසරේ මැයි දක්වා අපේ ආනයන වියදම ඉතා විශාල වශයෙන් වැඩි වුණා. ඉතින් ඒ වැඩි වීමට ප්‍රධාන වශයෙන්ම බලපානවා, මැද පෙරදිග පවතින යුද්ධය. ඒ යුද්ධය නිසා ඉන්ධන මිල වැඩි වුණා; නැව් ගාස්තු වැඩි වුණා; භාණ්ඩ ප්‍රවාහන ගාස්තු, premium එක වැඩි වුණා; රක්ෂණ ගාස්තු වැඩි වුණා. මෙන්න මේවා නිසා අපට ආනයනය සඳහා විශාල වැය බරක් දරන්න සිද්ධ වුණා. මොකද, අපි විශාල වශයෙන් භාණ්ඩ ආනයනය මත රැඳී පවතින රටක්. ඊටත් අමතරව 2025දී අපි වාහන ආනයනය කරන්න අවසර දුන්නා. 2025දී වාහන ආනයනය කරන්න අවසර දෙනකොට අපි බලාපොරොත්තු වුණේ, ඇමෙරිකානු ඩොලර් බිලියන 1.2ක වාගේ ප්‍රමාණයකින් ඒක සීමා වෙයි කියලා. නමුත් 2025 වසර අවසාන වනකොට ඇමෙරිකානු ඩොලර් බිලියන 2.2කට ආසන්න ප්‍රමාණයකට LCs open කරලා තිබුණා. ඒ වුණත් අපි වාහන ආනයනය සීමා කළේ නැහැ. මේ වනකොටත් ඇමෙරිකානු ඩොලර් බිලියන 3.3කට ආසන්න ප්‍රමාණයකට LC open කරලා තිබෙනවා. ඉතින් විශාල ඩොලර් ප්‍රමාණයක් ඒ වෙනුවෙන් වැය වනවා. මේ දවස්වල පවතින මැද පෙරදිග යුද්ධය හේතුවෙන් මතු වී තිබෙන අවිනිශ්චිතතා නිසා ඇති වුණු තාවකාලික අර්බුදයක් තමයි මේ තිබෙන්නේ.

දැන් මෙතැනදී පොඩි පොඩි කැලි අරගෙන යම් යම් ආයතන පාඩුයි කිව්වාට සමස්ත ආර්ථිකය අරගෙන කථා කළේ නැහැ. සමස්ත ආර්ථිකය ගත්තාම ඉලක්කම්වලින් ඉතාම පැහැදිලිව ඕනෑම කෙනෙකුට බලන්න පුළුවන්, 2025 වසරේදී අපි ආර්ථිකය වඩාත් ස්ථාවරව හොඳ තත්ත්වයකට ගෙනැල්ලා තිබෙන බව. සංචාරක ආදායම ගත්තොත්, මැද පෙරදිග යුද්ධය නිසා පසුගිය මාස කිහිපයේදී සංචාරක ආදායමේ යම් අඩුවීමක් තිබෙනවා. මොකද, සංචාරකයන්ගේ පැමිණීමේ යම් අඩුවක් තිබෙනවා. නමුත් මැයි මාසයේදී, ගිය අවුරුද්දේ මැයි මාසයට වඩා සියයට 9ක වාගේ වර්ධනයක් සංචාරක පැමිණීම්වල පැහැදිලිවම අපට දකින්න තිබෙනවා. කොහොමත් අප්‍රේල්, මැයි, ජූනි කියන මාස තුනේ සංචාරකයන්ගේ පැමිණීම අඩුයි. අපි ඒ කාලය හඳුන්වන්නේ off-peak season කියලා. ජූලි මාසයේ ඉඳලා තමයි සංචාරකයන්ගේ පැමිණීම වැඩි වන්නේ. යුද්ධයේ බලපෑම අඩු වීමත් එක්ක අපි බලාපොරොත්තු වනවා, ජූලි මාසයේ ඉඳලා ඉදිරි මාස හයේදී සංචාරකයන්ගේ පැමිණීම විශාල වශයෙන් වැඩි වෙලා සංචාරක ක්ෂේත්‍රයෙන් ලැබෙන ආදායම වැඩි වෙයි කියලා.

විදේශ ප්‍රේෂණ ගත්තාම, 2025 ජනවාරි මාසයේදී ඇමෙරිකානු ඩොලර් මිලියන 573ක් ලැබිලා තිබුණා. 2026 ජනවාරි මාසයේදී ඒ ඇමෙරිකානු ඩොලර් මිලියන 573 ඇමෙරිකානු ඩොලර් මිලියන 751ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. 2025 පෙබරවාරි මාසයේදී ඇමෙරිකානු ඩොලර් මිලියන 548ක් අපට ලැබී තිබෙනවා, විදේශ ප්‍රේෂණ විධියට. 2026 පෙබරවාරි මාසයේදී එය ඇමෙරිකානු ඩොලර් මිලියන 720ක් දක්වා වර්ධනය වෙලා තිබෙනවා. 2025 මාර්තු මාසය ගත්තාම ඇමෙරිකානු ඩොලර් මිලියන 693ක් විදේශ ශ්‍රමික ප්‍රේෂණ විධියට ලැබෙනකොට 2026 මාර්තු මාසයේදී ඇමෙරිකානු ඩොලර් මිලියන 815ක් ලැබී තිබෙනවා. ඒ වාගේම 2025 අප්‍රේල් මාසයේදී ඇමෙරිකානු ඩොලර් මිලියන 646කුත්, 2026 අප්‍රේල් මාසයේදී ඇමෙරිකානු ඩොලර් මිලියන 777කුත් ලැබී තිබෙනවා. මට මෙතැනදී කියන්න ඕනෑ වුණේ, මැද පෙරදිග යුද්ධය තිබුණත්, අපේ රටට ලැබෙන විදේශ ප්‍රේෂණ ප්‍රමාණයේ පැහැදිලි වර්ධනයක් තිබෙනවා කියන එකයි. ඒ අනුව ලැබෙන විදේශ ප්‍රේෂණ ප්‍රමාණයේ කැපී පෙනෙන වර්ධනයක් මේ වනකොට තිබෙනවා.

ඊට අමතරව අපේ අපනයන ආදායම ගත්තත්, මැද පෙරදිග යුද්ධය නිසා අපේ අපනයනවලට යම් යම් බාධා මතු වෙලා තිබෙනවා. අපේ අපනයන භාණ්ඩ යම් යම් රටවලට යැවීමේ අපහසුතා මතු වෙලා තිබෙනවා. ඒ අපහසුතා මධ්‍යයේත් 2025 අවුරුද්දට සාපේක්ෂව අපේ අපනයන ආදායමේ ඉතාම පැහැදිලිව වර්ධනයක් මේ අවුරුද්දේ ලබා ගන්න අපි සමත් වෙලා තිබෙනවා. ඉතින් පැහැදිලිවම අපි නිසි ආකාරයෙන් අපේ ආර්ථිකය කළමනාකරණය කරලා කටයුතු කිරීම තුළ තමයි මේ ආකාරයට අපනයන ආදායම වැඩි කර ගන්න සමත් වෙලා තිබෙන්නේ, මෙච්චර අර්බුදයක් තිබියදීත්.

ඊයේ විවාදය පැවැත්වුණා, ආනයනය කරනු ලබන රෙදිපිළි මත VAT එක පැනවීම සම්බන්ධයෙන්. මෙතෙක් කාලයක් ඒකට තිබුණේ සෙස් බද්ද. කිලෝග්‍රෑමයකට අය කරන සෙස් බද්දක් තිබුණේ. නමුත් ඊයේ මේ පාර්ලිමේන්තුවේදී සම්මත කළා, සෙස් බද්ද ඉවත් කරලා ආනයනය කරන රෙදිපිළි මත VAT එක පනවන්න. ඉතින් එතැනදී විපක්ෂය පැත්තෙන් වැරදි කරුණු කිහිපයක් මතු වුණා. විශේෂයෙන්ම මතු වුණු කාරණය තමයි, SVAT යටතේ ලියාපදිංචි අපනයනකරුවන්ට සැපයුම් කරන දේශීය සැපයුම්කරුවෝ නිමි භාණ්ඩ නිෂ්පාදනය කරලා සැපයුමක් කරනවා නම්, ඒ සැපයුම කරද්දී ඒකට VAT එක එකතු කරන්න ඕනෑ, ඒ නිසා ඒ දේශීය නිෂ්පාදකයන්ගේ භාණ්ඩ මිල වැඩි වෙනවා, ඒ තුළ දේශීය නිෂ්පාදකයන් අධෛර්යවත් වනවා කියන එක. ඒක වැරදි ප්‍රකාශයක්. දේශීය නිෂ්පාදකයෙක් නිමි ඇඳුම් නිෂ්පාදනය කරලා අපනයනකරුවෙකුට දෙනවා නම්, VAT එකත් එකතු කරලා තමයි දෙන්නේ. ඒක හරි.

නමුත්, ඒක අපනයනකරුගේ පිරිවැයක් වෙන්නේ නැහැ. මොකද, ඒ අපනයනකරුට SVAT ක්‍රමය යටතේ ඒක ආපසු ගෙවීමක් හැටියට ලැබෙනවා. එතකොට ඒ VAT එක හැර මුළු මුදල තමයි ඒ පුද්ගලයාගේ cost එක වෙන්නේ. ඒ නිසා ඊයේ ගෙනාපු නීතිය නිසා අපනයනය කරන දේශීය නිෂ්පාදන අධෛර්යවත් වීමක් කිසිසේත්ම සිදු වෙන්නේ නැහැ. ඒගොල්ලන්ට ඒක ආපසු ගෙවීමක් විධියට ගන්න පුළුවන්.

මම විශේෂයෙන්ම මේ කාරණයත් කියන්න ඕනෑ. මේ දිනවල කෙටි කාලීනව අපේ විදේශ විනිමයේ යම් විචලනයක් තිබුණත් අපි ආර්ථිකය වඩාත් හොඳින් ස්ථාවර කරලා, ආර්ථික දත්ත ඉතාම හොඳින් පවත්වා ගනිමින් ආදායම් රැස් කිරීමත්, ජනතාවගේ එදිනෙදා අවශ්‍යතා සහ භාණ්ඩ සැපයීමත් නොපිරිහෙළා ඉටු කරමින්, ආර්ථිකය වඩාත් ශක්තිමත්ව පවත්වාගෙන යන බව සඳහන් කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Harsha de Silva, the Floor is yours. You have four minutes.

[අ.භා. 1.33]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, export කරන BoI ආයතනයකට අමුද්‍රව්‍ය සපයන දේශීය නිෂ්පාදකයා VAT එකතු කරන්න ඕනෑ නැහැ කියලා ආර්ථික සංවර්ධන නියෝජ්‍ය ඇමතිතුමා කියන එක නිවැරදි නම් කරුණාකරලා ඒ පිළිබඳ ප්‍රකාශයක් කරන්න. මොකද, අපනයනකරුවෙකුට අවශ්‍ය අමුද්‍රව්‍ය විදේශයෙන් ගෙන්වනවා නම් VAT එක එකතු වෙන්නේ නැහැ. හැබැයි, ඔබතුමන්ලා ඊයේ ගෙනාපු නීතියත් එක්ක අපනයනකරුවෙක් දේශීයව නිෂ්පාදනය කරලා විකුණනවා නම් VAT එක ගහන්න ඕනෑ.

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)
අපනයනකරුවෙකුට කවුරු හරි දේශීය අමුද්‍රව්‍යවලින් නිෂ්පාදනයක් කරනවා නම් ඒක VAT එකට යටත් වෙනවා. නමුත්, ඒ VAT එකට යටත් වන මුදල අපනයනකරුට දෙනකොට ඒක අපනයනකරුගේ ආපසු ගෙවීමක් වෙනවා. එතකොට අර VAT එක පැහැදිලිවම නිෂ්පාදනයේ පිරිවැයක් වෙන්නේ නැහැ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
අපනයනකරුට නිෂ්පාදනයේ පිරිවැයක් වෙන්නේ නැති බව අපි දන්නවා. මෙතැන ප්‍රශ්නය තිබෙන්නේ අපනයනකරු ගැන නොවෙයි, දේශීය නිෂ්පාදකයා ගැන. දේශීය නිෂ්පාදකයා අපනයනකරු නම් අවුලක් නැහැ. අපනයනකරු අමුද්‍රව්‍ය විදේශයෙන් ගෙන්වනවා නම් VAT එකක් නැහැ. හැබැයි, අමුද්‍රව්‍ය දේශීයව ගන්නවා නම් VAT එක ගහනවා. VAT එක refund කර ගන්න එක පිළිබඳව වෙන කථාවක් තිබෙනවා. ඒක මෙතැනට අදාළ නැහැ. හැබැයි, SVAT එකෙන් කළේ ඒ process එක සම්පූර්ණයෙන්ම ලිහිල් කරපු එක. අපි දීර්ඝව ඒ ගැන සාකච්ඡා කරමු. මොකද, අපි ඔක්කෝටම ඕනෑ මේ රටේ දේශීය නිෂ්පාදකයා අපනයනකරුවෙක් කරන්නයි.

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

අනෙක් කාරණය මේකයි. ගරු බිමල් රත්නායක ඇමතිතුමා කිව්වා, අපි "තග" දමලා "Rebuilding Sri Lanka" fund එක ගැන ඇහුවා කියලා. ආණ්ඩුවේ මන්ත්‍රීවරු ගොඩක් එතැන හිටියා. මම කවදාවත් "තග" දමන ජාතියේ මනුස්සයෙක් නොවෙයි. ඒක ඔබතුමන්ලා දන්නවා. අපි සාධාරණ විධියට ඒ ප්‍රශ්නය ඇහුවේ. "Rebuilding Sri Lanka" කියලා fund එකක් හදන්න බැහැ, ඔබතුමන්ලා පිළිගත් IMF වැඩ පිළිවෙළ අනුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේ නැතිව. එච්චරයි මම කියන්නේ. අපි කවුරුවත් කියලා නැහැ, ඒ සල්ලි සාක්කුවේ දමා ගත්තා කියලා. කවදාවත් මම එහෙම දෙයක් කියලා නැහැ. මම කියලා තිබෙන්නේ භාණ්ඩාගාරයේ account එකක සල්ලි තිබෙනවා, ඒක හදන්න ඔබතුමන්ලාට වගකීමක් තිබෙනවා කියන එකයි. ඒක, මාස 7ක් තිස්සේ කරන්න ඕනෑ නැහැ; ඒක සති දෙකක වැඩක්.

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. I want to ask whether we have declared a crisis in this country. It was during the crisis from 2022 to 2024 that we brought in what is called the forced conversion regulation. That means, if you have some export revenue, after keeping aside what is needed for your debt payments and raw materials, whatever that is left with you, you are forced to convert into Sri Lankan Rupees - LKR. So, in doing so, you take away what is called the economic freedom. If you do not have economic freedom, Sir, investors become jittery and would want to make decisions based on their projections, observations and their forecasts and not be bound by some government official telling them how to run their businesses. So, unless we have economic freedom, that is what happens. ආර්ථික නිදහස, ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් තමයි අපි සටන් කරන්නේ. සමගි ජන බලවේගය "The Blueprint" එක මඟින් ඉදිරිපත් කළේ ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය සහ ආර්ථික නිදහස. ඔය කට්ටිය ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදයයි, ආර්ථික නිදහස ගැනයි කථා කරනවා. නීති දමලා, තමන්ගේ dollar income එක රුපියල්වලට මාසයක් ඇතුළත convert කළ යුතුමයි කියන්නේ, forced; it is not “may”, but “shall”. එහෙම කරන එකෙන් ඇත්ත වශයෙන්ම වෙන්නේ ආයෝජකයන්ට තිබෙන ඕනෑකම අඩු වන එකයි. It is a fact, I have to state that. So, therefore, unless we are running into a crisis, you should not bring rules that are so draconian, anti-economic freedom and anti-business friendly.

Today, you have been able to calm the market for a little while because the exporters are thinking, “Okay, this is forcing of the market”, and now, they are converting the dollars to rupees and the exchange rate has strengthened a little. But, the dollar has appreciated back to Rs. 330 or to some rate like that. So, if you are implementing crisis-time regulations, then you also must make a statement in Parliament that this is temporary, that in three months, you will remove it or something like that because all what you need to do is, to build confidence in the market. And to build confidence in the market, bringing these draconian types of regulations would not do. That is my point of view.

Thank you.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Namal Karunaratne. You have ten minutes.

Order, please! The Hon. Deputy Chairperson of Committees will now take the Chair.

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය [ගරු හේමාලි වීරසේකර මහත්මිය] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] took the Chair.*

[අ.භා. 1.39]

**ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දැන් මේ සභාවේ සාකච්ඡා වුණා ආයතන පාඩු ලබනවා, ආර්ථිකය කඩා වැටිලා කියලා. මේ ආදී සාකච්ඡාවක් මේ සභාවේ මතු වුණා. අපට කියන්න තිබෙන්නේ, "දිට්වා" ආවා, යුද්ධයක් ආවා, ඒ යුද්ධය මුළු ලෝකයටම බලපෑ එකක්, ඒ යුද වාතාවරණය තුළ ඩොලරයේ අගය පිළිබඳ යම් යම් ගැටලුවක් මතු වුණා, ඒක අපට විතරක් නොවෙයි ලෝකයටම පොදු ප්‍රශ්නයක් කියන එක. ඒ තත්ත්වය හැරුණුකොට ඇත්තටම කිසිම ගැටලුවක් නැහැ. මේ සියල්ල කළමනාකරණය කරගෙන ආණ්ඩුව මේ වෙනකොට ඉතාම හොඳ ගමනක් යන බව මේ වෙලාවේ ප්‍රකාශ කරන්න කැමැතියි. ඒ තත්ත්වයත් එක්ක පොදුවේ ගත්තොත් ආර්ථිකයේ වර්ධනයක් තමයි තිබෙන්නේ. ආර්ථිකය බංකොලොත් කරපු වෙලාවේ අපේ රටේ ආර්ථික වර්ධන වේගය සෘණ අගයක තිබුණේ. ඩොලර් සංචිතය බින්දුවේ තිබුණේ. එහෙව් රටක් තමයි අද මේ මට්ටමට ඇවිල්ලා තිබෙන්නේ. ඉතින්, ඒ පරිසරය ඇතුළේ අද අපි විශාල වශයෙන් ජනතාවගේ ප්‍රශ්නවලට මැදිහත් වෙමින්, සහන ලබා දෙමින්, විශාල ව්‍යාපෘති ගණනාවකට අත ගහලා තිබෙනවා. මේ වෙලාවේ රට තුළ විවිධ වැරදි මත සම්ප්‍රේෂණය කරන නිසා මම මෙය අවස්ථාවක් කරගන්නවා ඒවාට පිළිතුරු ලබා දීමට.

මෑතකදීත් එක්තරා නාළිකාවක ගොවීන්ගෙන් ගත්තු voice-cut පළ වුණා, "අපට පොහොර සල්ලි හම්බ වුණේ නැහැ, පොහොර හම්බ වුණේ නැහැ" කියලා. නමුත් ඒ ගොවියා අයත් අනුරාධපුර දිස්ත්‍රික්කයේ, කාගම ඒ ගොවි සංවිධානයේ සභාපති, ලේකම් ප්‍රකාශ කරනවා, "අපට පොහොර සල්ලි හම්බ වුණා. වගා කරපු අපේ ගොවීන්ට හම්බ වුණා. මේ voice-cut එකක් දුන්නු ගොවියා වගා කරලා නැහැ" කියලා. වගා කරපු නැති කෙනෙකුට සල්ලි හම්බ වෙන්නේ නැහැ තමයි. මෙන්න මේ විධියට අද සැලසුම් සහගතව, ආණ්ඩුවට ප්‍රහාර එල්ල කරන්න, මඩ ප්‍රචාර අරගෙන යන්න, බොරු ප්‍රචාර අරගෙන යන්න ඉදිරිපත් වෙලා තිබෙනවා. ඒ නිසා මේකට උත්තරයක් ලබා දෙන්න අවශ්‍යයි.

විශේෂයෙන්ම කියන්න ඕනෑකම තිබෙනවා, අපි ආණ්ඩුව ගන්නකොට හෙක්ටෙයාර දෙකක් සඳහා පොහොර සහනාධාරය

හම්බ වුණේ රුපියල් 30,000යි කියන එක. දැන් අපි ඒ සඳහා රුපියල් 60,000ක් ගෙවනවා. ඒක දෙගුණයක් කරලා තිබෙනවා. අද වෙනකොට ගොවීන් 571,025දෙනෙකුට පොහොර සල්ලි ගිණුම්ගත කර තිබෙනවා. හෙක්ටෙයාරවලින් ගත්තොත්, හෙක්ටෙයාර 405,000කට අදාළව පොහොර සල්ලි දමලා ඉවරයි. තව සල්ලි දමන්න තිබෙන්නේ, හෙක්ටෙයාර 51,000ක් වාගේ ප්‍රමාණයකට අදාළවයි. මේ සල්ලි දමන්නේ ගොවියා වගා කරන කන්නය අනුව, වගාව පිහිටුවන රටාව අනුව. ඒ නිසා ඔක්කොටම එකවර සල්ලි දමන්නේ නැහැ. වගාව පිහිටුවන කාල රාමු වෙනස්; දින වකවානු වෙනස්. අන්න ඒ අනුව මේ වෙනකොට ඒ ගොවීන්ගේ ගිණුම්වලට සල්ලි දමා තිබෙනවා. හෙක්ටෙයාර 405,000කට අදාළව සල්ලි දමා තිබෙනවා. හැබැයි, ඇතැම් නාළිකාවලින් මේවා මතු කරන්නේ කිසිම ගොවියෙකුට සත පහක්වත් දැම්මේ නැහැ වාගෙයි.

ඊළඟට, දැන් මේ යුද තත්ත්වයත් එක්ක පොහොර සම්බන්ධයෙන් විතරක් නොවෙයි ලෝකයේ හැම එකකටම ප්‍රශ්නයක් ආවා. ඒ වෙලාවේ අපි ගොවියා බේරා ගන්න, ගොවියාට යම්කිසි සහනදායී පිළිවෙතක් අනුගමනය කරන්න තීන්දු තීරණ ගත්තා. ජනාධිපතිතුමාගේත් ආශීර්වාදය, එකඟතාව මත ලාල් කාන්ත ඇමතිතුමා, අපි සාකච්ඡා කරලා අමාත්‍යාංශය විධියට තීරණ ගත්තා. ඒ තීරණ ජනාධිපතිතුමා ඇතුළු කැබිනට් මණ්ඩලය අනුමත කළා. ඒ අනුව ගොවීන්ට පරණ තිබුණු මිලටම සියයට 65ක් පොහොර ලබා දීමේ ව්‍යාපෘතිය අපි ආරම්භ කළා. ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා ගොවියාට පොහොර මිටිය රුපියල් 9,900-10,200 අතර මිලට රජය මඟින් ගන්න පුළුවන්කම ලැබුණු බව මම කියන්න කැමැතියි. සමාගම් සතුව තිබෙන පොහොරවලින් අපි සියයට 65ක් සල්ලි දීලා ගත්තා; අත්පිට මුදලට ගත්තා. ඒ සියයට 65 තමයි ගොවීන්ට බෙදුවේ. සියයට 65ක් අරගෙන, ගොවියාට සියයට 100ක් පොහොර දෙන්න අපට පුළුවන්කමක් නැහැ. ලංකාවේම සමස්ත ගොවි නායකයෝ එකතු කරලා, ඒ ගොල්ලන්ගේත් එකඟතාව උඩ හදපු වැඩ පිළිවෙළක් තමයි දැන් ක්‍රියාත්මක වෙන්නේ.

අන්තිමට ගෙනාපු පොහොර නැවෙන් පොහොර ටොන් 7,100ක් අපි මේ වෙනකොට අරගෙනයි තියෙන්නේ. ඒ පොහොර ටොන් 7,100 ආණ්ඩුව ගන්නේ පොහොර මිටියක් රුපියල් 17,000ට. රුපියල් 17,000ට ගන්න පොහොර මිටිය තමයි රුපියල් 10,200ට ගොවියාට දෙන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මෙන්න මේවා විකෘති කරනවා. රුපියල් 17,000ට ගත්ත පොහොර මිටිය රුපියල් 10,200ට ගොවියාට දෙන එකට අමතරව තමයි හෙක්ටෙයාර දෙකක් තියෙන ගොවියාට රුපියල් 60,000ක මුදලක් දෙන්නේ. එතකොට අවුරුද්දකට රුපියල් 120,000ක මුදලක් දෙන්නේ හෙක්ටෙයාර දෙකක් සඳහා. එක වංගියක් අපි පොහොර ගත්තා. ඒ පොහොර මිටියක් ගත්තේ රුපියල් 15,940ට. තව රුපියල් 60ක් එකතු වුණා නම් රුපියල් 16,000යි. තව කොටසක් ගත්තා, රුපියල් 13,700 ගණන්වලට. එහෙම නම් රුපියල් 17,000ට, රුපියල් 15,940ට, රුපියල් 13,700 ගණන්වලට ගත්ත පොහොර තමයි රුපියල් 10,200ට ගොවි ජනතාවට දැන් දෙන්නේ. ඊට අමතරව, ගොවියාට අතිරේක පොහොර කඩෙන් ලබා ගැනීම සඳහා විශාල මුදල් ප්‍රමාණයක් ආණ්ඩුව මේ වෙනකොට ගිණුම්ගත කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, අපි ආණ්ඩුව ගන්නකොට වී වගා කරන ඉඩම්වල අතිරේක භෝග වගා කරනවා නම්, ඒ ගොවීන්ට ශත පහක්වත් හම්බ වුණේ නැහැ. අපි ආණ්ඩුවක් විධියට ඒ ගොවීන්ටත් ගෙවනවා, පොහොර සහනාධාරය. අතිරේක භෝග වගා කරන ගොවීන්ටත් සහනාධාරය ලබා දෙනවා. මේ පොහොර ක්‍රියාවලිය සිද්ධ වෙන්නේ ඔන්න ඔය විධියට.

ඊළඟට තවත් කාරණයක් මම නිවැරදි කරන්න ඕනෑ වී මිල පිළිබඳව. දැන් මේ සම්බන්ධයෙන් උද්ඝෝෂණවලට කථා කරනවා; විවිධ විරෝධතාවලට කථා කරනවා. අපි ආණ්ඩුව ගන්නකොට වී කිලෝවක නිෂ්පාදන වියදම රුපියල් 99.75යි. මේ කථා කරන මම ම ආණ්ඩුවේ ලේඛනය රට පුරා අරගෙන ගිහිල්ලා පෙන්නුවා. වී කිලෝවක නිෂ්පාදන වියදම රුපියල් 99.75යි. ආණ්ඩුව වීවලට රුපියල් 105ක මිලක් නියම කෙරුවා. රුපියල් 105ට වී කිලෝවක් විකුණනකොට ගොවියාට ලාභ තිබෙනවා, රුපියල් 5.25ක්. හැබැයි, ඒ ආණ්ඩුව වීවලට සහතික මිලක් නියම කළත් ආණ්ඩුව එක වී ඇටයක් ගත්තේ නැහැ. වී ගබඩා වවුලන්ට, පරෙවියන්ට ඇරියා. ගබඩා කැලෑවලට ඇරියා. ගොවියාට ඉතාම අඩුවට තුට්ටු දෙකට වී ටික විකුණන්න සිද්ධ වුණා. මේක තමයි අපි ආණ්ඩුව ගන්නකොට තිබුණු තත්ත්වය. හැබැයි, අපි ආණ්ඩුව අරගෙන පළමු කන්නයේම රාජ්‍ය ආයතන, ගොවි සංවිධානවල ඒ නිෂ්පාදන වියදම සියල්ල අරගෙන ගණන් හදලා බැලුවාම කලින් නිෂ්පාදන වියදමට වඩා රුපියල් 10කට ආසන්න ප්‍රමාණයකින් නිෂ්පාදන වියදම අඩු වුණා. අන්න ඒ නිෂ්පාදන වියදමට අපි එකතු කෙරුවා, අපි ගෙනාපු සටන් පාඨය. අපි අන්න ඒකට පණ පෙව්වා. මොකක්ද, අපේ සටන් පාඨය? නිෂ්පාදන වියදමට සියයට 30ක් එකතු කරන්න කියන එක. සියයට 30ක් එකතු කරලා වී කිලෝවේ මිල අපි රුපියල් 120 කළා. ඊට පස්සේ ගබඩා ටික ඇරියා; වී ගන්න පටන් ගත්තා. ඒ ක්‍රියාවලිය යනවා. දැන් නාඩු වී කිලෝවක් රුපියල් 120යි. සම්බා වී කිලෝවක් රුපියල් 130යි. කීරි සම්බා වී කිලෝවක් රුපියල් 140යි. ගබඩා විවෘත කරලා වී ගන්න පටන් ගත්තා. කන්න පහුවෙනකම් වී මිලදී ගත්තා. අප්‍රේල් 9 වෙනතුරු, සමහර තැන්වල අප්‍රේල් 10 වනතුරුත් ගබඩා විවෘත කරලා තිබුණා. අප්‍රේල් වෙනකොට යල කන්නය පටන් ගෙන. සාමාන්‍යයෙන් අවුරුද්දට කලින් වී වපුරනවා සුළු වාරිවල යල කන්නය පටන් ගෙන. මහ කන්නය ඉවර වෙලා යල කන්නය පටන් ගෙනත් අපි ගබඩා ඇරලා තිබුණා. දැන් ගබඩා වහලා තියෙන්නේ. නැවත වතාවක් අපි ගබඩා අරිනවා, ආයෙත් ගොයම් කපන්න පටන් ගත්තාට පසු. නිෂ්පාදන පිරිවැය ගණන් බලනවා. ගණන් බලලා ඒකට සාපේක්ෂව වීවල මිල තීරණය කරනවා. එදා පොහොර මිටිය රුපියල් 40,000ටත් ගියා. රුපියල් 40,000ටත් පොහොර මිටිය මිලදී ගෙන ගොවියාට රුපියල් 80ට, 90ට වී විකුණන්න සිද්ධ වුණා. ඒ අතීතය අමතක කරලා අද මෙවැනි විවිධ විකෘති කිරීම් කරනවා. මේ විකෘති කිරීම් කරන්න ලෑස්ති වෙන්න එපා. අපි ඒවාට උත්තර දෙන්න ලෑස්තියි.

ඒ විතරක් නොවෙයි, අස්වැන්න වැඩි කර ගැනීමට අදාළව අපි මේ වෙනකොට ක්‍රියාමාර්ග ගොඩක් අරගෙන තිබෙනවා. අපි මේ රටේ ගොවි ජනතාවට කියනවා, දැන් ලෝකයේම "එල් නිනෝ" තත්ත්වයක් පිළිබඳව සාකච්ඡාවක් ඇති වෙලා තිබෙන බව. අපේ රටටත් ඒකෙන් බලපෑමක් එල්ල වෙන බවට කාලගුණ විද්‍යාඥයෝ මේ වන විට ප්‍රකාශ කරලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
නියමිත කාලය අවසන්, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)
මම අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

මේ තත්ත්වය තුළ ආහාර සුරක්ෂිතතාව අපට ඉතාම වැදගත්. වීවල වේවා, වෙනත් දේවල්වල වේවා මිල කියන්නේ උච්චාවචනය වෙන දෙයක්. ඉල්ලුම හා සැපයුම මත තමයි ඒක තීරණය වෙන්නේ. ඒවා තාවකාලිකයි. ඒ තත්ත්වය තුළ ආහාර උපරිම සුරක්ෂිත කරගෙන, ඉදිරියේදී "එල් නිනෝ" තත්ත්වයකට

[ගරු නාමල් කරුණාරත්න මහතා]

මුහුණ දීම සඳහා අපි කටයුතු කරන්න ඕනෑය කියන කාරණය මතක් කරමින්, එක එක දේශපාලන projectවලට හසු වෙන්න එපා කියන කාරණයත් මතක් කරනවා. මේ අවස්ථාවේදී විශේෂයෙන්ම ගොවි ජනතාවට මේ ගරු සභාවේ ඉඳන් ඒ පණිවුඩය ලබා දෙමින්, මම කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[1.49 p.m.]

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
*Bismillahir Rahmanir Raheem.*

Hon. Deputy Chairperson of Committees, today, the Government has brought in Rules to force exporters to convert their dollar export proceeds into rupees, and that is being seen as a panic action by the Government to contain the depreciation of the rupee, which is happening at a very fast pace. I have many comments to make on that, but before coming to that, I would like to deal with some of the urgent matters because, today, we are also debating a Resolution under the Essential Public Services Act to give effect to some decisions taken by the Government.

Madam, continuing with the Emergency Regulations is an issue regarding which we have been protesting for a long time and that has now become a norm. The Government seems to be continuing to extend the Emergency Regulations for its own parochial purposes and that has to be discontinued and discontinued, at least, from next month.

Having said that, I would now like to refer to a statement made by the Minister in charge of media, who is also the Chief Government Whip. "No decision to extend the retirement age of Judges: Minister" reports the "Daily Mirror" and goes on to state, "Amidst controversy over reports of the extension of retirement age of judges, Cabinet Spokesman and Minister Nalinda Jayatissa said yesterday that the Government has not taken any decision, claiming that there has been no discussion on the matter within the Government". That is not a total denial, but only saying that "so far, we have not decided." But, there is a serious doubt among the public. Also, many organizations, particularly the Bar Association of Sri Lanka and the Colombo High Court Lawyers' Association have issued statements, warning the Government against that unnecessary attempt to increase the retirement age of judges. We all are bound by what the Bar Association says as we are members of the Bar Association.

Then, I would like to take up another issue. Be that as it may, there have been four vacancies in the Court of Appeal and four vacancies in the Supreme Court existing for the last six months. The President has failed in his constitutional duty to nominate judges for promotion from High Court to the Court of Appeal and from Court of Appeal to the Supreme Court. By denying these promotional rights of the judges, undue pressure is being brought upon judges. Then, what will happen? This very President, when he was in the Opposition and when previous Presidents failed to gazette the names decided on by the Constitutional Council, made a big protest. Several times, he spoke about that very vociferously in the House. Now, when he had become the President, he is not nominating and sending the names. In the Twenty First Amendment to the Constitution, provision was made to prevent Presidents from delaying the decisions taken by the Constitutional Council. And, now, he is doing the reverse; he is not making nominations. So, that is much worse and as a consequence, even our fundamental rights are impacted on because as litigants, lawyers or the public, our right to expeditious disposal of cases is being impacted on by this delay in appointing judges to the Superior Courts.

Moreover, you are frustrating the judges who have served for years in the Judiciary. What happens to those in the minor Judiciary and others? There is a heavy concern among the Judiciary about extending the retirement age of judges. That creates a different issue; that will block their path and deprive many of their right to be appointed to the Bench or to the Superior Courts. Now, High Court Judges will have to wait for their chances and in expectation of being promoted, undue pressure will be brought upon them. This is a way in which the Constitution is being very deliberately violated by the President.

In fact, I have been speaking with some of the Opposition Members that we have to get together and write to the Speaker as the Chairman of the Constitutional Council. There, the Speaker has to act according to the wishes of the Members of Parliament. And, it is our wish that the President immediately nominates these names. Why has he been delaying it unduly for several months now? That undue delay has caused unnecessary frustration among the judicial ranks in the country. Several High Court Judges are waiting to be promoted and then, there are also several Court of Appeal Judges wanting to get on to the Supreme Court Bench. So, due to this, after a lifelong service, they are being denied their due right to be promoted. On top of it, even the senior officers of the Attorney-General's Department expecting to be promoted to one of the Superior Courts or to the High Court will be denied their right. So, there again, pressure is being brought by such inaction. This inaction, which is a Constitutional violation, is a deliberate inaction by the President. Therefore, we urge that this House take note of our protest regarding this undue delay in nominating judges to the superior Benches - both the four vacancies in the Supreme Court and the four vacancies in the Court of Appeal. So, that is a very serious matter. Of course, you will say, "We are not going to extend the retirement age

of the judges", but that is not the issue here. You are waiting until some preferred person becomes eligible to get on to the Bench, to be promoted. So, you are picking and choosing people to be promoted. And by doing that, you are unduly bribing the Judiciary of the country; that is interference with the independent Judiciary.

Then, Madam, I would like to refer to another matter. The Hon. Minister of Justice and National Integration recently said that he is going to bring in amendments to the Prevention of Terrorism Act; ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත වෙනුවට අලුත් පනතක් ගේනවා කියලා අපේ අධිකරණ ඇමතිතුමා ඊයේ කියලා තිබෙනවා. මේක හරියට, "ඉඟුරු දීලා මිරිස් ගත්තා වාගේ" වැඩක්. So, once again, you all are going to bring in another Act. I am sure, that would be much more draconian than the existing Act. That is how the Attorney-General's Department and the Sri Lanka Police behave because they have got used to working under the PTA. Therefore, the investigative power or the efficiency of both the Sri Lanka Police and the Attorney-General's Department has been retarded by continuing with that draconian legislation.

That apart, today, I see a news in the Tamil newspapers which states, " பிரபாகரனின் மகன் படுகொலை - Channel 4 ஆவணப் படம் பொய் கூறுகிறது. பிரிட்டனில் உள்ள இலங்கை உயர்ஸ்தானிகராலயம் நிராகரிக்கிறது". Now, there is an unnecessary panic among the Government ranks about the new episode of the documentary "Sri Lanka's Killing Fields" to be broadcast tonight on Channel 4. In that, they are focusing on the killing of Balachandran, Prabhakaran's son. In many photographs, he was seen having meals in a bunker and then, suddenly, his body was seen with a bullet wound. It is treatment of minors during war, whether it was a terrorist's son or not. What happened to Rohana Wijeweera? He was killed in a similar fashion, but his children and family were saved. The Government let them to live under protection.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, නියමිත කාලය අවසන්.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
That was the way in which the Government treated Rohana Wijeweera's family after having killed him. Of course, this Government, after having come to power, has forgotten about their past leader. They will have the "ඉල් මහ විරු දිනය" and celebrate all that, but they have forgotten him.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
So, they have forgotten all that.

Even Zahran's daughter was saved; they did not kill Zahran's daughter. Why did they have to kill Prabhakaran's daughter? So, if it had happened - I am not saying it had happened - why do you not inquire into it? உண்மையிலேயே போர்க் காலத்திலே இப்படியான போர்க்குற்றம் ஒன்று நடந்திருக்குமாக இருந்தால், பிரபாகரனுடைய மகன் கொலையுண்டிருப்பாராக இருந்தால் அல்லது கொலை செய்யப்பட்டிருப்பாராக இருந்தால், அது யுத்தக் குற்றமாகக் கருதப்பட்டு விசாரிக்கப்பட்டேயாக வேண்டும் என்பதுதான் என்னுடைய நிலைப்பாடு எனச் சொல்லி, எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සමන්මලී ගුණසිංහ මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.59]

**ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சமன்மலீ குணசிங்ஹ)
(The Hon. (Mrs.) Samanmali Gunasingha)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි දන්නවා, අද අපට අනුමත කර ගන්නට තිබෙන්නේ ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ ඉදිරිපත් කරලා තිබෙන අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන ඒම සම්බන්ධව තිබෙන රීති කිහිපයක් බව. මට හිතෙන හැටියට ඒ ගැන අපි මේ වෙලාවේ ලොකු කථිකාවක් කර ගත්තා. අපේ නියෝජ්‍ය ඇමතිවරු මේ පිළිබඳව කථා කළා.

මමත් මේ ගරු සභාවට අපි දැන් ඉන්න තත්ත්වය කියන්න කැමැතියි. එක පැත්තකින් පවතින මැද පෙරදිග යුද්ධය සහ අනෙක් පැත්තෙන් අපට සිද්ධ වුණු ස්වාභාවික ආපදාව නිසා අපේ ආර්ථිකය හොඳින් කළමනාකරණය කර ගන්න නම්, ආර්ථික චලනයන්ට මුහුණ දෙන්න හැකි ස්ථාවර තත්ත්වයකට මේ ආර්ථිකය ගෙන එන්න නම්, අපේ නිෂ්පාදන තවදුරටත් වැඩි කරගෙන ස්ථායීකරණයට එන්න නම් යම් යම් පියවර ගන්න වෙනවා. ඒකේ එක පියවරක් තමයි ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ ඉදිරිපත් කරලා තිබෙන මේ රීති. අපනයනකරුවන් දැනටමත් ඔවුන්ගේ අපනයන ආදායමින් යම් කොටසක් රුපියල් බවට පත් කරගන්න ඕනෑ. ඒ ඔවුන්ගේ සියලු වියදම් කළාට පස්සේ ඉතිරියෙන් කොටසක්. අවසර දීලා තිබෙන වියදම් කළාට පසුව ඉතිරි මුදල සෑම මසකම 10වෙනි දාට පෙර රුපියල් බවට පත් කරන්න කියන සංශෝධනය තමයි මේ ගෙනැල්ලා තිබෙන්නේ.

සාර්ව ආර්ථික විද්‍යාවට අනුව අපේ ආර්ථිකය යම් ස්ථායීකරණයක, එහෙම නැත්නම් ධන මට්ටමක තියාගෙන ගියත් අපි රටක් විධියට ලෝක ආර්ථිකයත් එක්ක ගනුදෙනු කරද්දී අපේ විනිමය අනුපාතය පවත්වාගෙන යන්න ඕනෑ අපට අවාසි නොවන විධියට. පසුගිය කාලයේ සමහරු මෙතැන මහා ලොකු සද්දයක් දැම්මා රුපියලට මොකද වෙන්නේ කියලා අහලා. මම හිතන විධියට, අද පසුගිය සතියට වඩා අපේ රුපියල ශක්තිමත් වෙලා තිබෙනවා. අද වෙද්දී ඩොලර් එකක ගැණුම් මිල රුපියල් 331ත් විකුණුම් මිල 341 දක්වාත් ස්ථාවර වෙලා තිබෙනවා. ඒ වාගේම අපි මේ ස්ථාවරත්වය දිගටම පවත්වාගෙන යන්නත්, එහි වාසිය

[ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය]

රටට ගන්නත් ඕනෑ. මොකද, අපි තාමත් අමුද්‍රව්‍ය පිටරටින් ගෙන්වන්න ඕනෑ, ඒ වාගේම අපට නැති අත්‍යවශ්‍ය තෙල්, ගල් අඟුරු, අනෙකුත් අත්‍යවශ්‍ය භාණ්ඩ පිට රටින් ගෙන්වන්න ඕනෑ. අපි මෙහිදී වාසියක් ගන්න නම් විනිමය අනුපාතය පිළිබඳව සැලකිලිමත් වෙන්න ඕනෑ.

අපේ මූල්‍ය වෙළෙඳ පොළ වාගේම අපේ ආර්ථිකය යම් ස්ථාවර තත්ත්වයකට පත් කරගෙන අපේ ආදායම වැඩි කර ගන්න අපි රටක් විදියට උත්සාහ අරගෙන තිබෙනවා. එහි ප්‍රතිඵලයක් විදියට පසුගිය 2025 පළමුවෙනි කාර්තුවේදී රාජ්‍ය ආදායම රුපියල් ට්‍රිලියන 1.07යි. හැබැයි කියන්න සතුටුයි, විපක්ෂය කෑගහලා කොච්චර දැඟලුවත් 2025 පළමුවෙනි කාර්තුවට වඩා 2026 පළමුවෙනි කාර්තුව වෙද්දී අපි රාජ්‍ය ආදායම වැඩි කරගෙන තිබෙනවා, රුපියල් ට්‍රිලියන 1.5 දක්වා ගෙනැල්ලා තිබෙනවා.

ඒ කියන්නේ, සියයට 40.5ක වර්ධනයක් අත්පත් කරගෙන තිබෙනවා. ඒ වාගේම තමයි, 2025 පළමුවැනි කාර්තුවේ ප්‍රාථමික ගිණුමේ හිඟයක් පෙන්වූවත්, 2026 වෙද්දී අපට ප්‍රාථමික ගිණුමේ අතිරික්තයක් තිබෙනවා. ඒ කියන්නේ, ණය පොලී හැර අනෙකුත් වියදම් කරලා ඉතිරිය ගත්තොත්, ප්‍රාථමික ගිණුමේ අතිරික්තයක් පෙන්නුම් කරන්න පුළුවන් වෙලා තිබෙනවා. 2025දී හිඟයක් තිබුණාට, අපට සියයට 78.5 දක්වා ප්‍රාථමික ගිණුමේ අතිරික්තයේ වර්ධනයක් පෙන්නුම් කරන්න පුළුවන් වෙලා තිබෙනවා. ඒකට ප්‍රධාන හේතු කිහිපයක් තිබෙනවා. ඒ ප්‍රධාන හේතු අතර අපේ මූල්‍ය විනය ගැන අපි රජයක් විදියට සැලකිලිමත් වෙලා තිබෙන කාරණය තිබෙනවා. ඒ වාගේම ආදායම් උත්පාදනය කරන යන්ත්‍රණයේ සාර්ථකත්වය මෙන්ම, ඒ සඳහා අපි ගත්ත ක්‍රියාමාර්ග සාර්ථක වෙලා තිබෙනවා. ඒ නිසා අපට සාර්ව ආර්ථික විද්‍යාව අනුව යම් සාර්ථකත්වයක් ලැබිලා තිබෙනවා.

ඊළඟ කාරණය මේකයි. මේ සාර්ථකත්වය, එහෙම නැත්නම් මේ අතිරික්තය, 2025දී අපි ගත්ත ජයග්‍රහණ ජනතාවට දීලා තිබෙන්නේ කොහොමද කියලා බැලුවොත්, පසුගිය කාලයේ කියපු ඒවාම කියනවාට වැඩිය, වෙනත් අලුත් දේවල් තිබෙනවා කියන්න. මේ රටේ ජනතාව දන්නවා ඊයේ අත්‍යවශ්‍ය භාණ්ඩ 18ක මිල අඩු කරලා තිබෙන බව. ලංකා සතොස මැදිහත් වෙලා, සතොස වෙළෙඳ සැල් හරහා අත්‍යවශ්‍ය භාණ්ඩ 18ක මිල අඩු කරලා තිබෙනවා. ඒ සියලු භාණ්ඩ කුස්සියට, එහෙම නැත්නම් අපේ ගෙදරට අත්‍යවශ්‍ය භාණ්ඩ. මම උදාහරණයක් කිව්වොත්, ලොකු ලූනු කිලෝවක් රුපියල් 249ට තිබුණේ, දැන් එය රුපියල් 219ට අඩු කරලා තිබෙනවා. ඉතිරිය රුපියල් 30යි. සුදු සීනි කිලෝවක් රුපියල් 229ට තිබුණේ. එය දැන් රුපියල් 219 දක්වා අඩු කරලා තිබෙනවා. මයිසූර් පරිප්පු කිලෝවක් රුපියල් 279ට තිබුණේ. එය දැන් රුපියල් 249 දක්වා අඩු කරලා තිබෙනවා. රුපියල් 30ක වාසියක්, ඉතිරියක් ජනතාවට ලැබිලා තිබෙනවා. රතු නාඩු සහල් කිලෝවක් රුපියල් 230ටයි තිබුණේ. එය දැන් රුපියල් 209 දක්වා අඩු කරලා තිබෙනවා. රුපියල් 21ක ඉතිරියක් ජනතාව ලැබිලා තිබෙනවා. සුදු ලූනු ගත්තොත්, රුපියල් 249යි, ඒක රුපියල් 219 දක්වා අඩු කරලා තිබෙනවා. රුපියල් 30ක ලාභයක් ලැබිලා තිබෙනවා.

ඒ වාගේම, අපේ කෘෂිකර්ම නියෝජ්‍ය ඇමතිතුමා කියපු විදියට ගොවීන්ට, ධීවරයන්ට, සුළු හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තවල නියැළිලා ඉන්න කර්මාන්තකරුවන්ට මේ වාගේ අභියෝග තිබෙන කාලයක වෙනත් රජයක් තිබුණා නම් මේ සහන දෙන්න පුළුවන්ද? ඒක තමයි කවුරුත් හිතන්න ඕනෑ. වෙනත් රජයක් තිබුණා නම්, මේ සහන දෙන්න නොවෙයි, මේ සහන දෙනවා කියලා හිතන්නවත් බැහැ. හැබැයි, සහන දුන්නු කාලයක් තිබුණා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. හැබැයි, බාල ගෑස් ගෙනැල්ලා පිපිරුණා. ගෙවල්වල කුස්සිය ගිනි ගත්තා. එහෙම තමයි, ඒ ආණ්ඩු සහන දුන්නේ. හැබැයි, අපි අපේ ආර්ථික ජයග්‍රහණය අපේ රටේ ජනතාවට දුන්නා. මෙන්න නැවතත් ලබා දීලා තිබෙනවා. අපි අත්‍යවශ්‍ය භාණ්ඩ 18ක මිල අඩු කරලා තිබෙනවා. ඒ වාසිය අපේ රටේ ජනතාවට භුක්ති විඳින්න පුළුවන්. ලෝක පරිමාණයෙන් හා අපේ රට අභ්‍යන්තරයෙන් මොන තරම් ස්වාභාවික ව්‍යසන ආවත්, ඊට සාර්ථකව මුහුණ දෙන්න පුළුවන් ශක්තිමත් ආර්ථිකයක් මේ වෙද්දී අපි ගොඩනඟා ගෙන තිබෙනවා.

ඒ වාගේම,අපි ඉවර කරපු තවත් දේවල් ටිකක් තිබෙනවා. විපක්ෂයට දැන් හරි අමාරුයි, කප්පම් යුගය ඉවර කරපු නිසා. අද සරණලා අසරණ වෙලා ඉන්නවා. ඒ නිසා අද විපක්ෂයට හරි අමාරුකමක් තිබෙනවා. ආර්ථිකය හදනවා වාගේම, අපි ඒ කප්පම් යුගයත් අවසන් කළා.

අද මෙතැන ටිකකට කලින් කථා කළ සමහර අය ජාතිවාදය, අන්තවාදය ඇති කරන්න කටයුතු කළ අය. දැන් මොකද වෙලා තිබෙන්නේ? ජාතිවාදයත්, අන්තවාදයත් ඉවර කරමින් රටේ සාමය ඇති කිරීම වෙනුවෙන් අපි වැඩ කරමින් ඉන්නවා. ඒකටත් දැන් එතුමන්ලාට අමාරුයි. එදා නීතිය අතට අරගෙන රාජපක්ෂලාට ඕනෑ විදියට නීතිය ක්‍රියාත්මක කළා. අද රාජපක්ෂලාගේ ඒ අවනීතිය නීතියක් බවට පත් කළා. අද නීතිය ක්‍රියාත්මක කරද්දී සමහර අයට අමාරුයි. දැන් කෑ ගහනවා. ඔය කවුරු කෑ ගැහුවත් ලැබිය යුතු ප්‍රතිලාභ ජනතාවට ලැබෙනවා.

තව එක්කෙනෙක් මෙතැන කිව්වා හරි අපූරු දෙයක්. එතුමා කොලොන්නාව ගැන කථා කළා. එතුමා මොන පැත්තෙන් නැඟිටලා ඇවිත් කථා කළාද කියලා නම් මට තේරෙන්නේ නැහැ. පසුගිය කාලයේ "දිට්වා" කුණාටුවෙන් විපතට පත් වුණු කොලොන්නාවේ අයට රජය කිසිම දෙයක් කළේ නැහැ ලු. මෙන්න අහගන්න. එය කියලා පැනලා ගිය එක්කෙනාටත් මම කියනවා, මෙය අහගන්න කියලා. අද කොලොන්නාවට යන්න. පුළුවන් නම් කොලොන්නාවට යන්න. කොළඹ ඉඳගෙන යන්නේ නැද්ද කියලා මම දන්නේ නැහැ. කොලොන්නාවට යන්න. කොලොන්නාවට ගිහින් අහන්න, ඒ මිනිස්සු අනවසර ස්ථානවල පදිංචි කළේ කවුද කියලා. මිනිස්සු පදිංචි කළේ, ගංගා අසල. ඇළ ඉවුරුවල. අනවසර තැන්වල, වතුරෙන් යට වන තැන්වල මිනිස්සු පදිංචි කරලා අද කිඹුල් කඳුළු හෙළනවා. හැබැයි, අපි ඒ මිනිස්සු අනවසර පදිංචිකරුවන් කියලා බැලුවේ නැහැ. ඒ හැම කෙනෙකුටම රුපියල් 25,000ත් හම්බ වුණා, රුපියල් 50,000ත් හම්බ වුණා. පාසල් දරුවන්ට දෙන මුදලුත් ඒ දරුවන්ට හම්බ වුණා. අනවසර පදිංචිකරුවන් කියලා බලන්නේ නැතුව ආපදාවට පත් වුණු කොලොන්නාවේ සියලු ජනතාවට මුදල් ලබා දුන්නා. සියයට 90කට ඒ මුදල දීලා ඉවරයි. ඒ වාගේම තමයි රුපියල් ලක්ෂයේ දීමනාව, රුපියල් ලක්ෂ පනහේ දීමනාව 6,000කට ආසන්න ප්‍රමාණයකට දීලා තිබෙනවා. මම කියන්නම් බෙදා දුන් සමස්ත මුදල කීයද කියලා. කොලොන්නාවට මේ වෙද්දී රුපියල් මිලියන 4,028ක් බෙදා දීලා තිබෙනවා. ඇයි ඒ? "දිට්වා" කුණාටුවෙන් වැඩියෙන්ම අසරණ වුණේ කොලොන්නාවේ ජනතාව. පවුල් 55,000කට මුදල් ලබා දීලා තිබෙනවා. එච්චර මුදලක් දීලා තිබෙද්දී ලජ්ජා නැතුව මෙතැන නැඟිටලා අහනවා, "මොනවාද මේ රජය කළේ?" කියලා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමිය, දැන් කථාව අවසන් කරන්න.

**ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சமன்மலீ குணசிங்ஹ)
(The Hon. (Mrs.) Samanmali Gunasingha)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, කොළොන්නාවට දෙන්න තිබෙන සමස්ත මුදල, මෙම රජය අනිවාර්යයෙන්ම ගෙවන මුදල කියලාම මම කථාව නවත්වන්නම්. රුපියල් මිලියන 9,836ක් ගෙවන්න නියමිතව තිබෙනවා. ඒ සියලු මුදල් ගෙවනවා. ඒ නිසා කලබල වෙන්න එපා කියලා මම එතුමාට කියනවා. මේ ජනතාවගේ මුදල්. ඒවා ජනතාවට ලැබෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.10]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද ගරු සභාවේ විශේෂයෙන්ම ආර්ථිකය ගැන සාකච්ඡා වෙන අවස්ථාවේ අපට පෙනෙනවා ඉදිරිපත් වන අදහස් තුළ තහනම් වචන ගණනාවක් තිබෙන බව. "ජනතා පීඩනය" තහනම් වචනයක්; "ජනතා අසහනය" තහනම් වචනයක්; "ජනතා කලකිරීම" තහනම් වචනයක්; "ජනතාවට ජීවත් වීමේ නොහැකියාව" තහනම් වචනයක්. දැන් මේ මොහොත වන විට අපේ රටේ දුප්පත්කම සියයට 30-40 අතර ප්‍රමාණයකට වර්ධනය වෙලා. කර්මාන්ත පද්ධතිය කඩා වැටිලා. ලක්ෂ ගණනකගේ රැකියා අහිමි වනවා. අපනයන ක්ෂේත්‍රය දුර්වල වෙලා. ගොවි, ධීවර, කම්කරු හා සාමාන්‍ය ජනතාවගේ, ඒ වාගේම කර්මාන්තරුවන් සහ ව්‍යවසායකයන්ගේ ආර්ථික ක්‍රියාදාම අඩපණ වෙලා.

දැන් මට ඇහුණා මේ සභාවේ බොහොම ලොකුවට කියනවා, ප්‍රාථමික ගිණුමේ සාර්ථකත්වය හා රාජ්‍ය ආදායමේ සාර්ථකත්වය ගැන. මොනවා කරලාද මේ සාර්ථකත්වය ළඟා කර ගත්තේ? බදු ගහලා. ඉතින්, ඒක ඕනෑම කෙනෙකුට කරන්න පුළුවන් දෙයක් නේ. බදු ප්‍රතිශතය වැඩි කළාම රාජ්‍ය ආදායම වැඩි වනවා, ප්‍රාථමික ගිණුමේ ශේෂය වැඩි වනවා. බලන්න, එදා මේ රටේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන්, ව්‍යවසායකයන් හා මහා පරිමාණයේ කර්මාන්තකරුවන් රැකියා දසදහස් ගණනක් උත්පාදනය කළා. ඒ ව්‍යාපාරික ප්‍රජාවගේ ආර්ථික ක්‍රියාදාමය සහමුලින්ම අද අඩපණ වෙලා. ඉතින්, පුළුවන් නේ මේ රජයටත් කර්මාන්තශාලා 200 වැඩසටහනක් පටන් ගන්න, එදා ඇඟලුම් කම්හල් 200 වැඩසටහන ආරම්භ කළා වාගේ. එහෙම වෙන්නේ නැහැ. පුද්ගලයන් මත පනවන බදු ටික වැඩි කරලා, ආයතන මත පනවන බදු ටික වැඩි කරලා, සියයට 8ක් ලෙස තිබුණු VAT එක සිට සියයට 18 කරලා, ඒකට සියයට 2.5ක සමාජ ආරක්ෂණ බද්දකුත් එකතු කරලා, නිදහස් කරපු භාණ්ඩ හා සේවා 97ක් 2024 ජනවාරි ඉඳලා අලුතින් බද්දට යටත් කරනවා. හැබැයි ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එකක විතරක් බදු වැඩි කරලා නැහැ. ඒ තමයි සිගරට් බද්ද. සිගරට් බද්ද විතරක් වැඩි කරලා නැහැ. දැන් ලෝක සෞඛ්‍ය සංවිධානයත් කියනවා, සිගරට් බද්ද සියයට 75ක තිබෙන්න ඕනෑ කියලා. 2018දී සියයට 74ක්ව තිබුණු සිගරට් බද්ද අද සියයට 66.8 දක්වා අඩු කරලා තිබෙනවා. එතකොට, Income Tax වැඩි කරනවා, VAT වැඩි කරනවා, SSCL වැඩි කරනවා, ආයතනික බදු වැඩි කරනවා. ගහන්න පුළුවන් හැම බද්දක්ම ගහලා, සිගරට් බද්ද අඩු කරලා තිබෙනවා. ඒ කියන්නේ, වෙනදා සිගරට් සඳහා රුපියල් 12කට රුපියල් 9ක් බදු ගැහුවා නම් අද ගහන්නේ රුපියල් 8යි. රුපියලකින් අඩු කරලා තිබෙනවා. මූල්‍යමය වශයෙන් ගත්තොත්, මේ සිගරට් බද්ද වැඩි නොකිරීම තුළ වසරකට රුපියල් බිලියන 17.3ක රාජ්‍ය ආදායම් අහිමිවීමක් සිදු වනවා. දළ වශයෙන් කිව්වොත්, ආපදා ක්ෂේත්‍රයේ budget එක රුපියල් බිලියන 14.8යි. සිගරට් බද්ද අඩු කිරීම නිසා ඒ budget එකට වඩා 1.2කින් ලබා ගත හැකි ආදායම අඩු වෙනවා. ඒ තමයි රුපියල් බිලියන 17.3ක මුදල. පෝෂණය සහ සුරක්ෂිතතාව වෙනුවෙන් වෙන් කර තිබෙනවා, රුපියල් බිලියන 12.9ක්. ඊටත් වඩා 1.3කින් රුපියල් බිලියන 17.3ක රාජ්‍ය ආදායම අහිමි වෙලා තිබෙනවා. ප්‍රසූත නිවාඩු ප්‍රතිලාභය ලබා දුන්නත් ඒකට වැය වෙන්නේ රුපියල් බිලියන 7.2යි. ඇත්ත වශයෙන්ම ඊටත් වඩා 2.4ක් විතර වැඩියෙන් රුපියල් බිලියන 17.3ක බදු ආදායම රටට අහිමි වෙනවා. ඇත්ත වශයෙන්ම VAT එක වැඩි කළා, Income Tax එක වැඩි කළා, ආයතනික බද්ද වැඩි කළා, SSCL එක වැඩි කළා. හැබැයි, සිගරට් බද්ද වැඩි කළේ නැහැ.

වර්තමාන ජනාධිපතිවරයාට මම යෝජනා කරනවා, දැන්වත් එක පෑන් පහරින් රාජ්‍ය ආදායම රුපියල් බිලියන 17.3කින් වැඩි කරගෙන මේ රටේ අහිංසක ජනතාවට සහන ලබා දෙන්න අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල අඩු කරන්න කියලා. අපේ ගරු මන්ත්‍රීතුමියක් කිව්වා, භාණ්ඩ ගණනාවක මිල අඩු කර තිබෙනවා කියලා. මම එතුමියට අභියෝගයක් කරනවා. සාමාන්‍ය ජනතාව අතරට ගිහිල්ලා 10දෙනෙකුගෙන්, 20දෙනෙකුගෙන් අහලා බලන්න. එතකොට කියන්න පුළුවන් ඇත්තටම කී දෙනෙක් බඩු මිල අඩු වෙලාද, නැද්ද කියලා හිතනවාද කියන එක; ඇත්තටම කී දෙනෙකු එහෙම හිතනවාද කියන එක. වායුසමීකරණය කළ මේ සභාවේ ඉඳගෙන බඩු මිල අඩු කළාය කියන එකට වඩා, පොදු ජනතාව අතරට ගිහිල්ලා 10දෙනෙකුගෙන්, 20දෙනෙකුගෙන් randomly අහන්න පුළුවන් බඩු මිල අඩු වෙලා තිබෙනවාද, වැඩි වෙලා තිබෙනවාද කියන එක ගැන.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මගේ කථාව අවසන් කරන්න පෙර මේ කාරණාවත් මම කියන්නම්. මේ රජය පොරොන්දු වුණා, අපේ රට සංවර්ධනයේ කේන්ද්‍රස්ථානයක් බවට පත් කරනවා කියලා. හැබැයි, මේ මොහොත වනවිට අපේ රට සයිබර් වංචාවල මූලස්ථානයක් බවට පත් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම විවිධ ලිහිල් කිරීම් තුළ, නීතිය ලිහිල් කිරීම් තුළ කාම්බෝජයේ හිටපු, පිලිපීනයේ හිටපු සයිබර් වංචාකරුවන් අද අපේ රටට ඇවිල්ලා මේ රට සයිබර් වංචා ක්ෂේත්‍රයේ මූලස්ථානය බවට පත් කර තිබෙනවා. ඒ නිසා කරුණාකරලා ඒ පිළිබඳව පියවරක් ගන්න කියලා ඉල්ලීමක් කරනවා.

මගේ අවසාන ඉල්ලීම මේකයි. මේ රටේ වැඩිහිටි ප්‍රජාවගේ, විශ්‍රාමික ප්‍රජාවගේ - ඒ වයස්ගත ජනතාවගේ - ලක්ෂ 15ක ඉතිරි කිරීම්වලට සියයට 15ක පොලියක් ලබා දුන්නා. නමුත්, මේ ආණ්ඩුව ඒ පොලිය කප්පාදු කර තිබෙනවා. මේ හේතුවෙන් ලක්ෂ ගණනක් මේ රටේ වැඩිහිටි ජනතාව, විශ්‍රාමික ජනතාව දැඩි ලෙස අසහනයට පත් වෙලා තිබෙනවා. මොකද, ඒ ලබා ගත් සියයට 15 පොලී ආදායමෙන් තමයි තමන්ගේ බෙහෙත් හේත් ටික ගත්තේ. ඒ අසරණ අම්මලා, තාත්තලා නඩත්තු වුණේ ඒකෙන්. කරුණාකරලා මේ සභා ගර්භය ඇතුළට ඇවිල්ලා සිහින ලෝකයක් මවා පාන්නේ නැතිව, බොරු සුන්දර ලෝකයක් නිර්මාණය කරන්නේ නැතිව, ඇත්තටම මහ පාරට බැහැලා ජනතාවගේ දුක අහලා, එයට සවන් දීලා ඒවාට විසඳුම් ලබා දෙන්න කටයුතු කරන්න කියා මම මේ අවස්ථාවේ රජයෙන් ඉල්ලීමක් කරනවා.

ස්තුතියි.

**ගරු මහින්ද ජයසිංහ මහතා (කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ - தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Mahinda Jayasinghe - Deputy Minister of Labour)
Madam, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
ස්ථාවර නියෝග,- *[බාධා කිරීමක්]* ගරු විපක්ෂ නායකතුමාගේ පැත්තෙන් ඉදිරිපත් කළා, ලක්ෂ ගණනක් රැකියා අහිමි වෙලා තිබෙනවා කියලා. මම කැමැතියි එතුමාගෙන් ඉල්ලන්න, ඒ පිළිබඳව මේ සභාවට කරුණු පැහැදිලි කිරීමක් කරන්න කියලා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, -

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඒක point of Order එකක් නොවෙයි.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
එතුමාට ප්‍රශ්නයට උත්තර දෙන්න ඉඩ දෙන්න. ප්‍රශ්නයක් ඇහුවා නේ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
විනාඩියක කාලයක් ගන්න, ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම එතුමාගෙන් අහන්න කැමැතියි, - එතුමා දන්නවාද, නැද්ද දන්නේ නැහැ - Hirdaramani factories කීයක් වහලා ගිහිල්ලා ද කියලා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු විපක්ෂ නායකතුමා, ඔය සම්බන්ධව අපි විවාදයකට යන්නේ නැතිව ඉඳිමු.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ, කරුණාකරලා මට උත්තර දෙන්න අවස්ථාව දෙන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔය සම්බන්ධව අපි විවාදයකට යන්නේ නැතිව ඔබතුමා, -

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට උත්තර දෙන්න අවස්ථාව දෙන්න. MAS Holdingsහි කර්මාන්තශාලා කීයක් වහලා ඔවුන් රටින් ගිහිල්ලා තිබෙනවාද?

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
අපට කාලය නැහැ. අද දින කාලය ඉතා ප්‍රශ්නකාරී විධියට යන්නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Brandixහි කර්මාන්තශාලා කීයක් වහලා තිබෙනවාද?

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔය ගැන අපි විවාදයකට යන්නේ නැතිව ඉඳිමු.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඇඟලුම් කම්හල් 200ක් කර්මාන්තශාලා කීයක් වහලා තිබෙනවාද? ලක්ෂ ගණනින් රැකියා අහිමි වෙලා තිබෙනවා. වැහුණු කර්මාන්තශාලාවල ලැයිස්තුවක් මම මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නම්.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු ගාමිණී රත්නායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා. *[බාධා කිරීම්]* අපි විවාදයකට නොයා ඉඳිමු. *[බාධා කිරීම්]* ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අපි ඔය ගැන විවාදයකට නොයා ඉඳිමු, අපට කාලය කළමනාකරණය කරගන්න තිබෙන නිසා. *[බාධා කිරීමක්]* ගරු ගාමිණී රත්නායක මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව ආරම්භ කරන්න.

[අ.භා. 2.20]

**ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා**
(மாண்புமிகு ஆர்.எம். காமினி ரத்நாயக்க)
(The Hon. R. M. Gamini Rathnayake)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අප රටේ විදේශ විනිමය ස්ථාවරව පවත්වා ගැනීමට අවශ්‍ය කරන මූලික විධිවිධාන ශක්තිමත් කිරීම පදනම් කරගෙන කරනු ලබන සංශෝධන පිළිබඳ විවාදයේදී, විපක්ෂ නායකතුමාගේ කථාවෙන් පස්සේ මට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මම විශේෂයෙන්ම ඔබතුමියට ස්තුතිවන්ත වනවා.

විපක්ෂ නායකතුමාගේ කථාව අවසාන කරනකොට යම් කාරණයක් කිව්වා. ඒකටත් පිළිතුරක් ලබා දෙන්න අවස්ථාව ලැබීම මට සතුටට කරුණක්. එතුමා කිව්වා, අපේ රටේ ගොවි ජනතාව අර්බුදයට ලක් වෙලා, අපේ රටේ වැඩ කරන ජනතාව

පීඩාවට පත් වෙලා, ඒ වාගේම අපේ රටේ ලක්ෂ සංඛ්‍යාත වැඩ කරන ජනතාව රැකියාවෙන් දොට්ට දාලා කියලා. ගරු විපක්ෂ නායකතුමනි මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, ඔබතුමාගේ සිහින ලෝකයෙන් බිමට බැහැලා මේ රටේ මහ පොළොවේ පය ගහලා බලන්න කියලා. මේ රටේ වැඩ කරන ජනතාවත් එක්ක වැඩ කරන, වෘත්තීය සමිති කොටස්කරුවෙක් හැටියට මට මීට අදාළ කරන පැහැදිලි කිරීම ඔබතුමාගේ කථාවෙන් පස්සේ කරන්න ලැබීම සතුටට කරුණක්.

ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාගේ කථාවෙන් පසුව කළ පැහැදිලි කිරීම්වලදී ඇහුවා, අපේ රටේ හයිඩ්‍රාමනී කර්මාන්තශාලා කීයක් වැහුණාද කියලා. ගරු විපක්ෂ නායකතුමනි, මට කියන්න ඒ හයිඩ්‍රාමනී කර්මාන්තශාලා වැහුණේ කොයි කාලයේද, කාගේ කාලයේද කියලා. ඒ හයිඩ්‍රාමනී කර්මාන්තශාලා වැහුණේ ඔබතුමන්ලා ආණ්ඩු කරපු කාලයේ. *[බාධා කිරීම්]* ඒ විතරක් නොවෙයි. ඔබතුමා කිව්වා, ඔබතුමාගේ තාත්තා ඇඟලුම් කර්මාන්තශාලා 200ක් පටන් ගත්තා කියලා. *[බාධා කිරීම්]* ඒ පටන් ගත්ත ඇඟලුම් කර්මාන්තශාලා 200 දැන් කෝ? *[බාධා කිරීම්]* ඒ ඇඟලුම් කර්මාන්තශාලා 200 කුමාර් දේවපුරට වික්කේ කවුද? කොයි ආණ්ඩුව කාලයේද? *[බාධා කිරීම්]* කාගේ කාලයේද? *[බාධා කිරීම්]* ඒ කර්මාන්තශාලා ටික වහලා ගියේ කොයි කාලයේද? ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාට කට තිබුණාට ඔළුව නැහැ, මොළය නැහැ, ඒ දෙකම නැහැ කියන එක මම මේ මොහොතේ කියනවා. *[බාධා කිරීම්]* විකාර කියවන්න එපා. පාඩම් කර ගත්ත කතන්දරය විතරක් කියවන්න එපා. මහ පොළොවට බැහැලා යථාර්ථය තේරුම් ගන්න. ඒ යථාර්ථය තේරුම් ගන්න ඕනෑ නම් මම ඔබතුමාට එක පාඩමක් විතරක් කියලා දෙන්නම්, මේ කෙටි කාලය තුළ. ඔබතුමාගේ කථාව අවසානයේදී කිව්වා, අපේ රටේ ආර්ථිකය බංකොලොත්, ආර්ථිකය කඩා වැටෙනවා, ආර්ථිකය බොහොම විනාශකාරී තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ කියලා. *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීවරුනි, නිහඬ වෙන්න. සභාව නිහඬ වෙන්න.

**ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා**
(மாண்புமிகு ஆர்.எம். காமினி ரத்நாயக்க)
(The Hon. R. M. Gamini Rathnayake)
දැන් ආර්ථිකය කඩා වැටිලා සුන්බුන් තත්ත්වයට පත් වෙලා නම් තිබෙන්නේ, ඔබතුමා මේ කාරණය තේරුම් ගන්න. ගෙවුණු කාල වකවානුව ඇතුළේ බංකොලොත් තත්ත්වයට පත් වෙච්ච, ගෙවුණු කාල වකවානුව තුළ ණය ගෙවා ගන්න බැරි වුණු තත්ත්වයට පත් වෙච්ච ආර්ථිකයක් තුළ හැමදාම හිඟ අය වැයක් සහිත ආර්ථිකයක් පවත්වාගෙන ගිය අය වැය ලේඛන තමයි අපි බලයට එනතෙක් තිබුණේ. 2024 අය වැය හිඟය රුපියල් බිලියන 24.6ක්. ඒක ණය වෙච්ච අය වැයක්. හැබැයි ඒ අය වැය හිඟය වෙනුවට ඉතිහාසයේ පළමුවැනි වතාවට 2026 වසරේ පළමුවැනි කාර්තුව වනකොට රුපියල් බිලියන 116ක අය වැය අතිරික්තයක් සහිත අය වැය ක්‍රියාවලියක් ඉදිරියට ගේන්න අපට පුළුවන්කම ලැබුණා. ගරු විපක්ෂ නායකතුමනි, අය වැය හිඟයක ඉඳලා 2026 වසරේ පළමුවැනි කාර්තුව වන විට අය වැය අතිරික්තයක් දක්වා රටේ අය වැය ක්‍රියාවලිය ශක්තිමත් කරන්න පුළුවන් නම් මම ඔබතුමාගෙන් අහනවා, මොන ආර්ථික විද්‍යාවට අනුවද ඒ ආර්ථිකය කඩා වැටිලා තිබෙන්නේ කියලා.

ඒ විතරක් නොවෙයි. තවත් වාර්තා අරගෙන බලන්න. අපේ මහ බැංකු වාර්තා පැත්තක තියන්න. ජාත්‍යන්තර මූල්‍ය සංවිධාන විසින් ගෙවුණු කාල වකවානු තුළ ශ්‍රී ලංකාවේ ආර්ථිකය පිළිබඳව දීලා තිබෙන සහතිකය පැහැදිලි කරගන්න. අපේ ආර්ථිකය කඩා වැටෙන ආර්ථිකයක් නම්, බංකොලොත් ආර්ථිකයක් නම්, රුපියල කඩා වැටෙනවා නම් බ්ලූම්බර්ග් ආයතනය විසින් දීපු සහතිකය ගැන හොඳට හොයලා බලන්න. එම ආයතනය විසින් අපට දීපු සහතිකය මොකක්ද? එය තමයි, ගෙවුණු කාල වකවානුව තුළ දකුණු ආසියාවේ ශක්තිමත්ම මුදල් ඒකකය ශ්‍රී ලංකා රුපියල කියන එක. අපි නොවෙයි, ඒගොල්ලන් තමයි එහෙම කියලා තිබෙන්නේ. ආර්ථිකය කඩා වැටෙනවා නම්, බංකොලොත් නම් ආසියානු කලාපය තුළ ශක්තිමත්ම මුදල් ඒකකය රුපියල කියන සහතිකය ජාත්‍යන්තර සංවිධානවලින් දෙන්නේ කොහොමද? ගරු විපක්ෂ නායකතුමනි, ඒ නිසා කරුණාකරලා දැන්වත් ඔය සිහින ලෝකයෙන් බිමට බහින්න. බිමට බැහැලා මේ මහ පොළොවේ යථාර්ථය තේරුම් අරගෙන මේ රටේ ජනතාවත් එක්ක වැඩ කරන්න. එහෙම නැත්නම් ඔබතුමන්ලාට වෙන කිසිවක් නොවෙයි, තවත් විරාත් කාලයක් බංකොලොත් වෙච්ච, බුන් බවට පත් වෙච්ච සුන්බුන් විපක්ෂයේ භූමිකාව පමණමයි ඉටු කිරීමට සිදු වෙන්නේ. ඒක තේරුම් ගන්න. ඒ නිසා ඒක තේරුම් අරගෙන සාර්ව ආර්ථික විශ්ලේෂණයක් සහිතව, සාර්ව ආර්ථික විග්‍රහයක් සහිතව ආර්ථිකය පිළිබඳව විශ්ලේෂණයකට, විග්‍රහයකට එන්න. ඔබතුමන්ලා විසින් අපේ රටේ ආර්ථිකය පිළිබඳව එහෙම සාධනීයව ඉදිරිපත් කරන විවේචන භාරගන්න අපි සූදානම්. එසේ නොමැතිව මේ රටේ ආර්ථිකය තුළ මහ පොළොවේ තිබෙන සැබෑ යථාර්ථයට හාත්පසින් පරිබාහිරව ඔබතුමන්ලා ද්වේෂසහගතව ඉදිරිපත් කරනු ලබන කිසිදු විවේචනයක්, කිසිදු කරුණක් සැලකිල්ලට ලක් කරන්න අපි සූදානම් නැහැ. ඒ නිසා මේ මහ පොළොවේ තිබෙන යථාර්ථයක් එක්ක කටයුතු කරන්න.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ රටේ ආර්ථිකය, විනිමය අනුපාතය ස්ථාවරව පවත්වාගෙන යන්න මේ රටේ මහ බැංකුවට තිබෙන අයිතිය යටතේ මේ රටේ මූල්‍ය ක්‍රියාවලිය විධිමත්ව, ශක්තිමත්ව පවත්වා ගැනීමට අවශ්‍ය කරන ක්‍රියාවලියක පියවරක් හැටියට තමයි මහ බැංකුව විසින් ගෙන එන මෙම රීති සම්මත කරන්න අවශ්‍ය වන්නේ. ගෙවිවුණු කාල වකවානුව තුළ අපේ රටේ ආර්ථික ක්‍රියාවලිය අඩපණ වෙලා තිබුණේ. ඒ කියන්නේ අපේ රටේ මූල්‍ය වෙළෙඳ පොළේ විනිමය අනුපාතය කෙටි කාලීනව උච්චාවචනයට ලක් වුණා, චලනයට ලක් වුණා. ඒ චලනය, උච්චාවචනය ස්ථාවර කරගෙන ආසියානු කලාපය තුළ රුපියල ශක්තිමත්ම මුදල් ඒකකය බවට පත් කරගන්න අවශ්‍ය කරන නීතිමය මූලික අඩිතාලම දමන්න අවශ්‍ය ක්‍රියාමාර්ග අපි ගත්තා. ඔයගොල්ලන් බලයේ හිටියා නම් මොකක්ද කරන්නේ? ඔයගොල්ලන්ගේ පාලනය තුළ තිබුණේ වහලා, හිර කරලා, සියල්ල පාලනය කරලා පවත්වාගෙන ගිය ආර්ථිකයක්. එය කටුවක් ඇතුළට කොටු කරපු එකක් වාගේයි. හැබැයි ඒ වෙනුවට ආර්ථිකය ප්‍රසාරණය කරලා ආසියානු කලාපය තුළ ශක්තිමත් මුදල් ඒකකය බවට ශ්‍රී ලංකා රුපියල පත් කරන්න අවශ්‍ය නෛතිකමය ක්‍රියාමාර්ග ටික, පියවර ටික ආණ්ඩුවක් හැටියට අපි ගන්නවා කියන කාරණය මේ වෙලාවේ මම මතක් කරනවා. මේ රටේ ආර්ථිකයේ ශක්තිමත් පියවර එක්ක ඔබතුමන්ලා සිහින දකිනවා. ඔබතුමන්ලාට තවදුරටත් ඒ සිහින දකින්න අවස්ථාව විවර කර දෙමින්, ඒ සිහින තුළම ජීවත් වෙන්න අවස්ථාව දෙමින්, මේ රටේ මහ පොළොව තුළ මේ රටේ ජනතාවට ශක්තිමත් ආර්ථිකයක් සහ ස්ථාවර ආර්ථිකයක් ගොඩනැඟීමට අවශ්‍ය මූලික පියවර - අඩිතාලම - ජාතික ජන බලවේගයේ ආණ්ඩුව විසින් ගනු ලබනවා කියන සහතිකය මේ පාර්ලිමේන්තුවට ලබා දෙමින් මම නිහඬ වනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.29]

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඉස්සෙල්ලාම මම කියන්න කැමැතියි, මට කලින් කථා කළ මන්ත්‍රීතුමා හීනෙන් භය වෙලා ඇහැරිලා වාගේ තමයි අපි දැක්කේ කියන කාරණය. මොකද, ඇමතිකමක් නැති නිසා හැම දාම නින්ද යන්නේත් නැහැ වාගෙයි. එහෙම නේද? *[බාධා කිරීමක්]* හොඳයි, කමක් නැහැ. *[බාධා කිරීමක්]* ඒකට කමක් නැහැ. ඒ කොහොම වුණත්, අපි පැහැදිලිවම කියන්න ඕනෑ, මේ වෙනකොට ඉතාම අමාරු තැනකට මේ රට පත් වෙලා තිබෙන බව. අපේ විපක්ෂ නායකතුමා කිව්වා වාගේම තමුන්නාන්සේලාගේ ආණ්ඩුව බලයට පත් වෙලා අවුරුදු එකහමාරක් පමණ ගත වෙනකොට, රටේ ලක්ෂ ගණනක් වන ජනතාවගේ රැකියා අහිමි වෙලා තිබෙන බව මම පැහැදිලිව කියනවා. මේ පිළිබඳ විස්තර අපි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නම්. කලබල වෙන්න එපා. ඒ නිසා අපි පැහැදිලිව කියනවා, මෙන්න මේ කාරණාවලටත් උත්තර දෙන්න කියලා. *[බාධා කිරීමක්]* මගේ කථාවට බාධා කරන්න එපා. *[බාධා කිරීමක්]* මෙතුමා ඉස්සෙල්ලාත්,- *[බාධා කිරීම්]* ඒ වාගේම පැහැදිලිව කියන්න ඕනෑ, මේ වෙලාවේ,- *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මන්ත්‍රීතුමාගේ කථාවට බාධා කරන්න එපා, ගරු නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
මේ වනවිට තුල්හිරිය MAS Holdings ආයතනය වහලා තිබෙනවා. ඒ, තමුන්නාන්සේලා ආණ්ඩු බලය ගත්තාට පසුව. *[බාධා කිරීම්]* ඒ වාගේම නිවිතිගල Hirdaramani garment factory එක වහලා තිබෙනවා. *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමාගේ කථාවෙන් පසුවයි අවස්ථාව ලබා දිය හැක්කේ, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. *[බාධා කිරීම්]*

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ වනවිට කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තශාලා ගණනාවක් වැහිලා තිබෙනවා. ඒ අනුව ඒවායේ රැකියා කළ ලක්ෂ ගණනකට රැකියා අවස්ථා අහිමි වුණා කියන එක ගැන ආයෙත් අහන්න දෙයක් නැහැ. ඒ සම්බන්ධව අපි ඉදිරියේදී පැහැදිලි කරන්නම්. මම හිතන විධියට, කම්කරු නියෝජ්‍ය ඇමතිතුමා මේ කරුණු දන්නේ නැහැ. *[බාධා කිරීමක්]* හරි, හරි. දන්නේ නැතිකම ගැන අපි කනගාටු වෙනවා. නමුත් මේක තමයි ඇත්ත. මේක තමයි මහ පොළොවේ වෙලා තිබෙන දේ. *[බාධා කිරීමක්]* මම විශේෂයෙන්ම කියන්න ඕනෑ, මේ වෙනකොට මහ බැංකු අධිපතිතුමා,- *[බාධා කිරීමක්]*

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
මම වැඩබලන කම්කරු ඇමතිවරයා. *[බාධා කිරීමක්]*

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
හරි, හරි. වැඩබලන එක ලොකු දෙයක්ද? *[බාධා කිරීමක්]* එහෙම තමයි. වැඩ බලනවා, ඇමති ගියාම. ඒ ගැන ඔබතුමා පොඩ්ඩක් චූන් වෙන්න. සාමාන්‍ය දෙයක් නේ, ඒක; සාමාන්‍ය දෙයක් නේ. ඇමතිතුමා විදේශගත වුණාම නියෝජ්‍ය ඇමති වැඩ බලනවා. ඕක ලොකු දෙයක් නොවෙයි. පොඩ්ඩක් වාඩි වෙන්න. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් වාඩි වෙන්න, මහත්තයෝ. *[බාධා කිරීමක්]*

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මහ බැංකු අධිපතිතුමා පැහැදිලිව කිව්වා, උද්ධමනය සියයට හත දක්වා වැඩි වී තිබෙනවා කියලා. කලින් කථා කරපු මන්ත්‍රීතුමා කිව්වා, අපේ රටේ රුපියල ශක්තිමත් වෙලා තිබෙන්නේ කියලා. ඒ නිසා වෙන්න ඇති, රනිල් වික්‍රමසිංහ හිටපු ජනාධිපතිතුමාගේ කාලයෙන් පසුව තමුන්නාන්සේලා රට භාරගෙන රුපියල් 290 ඉඳලා අද වනවිට රුපියල් 336-340 දක්වා ඩොලරයේ අගය ඉහළ ගිහින් තිබෙන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
342යි.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
අද ඩොලරයේ අගය රුපියල් 342යි. ඒක තමයි ශක්තිමත්කම. එතකොට මොකද වෙන්නේ? අද වනකොට මේ රටේ ජනතාව ඉතාම අමාරුවෙන් ජීවත් වෙන්නේ. ඒක තමුන්නාන්සේලා දන්නේ නැහැ. විපක්ෂ නායකතුමා කිව්වා වාගේම අද වනවිට දුප්පත්කම සියයට 30ට වඩා වැඩි වෙලා තිබෙනවා. ජනතාවට ජීවත් වෙන්න බැරි තරමට අද අත්‍යවශ්‍ය භාණ්ඩ හැම එකකම මිල ඉහළ ගිහින් තිබෙනවා. ඩොලරයේ අගය වැඩි වෙනවා කියන්නේ මොකක්ද? අද විදේශ රටවලින් ගෙන්වන හැම භාණ්ඩයකම මිල වැඩි වෙනවා. ඒ විතරක් නොවෙයි, අපි අපනයනය කරන භාණ්ඩ වර්ග ගොඩක් නිෂ්පාදනය කරන්න අවශ්‍ය අමුද්‍රව්‍ය ගෙන්වන්නේ පිට රටින්. ඒවායේ නිෂ්පාදන වියදමත් වැඩි වෙලා තිබෙනවා. ඒ නිසා තමුන්නාන්සේලා මේ කථා කරන දේ නොවෙයි අද වෙලා තිබෙන්නේ. අද අපේ රට ඉතාම අවාසනාවන්ත තැනකට ගිහින් තිබෙනවා.

ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ වන රීති සම්බන්ධයෙන් කථා කරන මේ වෙලාවේදී මම පැහැදිලිව කියන්න ඕනෑ, මේ තත්ත්වය අපි 2002දීත් දැකපු බව. ඒ තත්ත්වය තමයි අදත් ඇති වෙලා තිබෙන්නේ. මේ වෙනකොට මහ බැංකුවෙන් චක්‍රලේඛයක් නිකුත් කර අපනයනකරුවන්ට නොයෙකුත් වාරණ දමා තිබෙනවා. විශේෂයෙන්ම අපනයනකරුවන්ට ලැබෙන ඩොලර් ප්‍රමාණය තමන්ගේ account එකේ දවස් 90ක් තියා ගන්න පුළුවන්කම තිබුණා. නමුත් අද වනවිට එම කාල සීමාව මාසය දක්වා අඩු කර තිබෙනවා. මේක අපි ඉස්සෙල්ලාත් දැක්කා. ගෝඨාභය රාජපක්ෂගේ පාලන කාලයේ අවසාන භාගයේ, එහෙම නැත්නම් ආර්ථිකය කඩා වැටෙනකොටත් මේකම කළා. මේක අලුත් දෙයක් නොවෙයි. ඒ නිසා අද වනකොට ඉතාම අවාසනාවන්ත තැනකට තමයි මේ රට යන්නේ. ඒක තමයි අපි මේ කියන්නේ.

අපි දැන් සිහින දකිනවා කියලා කලින් කථා කළ මන්ත්‍රීතුමා කිව්වා. සිහින දකින්නේ තමුන්නාන්සේලා. රටේ ජනතාව ඉතාම භයානක තැනකට වැටී තිබෙනවා. මේ අනතුරුදායක තත්ත්වය තුළ රටේ ආර්ථිකය ඉතාම අවාසනාවන්ත තැනකට කඩා වැටීගෙන යනවා. ඒ නිසාම තමයි අපි කියන්නේ උද්ධමනය සියයට හත නොවෙයි, ඊළඟ මාසය වෙනකොට ඊට වඩා වැඩි වෙන්න පුළුවන් කියලා. මොකද, ඩොලරයේ අගය වැඩි වීම නිසා වාගේම ගෙන්වන භාණ්ඩවල මිල වැඩි වීම නිසාත් රටේ ජීවත් වන ජනතාව ඉතා අපහසුතාවට පත් වෙනවා.

රජයක් හැටියට මේවා සම්බන්ධයෙන් ගන්නා පියවර පිළිබඳව අපට කිසිම පැහැදිලි තත්ත්වයක් අද වනකොට පෙනෙන්න නැහැ. මේ තත්ත්වය තුළ, 2024 වර්ෂයේ අග භාගයේ තිබුණු තත්ත්වයට වඩා ඉතාම අවාසනාවන්ත තැනකට මේ අවුරුදු එකහමාර තුළ රට ගමන් කරමින් තිබෙනවා. ඒක තමයි ඇත්ත තත්ත්වය, ආර්ථික වශයෙන් ගත්තාම.

දැන් මැද පෙරදිග යුද්ධය ගැනත් කථා කරනවා. මේ මැද පෙරදිග යුද්ධය ප්‍රශ්නයක් බව අපි දන්නවා. නමුත්, ඒ යුද්ධයම නොවෙයි මේකට ප්‍රශ්නය. ඒ යුද්ධය පටන් ගන්න කලින් තමයි අපේ රටේ රුපියල ක්ෂය වෙන්න පටන් ගත්තේ. ඒ නිසා මේකට ඒ යුද්ධයම නොවෙයි බලපා තිබෙන ප්‍රශ්නය. තමුන්නාන්සේලා මේ රටේ ජනතාවට කිව්වේ, අපි වෙනසක් කරනවා, අපි මේ රටේ ආර්ථිකය ගොඩ දානවා කියලායි. නමුත්, රනිල් වික්‍රමසිංහ හිටපු ජනාධිපතිතුමා පවත්වාගෙන ආපු ආර්ථිකයවත් තමුන්නාන්සේලාට ගෙන යන්න බැරි වෙලා තිබෙනවා. එතුමා ගෙනාපු වෙනස්කම් ටික; මේ රටේ ආර්ථික වශයෙන් කරන්න අවශ්‍යව තිබුණු වෙනස්කම් ටික කරපු නැති නිසා දැන් ඇති වෙලා තිබෙන මේ තත්ත්වය භයානක ගමනකට ආරම්භය වෙලා තිබෙනවා.

අපි දැක්කා, නියෝජ්‍ය මුදල් ඇමතිවරයා කථා කරනවා. ඩොලරය රුපියල් 350ට ගිය වෙලාවේදී නියෝජ්‍ය මුදල් ඇමතිවරයා මොකක්ද කිව්වේ? "ඒක ප්‍රශ්නයක් නොවෙයි" කිව්වා. එතුමාට ඒක ප්‍රශ්නයක් නොවෙන්න පුළුවන්. නමුත්, ඒක මේ රටේ ජනතාවට ප්‍රශ්නයක්; මේ රටේ ආර්ථිකයට ප්‍රශ්නයක්. හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ රජය කාලයේ හිටපු මුදල් ඇමතිවරයා වන බැසිල් රාජපක්ෂ මැතිතුමාත් කිව්වේ එහෙමයි. අපි IMF එකට යන්න කියනකොට එතුමා කිව්වා, අපි IMF එකට යන්න අවශ්‍ය නැහැ, අපිට ඉන්දියාවේ සහාය තිබෙනවා, IMF එකට යන්නේ නැතිව අපි මේ රටේ ආර්ථිකය ගොඩ ගන්නවාය කියලා. නමුත්, අන්තිමට මොකක්ද වුණේ? ආර්ථිකය බංකොලොත් වෙලා මේ රටේ ලක්ෂ 220ක් ජනතාවට විශාල දුක් කන්දරාවකට මුහුණ දෙන්න සිද්ධ වුණා; පෝලිම්වල ඉන්න සිද්ධ වුණා; තෙල් පෝලිම්වල විතරක් නොවෙයි, හැම පෝලිමකම ජනතාවට ඉන්න සිද්ධ වුණා. ආර්ථිකය කඩාගෙන වැටිලා මේ රට අවාසනාවන්ත තැනකට පත් වුණා. ඒ නිසා තමුන්නාන්සේලාට මම කියනවා, කොවිඩ් වසංගතයෙන් පස්සේ ගෝඨාභය රාජපක්ෂ රජය කාලයේ රටේ ඇති වූ තත්ත්වය වාගේ තත්ත්වයකට මේ අවුරුදු එකහමාර තුළ තමුන්නාන්සේලා නැවත වතාවක් මේ රට ගෙනැල්ලා තිබෙන බව. තමුන්නාන්සේලා හැම වෙලාවේදීම කියන්නේ අපි බලයට එනකොට භාර ගත්තේ පෝලිම් තිබෙන, එහෙම නැත්නම් කඩාගෙන වැටුණු ආර්ථිකයක් කියායි. ඇත්තටම පැහැදිලිව මම කියන්න ඕනෑ, තමුන්නාන්සේලා භාර ගත්තාට වඩා ඉතා අවාසනාවන්ත තැනකට මේ අවුරුදු එකහමාර තුළ මේ රට ගෙනැල්ලා තිබෙන බව. මේ තත්ත්වය තුළ රටේ උද්ධමනය වැඩි වෙලා, ජනතාවට ජීවත් වෙන්න බැරි විධියේ ඉතාම අපහසු තැනකට මේ රට පත් වෙලා තිබෙනවා.

විශේෂයෙන්ම ග්‍රාමීය මට්ටමින් බැලුවාම පෙනෙනවා, තමන්ගේ දරුවන්ට කෑම ටික දෙන්න අහිංසක, දුප්පත් ජනතාව කඩයකට ගිහිල්ලා අද වනකොට පරිප්පු ග්‍රෑම් 50ක්, සීනි ග්‍රෑම් 50ක් ගන්න ආකාරය. ඔබතුමන්ලා ගමට ගිහිල්ලා බලන්න. අන්න එවැනි අවාසනාවන්ත තත්ත්වයකට මේ රට පත් වෙලා තිබෙනවා. දුප්පත්කම සියයට 30කට වඩා වැඩි වෙලා කියන්නේ, පවුල් ගණනාවක් මේ තත්ත්වය තුළ විශාල පීඩාවකට පත් වෙලා තිබෙනවාය කියන එකයි. මේ සම්බන්ධව අවශ්‍ය පියවර අරගෙන මේ රටේ ජනතාව ජීවත් කරවන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියලා තමුන්නාන්සේලාට මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.37]

**ගරු මහින්ද ජයසිංහ මහතා (කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ - தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Mahinda Jayasinghe - Deputy Minister of Labour)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

මීට කලින් ගරු විපක්ෂ නායක "AI සජිත් ප්‍රේමදාස" මැතිතුමාත්, විපක්ෂයේ තව මන්ත්‍රීවරුනුත් බොරු බේගල් විශාල ප්‍රමාණයක් ඇද බෑවා. එතුමන්ලාගේ පුරුද්ද බොරු කියන එක වුණාට අපිට වගකිව යුතු ආණ්ඩුවක් විධියට වගකීමක් තිබෙනවා, ඒවාට උත්තර දෙන්න. "AI සජිත් ප්‍රේමදාසටත්", විපක්ෂය නියෝජනය කරමින් දැන් කථා කරපු මන්ත්‍රීතුමාටත් මම අභියෝග කරනවා, අද බැරි නම් හෙට, හෙට බැරි නම් අනිද්දා, එහෙම නැත්නම් ඊළඟ පාර්ලිමේන්තු රැස්වීම් සතියේ හෝ අපේ ආණ්ඩුවේ මේ වසර එකහමාරක කාලය තුළ ලක්ෂ ගණනක් රැකියා අහිමි වුණාය කියන එකට අදාළ සංඛ්‍යාලේඛන, දත්ත සහිතව සහ ආයතන සහිතව ඉදිරිපත් කරන්න කියලා. අපේ ආණ්ඩු කාලය තුළ කර්මාන්තශාලා ඇතුළේ විවිධ අර්බුද මතු වුණා. කම්කරු අමාත්‍යාංශය විධියට අපි මැදිහත් වෙලා, හාම්පුතුන්, වෘත්තීය සමිති නියෝජිතයින්, නැත්නම් ඒ ආයතනවල සේවකයින් ගෙන්වලා ඒ හැම අර්බුදයක්ම - කාර්මික ආරාවුලක්ම - සමථයකට පත් කළා. අපි 1/12 ගිවිසුම් ගණනාවක් අත්සන් කළා. මීට සති දෙක තුනකට කලින් හෙළ ක්ලෝතින් කියන ආයතනයේ 5,000කගේ රැකියා අහිමි වෙන්න ගිය වෙලාවේ ඒ සඳහා මැදිහත් වෙලා අපි ඒ අයගේ රැකියා ටික ආරක්ෂා කර දුන්නා. ඒ ආයතන අතරේ කාර්මික සාමය ගොඩ නඟන්න කටයුතු කළා. එහෙමයි වර්තමාන ආණ්ඩුව බලයට පත් වුණාට පස්සේ කටයුතු කරලා තිබෙන්නේ.

මේගොල්ලන් අද පාර්ලිමේන්තු වරප්‍රසාදවලට මුවා වෙලා මේ පාර්ලිමේන්තුව ඇතුළේ ඕනෑම බොරුවක්, ඕනෑම බේගලයක් ඇද බානවා, කිසි හිරිකිතයක් නැතුව. ලජ්ජයි! අපට ඊයේ එක නීතිඥ මහත්මයෙක් කිව්වා, "ලජ්ජයි" කියලා. ලජ්ජා වෙන්න ඕනෑ ඒගොල්ලන්. ලජ්ජයි! හැම දාම මොනවා හරි දෙයකට උත්තර දී ගන්න බැරි වෙනකොට ගලේ පහරපු බළලුන් වාගේ 1988-89 කාලය ගැන කියනවා. විපක්ෂය පැත්තේ ඉන්න හිටපු ඇමතිතුමා අදත් ඒක කිව්වා. හැම දාම එහෙමයි. රූපවාහිනී සංවාදයකට

[ගරු මහින්ද ජයසිංහ මහතා]

ගියත්, පාර්ලිමේන්තුවේත් අපි ප්‍රශ්නයක් ඇහුවාම ඒකට උත්තර දී ගන්න බැරි වෙනකොට 1988-89 ගැන කියලා ඒකට මුවා වෙනවා. මම නැවත නැවත අභියෝග කරනවා, පුළුවන් නම් මේ ඉදිරි දින දෙකේ - හෙටයි, අනිද්දායි - පාර්ලිමේන්තුවට සංඛ්‍යාලේඛන සහිතව ඉදිරිපත් කරන්න, රැකියා අහිමි වෙච්ච ප්‍රමාණය.

ඒ විතරක් නොවෙයි. අපි ආර්ථිකය බංකොලොත් කළාලු. රනිල්ගේ කාලයේ තිබුණු තැනට වඩා වැට්ටුවාලු. කොයි ලෝකවල ඉඳලාද මේ කථා කරන්නේ? රනිල් වික්‍රමසිංහ මේ රට භාර ගන්න කොට තිබුණු තැනට වඩා විදේශ ප්‍රේෂණවලින් අපි ඉහළට ඔසවා තිබෙනවා. වැඩිම විදෙස් ප්‍රේෂණ. වැඩිම සංචාරකයෝ. ඒ වාගේම ආර්ථිකය දියුණු කරලා තිබෙනවා. ඩොලර් බිලියන 7.2ක දක්වා අපේ විදෙස් සංචිත ඉතුරු කර ගන්න අපි සමත් වුණා. රනිල් කොහොමද විදේශ සංචිත හැදුවේ? රනිල් විදේශ සංචිත හැදුවේ ආර්ථිකය හිරකරලා. 2019න් පස්සේ වාහන ආනයනය කළේ නැහැ. අපි වාහන ආනයනය කළා ඩොලර් බිලියන දෙකකට වැඩි ප්‍රමාණයක් වැය කරලා. එහෙමත් කරලා තමයි මේ ආර්ථිකය මේ තිබෙන තත්ත්වයට ගෙනැල්ලා තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. විපක්ෂයේ අය බොරු බේගල් ඇද බානවා.

මේ වනකොට විපක්ෂය පැත්තේ ඉන්න කිහිප දෙනෙක් කලබල වෙලා ඉන්නේ. නයි දෙරණ නාළිකාවේ හිමිකරු ඊයේ ඔහුගේ කථාව මුල පිරුවේ අනාගතයේ දැවැන්ත ආර්ථික අර්බුදයක් එනවා කියලායි. ඒක තමයි කථාවේ ආරම්භය. එතුමා ප්‍රාර්ථනා කරනවා ඇති, විපක්ෂයේ අනෙක් අය කල්පනා කරනවා වාගේ රටේ ආර්ථික අර්බුදයක් ඇවිල්ලා, රටේ ජනතාවට තුන් වේල කන්න විධියක් නැතුව තුන් වේලම රොටි පුච්චාගෙන කන ආර්ථිකයක් ලැබේවා කියලා. අල කොළයි, රොටියි කන ආර්ථිකයක් ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවා ඇති. මම දැක්කා ඊයේත් කියනවා, බෝධි පූජා තියන්න ගියා ලු. මගේ අම්මේ! බුද්ධාගමට අපහාස කරපු එක්කෙනා; අපේ බුදුරජාණන් වහන්සේට අපහාස කරපු එක්කෙනා. බෝධි පූජා කරලා ඒ අපහාසවලින් ගැලවෙන්න බැහැ.

ඊයේ දවසේ සැහෙන්න කලබල වෙලා හිටියා, නාමල් ඇතුළු කණ්ඩායම. සලේ අත්අඬංගුවට අරගෙන සලේගේ පැත්තෙන් නම කියැව්වාද, නැද්ද කියලා අපි දන්නේ නැහැ, ගෝඨාභයට විදෙස් ගමන් තහනමක් පැනෙව්වා. ඒ අය කලබල වුණා. පොහොට්ටුව, දිලිත්ලා ඇතුළු හතර ගාතේ දාලා ඉන්න අනාථ විපක්ෂයේ එළියේ සෙට් එකක් ඉන්නවා. ගම්මන්පිල, වීරවංශ ඇතුළු ඒ සෙට් එක කලබල වෙන එක ගැන නම් අපි පුදුම වෙන්නේ නැහැ. අපි බැලුවා, ඇයි සජබය මෙච්චර කලබල වෙලා තිබෙන්නේ කියලා. අද පාර්ලිමේන්තුව ගත්තාම එකම ගාලගෝට්ටියක්. බොරු බේගල් ඇද බාමින් සැහෙන කලබල වෙලා තිබෙනවා. අපි බැලුවා, පොහොට්ටුවේ අය කලබල වෙන කොට මේගොල්ලනුත් කලබල වෙන්නේ ඇයි කියලා. මේගොල්ලන්ගෙත් යම් ඥාති සම්බන්ධයක් තිබෙනවාද දන්නේ නැහැ මේ දේවල්වලට.

අපි දන්නවා, මේ ආර්ථිකය ගැන. අපට ඒක නොතේරෙනවා නොවෙයි. මහ පොළොවේ දේශපාලනය කරපු, කරන මිනිස්සු විධියට, මහ පොළොවේ ජනතාවත් එක්ක හැම දාම එකට ජීවත් වෙන මිනිස්සු විධියට අපි දන්නවා මේ රටේ ජනතාවට තිබෙන ආර්ථික අපහසුකම් ගැන. අපි ඒ වෙනුවෙන් හැම දාම අරගළ කරපු මිනිස්සු; ඒ වෙනුවෙන් සටන් කරපු මිනිස්සු. ඒක නිසා අපි ඒ ගැන ඔයගොල්ලන්ට වඩා හොඳට දන්නවා, මහත්වරුනි. රටේ ජනතාව ආර්ථික අර්බුදවලට වැටෙන කොට ඔයගොල්ලන් වාගේ සඳලු තලවල අපි ජීවත් වුණේ නැහැ. එදත් නැහැ. අදත් නැහැ. ඒ නිසා අපි ඒ ජනතාවගේ ආර්ථික අර්බුදය ගැන හොඳට දන්නවා. 2024 සැප්තැම්බර් මාසයේ බලයට එනකොට තිබුණු තෙල් මිල රුපියල් 50කට වැඩි ප්‍රමාණයකින් අඩු කරපු ආණ්ඩුවක්, මේක. මේ මහත්වරුන්ට තේරුම් ගන්න බැරි වුණාට තෙල් පෝලිමක් ළඟට ගිහින් තෙල් පෝලිමේ ඉන්න මේ රටේ, ලෝකයේ දේශපාලනය ගැන අබමල් රේණුවක හෝ කියවීමක් තිබෙන කෙනෙක්ගෙන් ඇහුවොත් ඒ කෙනා කියනවා, මේක මේ ආණ්ඩුවට පාලනය කර ගන්න බැරි අපේ පාලනයෙන් තොර ප්‍රශ්නයක් කියලා. මැද පෙරදිග යුද්ධය තවමත් ඇවිළෙනවා. ඊයේ පෙරේදාත් ගහ ගන්නවා. අදත් ගහ ගන්නවා. මේක තවදුරටත් ඇවිළෙන යුදමය වටපිටාවක්. එවැනි වටපිටාවක් තුළ තමයි රටේ ජනතාවට තෙල් අර්බුදයකට යන්න දෙන්නේ නැතුව, හැමදාම තෙල් ටික ලබා දෙමින්, ගෑස් ටික ලබා දෙමින්, ආර්ථිකය කළමනාකරණය කරමින් යන්නේ. හැබැයි අපි දන්නවා, බඩු මිල වැඩිවෙලා තිබෙන බව. මතක තබා ගන්න. අපි අපේ අවුරුදු එකහමාර තුළ භාණ්ඩ වර්ග 40කට වැඩි ප්‍රමාණයක මිල අඩු කළා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඒ අඩු කරපු බඩු මිල තමයි මේ අර්බුදයත් එක්ක ක්‍රමානුකූලව ඉහළ යමින් තිබෙන්නේ.

මේ සියලු තත්ත්වයන් මැද අපට "දිට්වා" සුළි කුණාටුවට මුහුණ දෙන්නත් සිදු වුණා. ඒ වෙනුවෙන් රුපියල් බිලියන 500ක් - කෝටි 50,000ක් - වෙන් කළා. ඒ අනුව අපි කටයුතු කරමින් ඉන්නවා. මේ කාල සීමාව තුළ අත්‍යවශ්‍ය සේවාවන් සඳහා රාජ්‍ය සේවකයින් 120,000ක් බඳවාගෙන තිබෙනවා. අපි රාජ්‍ය සේවක වැටුප් වැඩි කළා; අවුරුදු 3ක් තුළ තුන් වතාවකදී ඔවුන්ගේ වැටුප් වැඩි වෙනවා. අලුතින් උපාධිධාරි ගුරුවරු බඳවා ගන්න කටයුතු කරමින් තිබෙනවා. මේ ආර්ථිකය හැම පැත්තකින්ම කළමනාකරණය කරමින්, ඔබතුමන්ලාගේ කාලවල - 2019 සැප්තැම්බර් 01 දිනට කලින් - අනියම්, තාවකාලික හා කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන සිටි 9,800ක් වන සේවකයින් පිරිසක් ස්ථිර කරන්නත් කටයුතු කරපු ආණ්ඩුවක්, මේක. එම නිසා අපි කියනවා, ඔබතුමන්ලා සිහින දකින්න, ඔබතුමන්ලාගේ සිහින දැකීමේ අයිතියට අපි අබමල් රේණුවකින්වත් බාධා කරන්නේ නැහැ. සජිත් මහත්මයා ඇතුළු සජබයේ සහ විපක්ෂයේ කණ්ඩායම්වලට අපි බාධා කරන්නේ නැහැ. සිහින දකින්න. හැබැයි, අපි එක කාරණයක් අවධාරණය කරනවා. ඔබතුමන්ලා මොන තරම් බඩ පිනුම්, හිටි පිනුම් ගැහුවත්, ජාතික ජන බලවේගය ආණ්ඩුව ඒ කිසිවකට සැලෙන ආණ්ඩුවක් නොවෙයි කියලා අපි සහතික වෙනවා. ඒ විතරක් නොවෙයි, මේ රටේ පෞද්ගලික අංශයට, වතු ක්ෂේත්‍රයට, රාජ්‍ය අංශයට, වැඩ කරන ඒ සියලු ජනතාවට දෙන්න පුළුවන් උපරිම සහන ලබා දෙමින්, මේ රටේ සියලුම පොදු ජනතාවට දෙන්න පුළුවන් සහන ලබා දෙමින් අපි කටයුතු කරනවා. විශේෂයෙන් අපි ඒ කාරණයත් අවධාරණය කරනවා. ඒ වාගේම මැදපෙරදිග යුදමය වටපිටාව අවසන් වෙලා ආර්ථිකය යථාවත් වුණාට පස්සේ, බලශක්ති අර්බුදයෙන් අපේ රට මිදුණාට පස්සේ අනිවාර්ය ලෙසම අපි මීට වඩා සහන සහිත රටක්, ආර්ථිකයක් ගොඩ නඟනවා. එතෙක් ඔබතුමන්ලා සිහින දකින්න. ඒ සිහින දැකීමේ අයිතියට අපි බාධා කරන්නේ නැහැ කියමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.46]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඊයේ රාත්‍රියේ තමයි ආණ්ඩුව මේ සංශෝධනය ගේන්න තීන්දු කළේ. අපනයනකරුවන් මේ රටට ගෙනෙන ඩොලර් දින 30ක් ඇතුළත රුපියල් බවට පරිවර්තනය කරන්න ඕනෑය කියන තීන්දුව අරගෙන අද ඒක පාර්ලිමේන්තුවට ගෙනැල්ලා තිබෙනවා. මේක හදිසියේ ගෙනාවේ ඇයි? අපනයනකරුවන්ට ඩොලර් ගෙනැල්ලා ඒවා රුපියල් බවට පරිවර්තනය කරන්න මීට කලින් දින 90ක කාලයක් ලබා දීලා තිබුණා. එහෙම තිබුණු එක තමයි ඊයේ රෑ හදිසියේම තීරණයක් අරගෙන වෙනස් කළේ. ටෙලිකොම් කුලුනු සම්බන්ධ යෝජනාවක් තමයි අද ගෙනෙන්න තිබුණේ. ඒක නවත්වලා ඊයේ රෑ තීරණය කරලා හදිසියේම ඇයි මේ යෝජනාව ගෙනාවේ?

ජනාධිපතිතුමා මැයි මාසයේ 13වැනි දා IMF එකට ලියනවා, ඒ දින 90ක කාලය අයින් කරනවා කියලා. ඒ කියන්නේ, ආර්ථිකය තවත් ලිහිල් කරලා දින 90 සීමාව අයින් කරලා අපනයනකරුවන්ට ඊට වඩා සහනයක් ලබා දෙනවාය කියන එක තමයි ජනාධිපතිතුමා මැයි මාසයේ 13වැනි දා IMF එකට ලියපු ලියුමේ සඳහන් කරලා තිබෙන්නේ. ඒ ලියුම ලියලා සති තුනක් ගියේ නැහැ, දැන් ජනාධිපතිතුමා reverse එකට ඇවිල්ලා තිබෙනවා. ජනාධිපතිතුමා reverse එකට ඇවිල්ලා දැන් කියනවා, දින 90 දින 30කට සීමා කරනවා කියලා. ඇයි, එහෙම කළේ? ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එහෙම කළේම crisis එකක් තිබෙන නිසායි. ඒ කියන්නේ අර්බුදයක් තිබෙනවා. අර්බුදයක් තිබෙන නිසා තමයි මේක කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ. දැන් ආණ්ඩුව පිළිගන්නවා, දින 90ක කාලය දින 30ට ගෙනාවේම අර්බුදයක් තිබෙන නිසා කියලා. මොකක්ද, අර්බුදය? රටේ ඩොලර් නැතිකමක් තිබෙනවා; ඩොලර් හිඟයක් තිබෙනවා. ඒ ඩොලර් හිඟය පියවා ගන්න තමයි ඒක දින 30 දක්වා අඩු කළේ. ඒ කාලය දින 30ට අඩු කළාම අපනයනකරුවන් ළඟ තිබෙන ඩොලර් ටික වෙළෙඳ පොළට එයි කියලා ආණ්ඩුව විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විශේෂයෙන්ම පසුගිය දවස් ටිකේම ඩොලර් එක ඉතා ඉහළට යනවා අපි දැක්කා. අපි දැක්කා, මීට සති දෙකකට කලින් ඩොලර් එක රුපියල් 350ට ගියා. එහෙම ගියාම මහ බැංකුව පොලී අනුපාතය ඉහළ දැම්මා. පොලී අනුපාතය ඉහළ දාලත් ඩොලරයේ අගය අඩු වුණේ නැහැ. ඊළඟට, IMF එකෙන් ඩොලර් මිලියන 695ක් ලැබුණා. ඒ මුදල ලැබිලාත් ඩොලර් එකේ අගය අඩු වුණේ නැහැ; රුපියල ශක්තිමත් වුණේ නැහැ. ඒ හින්දා දැන් ආණ්ඩුව බලනවා, අපනයනකරුවන්ට දින 90ක් දීපු එක දින 30ක් කරලා ඩොලර් ටික මාර්කට් එකට ගේන්න පුළුවන්ද කියලා. මේකට අපි කියනවා, forced conversion කියලා. ඒ කියන්නේ බලහත්කාරයෙන් මේක කරන්න හදනවා. බලහත්කාරයෙන් කරන්න ගියාට මේක එහෙම කරන්න පුළුවන්ද? ඒක තමයි දැන් තිබෙන ප්‍රශ්නය.

ඊළඟ කරුණ මේකයි. අපේ ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කිව්වා වාගේ දැන් ආණ්ඩුව normal mood එකේ ඉඳන් crisis mood එකට මේක මාරු කරලා තිබෙනවා. ආණ්ඩුවට කියන්න පුළුවන්, එහෙම crisis එකක් නැහැ කියලා. Crisis එකක් නැත්නම් මාර්කට් එකේ ඩොලර් තිබෙන්න ඕනෑ. නමුත් මාර්කට් එකේ දැන් ඩොලර් නැහැ. මහ බැංකුව unofficially වාණිජ බැංකුවලට කියලා තිබෙනවා, රටේ අත්‍යවශ්‍ය භාණ්ඩවලට විතරක් TT ගහන්න කියලා. අනෙක් ඒවාට ප්‍රමුඛතාව දෙන්න එපා කියලා මහ බැංකුව, unofficially දැනුම් දීලා තිබෙනවා. ඒක officially දැනුම් දීලා නැහැ. ඒ වුණාට සමහර වාණිජ බැංකු දැනටමත් ඒක ක්‍රියාත්මක කරනවා. ඒගොල්ලන් අත්‍යවශ්‍ය භාණ්ඩවලට විතරයි TT ගහන්නේ. ඒ හින්දා අපට පෙනෙන්නට තිබෙනවා, මේක යම් crisis එකකට දැන් ගමන් කරනවා කියලා. මේක ඉතාම භයානකයි. අපි මේක කලින් කිව්වා. ඒ කියන්නේ වෙළෙඳ පොළේ විශ්වසනීයත්වය බිඳ වැටිලා තිබෙනවා. වෙළෙඳ පොළේ විශ්වසනීයත්වය බිඳ වැටුණු නිසා තමයි වෙළෙඳ පොළ තුළ දැන් ඩොලර් හිඟයක් මතු වෙලා තිබෙන්නේ. තමුන්නාන්සේලා ඒ විශ්වාසය ගොඩ නඟන්නේ නැතුව එක එක නීති රීති ගෙනැල්ලා මේ වෙළෙඳ පොළ පාලනය කරන්න පුළුවන් කියලා හිතනවා නම්, මේක ඉතාම නරක තැනකට ගමන් කරයි කියලා මම හිතනවා.

අපි සති දෙකකට කලින් මේක කිව්වා. අද වනකොට ඩොලර් එක ආයෙත් රුපියල් 337කට ඇවිත් තිබෙනවා. තමුන්නාන්සේලා ආණ්ඩුව භාර ගන්න කොට ඩොලර් එක රුපියල් 290ට තිබුණේ. එක පැත්තකින්, සංචිත වැඩි වෙනවා. සංචිත වැඩි වුණාට අපේ රටේ ඩොලර් හිඟයක් තිබෙනවා. ඒ වාගේම උද්ධමනය වැඩි වෙගෙන යනවා. මේක හරියට මොකක් වගේද? ගෙදරක තාත්තාගේ ඉතිරි කිරීමේ ගිණුමේ මුදල් තිබෙනවා, නමුත් ගෙදර ළමයින්ට කන්න නැහැ වාගේ දෙයක්. ඒ වාගේ ප්‍රශ්නයක් තිබෙන්නේ. ඩොලර් තිබෙනවා. ඩොලර් තිබුණාට උද්ධමනය වැඩි වෙනවා; භාණ්ඩවල මිල ඉහළ යනවා; මාර්කට් එකේ ඩොලර් නැහැ. ආයෙත් කිව්වොත්, මේක හරියට, ගෙදරක තාත්තාගේ නමට තිබෙන ඉතිරි කිරීමේ account එකේ සල්ලි තිබෙන නමුත් ගෙදර ළමයින්ට කන්න දෙන්න සල්ලි නැහැ වාගේ දෙයක්. මේ දෙකම තිබෙන්න ඕනෑ. ඉතිරි කිරීමේ ගිණුමේ සල්ලි තිබෙන්නත් ඕනෑ; ගෙදර අයට කන්න දෙන්න සල්ලි තිබෙන්නත් ඕනෑ. අප කියන්නේ ඒ තත්ත්වය හදන්න කියලායි. නමුත්, තමුන්නාන්සේලා ඒ තත්ත්වය හදන්නේ නැතුව වෙළෙඳ පොළ පාලනය කරන්න නීති රීති ගෙන ඒම තුළ වෙළෙඳ පොළේ විශ්වාසය බිඳ වැටෙන්න පුළුවන්. ඒ විශ්වාසය බිඳ වැටුණොත් මේක නරක තැනකට තල්ලු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, තව දෙයක් තිබෙනවා. මේ රටට ඩොලර් ගෙන එන අපනයනකරුවන් ඉන්නවා. මේ රටේ තිබෙන විශාල කර්මාන්තයක් තමයි පලතුරු හා එළවලු අපනයන කර්මාන්තය. එම අපනයනකරුවන් ප්‍රධාන වශයෙන් 30දෙනෙක් ඉන්නවා. ඒගොල්ලන් පසුගිය අවුරුදු හතළිස් ගණන තුළ අවුරුද්දකට ඩොලර් බිලියන එක ගණනේ මේ රටට ආදායම ගෙනාවා, මැද පෙරදිගට පලතුරු හා එළවලු අපනයනය කරලා. ඔය කියන මැදපෙරදිග යුද්ධය පෙබරවාරි මාසයේ 28වැනි දා පටන් ගත්තාට පස්සේ ඒ අපනයනය සම්පූර්ණයෙන් කඩා වැටිලා තිබෙනවා. ඒ අපනයනය කඩා වැටීම නිසාම ඒගොල්ලන් යවපු කන්ටේනර් විශාල ප්‍රමාණයක් අද වන කොට වරායේ හිර වෙලා තිබෙනවා. ඒ කන්ටේනර් යවාගන්න විධියක් නැහැ. මොකද, මැද පෙරදිග යුද්ධයක් තිබෙන නිසා අද ඒ කන්ටේනර් ඔක්කොම return වෙලා තිබෙනවා. Return වුණු කන්ටේනර් එකක් dispose කරන්න එක අපනයනකරුවෙකුට ලක්ෂ 16ක් demurrage ගෙවන්න වෙලා තිබෙනවා. මොකද, මේ වන කොට ඒ කන්ටේනර් ඇවිල්ලා දින 50කට වඩා වරායේ, රේගුවේ තියාගෙන ඉන්නවා. ඒවාට අදාළ රජයේ නිලධාරින් මැදිහත් වෙලා ඒ කන්ටේනර් ඉක්මනින් එළියට දමන්නේ නැහැ. ඒ අපනයනකරුවන් ජනාධිපතිතුමාට ලියුම් ලියලා තිබෙනවා; ඇමතිතුමාට ලියුම් ලියලා තිබෙනවා; අපනයන සංවර්ධන මණ්ඩලයට - Export Development Board එකට - ලියුම් ලියලා තිබෙනවා. නමුත් කියන්න කනගාටුයි, ඒ කිසිම කෙනෙක් අද වනකල්ම ඒ සම්බන්ධව මැදිහත් වෙලා නැහැ. එතකොට මේ රටට ඩොලර් ගෙන්වන ප්‍රධාන අපනයනකරුවන්ට මේ යුද්ධය හරහා ඇති වෙලා තිබෙන අකරතැබ්බයට ඇහුම්කන් දෙන්න, ඒකට විසඳුමක් දෙන්න, සහනයක් දෙන්න අද ආණ්ඩුවට

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

නොහැකි වෙලා තිබෙනවා. අද ඒගොල්ලෝ අතරමං වෙලා ඉන්නවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඒ හින්දා තමයි අප කියන්නේ අද ඒ අපනයනකරුවන් දිරිමත් කරන්න කියලා. මොකද, ඒ අය මේ රටට ඩොලර් ගෙනාපු උදවිය; මේ රටට අවුරුද්දකට ඩොලර් බිලියන එකක ආදායමක් ගෙනැල්ලා දීපු උදවිය. අද ඒ වටා ගොඩනැඟුණු විශාල සේවක පිරිසක් - 10,000ක වාගේ සේවක පිරිසක්

- ඉන්නවා; ගොවීන් ඉන්නවා; අමතර බඩු සපයන්නන් ඉන්නවා. ඒ chain එක අද සම්පූර්ණයෙන්ම බිඳ වැටිලා. ඒ හින්දා ඔබතුමන්ලාගේ අවධානයට මම එය යොමු කරවනවා. වහාම ඒ අපනයනකරුවන් ගෙන්වා කථා කරලා ඔවුන්ට අවශ්‍ය සහනය ලබා දෙන්න. මොකද, පාර්ලිමේන්තුවට ඇවිල්ලා කයිවාරු ගැහුවාට, එක එක කථා කිව්වාට වැඩක් නැහැ. එළියේ තිබෙන තත්ත්වය වෙනස්; එළියේ වෙනස් තත්ත්වයක් තිබෙන්නේ. මෙතැන ඇවිල්ලා ඔය වාගේ කයිවාරු ගැහුවා ගෝඨාභය රාජපක්ෂලාත්; ඔය වාගේ කයිවාරු ගැහුවා බැසිල් රාජපක්ෂලාත්; අජිත් නිවාඩ් කබ්රාල්ලාත්. අන්තිමට මොකද වුණේ? ආර්ථිකය කඩා වැටෙන කල් දන්නේ නැහැ. ඒ නිසා කයිවාරුවෙන් වැඩක් නැහැ. වැඩ තමයි අවශ්‍ය වෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අවසාන වශයෙන් තවත් එක දෙයක් කියන්න ඕනෑ. මේ රටේ තිබුණා දේශීය කර්මාන්තයක්, විශේෂයෙන්ම රෙදි ආනයනය කරලා, නිෂ්පාදනය කරලා වෙළෙඳ පොළට දමන. පසුගිය කාලයේ රෙදි ආනයනය කිරීමේදී ඒගොල්ලන්ට රෙදි කිලෝ එකකට රුපියල් 100ක බද්දක් ගැහුවා. CESS එක තමයි ඒගොල්ලන්ගෙන් charge කළේ, රෙදි කිලෝ එකකට රුපියල් 100 බැගින්. නමුත්, මේ අවුරුද්දේ අප්‍රේල් 01වැනි දා ඉඳන් CESS එක අයින් කරලා VAT එක පැනවූවා. ඒ සියයට 18 VAT එක පැනවූවාට පස්සේ ඒ කර්මාන්තය සම්පූර්ණයෙන්ම අවදානමකට ලක් වෙලා තිබෙනවා. ඒගොල්ලන්ගේ නිෂ්පාදන පිරිවැය ඉහළ ගිහින් තිබෙන නිසා ඒ භාණ්ඩ වෙළෙඳ පොළට දමා විකුණා ගන්න බැරි වීම හරහා 30,000ක වාගේ සේවක පිරිසක් සහ ඒ ආනයනකරුවනුත් අද වනකොට විශාල අකරතැබ්බකට මුහුණ දී සිටිනවා. මේ පිළිබඳවත් තමුන්නාන්සේලාගේ අවධානය වහාම යොමු කරන්න කියමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු විජේසිරි බස්නායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. (PROF.) SENA NANAYAKKARA took the Chair.*

[අ.භා. 2.55]

**ගරු විජේසිරි බස්නායක මහතා**
(மாண்புமிகு விஜேசிறி பஸ்நாயக்க)
(The Hon. Wijesiri Basnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ අපි විශේෂයෙන්ම සාකච්ඡාවට භාජන කරනවා අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන ඒම පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවා ඇති විධිවිධාන පිළිබඳවත්. ඒ අපනයනකරුවන් මේ රටට ආදායම් ගෙන එනවා. එසේ ආදායම් ගෙන ඒමේදී මීට ඉහත තිබුණු දින සීමාව අඩු කරලා මේ මොහොත වන විට ලෝකයේ පවතින තත්ත්වයට මුහුණ දෙන්න රටක් විධියට අප විසින් උපාය මාර්ග ගනු ලබනවා. ඒ අපනයන ක්ෂේත්‍රය ගත්තොත්, විශේෂයෙන්ම ජනවාරි ඉඳලා අප්‍රේල් වනකල් විශාල ප්‍රගතියක් අපි අත්පත් කරගෙන තිබෙනවා. විශේෂයෙන්ම ඇඟලුම් සහ රෙදිපිළි කර්මාන්තයෙන් ඩොලර් මිලියන 1,619ක් මේ රටට ගෙනෙන්න අපට හැකි වෙලා තිබෙනවා. මෙන්න මේ විධියට transport and logistics, තොරතුරු තාක්ෂණය, තේ, ඛනිජ තෙල් නිෂ්පාදන, පොල් නිෂ්පාදන, රබර් නිෂ්පාදන අංශවලින් අපි විශාල ආදායමක් අත්පත් කර ගන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මීට ඉහතදී විපක්ෂයේ ගරු මන්ත්‍රීවරු - විශේෂයෙන්ම රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා - මතු කළා ආණ්ඩුව මේ රටේ ව්‍යාපාරිකයන්ගේ ආර්ථික නිදහස නැති කරන්න යනවා; බල කිරීමක් කරනවා කියලා. අපි අවබෝධ කර ගන්න ඕනෑ මේ මොහොතේ ලෝකයේ turbulent time එකක්, crisis time එකක් තිබෙන බව. මෙන්න මෙතැනදී අපි ඒ බාහිර පරිසරය විශ්ලේෂණය කර ගන්න ඕනෑ; විග්‍රහ කර ගන්න ඕනෑ. අපි ඒකට කියනවා test factors කියලා. ඒ දේශපාලන පරිසරය, ඒ ආර්ථික පරිසරය, ඒ සමාජ පරිසරය, ඒ තාක්ෂණික පරිසරය කියන පරිසර අධ්‍යයනය කිරීම තුළින් තමයි අපට ඊළඟ ක්‍රියාමාර්ගයට යන්න පුළුවන් වෙන්නේ, අපේ strategy එක නිර්මාණය කර ගන්න පුළුවන් වෙන්නේ. මෙන්න මේ විධියට තමයි මේ මොහොතේ මේ ලෝකයේ ඇති වෙලා තිබෙන ඒ අර්බුදයත් එක්ක අප කටයුතු කළ යුත්තේ. ඒ අර්බුදයේ ප්‍රතිඵල අප වෙතටත් ගලාගෙන එනවා. මෙන්න මේ තත්ත්වය යටතේ රටේ ආර්ථිකය කළමනාකරණය කිරීමේදී අපි තීන්දු ගන්නවා; තීරණ ගන්නවා. විශේෂයෙන්ම අපි දන්නවා, මේ මොහොතේ ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය හැල්ලු වෙනවා කියලා. එහෙම නම් ආර්ථික කළමනාකරණයේදී රටක් විධියට අපි තීන්දු ගන්න ඕනෑ. මේ මොහොතේදී ආනයන වියදම වැඩි වෙලා තිබෙනවා. විශේෂයෙන්ම ඒ මැද පෙරදිග අර්බුදයත් එක්ක ඉන්ධන බැරලයක මිල වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම, ඒවා ලංකාවට ආනයනය කිරීමේදී ඒ සඳහා වන නැව් ගාස්තු, රක්ෂණ ගාස්තු වැඩි වෙලා තිබෙනවා. අපේ වාහන ආනයනය වැඩි වෙලා. එහෙම නම් මෙතැනදී මොකක්ද වෙන්නේ? එතැනදී ඩොලරයට විශාල ඉල්ලුමක් ඇති වෙනවා. අපි ඩොලර් උපයමින් යන්නේ. අපි සංචිත ගොඩ නඟමින් යන මොහොතක් මේක. නමුත්, අනපේක්ෂිත ලෙස ලෝක රටාව තුළ ඇති වන මේ ගැටලුවට අපි මුහුණ දෙන්න ඕනෑ. එහෙනම්, මෙන්න මෙතැනදී තමයි ඒ අපනයනකරුවන්ගේ ඉපැයීම් මේ රටට ගෙනැල්ලා ඉතා ඉක්මනින් තැන්පත් කරන්න කියන ඒ

කාරුණික ආයාචනය කරන්නේ. මේක බලකිරීමක් නොවෙයි. මේක force කිරීමක් නොවෙයි. විපක්ෂය හැමදාම බිල්ලෝ මවනවා. මේ මොහොතේ මේ කාරණයත් මුල් කරගෙන ඒගොල්ලන් මේ කාරණාව එහෙම්ම මේ ජන සමාජය මත පතිත කරන්න හදනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට මතක ඇති, 2022 වර්ෂයේ ලංකාව මුහුණු දුන්නු ඒ දැවැන්ත ආර්ථික, සමාජ ඛේදවාචකය. නිදහසින් පස්සේ තමයි අපි එවැනි දෙයක් අත්වින්දේ. විශේෂයෙන්ම මේකට හේතු වුණු කරුණු ගණනාවක් තිබෙනවා. එදා මොකක්ද වුණේ? එදා විදේශ විනිමය අර්බුදයක් ඇති වුණා. අද මැදපෙරදිග යුද්ධයත් එක්ක ඇතිවෙලා තිබෙන තත්ත්වය සමහරු 2022 අවුරුද්දත් එක්ක ගළපන්න හදනවා. නැහැ, එහෙම තත්ත්වයක් නොවෙයි තිබෙන්නේ. එදා දැවැන්ත විදේශ විනිමය හිඟයක් තිබුණා, අපේ රටේ වැරදි ආර්ථික කළමනාකරණය නිසා. ඒ විතරක් නොවෙයි, එදා ණය ගෙවීම් අත්හිටවුවා. ඒ වාගේම, විශාල ඉන්ධන හිඟයක් ඇති වුණා. ඖෂධ හිඟයක් ඇති වුණා. මේ රටේ උද්ධමනය සියයට 70 පසු කරපු ආකාරය අපි දැක්කා. මෙන්න මේ වාගේ දැවැන්ත ආර්ථික, සමාජයීය පරිහානියක් ඇතිවෙලා තිබුණේ. හැබැයි, අද තිබෙන තත්ත්වය එහෙම නැහැ. නමුත්, මේ විපක්ෂය වර්තමාන තත්ත්වය එදාට සංසන්දනය කරන්න හදනවා. 2022 වර්ෂයේ රාජ්‍ය ආදායම, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් විධියට 8ක, 9ක තිබුණේ. හැබැයි, අද වෙනකොට අපට හැකිවෙලා තිබෙනවා, ඒක සියයට 14ට, 15ට ගේන්න. විශේෂයෙන්ම බදු ආදායම සියයට 14ට, 15ට ගෙන්න අපට හැකිවෙලා තිබෙනවා. අද බදු එකතු කිරීමේ කාර්යක්ෂමතාව වැඩි වෙලා. බදු පදනම වැඩි වෙලා. විශේෂයෙන්ම මේ වාගේ උපාය මාර්ග අනුගමනය කිරීමෙන් තමයි එහෙම සිද්ධ වෙලා තිබෙන්නේ. අපේ විපක්ෂ නායකතුමා කියනවා, මේ රටේ මිනිසුන්ගේ බෙල්ල මිරිකලා බදු අය කරනවාලු. නැහැ. බදු කියන්නේ මේ රටේ ප්‍රධාන ආදායම් මාර්ගයක්. මම එතුමාගෙන් ප්‍රශ්න කරනවා, බදුවලින් මේ රටේ ආදායම වැඩි නොකරන්න නම් ඒ වෙනුවට තිබෙන අලුත් ප්‍රවේශ මොනවාද කියන්න කියලා. එවැනි විකල්ප අවස්ථා පෙන්වා දෙන්නේ නැතිව හුදු විවේචන විතරක් කරන්න එපා.

ඒ වාගේම, අපේ විදේශ සංචිත ගත්තොත් මේ මොහොත වන විට ඒක ඉහළ මට්ටමක තිබෙන්නේ. විශේෂයෙන්ම අපි දැක්කා, 2022දී අපේ දළ ජාත්‍යන්තර සංචිත තිබුණේ ඩොලර් බිලියන 2යි කියලා. හැබැයි, 2025 අග වෙනකොට අපට හැකිවෙනවා, ඒක ඩොලර් බිලියන 6.8 දක්වා වර්ධනය කරන්න. මෙන්න මේ ප්‍රගතිය තමයි අපි අත්පත් කරගෙන තිබෙන්නේ. ඒ විතරක් නොවෙයි, අපේ සංචාරක ආදායම්වලින්, විශේෂයෙන්ම විදේශ සේවාවල නියුක්ත වෙලා සිටින ඒ නියුක්තිකයන්ගේ ප්‍රේෂණ විශාල වශයෙන් ඉහළ ගියා. මෙන්න මේවාත් එක්ක අපට හැකි වුණා, ඒ සංචිතය ගොඩ නඟන්න. හැබැයි, 2022දී එහෙම නොවෙයි වුණේ. ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව විතරක් නොවෙයි, IMF එකේ වාර්තාවත් කියනවා, 2025දී ශ්‍රී ලංකාවේ ආර්ථිකය සියයට 5කින් වර්ධනය වෙලා කියලා. ඒ වාගේම, 2022දී සියයට 70ට එහා තිබුණු උද්ධමනය අද වෙනකොට තනි ඉලක්කමකට ගෙනැල්ලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, මේ රාජ්‍ය මූල්‍ය ක්ෂේත්‍රයේ අපි සැලකිය යුතු ප්‍රගතියක් අත්පත් කරගෙන තිබෙනවා. විශේෂයෙන්ම අපට ඉලක්කයක් තිබුණා. ඒ තමයි 2025 වසරේ ප්‍රාථමික අය වැය අතිරික්තය. IMF එක අපට දීලා තිබුණු ඒ ඉලක්කය 2.3යි. නමුත්, අපට හැකි වෙනවා එය 5.4ට වැඩි කරන්න, අපේ බදු කළමනාකරණ ප්‍රතිපත්තිය හේතුවෙන්. ඒ විතරක් නොවෙයි, 2026 වසරේ මුල් මාස තුනේ රජයට ලැබිච්ච ආදායම් සහ ප්‍රදාන විශාල වශයෙන් ඉහළ ගිහිල්ලා තිබෙනවා. එහි වටිනාකම රුපියල් බිලියන 1,499ක්. මේක 2025 අවුරුද්දේ මුල් මාස 3ත් එක්ක සැසඳුවොත් ඒක සියයට 40.4ක වර්ධනයක්. මෙන්න මෙවැනි වර්ධන අත්පත් කර ගනිමින් තමයි අපි ඉදිරියට යන්නේ. අපි විදේශ ප්‍රේෂණ ගත්තොත්, පසුගිය මැයි මාසයේදී පමණක් ඒ ශ්‍රමිකයන්ගෙන් අපට ලැබිච්ච ප්‍රේෂණ ඇමෙරිකානු ඩොලර් මිලියන 847ක්. මේ ප්‍රමාණය 2025 මැයි මාසයේ ලැබුණු මුදලත් එක්ක අපි සංසන්දනය කළොත්, ඒක සියයට 32කට ආසන්න වර්ධනයක්. මෙන්න මේ විධියට අපි මේ ආර්ථිකය කළමනාකරණය කර ගනිමින් යනවා.

ඒ විතරක් නොවෙයි. විදේශ ආයෝජන ගත්තොත්, කොළඹ වරාය නගරය හරහා ඉදිරි වසර පහ තුළ අපි සාමූහිකව රුපියල් බිලියන 125ක පමණ වටිනාකම් ඉඩම් සංවර්ධනය හරහා නිර්මාණය කරනවා. ඒ වාගේම අපේ පුරෝකථනයක් තිබෙනවා, ඇමෙරිකානු ඩොලර් බිලියන 362ක විදේශ ආයෝජන ගෙන එන්න. ඒ හරහා 10,000කට වැඩි රැකියා අවස්ථා නිර්මාණය වෙනවා, මේ මහ පොළවේ. ඒ විතරක් නොවෙයි. පසුගිය කාලයේ අපි විදේශ රටවල් එක්ක රාජ්‍ය තාන්ත්‍රික සබඳතා වර්ධනය කර ගත්තා. විශේෂයෙන්ම මාලදිවයින, වියට්නාමය වැනි රටවල් සමඟ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු විජේසිරි බස්නායක මහතා**
(மாண்புமிகு விஜேசிறி பஸ்நாயக்க)
(The Hon. Wijesiri Basnayake)
ඒ හැම අවස්ථාවකදීම අපට පුළුවන් වුණා, ලංකාවට වාසිදායක විධියට ඒ රාජ්‍ය නායකයන් එක්ක ගිවිසුම් ඇති කර ගන්න. එහෙම නම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොහොමද මේ විපක්ෂයේ මන්ත්‍රීවරු මේ රටට බොරු බියක් මවන්නේ, මේ මොහොතේ අපේ තත්ත්වය ඉතාම භයානකයි කියලා? බොරු බිල්ලෝ මවන්නේ කොහොමද? ඔවුන් පවතින යථාර්ථය මේ රටේ මහ ජනතාවට ඉදිරිපත් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි මේ මොහොතේත් අපි සංවර්ධන වැඩ විශාල ප්‍රමාණයක් කරගෙන යනවා. ඒ තුළින් අපි බලාපොරොත්තු වෙනවා, මේ රටේ ව්‍යාපාරික ප්‍රජාවට, මේ රටේ මහ ජනතාවට අවශ්‍ය ජීවන තත්ත්වය නිර්මාණය කර දෙන්න.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ජී.ජී. පොන්නම්බලම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[පි.ව. 3.05]

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நான் குறிப்பாக மூன்று விடயங்கள் சம்பந்தமாகப் பேச விரும்புகின்றேன். நீர்கொழும்பில் இருந்து குறிப்பிட்ட ஒரு seasonக்கு 244 மீனவக் குடும்பங்கள் காலங்காலமாக முல்லைத்தீவு கரையோரத்துக்கு வந்து குறிப்பாக, கொக்கிளாய் முகத்துவாரத்துக்கு வந்து, அங்கு வாடிகட்டி

[ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා]

தங்களுடைய தொழிலைச் செய்வது வழக்கம். அவர்கள் வருடத்தின் ஒருசில மாதங்கள் அங்கு தங்கியிருந்து தொழில் செய்துவிட்டு, திரும்பவும் தங்களுடைய ஊருக்குச் சென்று விடுவார்கள். "நீங்கள் எந்த ஊரைச் சேர்ந்தவர்கள்?" என்று அவர்களிடம் கேட்டால், முழுக்க முழுக்க நீர்கொழும்பு பிரதேசத்தைச் சேர்ந்தவர்களென அவர்கள் தங்களை அடையாளப்படுத்துவார்கள். இதற்கு முன்னர் இருந்த மஹிந்த ராஜபக்ஷ, கோட்டாபய ராஜபக்ஷ ஆகியோரின் அரசாங்க காலப்பகுதியில் ஏன், ரணில் விக்கிரமசிங்ஹவின் அரசாங்க காலப்பகுதியில்கூட, இந்த 244 குடும்பங்களும் முல்லைத்தீவில் தங்களுக்கு நிரந்தர வசிப்பிடங்களை எடுப்பதற்கு முயற்சிகளை எடுத்தும், அந்த முயற்சிகள் தோல்வியடைந்ததற்குப் பிரதான காரணம், அவர்களுக்கு அங்கு நிரந்தர இருப்பிடம் இல்லாமைதான்.

அவர்களுக்கு அங்கு காணியில்லை. எந்தவொரு காலகட்டத்திலும் அவர்களுக்கு அங்கு காணிகள் இருக்கவுமில்லை. இதற்கு முதல் இருந்த அரசாங்கங்கள்கூட, அவர்களுக்கு அங்கு நிரந்தரமாக வீடுகளைக் கட்டுவதற்கு அல்லது காணிகளை ஒதுக்குவதற்கு ஏதுவாக அவர்களை எந்தவொரு வேலைத்திட்டத்துக்குள்ளும் உள்வாங்க முடியாதென்ற காரணத்தைக்காட்டி, குறித்த பருவகாலத்தில் மாத்திரம் அங்குவந்து தொழில் செய்வதற்கு அனுமதி வழங்கின. எனினும், இந்த அரசாங்கம் 'தித்வா' புயலுக்குப் பிற்பாடு, அவர்களுக்குப் பாதுகாப்பானதொரு வசிப்பிடம் அவசியம் என்ற போர்வையில், முதற்தடவையாக அந்த மாவட்டத்தைச் சாராத, வெளிமாவட்டத்தைச் சார்ந்தவர்களுக்கு குறிப்பாக, நீர்கொழும்பு பிரதேசத்தைச் சார்ந்தவர்களுக்கு நிரந்தரமாக வீடுகளைக் கட்டுவதற்கு 'தித்வா' புயல் நிவாரணம் ஊடாக மிகவும் தவறானதொரு நடவடிக்கையை மேற்கொள்வதற்கு முடிவெடுத்து, அந்த நடவடிக்கையை மேற்கொண்டும் இருக்கின்றது. குறிப்பாகச் சொல்வதென்றால், அவர்களுக்கு கொக்கிளாய் ஆஸ்பத்திரிக்குப் பின்பகுதியில் கொக்கிளாய் மேற்கு GN பிரிவில் வீடு கட்டுவதற்கு காணிகள் ஒதுக்குவதற்கான நடவடிக்கைகள் மேற்கொள்ளப்படுகின்றன.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எங்களைப் பொறுத்தவரையில் இது மிகத் தவறான ஒரு விடயமாகும். தமிழ்ப் பிரதேசங்களில் இனவிகிதாசாரத்தை மாற்றியமைப்பதற்கு கடந்த 75 வருடங்களாக மாறி மாறி ஆட்சிக்கு வந்த அரசாங்கங்கள் நடவடிக்கை எடுத்ததனால்தான் இந்த நாட்டில் இனப்பிரச்சினை பெரிதாக வெடித்தது. அது இந்த அரசாங்கத்துக்கும் நன்றாகத் தெரியும். தேசிய மக்கள் சக்தியினர் ஆட்சிக்கு வருவதற்கு முதல், மாறி மாறி ஆட்சியிலிருந்த அனைத்து அரசாங்கங்களும் நடந்துகொண்டது தவறு என்பதை ஒப்புக்கொண்டிருந்தனர். இதற்கு முதல் இருந்த அரசாங்கங்கள் இனவாத ரீதியாகச் செயற்பட்டன, தமிழ் மக்களுக்குப் பாதிப்புகளை ஏற்படுத்துகின்ற வகையில் செயற்பட்டன என்ற குற்றச்சாட்டை இந்த அரசாங்கம் முன்வைத்துக்கொண்டு இருக்கின்ற சூழலில், இதற்கு முதல் இருந்த அரசாங்கங்கள் செய்யாத மிகத் தவறான ஓர் இனவாதமான செயலை இந்த அரசாங்கம் செய்வதற்கு நடவடிக்கை எடுப்பது பொருத்தமற்றது. தற்பொழுது, இந்தச் சபையில் முன்வரிசையில் பொறுப்புவாய்ந்த எந்தவோர் அமைச்சரும் இல்லை. கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நீங்களாவது இந்த விடயத்தை உரிய அமைச்சர்களுக்கு எடுத்துக் கூறி, இது சம்பந்தமான நடவடிக்கைகளை நிறுத்த வேண்டுமென தயவுடன் கேட்டுக் கொள்கின்றேன்.

அடுத்து, 'தித்வா' புயலுக்குப் பிற்பாடு எல்லாம் அழிந்துபோய் மக்கள் மிக மோசமாகப் பாதிக்கப்பட்டு இருக்கின்ற நேரத்தில், அபிவிருத்தி நடக்க வேண்டும், தங்களுடைய பொருளாதாரம் கட்டியெழுப்பப்பட வேண்டுமென மக்கள் நினைத்துக்கொண்டு இருக்கின்ற சூழலில், இன்னுமோர் அசம்பாவிதம் - அநியாயம் - அதே முல்லைத்தீவு மண்ணைச் சார்ந்து நடைபெற்றுக்கொண்டு இருக்கின்றது. முல்லைத்தீவில் கொக்குத்தொடுவாய் மத்தியிலுள்ள குஞ்சுக்கால்வெளி என்ற பிரதேசத்தில் - தமிழர்கள் பிரித்தானியர் காலத்திலிருந்து உறுதிக் காணி வைத்திருக்கின்ற பிரதேசத்தில் - தெற்கைச் சேர்ந்த ஒரு வர்த்தகருக்கு மகாவலி அபிவிருத்தி அதிகாரசபை ஊடாக 5 ஏக்கர் காணி ஒதுக்கப்பட்டு இருக்கின்றது. அந்தக் காணி தனியாருடைய உறுதிக் காணியாகும். அது அரச காணி அல்ல. அந்தக் காணியைச் சட்டபூர்வமாக ஒதுக்கவில்லை. அதனைச் சட்டபூர்வமாக ஒதுக்குவதென்றால், ஒரு Surveyorமூலம் survey செய்ய வேண்டும்.அந்தக் காணி survey செய்யப்பட்டால் - அளவீடு செய்யப்பட்டால் - அது தனியாருடைய காணி என்பது உறுதிப்படுத்தப்பட்டுவிடும் என்பது மகாவலி அபிவிருத்தி அதிகாரசபைக்கு நன்றாகத் தெரியும். தனியாருடைய காணியென உறுதிப்படுத்தப்படாத வகையில், அந்தக் காணி தெற்கைச் சார்ந்த ஒரு வர்த்தகருக்கு வழங்கப்பட்டு இருக்கின்றது. அந்த வர்த்தகர் கடந்த பெப்ருவரி மாதம் மேலதிகமாக 15 ஏக்கர் காணியையும் பிடித்து, அந்தப் பிரதேசத்தை ஆக்கிரமித்து உப்பளமொன்றை நடத்துவதற்கு நடவடிக்கையெடுத்து இருக்கின்றார்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, தனியாருக்குச் சொந்தமான அந்த உறுதிக் காணி உரித்தாளிக்கு மீண்டும் வழங்கப்பட வேண்டுமே தவிர, அபிவிருத்தி என்ற பெயரைப் பயன்படுத்தி இவ்வாறு தவறான முறையில் வழங்கப்படக் கூடாது. அந்த மண்ணைச் சாராத, அந்த மண்ணுடன் எந்தவித சம்பந்தமும் இல்லாத ஒருவருக்கு இந்தக் காணியை ஒதுக்குவது தவறு! ஒதுக்கிய 5 ஏக்கர் தனியார் காணிக்கு மேலதிகமாக அவர் பிடித்து வைத்திருக்கின்ற 15 ஏக்கர் காணியானது reserve காணி. அது mangroveக்காக, மேய்ச்சல் தரைக்காக reserve பண்ணப்பட்ட காணி. அது nature reserveக்குள்ளும் forestக்குள்ளும் வரும். சாதாரண ஒரு தமிழ் பொதுமகன் அல்லது நிரந்தரக் குடி Forest Departmentஆல் reserve பண்ணப்பட்ட காணிக்குள் கால்வைத்தாலே நீதிமன்றத்தில் வழக்குத் தாக்கல் செய்வார்கள். ஆனால், அந்த மண்ணைச் சாராத, செல்வாக்கைப் பயன்படுத்தி அந்த இடத்தில் காணியை ஒதுக்குவதற்கு நடவடிக்கை மேற்கொண்டவர் எல்லாச் சட்டங்களையும் தன்னுடைய கையில் எடுத்துக்கொண்டு நடந்துகொள்வதை அனுமதிப்பதென்றால், அதைவிட ஓர் அநியாயம் இருக்க முடியாது. கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த நடவடிக்கை உடனடியாக நிறுத்தப்பட வேண்டுமென்ற விடயத்தை உரிய அமைச்சரிடம் எடுத்துரைத்து, உரிய நடவடிக்கை எடுக்க வேண்டுமென நான் உங்களிடம் தயவுடன் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අශෝක ගුණසේන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.15]

**ගරු අශෝක ගුණසේන මහතා**
(மாண்புமிகு அசோக குணசேன)
(The Hon. Ashoka Gunasena)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපනයන ක්ෂේත්‍රයෙන් අපේ රටට උත්පාදනය වන ආදායම් - ඩොලර් සංචිත - රැක ගැනීම, ආදායම් ගෙන්වා ගැනීම සහ ආරක්ෂා කර ගැනීම සම්බන්ධයෙන් මහ බැංකුව විසින් පනවන ලද නීති, අණ පනත් සම්බන්ධයෙන් තමයි අද අපි කථා කරන්නේ. රටක ආණ්ඩුවක වගකීම තමයි ඒ ඒ මොහොතේදී එළැඹෙන අභියෝගවලට මුහුණ දීලා, ඒවා ජයග්‍රහණය කරලා, රටේ ජනතාවගේ සුබසිද්ධිය සඳහා රට ඉස්සරහට ගෙන යන එක. ඉතින්, අද දවසේදී අපි මුහුණ දීලා තිබෙන තත්ත්වයත් එක්ක තමයි අපි අද මේ සාකච්ඡා කරන මාතෘකාවට එන්නේ. අපේ විපක්ෂය අද දවස තුළ කථා කරපු කාරණාත් එක්ක, අපේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් ඉදිරිපත් වුණු කාරණාත් එක්ක අපට දකින්න ලැබුණේ මොකක්ද? විපක්ෂය ඇත්තටම අපේ ආණ්ඩුව සම්බන්ධයෙන් හරියට තේරුම් අරගෙන නැහැ. ඒ නිසා, ඉස්සර වෙලාම අපි ආණ්ඩුවක් ලෙස අභියෝගවලට මුහුණ දෙන්නේ කොහොමද කියන එක සම්බන්ධයෙන් විශේෂයෙන්ම අපේ විපක්ෂය දැන ගත යුතුයි කියන එක මම කියන්න ඕනෑ.

අපි මේ රට භාර ගන්න වෙලාවේදී අපට තිබුණු අභියෝග මොනවාද? අපට අභියෝග නොවුණේ මොනවාද? අපි මේ රට භාර ගන්න වෙලාවේදී රටේ ආර්ථිකය, නීතිය, රාජ්‍ය සේවය, සංස්කෘතිය යන ඒ හැම එකක්ම අභියෝගයක් බවට පත් කරලා තිබුණා. ඒ කියන්නේ අපේ රටේ අනාගතය වෙනුවෙන් සුබවාදී විධියට කිසි දෙයක් සකස් වෙලා තිබුණේ නැති රටක් තමයි අපි භාර ගත්තේ. ඒක තමයි අපට තිබිච්ච අභියෝගය. ඒ අභියෝගයත් එක්ක තමයි අපි මේ පසුගිය අවුරුද්ද, එකහමාර ඇතුළත අරගළ කළේ; සාමූහිකව එකට එකතු වෙලා සටන් කළේ. එහි ප්‍රතිඵලයක් හැටියට අපි පසුගිය අවුරුදු එකහමාර ඇතුළේ අපේ රටේ ආර්ථිකය නඟා සිටුවන්න සමත් වුණාද, නැද්ද කියලා විපක්ෂයට තේරුණේ නැති වුණාට අපේ රටේ ජනතාව ඒක හොඳට දන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වාගේම අපේ රටේ නීතිය හා සාමය කොයි තරම් දුරට ශක්තිමත් කරන්න අපේ ආණ්ඩුව සමත් වුණාද, නැද්ද කියලා යන්තම් හරි අවබෝධයක් තිබෙන අපේ රටේ සාමාන්‍ය ජනයාට පවා තේරෙනවා. ඒ වාගේම අපේ රාජ්‍ය සේවය ශක්තිමත් කරන්න, එය නඟා සිටුවන්න, නැවත බඳවා ගැනීම් කරන්න අප කොච්චර මැදිහත් වුණාද කියලා අපේ රටේ රාජ්‍ය සේවකයන් හොඳින් දන්නවා.

නමුත් අපේ රටේ සාමාන්‍ය ජනයාට තිබෙන අවබෝධයවත් නැති ගණනට තමයි මෙතෙක් කථා කළ විපක්ෂයේ හැම කෙනෙකුම වාගේ කථා කළේ. විපක්ෂයක් ලෙස රටේ අනාගතය දිහා සුබවාදී ඇහැකින් බලනවාට වඩා මේ මතුවෙලා තිබෙන තත්ත්වයන් හැම එකක්ම තමන්ගේ වාසියට පෙරළාගෙන සිහින මවන බව තමයි ඒකෙන් පෙන්වන්නේ. මන්ත්‍රීවරු ගොඩක් දෙනෙක් ප්‍රකාශ කළ ආකාරයට, මේ තත්ත්වය ඇතුළේ තමන්ට බලය අත්පත් කර ගන්න පුළුවන්ද කියන එක ගැන ඔවුන් සිහින මවනවා. විපක්ෂය අවුරුදු හැත්තෑ ගණනක් තිස්සේ අපේ රට පාලනය කළා. ඒ පාලනය හරහා අපේ රට ඇද දමපු තත්ත්වය ගැන අපේ රටේ ජනතාව දන්නවා. ඒ නිසා මේ අයට නැවත බලය ගන්න ජනතාව කිසිම වෙලාවක ඉඩ දෙන්නේ නැහැ කියන පණිවුඩය, මේ වෙලාවේදී විපක්ෂය විසින් එළියේ සිදුකරන උද්ඝෝෂණවල, අරගළවල අසාර්ථකභාවය තුළින් පෙන්වමින් තිබෙනවා. කොටුවට ඇවිල්ලා උද්ඝෝෂණ කරන්න හැදුවත් ඒගොල්ලෝ ළඟ ඉන්න ඉතා සීමිත පිරිසක් තමයි ඒකට එකතු වුණේ. ඒ නිසා ජනතාවගෙන් වෙන්වෙලා විපක්ෂයට තමන් දකින සිහින සැබෑ කරගන්න හම්බවෙන්නේ නැහැ. අභියෝග භාරගෙන, ඒ අභියෝග එක්ක පොර බදලා, සාමූහිකව එකට එකතුවෙලා අභියෝග ජයග්‍රහණය කරන්න පුළුවන් ආණ්ඩුව මොකක්ද කියලා අපේ රටේ ජනතාව දන්නවා. ඒ නිසා විපක්ෂයට හැමදාම සිහිනවල තමයි ඉන්න වෙන්නේ.

අපි ආණ්ඩුව භාරගන්නකොටම අපේ රටට ස්වාභාවිකව මුහුණ දෙන්න වෙච්ච අභියෝග ගත්තොත්, 2024 නොවැම්බර් මාසයේ අපි මේ පාර්ලිමේන්තුවට පය තියන කොටම රටේ විශාල ගංවතුරක් ඇති වී තිබුණා. ඒ වාගේම, 2025 නොවැම්බර් මාසය කියන්නේත් "දිට්වා" සුළි කුණාටුව හේතුවෙන් අපේ රටට විශාල ස්වාභාවික ආපදාවකට මුහුණ දෙන්න සිදුවුණු අවස්ථාවක්. ඒ වාගේම 2026 අවුරුද්ද පටන්ගෙන මාස දෙක තුන හතර යනකොට මැදපෙරදිග ඇතිවුණු යුද්ධය තත්ත්වය විසින් අපට නැවතත් අලුත් අභියෝගයක් නිර්මාණය කරලා තිබෙනවා. පසුගිය වර්ෂවලදී අපට මුහුණ දෙන්න සිදුවෙච්ච අභියෝග ජයග්‍රහණය කරන්න අපි සමත් වුණා. ඒ ජයග්‍රහණය කිරීමේ ක්‍රමවේදය තුළ තිබුණේ, රටේ ආණ්ඩුකරණය ඇතුළේ දේශපාලන නායකත්වය දක්වපු ආදර්ශය සහ රාජ්‍ය යන්ත්‍රණය දක්වපු කැප කිරීම. ඒ වාගේම ග්‍රාමීය ජනතාව දිළිඳුකමින් මුදා ගැනීම සඳහා සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය යටතේ රුපියල් මිලියන 25,000ක් වෙන්කරලා ග්‍රාමීය ජනතාව හොඳට සංවිධානය කරලා ඉස්සරහට ගෙනයන්න පටන්ගෙන තිබෙනවා. ඒක තමයි අපි අභියෝග ජයග්‍රහණය කිරීමේ රහස; රටේ දේශපාලන නායකත්වය දක්වපු ආදර්ශය, රාජ්‍ය යන්ත්‍රණය හොඳින් ශක්තිමත් කර ගනිමින් ක්‍රියාත්මක කිරීම සහ රටේ ජනතාව හොඳින් සංවිධානාත්මකව පෙළ ගස්වා ගැනීම.

අභියෝග ජයග්‍රහණය කිරීමේ රාජ්‍ය යන්ත්‍රණය දැකපු ජනතාවක් තමයි අපේ රටේ ඉන්නේ. ඒ නිසා අපට මේ වෙලාවේ ඇවිල්ලා තිබෙන අලුත් අභියෝගය මොකක්ද කියලා විපක්ෂයට තේරුණේ නැති වුණාට අපටත්, රටටත් හොඳට තේරෙනවා. මේ අභියෝගය ජයග්‍රහණය කිරීමේ රහස තිබෙන්නේත් එතැනයි. මෙහිදී හොඳ දැක්මක් සහිතව දේශපාලන නායකත්වයක් දෙමින් ඉන්නවා. ඒ නිසා තමයි අභියෝගයක් අර්බුදයක් වෙන්න කලින් ඒ අභියෝගයට මුහුණ දෙන්න අවශ්‍ය අණපනත් සම්මත කිරීමට අපි කටයුතු කරමින් ඉන්නේ. මෙතැනදී විපක්ෂයට සිහින දකින්න පුළුවන්. නමුත් අපි අනාගතය දිහා හරියට බලලා, අනාගතයේදී සිද්ධ වෙන්න පුළුවන් අර්බුදකාරී තත්ත්වයන් මඟහරවා ගැනීම සඳහා පියවර ගනිමින් ඉන්නවා. ඒ පියවරත් අපට සාර්ථකව අවසන් කර ගන්න පුළුවන්. අපි ඒ සඳහා අවශ්‍ය කැපකිරීම සහ දේශපාලන නායකත්වය ලබාදෙනවා.

අපේ රට බංකොලොත්භාවයට ඇද දමලා තිබුණා. ඒ වාගේම විපක්ෂ නායකතුමා කථා කරනකොට කිව්වා, රටේ දුප්පත්කම ගොඩගැහිලා කියලා. එතුමාගේ පියාණන් සිටි කාලයේත් දුප්පත්කම තුරන් කරන්න කටයුතු කරපු ආකාරය අපට මතකයි. එතුමා දුප්පතාගේ හිතවතා. එතුමා ඒ සඳහා වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කළා. දශක ගණනාවක් තිස්සේ මුදල් වෙන්කරලා, මුදල් කාබාසිනියා කරලා රටේ දුප්පත්කම වෙනස් කරන්න සමත් වුණේ නැතිව අදත් කියනවා, දුප්පත්කම ගොඩගැහිලා කියලා. ඒ නිසා ඒගොල්ලෝ මේ මතුවෙලා තිබෙන අර්බුදකාරී තත්ත්වය පාවිච්චි කරලා බලය ගන්න උත්සාහ කරන්නේ නැවතත් පෙර තිබුණු තත්ත්වයට රට පත් කරන්නයි. ඒක අපේ රටේ ජනතාව හොඳින් දන්නා කාරණයක්. ඒකට කිසිම මොහොතක රටේ ජනතාව ඉඩ දෙන්නේ නැහැ. ඒ නිසා ඒගොල්ලන්ට සිහින පමණයි දකින්න වෙන්නේ.

ඒ වාගේම අපේ රට තුළට එන ආදායම වැඩි කර ගැනීමේ, ආදායම රැක ගැනීමේ, ආදායම නාස්ති නොකර පරිහරණය කිරීමේ වගකීම තමයි මේ වෙලාවේ අපි ඉෂ්ට කරමින් ඉන්නේ. ඒක රටේ ජනතාවට අවබෝධ කර දීම සඳහා තමයි

[ගරු අශෝක ගුණසේන මහතා]

පාර්ලිමේන්තුවේදී අපි මේ අදහස් දක්වන්නේ. දුප්පත්කම වර්ධනය වීම ගැන කථා කරනකොට, රට පත් වෙලා තිබෙන තත්ත්වය ගැන කථා කරනකොට විපක්ෂයට ඒගොල්ලන් රට පාලනය කරපු කාලයේ තිබිච්ච තත්ත්වය ගැන කිසිම අවබෝධයක් නැතිව වාගේ කථා කරනවා. මේ මතු වෙලා තිබෙන තත්ත්වය අභියෝගයක් ලෙස භාර ගෙන, ඒක ජයග්‍රහණය කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙළ සකස් කරලා ඒවා යථාර්ථයක් බවට පත් කරගෙන, අභියෝග ජයග්‍රහණය කරන්න සමත් ආණ්ඩුවක් තමයි මේ ආණ්ඩුව. ඒ නිසා විපක්ෂයට සිහින දකින්න අවස්ථාව දෙමින්, මේ අභියෝගය අපි ජයග්‍රහණය කරන බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.23]

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මම හිතන විධියට, ඔබතුමන්ලා කටින් බතල හිටවන්න අරන් අවුරුදු එකහමාරකටත් වැඩියි. හැබැයි එළදාවක් නම් ඇවිල්ලා නැහැ. තවම බතල හිටවනවා. බතල කියන්නේ කෙටි කාලීන භෝගයක්. මම හිතන විධියට, ඔයගොල්ලන් හිටවන්නේ බතල නොවෙයි, වෙන මොනවා හරි ජාතියක්.

විශේෂයෙන්ම අපි දන්නවා, අපේ අපනයනකරුවන්ගේ dollar accountsවල තිබෙන මුදල් දවස් 30ක් ඇතුළත රුපියල් බවට පරිවර්තනය කරන්න ගත්ත තීන්දුව හරහාම මේ රට තුළ ඩොලර් හිඟයක්, අර්බුදයක් තිබෙනවා කියන පණිවුඩය වෙළෙඳ පොළට යනවා කියන එක. වෙළෙඳ පොළට යන මේ පණිවුඩයම අනතුරුදායකයි කියන එක තමයි අපට කියන්න තිබෙන්නේ. අපි දන්නවා, පසුගිය දවස්වල ඩොලරයේ අගය රුපියල් 350ට, 356ට, 357ට, 358ට ඉහළ ගිය බව. ඉතින් මේ තුළින් පෙනෙන්නේ අපනයනකරුවන්ව දිරිමත් කරනවා වෙනුවට අද ඔවුන්ව එක විධියකට ඇදලා දාලා බැඳලා දාලා, ඔවුන්ගේ ව්‍යාපාරවලට නොයෙක් රෙගුලාසි දාලා, ඔවුන්ව හිර කරලා මේ රටේ ආර්ථිකය කළමනාකරණය කරන්න හදනවා කියන එකයි. ඒගොල්ලන් මේක හරියට කරනවාලු. පොල් ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කරන විශාල පිරිසක් අපේ ප්‍රදේශයේ ඉන්නවා. Value-added products, coconut milk, coconut water, virgin oil වාගේම පොල් කොහු වෙන්න පුළුවන්, වෙනත් උපස්තර ආශ්‍රිත නිෂ්පාදන වෙන්න පුළුවන්, මේ හැම දෙයක් සම්බන්ධයෙන්ම බරපතළ ප්‍රශ්නයක් ඉදිරියේදී මතු වනවා. විශේෂයෙන්ම coconut oilවලට සහ virgin coconut oilවලට. අද හෙට වන විට අපේ රටට ගෙනෙන පොල් තෙල් සහ ඒවායේ ආදේශකවලට විශාල බද්දක් පනවන්න යනවා. මීට කලින් තිබුණේ palm oil සහ coconut oil කිලෝ එකකට රුපියල් 150ක Special Commodity Levy - SCL - එකක් විතරයි. හැබැයි, ඒකත් තිබියදී තමයි මේකට VAT එකත්, SSCL එකත් පනවා රුපියල් 350ක විතර බද්දක් ඉස්සරහට අරගෙන ගිහිල්ලා තිබෙන්නේ.

ලෝක වෙළෙඳ පොළත් එක්ක තරගකාරීව කටයුතු කරන අපේ පොල් කිරි කර්මාන්තකරුවා, virgin coconut oil කර්මාන්තකරුවා, ඒ වාගේම coconut water can කරලා යවන අය ඩොලර් විශාල ප්‍රමාණයක් මේ රටට ගෙනෙනවා. ආසන්න වශයෙන් මේ පළමුවන කාර්තුවේදී විතරක් ඔවුන් ඩොලර් මිලියන 400ක් ගෙනැල්ලා තිබෙනවා. මේකෙන් වෙන්නේ, මේ අයට තරග කරන්න පුළුවන් හැකියාව නැති වෙලා යන එක. පොල් ආශ්‍රිතව අගය එකතු කරමින් නිෂ්පාදන කරන වෙළෙඳ පොළට මේ තුළින් විශාල බලපෑමක් ඇති වනවා. ඒ නිසා මේ තීන්දු තීරණ රටට ඩොලර් ගලා ඒම වර්ධනය කරන තීන්දු තීරණද, එහෙම නැත්නම් ඩොලර් ගලා එන ජාලය අඩාළ කරන තීන්දු තීරණද කියලා බරපතළ ප්‍රශ්නයක් අපට තිබෙනවා. මේ සම්බන්ධයෙන් මම සමන්ත විද්‍යාරත්න ඇමතිතුමාවත් දැනුවත් කළා. පොල් ආශ්‍රිත නිෂ්පාදන සංගම් ගණනාවක නියෝජිතයින් ඇවිල්ලා එතුමා හමු වුණා. මුදල් අමාත්‍යාංශයේ නිලධාරිනුත් හමු වෙලා තිබෙනවා. හැබැයි මේ තීන්දු තීරණ ගන්නවා වෙනුවට මේවාට කල් මරන ගතියක් තමයි අපට පෙනෙන්නේ. අපට පෙනෙන්නේ නැහැ, අපේ රටේ අපනයන වර්ධනය කරන්න අවශ්‍ය කටයුතු කරන බවක්.

ජූලි මාසයේ 01වැනි දා අපේ මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට, වෙළෙඳ ව්‍යාපාරවල යෙදෙන අයට බරපතළ දිනයක් බවට පත් වනවා. මොකද, මේ දක්වා තිබුණේ අවුරුද්දක පිරිවැටුම රුපියල් ලක්ෂ 600ක්. එහෙම නැත්නම් මිලියන 60ක් තමයි VATවලට අදාළව තිබුණේ. දැන් ඒක රුපියල් ලක්ෂ 360ට ගෙනැල්ලා තිබෙනවා. රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමාගේ කාලය ගැන මේගොල්ලන් කථා කළා. හැබැයි, රනිල් වික්‍රමසිංහ මහත්තයා කජු කකා හරි රුපියල් ලක්ෂ 600ක සීමාව තමයි ව්‍යාපාරිකයින්ට පනවා තිබුණේ VATවලට අදාළ වන්න.

හැබැයි, මේ ආණ්ඩුව කරන්නේ මොකක්ද? මේ ජූලි 01වන දා ඉඳන් ඒ ව්‍යාපාරිකයින්ගේ වාර්ෂික පිරිවැටුම රුපියල් ලක්ෂ 360කට වැඩි නම්, ඔවුන්ට VAT එකට ඇතුළත් වන්න සිද්ධ වෙනවා. ඒ නිසා මේ ආණ්ඩුව මේ ජූලි මාසයේ 1වන දා ලංකාවේ ලක්ෂ දෙකක, දෙකහමාරක පමණ ව්‍යාපාරිකයින්ට වස කුප්පියක් දෙන්න තමයි යන්නේ. දැන් මේ විදුලි බිල හින්දා, ඩොලරයේ අගය වැඩිවීම නිසා, රටේ මිනිසුන්ගේ buying power එක අඩුවීම නිසා ඔවුන්ගේ ව්‍යාපාර වැටිලා තිබෙන්නේ. මේ වන විට ඔවුන්ගේ මිලදී ගැනීමේ හැකියාව නැති වෙලා තිබෙනවා. මෙලෙස ව්‍යාපාර අඩාළ වෙලා තිබියදී ව්‍යාපාරිකයින් ලක්ෂ දෙකකට වැඩි පිරිසකට මේ දෙන්න හදන දඬුවමෙන් මම හිතන විධියට රැකියා විශාල ප්‍රමාණයක් අහිමි වනවා, විශාල ව්‍යාපාර ප්‍රමාණයක් කඩා වැටෙනවා, ඒ හරහා රටේ ආර්ථිකයට බරපතළ තත්ත්වයක් ඇති වනවා. විශේෂයෙන් මේ ව්‍යාපාරිකයින්ගෙන් සියයට 90ක්ම ගිය මැතිවරණයේදී මාලිමාවට ඡන්දය දුන් අය. අද ඔවුන්ට අත් වෙන්න යන ඉරණමත් එක්ක ඔවුන් කාටද මේ ගැන කියන්නේ කියන බරපතළ තත්ත්වයක ඉන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ ව්‍යාපාරික පෙළැන්තියක් ඉන්න ඕනෑ. මම දන්නේ නැහැ, ඔබතුමන්ලාගේ ප්‍රතිපත්ති දැන් වෙනස් වෙලා ඇති. මේ රටේ සිටින ව්‍යාපාරික පෙළැන්තිය හරහා රැකියා විශාල ප්‍රමාණයක් ජනිත වනවා. විශාල පිරිසක් ඔවුන් හරහා යැපෙනවා. රටට ආර්ථිකමය වශයෙන් ඔවුන් බදු ගෙවනවා. ඒ වාගේම අනිකුත් සියලු දේවල්වලටත් ඔවුන් දායක වනවා. ඔවුන් හොඳ ව්‍යවසායකයින් විධියට ඉදිරියට යන පිරිසක්. ඔවුන්ට ව්‍යාපාර වර්ධනය කරන්න අවශ්‍ය ශක්තිය රජයක් විධියට දෙන්න ඕනෑ. ඒ නිසා ඔබතුමන්ලා මේ ජූලි මාසයේ 1වන දා ඉඳන් කරන්න හදන්නේ රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා ආර්ථිකය කඩා වැටිලා තිබුණු අර අන්තිම අමාරුම වෙලාවේවත් නොකරපු, ඒ වෙලාවේ රුපියල් ලක්ෂ 600ක සීමාවට තිබුණු ඒ VAT සීමාව රුපියල් ලක්ෂ 360ට ගෙන ඒමයි. එහෙම ගෙනැල්ලා

මේ රටේ සමස්ත ව්‍යාපාරිකයින්ගෙන් අති බහුතරයක් වන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයෝ සේරම නැත්තටම නැති කරලා දාන්න තමයි මේ හදන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මම ඉක්මනින් කථාව අවසන් කරනවා.

මේ පිළිබඳ අවබෝධයක් තිබෙන, දැනුමක් තිබෙන අය මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා නම්, කරුණාකරලා වහාම ඔබතුමන්ලා මේ බදු සීමාව රුපියල් ලක්ෂ 360ට ගේන එක නතර කරන්න. මේ නිසා වැටෙන ආර්ථිකය රටේ ආර්ථිකටත් බලපානවා. ඒ නිසා ඩොලරයේ අගය වැඩිවීම නිසා, විදුලි බිල වැඩිවීම නිසා වාගේම මේ හැම දේකින්ම බැට කාලා ඉන්න ව්‍යාපාරිකයා රැකගන්න නම්, ඔබතුමන්ලා කටින් බතල හිටවලා හරියන්නේ නැහැ. ප්‍රායෝගිකව අත්දැකීම් ලබලා, මේ අයත් එක්ක කථා කරලා, මේ අයට අවස්ථාව දීලා, ඒ අයගේ දුක ගැන කියන්න යම් වැඩ පිළිවෙළක් සකස් කරලා දෙන්න අවශ්‍යයි.

මම දැක්කා, ඊයේ පෙරේදා ඔබතුමන්ලා තඹුත්තේගමදී අලුත් කාර්යාලයක් විවෘත කළා. මේගොල්ලන්ට අවුරුදු දෙකක් ගිහිල්ලා තිබෙනවා, මිනිස්සුන්ට දුක කියන්න කාර්යාලයක් විවෘත කරන්නත්. කෙසේ නමුත් අති බහුතරයක් ආසනවල මෙවැනි කාර්යාල නැහැ, මහජන දින නැහැ. මේ ආණ්ඩුවට අඩුම ගාණේ මිනිස්සුන්ට දුක කියන්නවත් කාර්යාලයක් විවෘත කරගන්න බැරිව තිබියදී ආණ්ඩු කිරීම ගැන කවර කථාද?

ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.30]

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින විශේෂයෙන්ම ප්‍රධාන පනත් දෙකක් යටතේ ගෙන එන රීති සහ යෝජනා සම්මතයක් විවාදයට ගැනෙනවා. එකක්, ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ ගෙන එන 2026 අංක 02 දරන අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන ඒමේ රීති. දෙවනුව අද අපි සාකච්ඡාවට ගන්නේ අත්‍යවශ්‍ය මහජන සේවා පනත යටතේ ගෙනෙන යෝජනා සම්මතයයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ විවාදය පුරා විපක්ෂයේ ඇතැම් මන්ත්‍රීවරුන් උත්සාහ කළා, විශේෂයෙන්ම අපනයන සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව ඉදිරිපත් කරපු මේ රීති පිළිබඳව වැරදි අර්ථ කථනයක් සමාජගත කරන්නට. මේ රටේ ව්‍යාපාරික ක්ෂේත්‍රයේ නිරත වන අයට, විශේෂයෙන්ම අපේ රටට විදේශ විනිමය ගෙනෙන අපනයන ක්ෂේත්‍රයේ නිරත වෙලා ඉන්න අයට අවශ්‍ය පමණ දිරි දීමට, ඒ අය උනන්දු කරන්නට වගකිව යුතු රජයක් විධියට අපි කටයුතු කරනවා.

මොකක්ද, මේ රීතිය? මේ රීතිය අලුත් රීතියක් නොවෙයි. දැනටත් කිසියම් අපනයනකරුවෙකු තමන්ගේ අපනයන ආදායම කිසියම් නිශ්චිත කාලයක් තුළ නැවත ශ්‍රී ලංකාවට රැගෙන ආ යුතුයි. ඒ සඳහා දින 180ක කාලයක් තිබෙනවා. ඒ ව්‍යාපාරික ආයතනයට වෙන්න පුළුවන්, ඒ සමාගමට වෙන්න පුළුවන්, මේ රැගෙන එන විදේශ විනිමයෙන් යම් නිශ්චිත වියදම් ගණනාවක් තිබෙනවා, මෙම රීතියෙන් නිදහස් වන. මේ වියදම් පියවා ගැනීමෙන් පසුව ඉතිරි වන විදේශ විනිමය යම් නිශ්චිත කාල සීමාවක් තුළ නැවත රුපියල් බවට පරිවර්තනය කිරීමේ අවශ්‍යතාවක් තිබෙනවා.

ඒ අවශ්‍යතාව සම්පූර්ණ කිරීම සඳහා මේ වනකොට බලපවත්වන රීති අනුව සාමාන්‍යයෙන් මාස තුනක කාලයක් ලබා දීලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ මාස තුනක කාලය වරින් වර සංශෝධනය කරලා තිබෙනවා. මේ වාගේ මීට කලිනුත් සංශෝධනය කරලා තිබෙනවා. අද දින අපි සාකච්ඡාවට ගන්නා රීති පැනවීම මඟින් ඒ කාල සීමාව මාසයක කාලයක් දක්වා සීමා කිරීම, අඩු කිරීම තමයි කරලා තිබෙන්නේ.

දැන් මේ හරහා අපේ රටේ ව්‍යවසායකයින්, ව්‍යාපාරිකයින් අධෛර්යවත් කරන්නේ කෙසේද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා, අපි බලයට පත් වෙලා මේ වනකොට මාස 18කට ආසන්න කාලයක් වන බව. අපේ රටේ අපනයන ක්ෂේත්‍රය වර්ධනය කර ගැනීම සඳහා අපි විශේෂ අවධානයක් යොමු කළා. අපේ සාම්ප්‍රදායික අපනයන, අගය එකතු කරපු අපනයන වාගේම සේවා ක්ෂේත්‍රය ගත්තාම, 2025 වර්ෂය තමයි ලංකා ඉතිහාසයේ වැඩිම අපනයන ආදායමක් උපයපු වර්ෂය. මේගොල්ලන්ට ඒක හිතා ගන්නවත් බැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඇමෙරිකානු ඩොලර් මිලියන 17,250ක් භාණ්ඩ හා සේවාවලින් උපයා ගත්තා. අපනයන දිරිමත් කරන්නේ නැත්නම් ඒ පිළිබඳව ව්‍යවසායකත්වයන් ප්‍රවර්ධනය කරන්නේ නැත්නම් අපි මේ සා විශාල ජයග්‍රහණයක් අත්පත් කර ගත්තේ කොහොමද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? ඒ නිසා අපනයන දිරිමත් කිරීම වගකිව යුතු රජයක් විධියට අපි දිගින් දිගටම ඉටු කරනවා. ඒ වාගේම අපේ රටේ අනාගතය පිළිබඳව හොඳ සැලසුම් සහගත වැඩ පිළිවෙළක තමයි අපි ඉන්නේ. යම්කිසි අවස්ථාවක ආර්ථිකය කඩා ගෙන වැටිලා, ආර්ථිකය බංකොලොත් කරනවා.

මෙතෙක් කාලයක් හිටපු අය මේ රටේ ආර්ථිකය මෙහෙයවපු ආකාරයට නොවෙයි, වගකිව යුතු රජයක් විධියට අපි, අපේ රටේ ආර්ථිකය මෙහෙයවන්නේ. ඒ නිසා අපට දිගු කාලීන වැඩ පිළිවෙළක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ දිගු කාලීන වැඩ පිළිවෙළ තුළ අපි මේ විනිමය අනුපාතයේ ඇති වන චලනයන් හොඳින් හඳුනාගෙන, ඒවා යම්කිසි ආකාරයකට පාලනය කිරීම සඳහා තමයි මේ රීති මේ අවස්ථාවේදී පනවා තිබෙන්නේ. ඒ නිසා රට බංකොලොත් වනතුරු ඉන්න අවශ්‍ය නැහැ. රට අර්බුදයකට යනතුරු ඉන්න අවශ්‍යත් නැහැ. කලින් වසර ගණනාවක් ඉදිරියට දැකලා, අපි සැලසුම් සහගතව තමයි මේ වැඩ කටයුතු කරගෙන යන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා තමයි ගත වූ මාස 18ක කාලය තුළ අපට මේ ක්ෂේත්‍රයේ සුවිශාල ජයග්‍රහණ ලබා ගැනීමට හැකියාවක් ලැබුණේ. අපි 2025 වර්ෂය අවසන් කළේ ජංගම ගිණුමේ ඩොලර් මිලියන 1,700කට වැඩි ධන අතිරික්තයක් සහිතවයි. කාර්යක්ෂමව, මැනවින් සැලසුම්

[ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා]

කරලා, සන්දර්භයන් විග්‍රහ කරලා, ඒවාට ගැළපෙන විධියට ආර්ථිකය මෙහෙයවපු නිසා තමයි ඒ ජයග්‍රහණ අත්පත් කර ගන්න අපට හැකියාවක් ලැබුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට මෙතැන උපකල්පන - hypothesis - ගොඩනඟනවා. ඔබතුමා විශ්වවිද්‍යාල මහාචාර්යවරයෙක් විධියට දන්නවා, මේ සමහර උපකල්පනවලට කිසිම පදනමක් නැති බව. මේ රීතිවල කොහේවත් බදු පැනවීමක් පිළිබඳව සඳහන් වන්නේ නැහැ; අමතර බදු පැනවීමක් පිළිබඳව මේ රීතිවල කොහේවත් සඳහන් වන්නේ නැහැ. අපනයන ආදායම් කිසියම් නිශ්චිත කාලයක් තුළ අපේ රටට ගෙනාවාට පස්සේ ඒවා රුපියල් බවට පරිවර්තනය කිරීමේ කාල සීමාව පිළිබඳ ප්‍රශ්නයක් විතරයි මේ තිබෙන්නේ. හැබැයි, ඒක ඒ විධියටම තිබියදී වෙනත් උපකල්පනයක් ගෙනෙනවා, මෙන්න සමහර අපනයනවලට අමතර බදු පනවනවාය කියලා. කිසිම දත්තයක් මත පදනම් වෙච්ච නැති, කරුණු මත පදනම් වෙච්ච නැති උපකල්පනයක් ගොඩනඟලා, ඒ උපකල්පනය මත ඊට පස්සේ කරුණු ඉදිරිපත් කරනවා. බදු පිළිබඳව ජනතාවට වැරදි කරුණු සමාජගත කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. බදු ප්‍රතිපත්තියේ කිසිම වෙනසක් මෙහි නැහැ. අමතර බදු කිසිවක් මේ රීති මඟින් පනවා නැහැ. නමුත්, පනවපු නැති බදු පිළිබඳව උපකල්පනයක් ගොඩනඟලා ඒ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරනවා. ජනතාව නොමඟ යවන විධියේ ඉතාම ව්‍යාජ කරුණුත් සමාජගත කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වගකිව යුතු රජයක් විධියට අපි පැහැදිලි කරන්න ඕනෑ, මෙහිදී කිසිම ආකාරයක අමතර බදු පැනවීමක් සිදු වෙන්නේ නැහැ කියන එක. විශේෂයෙන්ම අපි දන්නවා, අපේ රටේ අපනයන ක්ෂේත්‍රයේ ඉතාම අවංකව, කාර්යක්ෂමව වැඩ කරන ව්‍යවසායකයින් ඉන්න බව. ඒ ව්‍යවසායකයින් අපේ රටට විශේෂයෙන්ම විදේශ විනිමය ගෙන ඒමේදී සුවිශාල කාර්යභාරයක් සිදු කරනවා. ඒ කාර්යභාරය පිළිබඳව අපට සුවිශේෂී ඇගැයීමක් තිබෙනවා. මෙය මේ කාල සීමාවේ අපේ විදේශ විනිමය අනුපාතයේ තාවකාලිකව ඇති වෙලා තිබෙන චලනයන් පාලනය කර ගැනීම සඳහා ගත්ත ක්‍රියාමාර්ගයක් පමණයි. අපි කිසිසේත්ම අපනයන ක්ෂේත්‍රය අධෛර්යවත් කරන්නේ නැහැ. අපි තව තවත් අපනයන ධෛර්යවත් කරනවා. අගය එකතු කළ භාණ්ඩ අපනයනය සඳහා අවශ්‍ය දිරිදීම් තව තවත් කරනවා. ඒක තමයි වර්තමාන රජය විධියට අපේ පරමාර්ථය සහ අරමුණ වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ සාකච්ඡාවට භාජන වන දෙවැනි අයිතමය තමයි, අත්‍යවශ්‍ය මහජන සේවා පනත යටතේ වන යෝජනා සම්මතය. මේකත් අර වාගේම තමයි. මොකද, මේක ඒ අයට තේරුම් ගන්න බැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එක කණ්ඩායමක් ඉන්නවා, කොහොමත් ඒ අයට මේක තේරුම් ගන්න බැහැ. මොකද, ඒගොල්ලන් මහා බිල්ලෙක් මවන්න හදනවා, මේ අත්‍යවශ්‍ය මහජන සේවා පනත යටතේ යෝජනා සම්මතය ගැන. ඒකට හේතුව මොකක්ද කියලා මම හොයා බැලුවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ පනත ගෙනෙන්නේ 1979දී. ඉතිහාසය පුරාම සිටි පාලකයෝ මේ පනත පාවිච්චි කළේ මේ රටේ වැඩ කරන ජනතාවට එරෙහිවයි. ඔබතුමාට මතක ඇති, 1980 ජූලි වැඩ වර්ජනයේදී ජීවන වියදම් දීමනාව ඉල්ලලා, වැටුප් වැඩිවීමක් ඉල්ලලා උද්ඝෝෂණය කළ, වැඩ වර්ජනය කළ සේවකයෝ 40,000ක් රැකියාවෙන් ඉවත් කරන්න තමයි පළමුවෙන්ම ඒගොල්ලන් මේ පනත පාවිච්චි කළේ කියන එක. ඊට පස්සේ 2017දී සහ 2019දී විදුලි සේවකයින්ගේ වර්ජනවලදීත්, සෞඛ්‍ය සේවකයින්ගේ වර්ජනවලදීත් මේ පනත පාවිච්චි කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒගොල්ලන් හිතාගෙන ඉන්නවා, ඒ අය වාගේම තමයි අපිත් කියලා. ඒගොල්ලන්ට තේරෙන්නේ නැහැ, මේ ජන විඥානය; ඒගොල්ලන්ට තේරෙන්නේ නැහැ, දැන් පරණ ක්‍රමය ඉවරයි, ඒක අවසන් කියලා. 2024 සැප්තැම්බර් මාසයේදී පැවති ජනාධිපතිවරණයේදීත්, 2024 නොවැම්බර් මාසයේදී පැවති මහ මැතිවරණයේදීත් මේ රටේ බහුතරයක් ජනතාව ඒ පැරණි ක්‍රමය ප්‍රතික්ෂේප කළා. ඒ ක්‍රමය තවදුරටත් වලංගු නැහැ. මොන නීති, මොන පනත් තිබුණත් අද තිබෙන්නේ මහ ජනතාවගේ ආණ්ඩුවක්; මේක වැඩ කරන ජනතාවගේ ආණ්ඩුවක්. අපි මේ පනත යටතේ එන බලතල කිසිම ආකාරයකින් වැඩ කරන ජනතාව මර්දනයට පාවිච්චි කරලා නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි පසුගිය මාස කිහිපය තුළ ඔප්පු කරලා තිබෙනවා, අපි මේ පනත පාවිච්චි කරන්නේ "දිට්වා" සුළි කුණාටුවෙන් ආපදාවට පත් ජනතාව නැවත ගොඩ නැඟීමේ ක්‍රියාවලිය සඳහා පමණමයි කියන එක. විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට අන්න ඒ කාරණය තේරුම් ගන්න බැරි වීම පිළිබඳව මම කනගාටු වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අද සභාවට ඉදිරිපත් කරලා තිබෙන ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ ගෙනෙන රීති සහ අත්‍යවශ්‍ය මහජන සේවා පනත යටතේ ගෙනෙන යෝජනා සම්මතය අපි රටේ ආර්ථිකය ස්ථාවර කරන්නත්, රට නැවත ගොඩ නැඟීමේ ක්‍රියාවලිය සක්‍රිය කරන්නත් දායක කර ගන්නවා කියන එක මතක් කරමින්, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාටත් බෙහෙවින්ම ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.41]

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බෙහෙවින්ම ස්තුතියි.

පසුගිය දවස්වල වාගේම හැම දාමත් අපි දකිනවා, මේ පාර්ලිමේන්තුවේදී අපේ ගරු බිමල් රත්නායක ඇමතිතුමා රාජපක්ෂ මහත්වරු පිළිබඳව උදේ ඉඳන් හැන්දෑ වෙනකම් කථා කරනවා. හැම දාම එතුමාගේ කථාවේ වැඩි කොටසක්, වැඩි වාර ගණනක් කියැවෙන්නේ රාජපක්ෂ මහත්වරු ගැන. අපි දන්නවා, එතුමාට අද එහෙම කථා කරන්න සිද්ධ වෙලා තිබෙන බව. අද රාජපක්ෂ මහත්වරු ගැන බිමල් ඇමතිතුමා ඇතුළු ඔවුන්ගේ කණ්ඩායම ඇතුළේ ලොකු ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. ඒ නිසා අද එතුමාට මේ පාර්ලිමේන්තුව තුළ ඒ වෙනුවෙන් කථා කරන්න සිදු වෙලා තිබෙනවා. අපි බිමල් ඇමතිතුමාට කියනවා, එතුමාගේ පෞද්ගලික ප්‍රශ්න මේ පාර්ලිමේන්තුවට නොගෙනෙනවා නම් හොඳයි කියන කාරණය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පාර්ලිමේන්තුව තුළ පසුගිය දවසක කළ ප්‍රකාශයක් පිළිබඳව අපේ විරෝධය ප්‍රකාශ කරන්නත් මා මෙය අවස්ථාවක් කර ගන්නවා. මේ ආණ්ඩුව ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති (සංශෝධන) පනත ගැන කථා කරන වෙලාවේ, ඒක අමාත්‍ය මණ්ඩලය දක්වා ගෙනාපු වෙලාවේ, මේ රටේ තිස් වසරක් පමණ තිබුණු ඒ ශාපලත් යුද්ධය නිමා කළ අපේ රණවිරුවන්ට අගෞරව වන විධියට, මේ රටේ සමස්ත ජනතාවට අගෞරව වන විධියට පසුගිය දවසක

පාර්ලිමේන්තුව තුළ ගරු මන්ත්‍රීවරයෙක් ප්‍රකාශයක් කළා. ගරු තුරෙරෛරාසා රවිකරන් මන්ත්‍රීවරයා පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කළා, LTTE එකේ මිලේච්ඡ ත්‍රස්තවාදියෙක් පිළිබඳව. එතුමා ඔහුව සමරනවා කියලා කිව්වා. ඔහු යුද වීරයෙක් කියලා කිව්වා. ඔහු බ්‍රිගේඩියර්වරයෙක් කියලා කිව්වා. අපි අහනවා, මේ පාර්ලිමේන්තුව තුළ එහෙම කියන්න අයිතියක් තිබෙනවාද කියලා. මේ රට තුළ ඒකීයත්වය, ඒකීයභාවය රකින බවට දිවුරුම් දීලා පාර්ලිමේන්තුවට ඇවිල්ලා වෙනම රටක් වෙනුවෙන් යුද වැදුණු, වෙනම රටක් ඕනෑ කියලා මේ රටේ මිනිසුන් දහස් ගණනක් මරපු, කොටි ත්‍රස්තවාදියෙක් මේ පාර්ලිමේන්තුව තුළ සමරන්න පුළුවන්ද කියලා අපි අහනවා. ඒ වෙලාවේ මූලාසනයේ හිටියේ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය. එම ප්‍රකාශය අයින් කරන්න කියන්න එතුමියට කොන්දක් තිබුණේ නැහැ. එම ප්‍රකාශය හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න කියන්න එතුමියට කොන්දක් තිබුණේ නැහැ. අපි අහනවා, තුරෙරෛරාසා රවිකරන් මන්ත්‍රීවරයාට විරුද්ධව අපි කුමක්ද කරන්නේ කියන කාරණය. එතුමා සැමරුවේ, එතුමා සමරන්න කියලා කිව්වේ, එතුමා බ්‍රිගේඩියර්වරයෙක් කියලා කිව්වේ කොටි ත්‍රස්තවාදයෙකුට. අපි අහනවා, කොටි ත්‍රස්තවාදී සංවිධානයක කොහේද බ්‍රිගේඩියර්වරු ඉන්නේ කියලා. නිල හමුදාවල විතරයි බ්‍රිගේඩියර්වරු ඉන්නේ. එතුමාට මේ පාර්ලිමේන්තුවේ පුළුවන් වුණා නම් කොටි ත්‍රස්තවාදියෙක් සමරන්න, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු විධියට අපි මෙතැන ඉන්න එක වැඩක් නැහැ. අපි ඒ ප්‍රකාශය පිළිබඳව කනගාටු වනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම නිසා අපි ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, තුරෛරාසා රවිකරන් මන්ත්‍රීතුමාට විරුද්ධව යම් ක්‍රියාමාර්ගයක් ගන්න කියලා.

බාල්රාජ් කියන්නේ කවුද කියලා ඔබ සියලුදෙනාම දන්නවා. අලිමංකඩ හමුදා කඳවුරට පහර දීලා එම කඳවුරේ සිටි අපේ ශ්‍රේෂ්ඨ රණ විරුවන් විශාල පිරිසක් ඝාතනය කරන්න නායකත්වය දුන්න කොටි ත්‍රස්තවාදියෙක්, ඒ. ඒ ත්‍රස්තවාදියා පිළිබඳව මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා කියන්න පුළුවන් තැනකට මේ පාර්ලිමේන්තුව පත් වෙලා තිබෙනවා නම් අපි සියලුදෙනාම ඒ පිළිබඳව කනගාටුව වෙන්න ඕනෑ. මම ඒ පිළිබඳව මීට වඩා කථා කරන්නේ නැහැ. හැබැයි, ඒ ප්‍රකාශයට විරුද්ධව මේ ආණ්ඩුව ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද කියලා අපි බලාගෙන ඉන්නවා. එම ප්‍රකාශයට විරුද්ධව ගරු කථානායකතුමා කුමක්ද කරන්නේ කියලා අපි බලාගෙන ඉන්නවා.

අද ඒ විධියට LTTE එකේ නායකයෝ පාර්ලිමේන්තුවේ සමරනකොට මේ රටට විශිෂ්ට බුද්ධි මෙහෙවරක් කළ සලේ මැතිතුමාව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ මේ ආණ්ඩුව අත්අඩංගුවට අරගෙන තිබෙනවා. එතුමාට අද චෝදනා එල්ල කරන්නේ අත්අඩංගුවට අරගෙන. අද චෝදනා හදමින් ඉන්නවා. අද උදේ කථා කළා බිමල් රත්නායක මැතිතුමා පාස්කු ප්‍රහාරය ගැන. පාස්කු ප්‍රහාරය ගැන එතුමන්ලාට කථා කරන්න අයිතියක් තිබෙනවාද කියන කාරණය අපි අහනවා. අද බිමල් රත්නායක ඇමතිතුමාට අමතක වෙලා තිබෙනවා, පාස්කු ප්‍රහාරයේ ඒ බෝම්බකරුවන් දෙදෙනාගේ පියා කවුද කියන කාරණය. ඒ විතරක් නොවෙයි. බිමල් රත්නායක ඇමතිතුමාට අමතක වෙලා තිබෙනවා, ඒ පාස්කු ප්‍රහාරයට බෝම්බ හැදුවේ කුමන කර්මාන්තශාලාවෙන්ද කියන එක. ඒ කර්මාන්තශාලාවේ අයිතිකරුවා කවුද කියලා එතුමා අමතක කරමින් අද කථා කරන්නේ. ඒ විතරක් නොවෙයි. බිමල් රත්නායක ඇමතිතුමාට අමතක වෙලා තිබෙනවා, ඒ පාස්කු ප්‍රහාරයේ බෝම්බකරුවන් දෙදෙනාගේ පියා තමන්ගේ පක්ෂයේ ජාතික ලැයිස්තුවේ හිටපු අපේක්ෂකයෙක් කියලා. ඒවා අමතක කරමින් එතුමා කථා කරන්නේ. අද ඒ ඊබ්‍රාහිම් මහත්තයා ගැන අමතක කරමින්, ඊබ්‍රාහිම් මහත්තයා පැත්තක තියමින් පාස්කු ප්‍රහාරය පිළිබඳව හොයනවා නම් ඒක මේ රටේ සමස්ත කතෝලික ජනතාවට කරන අගෞරවයක් විධියට තමයි අපි දකින්නේ. එම නිසා අපි ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, පාස්කු ප්‍රහාරය දේශපාලන පැතිවලට ගෙන යන්න එපා කියලා. මට කාල වේලාව නැහැ. ඇත්තටම පාස්කු ප්‍රහාරය පිළිබඳව අපි වෙනම කථා කරන්න ඕනෑ. විශේෂයෙන්ම ඇමෙරිකාවේ FBI එක, ඕස්ට්‍රේලියාවේ ෆෙඩරල් පොලීසිය කියන ආයතන තොරතුරු, දත්ත හා facts මත ලබා දුන් තොරතුරු තිබෙනවා. අද ආණ්ඩුව ඒවා නොසලකා හරිමින් ඉන්නේ. ඒ තොරතුරුවල තිබෙනවා, මේක අන්තවාදී කල්ලියක් විසින් සිදු කළා කියන කාරණය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්නම්. විශේෂයෙන්ම ඔබගේ අවධානය ඉතා ගෞරවයෙන් යොමු කරවනවා, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සතු සපුගස්කන්ද තෙල් පිරිපහදුවේ සේවා අංක 16649 දරන ආරක්ෂක නිලධාරිනියට වෙච්ච අසාධාරණයක් සම්බන්ධයෙන්. ඇත්තටම නියෝජ්‍ය ඇමතිතුමා ඒ පිළිබඳ මුලින්ම අවධානය යොමු කළා. එතුමිය ඉතාම අසරණ තත්ත්වයට පත් වෙලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එතුමියගේ දරුවා ඔටිසම් රෝගයෙන් පෙළෙනවා. ඒ විතරක් නොවෙයි, එතුමිය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඉහළ නිලධාරීන්ගේ විවිධ තාඩන පීඩනවලට ලක් වෙමින් ඉන්නවා. ඒ නිසා අපි ඉතා ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා. ඛනිජ තෙල් සංස්ථාව සම්බන්ධව කටයුතු කරන නියෝජ්‍ය ඇමතිතුමා මේ අවස්ථාවේ සභාවේ ඉන්නවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, නැවත වරක් ඔබතුමාගේ අවධානය මේ කෙරෙහි යොමු කර සහනයක් ලබා දෙන්න කියලා අපි ඉල්ලා සිටිනවා. මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු චන්දිම හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා. *[සභා ගර්භය තුළ නැත.]*

ගරු එම්.කේ.එම්. අස්ලම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[පි.ව. 3.49]

**ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා**
(மாண்புமிகு எம்.கே.எம். அஸ்லம்)
(The Hon. M.K.M. Aslam)
நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே!

ஏற்றுமதி வருமானத்தை இலங்கைக்குள் மீளக் கொண்டுவருதல் பற்றிய விதிகள், அத்தியாவசிய பொதுச் சேவைகள் சட்டத்தின் கீழ் தீர்மானம் ஆகியன தொடர்பான விவாதத்தில் இன்று நாங்கள் கலந்துகொண்டு இருக்கின்றோம். உண்மையில், ஏற்றுமதிமூலம் கிடைக்கக் கூடிய பெறுகைகள் இன்று நாட்டுக்கு மிக முக்கியமான தேவையாக இருக்கின்றது. அந்த வகையில், இது தொடர்பான விவாதத்தில் பலரும் பலவிதமான கருத்துகளை முன்வைத்திருந்ததை நாங்கள் கண்டோம். இந்த அரசாங்கத்தை நாங்கள் அமைக்கும்போது இந்த நாட்டில் பல்வேறுபட்ட பொருட்களின் இறக்குமதிகளுக்குத் தடை விதிக்கப்பட்டிருந்தது. மிக முக்கியமாகச் சொல்வோமாயின், வாகன இறக்குமதி தடை செய்யப்பட்டிருந்தது. பொருளாதார ஸ்திரத்தன்மைக்கான எமது அரசாங்கத்தின் நடவடிக்கைகள் காரணமாக, நாட்டு மக்களுக்குத் தேவையான அனைத்துப் பொருட்களையும் இறக்குமதி செய்யக்கூடிய சந்தர்ப்பத்தை

[ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා]

எமது அரசாங்கம் வழங்கியது. அதன்படி, பல்லாயிரக் கணக்கான வாகனங்கள் இறக்குமதி செய்யப்பட்டன. இன்றைய சூழ்நிலை மிகவும் வித்தியாசமானது. இப்போது ஏற்பட்டிருக்கின்ற பிரச்சினையான சூழ்நிலை எமது நாட்டிற்கு மட்டும் ஏற்பட்டதல்ல. இந்தச் சூழ்நிலையை எதிர்கொள்ளும் வகையில் இன்றைக்குப் பாரிய பொருளாதார ஸ்திரநிலையைக் கொண்ட நாடுகள்கூட - அமெரிக்காவாக இருக்கலாம், எமது அண்மைய நாடான இந்தியாவாக இருக்கலாம் - பொருளாதார ரீதியான பல்வேறுபட்ட பாதுகாப்புத் திட்டங்களை அமுல்படுத்திக் கொண்டிருக்கின்றன. இந்தியப் பிரதமர் மோடி அவர்கள், தற்போதைய இந்தப் பொருளாதார ரீதியான இக்கட்டான சூழ்நிலையில் இருந்து தமது நாட்டைப் பாதுகாப்பதற்கு, வெளிநாட்டுப் பயணங்களைக் குறைக்குமாறு தமது நாட்டு மக்களிடம் வேண்டுகோள் விடுத்திருப்பது எங்களுக்குத் தெரியும்.

ஆனால், இதுவொரு தற்காலிகப் பிரச்சினை! இந்தப் பிரச்சினை ஒருநாளும் எமது நாட்டுக்கு ஓர் அச்சுறுத்தலாக இருக்கப் போவதில்லை. இந்தப் பிரச்சினையை அரசாங்கம் தலையீடு செய்து தீர்க்க முடியுமாக இருந்தால், நிச்சயமாக மக்களிடம் அல்லது ஏற்றுமதியாளர்களிடம் எந்த வேண்டுகோளையும் விடுத்திருக்க வேண்டியதில்லை. 'தித்வா' சூறாவளியின்போது நாங்கள் ஒருபோதும் மக்களை நோக்கி எந்த வேண்டுகோளையும் விடுக்கவில்லை. மாறாக, "அரசாங்கத்துக்கு நீங்கள் ஒன்றும் செய்யத் தேவையில்லை, நீங்கள் பாதுகாப்பாக மட்டும் இருங்கள்! நாங்கள் உங்களுடைய தேவைகளை நிறைவேற்றுவோம்" என்று கூறினோம். ஆனால், தற்போது ஏற்பட்டிருப்பது எமது நாட்டுக்கு மட்டும் உரித்தான ஒரு பிரச்சினை அல்ல. எமது நாட்டின் பொருளாதார நிலையினைக் கொண்டோ அல்லது எமது அரசாங்கத்தினாலோ அல்லது தனிப்பட்ட ஒரு நாட்டினாலோ control பண்ணக்கூடிய ஒரு பிரச்சினையாக இது இல்லை. இது சர்வதேச ரீதியில் மற்றும் மத்திய கிழக்கில் ஏற்பட்டிருக்கின்ற போர்ச் சூழலினால் ஏற்பட்ட பிரச்சினை! எனவே, அரசாங்கத்தின் தலைமைத்துவத்தின்கீழ் நாட்டு மக்கள், ஏற்றுமதியாளர்கள் என அனைவரும் சேர்ந்து இந்தப் பிரச்சினைக்கு முகங்கொடுத்தால் மாத்திரம்தான் எமது பொருளாதாரத்தைப் பாதுகாக்க முடியும்.

இன்று எதிர்க்கட்சியினருக்கு பேசுவதற்கு வார்த்தைகள் இல்லாமல், குறை சொல்வதற்கு வேறு விடயம் இல்லாமல், இதை அரசியலாக்கி, இந்தச் சூழ்நிலையை விகாரமாக்கிக் கொண்டிருக்கின்றார்கள். இவர்கள்தான் எமது ஏற்றுமதியாளர் களது உள்ளத்தில் அச்சத்தை உருவாக்குகின்றார்கள். இது ஒரு தற்காலிக நிலை! இந்த நாட்டிலுள்ள அனைவரும் பங்களிப்புச் செய்யவேண்டிய ஒரு தருணம்! எனவே, இந்தத் தற்காலிகச் சூழலை எதிர்கொண்டு நாங்கள் அனைவரும் சேர்ந்து எமது நாட்டைக் கட்டியெழுப்புவோம் என இந்த நேரத்தில் அனைத்துத் தரப்பினரிடமும் நாங்கள் விநயமாக வேண்டுகின்றோம், அழைப்பு விடுக்கின்றோம்.

அடுத்து, இன்று மிகவும் முக்கிய hot topic ஆக இருப்பது 'ஈஸ்டர்' தாக்குதல் ஆகும். உண்மையில் அது, இந்த நாட்டில் ஏன் தாங்கள் உயிர்களை இழந்தோம், ஏன் காயமடைந்தோம், ஏன் தங்களுக்கு இவ்வாறு நடந்தது என்று தெரியாத 278 அப்பாவிகளை மரணமடையச் செய்த சம்பவம்! ஐந்நூறுக்கும் மேற்பட்டோர் காயமடைந்த சம்பவம்! இது திட்டமிட்ட ஒரு சமூகப் படுகொலை! இந்தச் சமூகப் படுகொலையைச் சிலர் தமது அரசியல் இலாபத்துக்காகத் திட்டமிட்டார்கள். ஒட்டுமொத்த முஸ்லிம் சமூகத்தவரும் இந்த 'ஈஸ்டர்' தாக்குதலின் பின்னர் பாதிக்கப்பட்டார்கள். இந்த 'ஈஸ்டர்' தாக்குதலைத் திட்டமிட்டவர்கள் இன்று தங்களைப் பாதுகாப்பதற்காகப் பல்வேறு நாடகங்களை முன்னெடுத் துள்ளார்கள்; இந்த நாடகங்களுக்கு இவர்களும் விலைபோகிறார்கள்.

முன்னாள் ஜனாதிபதி மைத்திரிபால சிறிசேன அவர்களின் காலத்தில், எமது நாட்டில் 52 நாட்கள் கொண்ட ஓர் அரசாங்கம் இருந்ததை நாங்கள் கண்டோம். அந்த அரசாங்கம் பிழையான முறையில் உருவாக்கப்பட்டது. எனவே, இன்னும் பல்வேறு கட்சிகளோடு எமது கட்சியும் இணைந்து நடத்திய போராட்டத்தின் பின்னர் அந்தத் தவறு சுட்டிக் காட்டப்பட்டுத் திருத்தப்பட்டது. இதுவொரு நல்ல முன்னுதாரணமாகும். ஒரு பிழையான செயற்பாடு நடக்கும்போது அனைத்துக் கட்சிகளும் ஒன்று சேர வேண்டும். அதேபோன்று, முன்னாள் பிரதம நீதியரசர் ஷிராணி பண்டாரநாயக்க அவர்களுக்கு எதிராக வழங்கப்பட்ட பிழையான தீர்ப்புக்குப் பின்னர், அனைவரும் சேர்ந்து போராடியதால் அவருக்கு நீதி வழங்கப்பட்டது. ஆனால், இன்றைய இந்த உண்ணாவிரதப் போராட்டம் எதற்கு? இன்றைய இந்த உண்ணாவிரதப் போராட்டமானது, எமது நாட்டில் சமூகப் படுகொலையைச் செய்த சூழ்ச்சிக்காரர்களைக் காப்பாற்றுவதற்காகவே மேற்கொள்ளப்படுகின்றது.

எமது நாட்டில் ஏற்படுத்தப்பட்ட மிகப்பெரிய நாசகாரச் செயல் இந்த Easter attacks ஆகும். இதனால் எமது நாட்டுக்குச் சுற்றுலா நோக்குடன் வந்த வெளிநாட்டவர்களில் 50க்கும் மேற்பட்டோர் உயிரை மாய்த்துக் கொண்டார்கள். அவர்கள் செய்த தவறு என்ன? அந்தச் சிறு பிள்ளைகள் செய்த தவறு என்ன? இந்தத் தவறை நாங்கள் திருத்த வேண்டுமாயின், இவ்வாறான சூழ்ச்சிக்காரர்களுக்குத் தகுந்த தண்டனையை வழங்க வேண்டும். அப்படியானால்தான், எதிர்காலத்தில் இந்நாட்டில் சிங்களம், தமிழ், முஸ்லிம், பேர்கர், மலே, கிறிஸ்தவர் என அனைத்து மக்களும் பாதுகாப்பாக வாழக்கூடிய சூழல் ஏற்படும். அவ்வாறில்லாமல், இந்தச் சூழ்ச்சிக்காரர்களைக் காப்பாற்றினால், இதனையே ஒரு முன்னுதாரணமாகக்கொண்டு இனிவரும் காலங்களிலும் ஆட்சியமைப்பதற்கோ அல்லது தேர்தல்களில் வெல்வதற்கோ சதித் திட்டங்களைத் தீட்டுவார்கள்.

நான் எதிர்க்கட்சியான සජබஇல் உள்ள முஸ்லிம், தமிழ் மற்றும் கிறிஸ்தவ MPகளிடம் கேட்கின்றேன். இவர்களுடைய ஒரு சூழ்ச்சிக்காரரான உதய கம்மன்பிலவின் புத்தக வெளியீட்டு விழாவிற்கு සජබஇன் தலைவர் போனார். ஈஸ்டர் தாக்குதலின் பிரதான சூழ்ச்சியாளர்களுடைய, இனவாதத்தைக் கக்கக்கூடிய பிக்குகள் கலந்து கொள்ளக்கூடிய அந்தக் கூட்டங்களுக்கு සජබஇன் செயலாளர் போகிறார். සජබஇல் உள்ள முஸ்லிம் பாராளுமன்ற உறுப்பினர்கள், தமது தலைமைத்துவத்திடம் இதுபற்றி கேட்க வேண்டும். அவர்களுடன் எவ்வாறு இவர்கள் ஒன்றிணைந்து பயணிப்பார்கள்? Easter attacks சம்பந்தமாக பிழையான பதிவை வழங்கும் புத்தக வெளியீட்டு விழாவுக்கு இவர்களது தலைவர் போகிறார். அதேபோன்று, கோட்டாபய ராஜபக்ஷ அவர்களுக்குப் பிரயாணத் தடை விதித்ததும் அவரைக் காப்பாற்ற සජබஇன் செயலாளர் போகிறார். அப்படியாயின், இது தனக்குள்ளேயே நம்பிக்கையில்லாத ஒரு பயணம்! முஸ்லிம் புத்திஜீவிகள், உலமாக்கள், பாராளுமன்ற உறுப்பினர்கள் என முழு முஸ்லிம் சமூகமும் பாதிக்கப்பட்ட அந்த ஈஸ்டர் தாக்குதலின் சூழ்ச்சிக்காரரைக் காப்பாற்றுவதற்கு எவ்வாறு உங்கள் தலைமைத்துவம் செயற்படலாம்? என்ற கேள்வியை நாங்கள் உங்களிடம் கேட்கின்றோம்.

நாங்கள் இந்த நாட்டில் அரசியல் இலாபங்களுக்கோ அல்லது பதவிகளுக்கோ ஆசைப்படக் கூடாது. முதலாவதாக இந்த நாட்டுக்குத் தேவை மனிதநேயம்! நாங்கள் நாட்டை நேசிப்போம்; எமது நாட்டு மக்களை நேசிப்போம். அதன் பின்னரே எமது அரசியல் மற்றும் பதவி ஆசையை நிறைவேற்ற வேண்டும். ஆனால், துரதிருஷ்டவசமாக எதிர்க்கட்சியினர் தமது அரசியல் இலாபத்துக்காகவும் தமது பதவிகளைக் காப்பாற்றிக் கொள்வதற்காகவும் யாருடனும் கூட்டிணைவதை நாம் இன்று காணக்கூடியதாக உள்ளது. தேசிய மக்கள் சக்தியாகிய நாங்கள் ஒருபோதும் மோசமான கூட்டத்தவர்களோடு சேருவதில்லை. நாங்கள் கடந்த காலத்தில் இடம்பெற்ற பிழைகளைத் திருத்திக்கொள்ள முயன்றோம். ஆனால், இன்று எந்தச் சூழ்நிலையிலும் அரசாங்கத்துக்கு எதிரான செயற்பாடுகளில் எதிர்க்கட்சியிலுள்ள முஸ்லிம் பாராளுமன்ற உறுப்பினர்களுடன் அவர்களின் தலைமைத்துவமும் இணைந்து செயற்படுவதைக் காண முடிகின்றது. ஆகவே, அவர்கள் இதுபற்றி தங்களுக்குள்ளேயே கேள்வி கேட்க வேண்டுமென்று கூறிக்கொண்டு, விடை பெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.58]

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඉදිරිපත් කර තිබෙන වැදගත්ම කාරණයක් තමයි, ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ වන රීති. අපනයන ආදායම ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කර ගැනීම සඳහා වූ මාස 6ක කාල සීමාව මීට පෙර මාස 3කට අඩු කරලා තිබුණා. මේ මඟින් එය මාසයක් දක්වා අඩු කර තිබෙනවා.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ 5වන සහ 6වන සමාලෝචනවලින් පසුව අදාළ වාරික දෙක ගෙව්වාට පසුව ඒගොල්ලෝ ඉදිරිපත් කරනවා ඒගොල්ලන්ගේ වාර්තාව. ඒ වාර්තාව තුළ කියනවා, රට නැඟිටලා තිබෙනවා, නමුත් එහි වේගය මදි කියලා. ඒ සමඟම ඒගොල්ලෝ කියනවා, PAYE Tax එක ගැන නැවත සලකා බලන්න අවශ්‍යයි කියලා. අප කියන්නේ ඊට අදාළව තිබෙන රුපියල් ලක්ෂ ඒකාබද්ධ සීමාව මදි කියලායි; ඒක නැවත සංශෝධනය කළ යුතුයි කියලායි. ඒ අයම කියනවා, "Broaden tax base without counting too much on motor vehicle import duties" කියලා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල කියන්න ඕනෑ නැහැ, අපි මාස 18කට ඉස්සෙල්ලා කිව්වා, "මේක තමයි වෙන්න යන්නේ, කරුණාකර මේ ගැන බලන්න" කිව්වාය කියලා. ඊට පස්සේ, "IMF calls for stronger financial sector supervision and regulation" කියලා NDB එකේ සිදුවීම පෙන්නුවා. අපි මහ බැංකුවේ අධිපතිවරයාට මේවා ගැන කියන කොට ඒක සමච්චලයට ලක් කරලා තමයි පෙන්වන්න හදන්නේ; මොනවාද වෙන්නේ කියලා අපි දන්නේ නැහැ කියලා. හැබැයි, සුද්දා කිව්වාම ටිකක් නැඟිටිනවා. ඒක තමයි මේකේ පසුබිම.

අපි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 2,900ක් ණය වශයෙන් ගන්නවා. ඒ ඩොලර් මිලියන 2,900ට අපි සියයට 5ක පොලියක් ගෙවනවා. සියයට 5ක පොලිය ගෙව්වාම එහි අවසානයේදී - ඒ කියන්නේ, ගත්තු ණයයි, ගෙවන දවසයි අතර - ඇමෙරිකානු ඩොලර් මිලියන 870ක් අපි පොලී ප්‍රමාණය වශයෙන් ගෙවනවා. පොලිය සියයට 5ක ණයක් වශයෙන් තමයි එය තිබෙන්නේ. සියයට 5 පොලිය එකතු කළාම අවුරුදු 8කට, මේ කාල පරිච්ඡේදය තුළ - අපි 2024 ඉඳන්, ගන්නා ණය ගෙවන කොට තව අවුරුදු 8කින් - අපි මුළු මුදල වශයෙන් කීයක් ගෙවනවාද? අපි ගෙවනවා ඩොලර් මිලියන 2,900ක් සහ පොලිය වශයෙන් ඩොලර් මිලියන 870ක්. ඔක්කොම එකතුව ඩොලර් මිලියන 3,770ක් ගෙවනවා. මෙන්න මේ පසුබිම තුළ අපි මොනවාද කරන්නේ?

Committee on Public Financeහි ඉන්න සාමාජික මන්ත්‍රීවරුන් වන අපි දන්නවා සාමාන්‍යයෙන් අප එහි සාකච්ඡා කරන්නේ ආණ්ඩුව, විපක්ෂය වශයෙන් නොව රට වශයෙන් මොනවාද වෙලා තිබෙන්නේ කියන කාරණය ගැන බව. සල්ලි අච්චු ගහන්නේ නැහැ කියන මහ බැංකුව, ඕනෑ තරම් සල්ලි තිබෙනවා කියන මහ බැංකුව ඊට පස්සේ කියන්නේ මොකක්ද? ආදායම් උපයනවාලු, මූල්‍ය විනයක් තිබෙනවා කියලා එයාලාම කියනවා. මොකක්ද එහෙම නම් රුපියලට වෙලා තිබෙන්නේ? රුපියල අවප්‍රමාණය වීමේ ප්‍රතිවිපාකය තමයි අද ඔබතුමන්ලාගේ සමස්ත ආණ්ඩුවට තිබෙන ගැටලුව. අප එදා කියපු එක විපක්ෂයෙන් කිව්වා කියලා හිතුවාට අද ඒක යම් විධියක රෑ සිහිනයක් බවට පත් වෙලා තමයි තිබෙන්නේ.

අද විදුලිබල ක්ෂේත්‍රය ගත්තොත්, ගල් අඟුරුවල තිබෙන බාලදෝෂය නිසා අපි බිලියන 30කුත්, බිලියන 100කුත් අතර, ඒ කියන්නේ කෝටි 3,000කුත්, කෝටි 10,000කුත් අතර ප්‍රමාණයක් ගෙවන්න තිබෙනවා. ඒක තමයි මේකේ තිබෙන ප්‍රතිවිපාකය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට මතකද කාර් විවෘත කරනකොට අපි කිව්වා, කාර් 50,000ක්, 60,000ක් නොවෙයි, අපට අවශ්‍ය වන්නේ, රටේ සමස්ත ජනතාවගේ - ලක්ෂ 220ක් වන ජනතාවගේ - අනාගතය සුරක්ෂිත කරන්න ඕනෑය කියලා? රුපියල් 293ට තිබුණු ඩොලරය අද - මේ කථා කරන මොහොත වෙනකොට - රුපියල් 338යි. ඊයේ රුපියල් 342යි. මීට සුමාන දෙකකට ඉස්සෙල්ලා රුපියල් 351යි. මේක තමයි අපි එදා කිව්වේ. ආනයනය කිරීමෙන් තෘප්තියක් ලබා ගන්නවා, ආදායමින්. නමුත්, කාර් 40,000ක්, 50,000ක් අලුතින් ගන්නවාද, නැත්නම් රුපියල ශක්තිමත් කරලා අපනයනය ඇති කරලා ඒක තුළින් රුපියල ආරක්ෂා කරලා ආනයනය කරනවාද කියලා හිතන්න ඕනෑ. මම ඒක කියන්නේ මූල්‍ය පැත්තේ වගකීම මහ බැංකුවට තිබෙන නිසා. අපට සටන තිබෙන්නේ, not with the Governor, but with the governance of the Central Bank. මම ඔබතුමන්ලාගෙන් ඉල්ලනවා, කරුණාකරලා මේ සම්බන්ධයෙන් සාකච්ඡා කරන්න කියලා. සාකච්ඡා කරලා අපි එක ස්ථාවරයකට ආවේ නැත්නම් තව මාස දෙකකින් ඩොලරය රුපියල් 350 වෙනවා, රුපියල් 370 වෙනවා.

අපනයන ක්ෂේත්‍රය තුළ අද කරලා තිබෙන දේ බලන්න. දවස් 90කින් අපනයනය ඇති වෙන්නේ නැත්නම්, එදා අලුත් ආයෝජන තිබ්බේ නැත්නම් අද මොනවාද වෙන්නේ කියන ප්‍රශ්නය තමයි තිබෙන්නේ. Tourism අඩු වෙනකොට, අපනයන අඩු වෙනකොට මේ අවස්ථාවේදී අපි ප්‍රේෂණ - remittances - විතරයි යම් විධියකට රැකගෙන තිබෙන්නේ. ඒක අපි අගය කරනවා. අපි හැමදෙනාටම කියනවා හැම ශතයක්ම මේ පැත්තට එවන්න කියලා. මේ අවස්ථාවේදී මම මේ ආණ්ඩුවෙන් අහන්නේ මේකයි. එදා කිව්වා, අපේ යහළුවෝ එවන්න පටන් ගත්තාම ටොන් ගණන් එවනවා, ලක්ෂ ගණන් එවනවා, බිලියන ගණන් එවනවා කියලා. දැන් තමයි වෙලාව. එදා ඔයගොල්ලන් එවන්න

[ගරු රවී කරුණානායක මහතා]

එපා කිව්වාට, අපි කියනවා හැම ඩොලරයක්ම මේ රටට එවන්න කියලා. එතැනින් තමයි අපට රටක් හදන්න පුළුවන් වන්නේ. හැබැයි මතක තියා ගන්න, ඔබතුමන්ලාගේ ආණ්ඩුව යටතේ Public Financial Management Act එක අනුව පරිපාලනය වෙන මේ අය වැය යටතේ සියයට එකක් පොලී අනුපාතය වැඩි වෙනකොට ඔබතුමන්ලාට වියදම් කරන්න පුළුවන් ප්‍රමාණය බිලියන 350කින් අඩු වෙනවා. බිමල් රත්නායක මහතාට පාරක් හදන්න බිලියන 112ක් යනවා නම් ඒකෙන් ඒ වාගේ පාරවල් තුනක් හදන්න තිබුණා. නමුත්, මහ බැංකු අධිපතිතුමාට උද්ධමනය පාලනය කරන එක upset ගිහිල්ලා, විනිමය අනුපාතය control කරන්න බැරි වීම නිසා දැන් සල්ලි මේ රටට ගෙන්වා ගන්න අනුපාතය වැඩි කරනවා. අනුපාතය වැඩි කළාම බිලියන 340ක, ඒ කියන්නේ කෝටි 35,000ක විතර වියදමක් අවුරුද්දකට ඇති වෙනවා. ඒක යන්නේ කාටවත් නොවෙයි, ඒක යන්නේ අය වැයට. අය වැයට ගියාම ඒ මුදල අන්තිමට ගෙවන්න වෙන්නේ සමස්ත ජනතාවට. අපි එදා ඒක තමයි කිව්වේ. ආදායම ලබාගෙන මුදල් අමාත්‍යාංශයේ තියාගන්න එක නොවෙයි අපි කළ යුත්තේ. අපි ආයෝජන කරන්න අවශ්‍යයි. ඊට වැඩිය ප්‍රතිලාභයක් ලබා ගන්න පුළුවන් ආයෝජනයක් කරන්න අවශ්‍යයි. දැන් ඇති වෙලා තිබෙන ප්‍රශ්නය ඒකයි.

අපි මේ අවස්ථාවේදී කියන්නේ මේකයි. අධික උද්ධමනයක් තිබෙනවා, රුපියල බාල්දු වෙනවා, අඩු වර්ධන වේගයක් තිබෙනවා. අද growth rate එක සියයට තුනයි කියලා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල කියනවා. අපි හිතනවා, ඒක සියයට 2ත්, සියයට 4ත් අතර ප්‍රමාණයක් වේවි කියලා. ඊට පස්සේ ආර්ථික වර්ධනය මන්දගාමී ස්වරූපයක් ගන්නවා. එකතැන පල් වීම - stagflation - වෙනවා. ඊට පස්සේ financial stock එකක්,- අපට අලුතින් සල්ලි එන්නේ නැහැ, ආයෝජන එන්නේ නැහැ, අපනයන අඩු වෙනවා. අපි මේවා කියන්නේ තිබෙන දත්ත තුළින්. නැත්නම් මේවා විපක්ෂයෙන් සුපුරුදු පරිදි කියන දේවල් නොවෙයි. අපි කැමැතියි, ශක්තිමත් ආර්ථිකයක් හදාගෙන ඒක තුළින් ගමන් කරන්න. Colombo Stock Exchange එකේ යම් විධියකින් inflow එක වහාම අඩු වෙනවා, මෙතැන අධික ලෙස පොලී අනුපාතය වැඩි වෙනකොට. ඊට පස්සේ පෞද්ගලීකරණයට අත වනවා, ශ්‍රීලන්කන් ගුවන් සේවය. මේ වාගේ බංකොලොත් තැනක් - ශ්‍රීලන්කන් ගුවන් සේවය - තියාගෙන ඉඳලා පෞද්ගලික අංශයට නිකම් ත්‍යාග කරන්න එපාය කියන එක මම මතක් කරනවා.

දේශීය වශයෙන් එක සාක්කුවකින් තව සාක්කුවකට සල්ලි ගියා කියලා වෙනසක් වෙන්නේ නැහැ. අද සිදු වීගෙන යන්නේ දුප්පත් අය තව දුප්පත් වෙලා, පොහොසත් අය ඊටත් වැඩිය පොහොසත් වෙන එකයි. නමුත්, මේක නොවෙයි ජනාධිපති එදා කිව්වේ. මට මතකයි, හනීෆ් යූසුෆ් ආණ්ඩුකාරතුමා එම ධුරයට පත් වෙනකොට, මට දෙන්න තිබෙන පණිවුඩය මේකයි කියලා එතුමා කිව්වා, "පොහොසත් අය වැඩිය පොහොසත් වුණාට ප්‍රශ්නයක් නැහැ, නමුත් දුප්පත් අය තව දුප්පත් වෙන්න ඉඩ දෙන්න බැහැ" කියලා. අද වෙලා තිබෙන්නේ ඒක නොවෙයිද? රුපියල බාල්දු වීම, පොලී අනුපාතය වැඩි වීම, සංචිත නැති වෙලා තිබීම කියන මේ ඔක්කෝම පරිපාලනය කරන්නේ කවුද? මුදල් අමාත්‍යාංශය තුළින් එක කොටසකුත්, ඊට වැඩිය කොටසක් මහ බැංකුවෙන් නොවෙයිද?

මෙතැන ඉන්න පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව නියෝජනය කරන මන්ත්‍රීවරු දන්නවා ඇති, අපට ඒ සම්බන්ධයෙන් කරන්න තිබෙන්නේ මොනවාද කියලා. ඇත්ත වශයෙන්ම අද Import and Export Control Department එක වහලා දාන්න ඕනෑ. ආයෝජන මණ්ඩලය කිසිම වැඩක් නැහැ. ඒක වහලා තිබුණොත් ඊට වඩා ප්‍රතිලාභයක් තිබෙනවා. ඒ වාගේම වෙළෙඳ කලාපවල - zonesවල - කිසිම වර්ධනයකට කටයුතු වෙන්නේ නැහැ. මම මේ හැඟීම්බරව කියන්නේ. මොකද, අපි මේවා ගැන කථා කරනවා. එතැන ඉන්න රජයේ නිලධාරීන්ට ඔවුන්ගේ අභිමතය පරිදි වැඩ කරන ස්වරූපය සම්පූර්ණයෙන්ම නැති වෙලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ. මට තව මිනිත්තු 4ක් තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
නැහැ. ඔබතුමාට තව විනාඩි දෙකයි තිබෙන්නේ.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
හොඳයි. කමක් නැහැ. මම දන්නවා ඔබතුමා තව වෙලාව දෙනවා කියලා. මේ කථා කරන්නේ ඔබතුමන්ලා වෙනුවෙන්. ඔබතුමන්ලාට කථා කරන්න බැරි දේ තමයි මම මේ කථා කරන්නේ.

මේ වාගේ මහ බැංකුවක් තුළින් අපේ රටේ ආර්ථිකයත් එක්ක තව සෙල්ලම් කරන්න දුන්නොත් අන්තිමට රුපියලේ අගය බාල්දු වේවි, රුපියල් 400කට විතර. අපි එකතු වෙලා වැඩ කරමු. Import and Export Control Department එක වහලා දානවා කිව්වා. මොකද, ව්‍යුහාත්මක වෙනස්කම් - structural reforms - ඇති වෙන්න අවශ්‍යයි.

ඒ වාගේම තමයි අපි මේ අවස්ථාවේදී LCs ගැන කථා කරන්න අවශ්‍යයි. තුන්වැනි පාර්ශ්වයකින්, පිටරට ඉඳන් ගේන්න කටයුතු කරන්න පුළුවන් ඒවා අපි වැඩිදියුණු කරන්න අවශ්‍යයි. ඩොලර්වලින් ඒක කරන්න. අන්තිමට මේක බංකොලොත් වන ස්වරූපයෙන් මහ බැංකුව කටයුතු කරන්න හොඳ නැහැ. ඒගොල්ලන් තමයි මෙතෙක් දුර මේක පාලනය කළේ. ඒගොල්ලන්ගේ නොහැකියාව ආණ්ඩුවට දාලා කටයුතු කරන එක කියන්න අපට හරි ලේසියි. නමුත් මේකේ ඊට වැඩිය බැරෑරුම් තත්ත්වයක් තිබෙනවා. අද තිබෙන්නේ දවස් 90ක් තුළ සිදු කෙරෙන අපනයන. එදා අපනයන වැඩි වුණේ නැති එකේ ප්‍රශ්නය තමයි අපට දරාගන්න බැරි වෙලා තිබෙන්නේ. Entrepot tradingවල ප්‍රශ්නයක් තිබෙනවා. ඒවාට බදු ගහනවා. අද බදු පිට බදු ගහන එක තමයි තිබෙන ලොකුම ප්‍රශ්නය. අපේ විනිමය අනුපාතය ශක්තිමත් කිරීමේ කටයුත්තට loan-to-value ප්‍රශ්න ඇති කරලා තිබෙනවා. එදා moral suasion - ඒ කියන්නේ මහ බැංකුව යම් විධියකින් ඉදිරිපත් වෙලා කියනවා, රුපියල අවප්‍රමාණ වෙන්න ඉඩ දෙන්න එපා කියලා. එහෙත් වුණා. අන්තිමට interest rate එක වැඩි කරනවා. එක පොලී අනුපාතයක් වැඩි කරනවා කියන්නේ ආණ්ඩු පක්ෂයට මේ අය වැයෙන් රුපියල් බිලියන 340ක්, - රුපියල් කෝටි 3,400ක් - වියදම් කරන්න පුළුවන් හැකියාව නැති වෙනවා කියන එකයි. බිමල් රත්නායක ඇමතිතුමා සභාවේ ඉන්නවා. එතුමාට පාර හදන්න යන්නේ රුපියල් බිලියන 112යි. මම නැවත කියනවා, ඒ මුදලින්

ඒ වාගේ පාරවල් 3ක් හදන්න පුළුවන්. එහෙම නම් මහ බැංකු අධිපතිට උද්ධමනය පාලනය කරන්න අවස්ථාව දෙනවාද, නැත්නම් රටේ සැබෑ සංවර්ධනයක් ඇති කරන්න ඉඩ දෙනවාද? ඒ වාගේම LC margin එක අඩු කරනවාද? අපනයනය ගත්තොත්, LCs අඩු වෙලා තිබෙනකොට බැරි වෙලාවත් ඩොනල්ඩ් ට්‍රම්ප් සහ ඉරානය අතර ප්‍රශ්නය තව මාසයක්, දෙකක්, තුනක් ඉදිරියට යනවා නම් අපනයන අඩු වෙන්න පටන් ගත්තොත් ඒ දවස් 90 තුළ ඩොලර් ටික එකතු වෙන්නේ කොහොමද කියලා මහ බැංකුව කියලා තිබෙනවාද? ඊට පස්සේ කියයි, LCs ටික නවත්වන්න කියලා. ඊට පස්සේ රුපියල තව අවප්‍රමාණ වේවි. පසුගිය මාර්තු මාසයේ 03වැනි දා රුපියල් 303ට තිබුණු ඩොලරය මාර්තු 15වැනි දා වෙනකොට රුපියල් 313ට ගිහිල්ලා, ඊට පස්සේ රුපියල් 340ට ගිහිල්ලා ඊට පසුව සුමානයේ ඒක රුපියල් 332ට අඩු කරලා ඊට පස්සේ පොලී අනුපාතය වැඩි කරලා ඩොලරයේ අගය ආයේ රුපියල් 348ට වැඩි වෙනවා. මහ බැංකුව කැසිනෝ එකක්ද මේ ඇති කරන්නේ? තොග ණය වැඩි වෙලා තිබෙනවා. මම එක සංසන්දනයක් කරනවා. ඊයේ ආනන්ද විජේපාල ඇමතිතුමා ඉතාම බැරෑරුම් කාරණයක් කියලා තිබුණා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තව පොඩි වේලාවකින් මම කථාව අවසන් කරනවා.

ආනන්ද විජේපාල මැතිතුමා කියලා තිබුණා, NDB බැංකුවේ සිදු වූ මූල්‍ය වංචාවට අදාළ රුපියල් බිලියන 13.2ක සල්ලිවලින් යම් ප්‍රමාණයක් පිට රටට ගියා කියලා. මහ බැංකුවේ circulars ඔක්කෝම තිබියදී කොහොමද ඒ සල්ලි ටික ගියේ?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් අවසන් කරන්න.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
හරි. අවසන් කරනවා.

2023 සැප්තැම්බර් මාසයේ ඩොලර් මිලියන 6,100ක්ව තිබුණු විදේශ විනිමය සංචිතය අද ඩොලර් මිලියන 6,780ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. Balance of payments බිලියන 200ක් තිබුණු එක- රුපියල් 293ට තිබුණු ඩොලරයේ අගය අද යම් විධියකින් රුපියල් 341ට වැඩි වෙලා තිබෙනවා. මේ තුළ එදා සියයට සෘණ 1.2ක්ව තිබුණු උද්ධමනය අද සියයට 5.7ක් වෙලා තිබෙනවා. මේ ඔක්කෝම මම කියන්නේ මූල්‍ය කටයුතු කරන්නේ මහ බැංකුව නිසා. ඒ නිසා මේ අවස්ථාවේ කාරුණිකව අපි ඉල්ලනවා මහ බැංකුව සම්බන්ධයෙන් විශේෂ කාරක සභාවක් පත් කරන්න කියලා. ඊට අදාළ ලේඛන දෙකක් මම **සභාගත*** කරනවා.

ස්තුතියි.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 8ක කාලයක් ලැබෙනවා. *[බාධා කිරීමක්]*

[අ.භා. 4.10]

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමනි, මගේ අවස්ථාව මට ලබා දෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි මේ කථා කරන ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ ගෙනෙන රීතිය ගත්තොත්, ඇයි මේ රීතිය පළ කරලා තිබෙන්නේ, මේ රීතිය මොකක්ද කියන එකෙන් අපි පටන් ගනිමු. මේ රීතියේ තිබෙන්නේ මේකයි. මෙච්චර කල් අපේ රටට අපනයන ඉපැයීම් එනකොට මාස 6ක් ඒක account එකේ රඳවාගෙන ඉන්නට පුළුවන්කම තිබුණා. දවස් 100ක් ඇතුළත එම මුදල රුපියල් බවට පරිවර්තනය කිරීමේ නියමයක්, Rule එකක් තිබුණා. රවී කරුණානායක මන්ත්‍රීතුමාත් කිව්වා වාගේ අද ලංකාවේ සහ ලෝකයේ ඇති වෙලා තිබෙන සුවිශේෂී තත්ත්වය මත අපේ රුපියල අවප්‍රමාණය වීමේ ප්‍රශ්නයක් අපට ඇවිල්ලා තිබෙනවා. විදේශ විනිමය මත යම් පීඩනයක් ඇති වෙලා තිබෙනවා. එසේ පීඩනයක් ඇති වීමේ තත්ත්වය සලකා බලමින් තමයි අපනයන ඉපැයීම් දවස් 40ක උපරිම කාලයකට යටත්ව අනිවාර්යයෙන්ම රුපියල් බවට පරිවර්තනය කිරීමේ රීතියක් අද අපි පාර්ලිමේන්තුවේ සම්මත කරන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මෙය සදාකාලිකව; හැම දාටම කරන දෙයක් නොවෙයි. විශේෂයෙන්ම මේ වෙලාවේ රුපියල අවප්‍රමාණය වීමේ අවදානමකට මුහුණ දෙනවා. ලංකාවේ රුපියල අවප්‍රමාණය වුණාම තිබෙන ප්‍රධානම ප්‍රශ්නය තමයි ආනයනික උද්ධමනයක් රට තුළ ඇති වෙන එක. අපි එය තේරුම් ගන්නට ඕනෑ. මොකද, ලංකාවේ ජනතාව පරිභෝජනය කරන භාණ්ඩ වර්ග ගොඩක් ආනයනය කරන ඒවා. ඒ වාගේම තමයි අමුද්‍රව්‍ය - raw materials, ඉන්ධන වාගේ දේවල් අපි ආනයනය කරනවා. ඒ අනුව රට තුළ නිෂ්පාදන වියදමත් වැඩි වෙනවා. ඒක නිසා රුපියල අවප්‍රමාණය වීම, එහෙම නැත්නම් ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය අඩු වීම කියන එක පාලනය කර ගත්තේ නැත්නම් අපිට එළියට ගෙවන්න වෙන paymentsවල ප්‍රශ්නයක් විතරක් නොවෙයි තිබෙන්නේ; අපිට අපේ reserve එක සම්බන්ධ ප්‍රශ්නයක් විතරක් නොවෙයි තිබෙන්නේ. එදිනෙදා සාමාන්‍ය ජනතාවට බලපාන ප්‍රශ්නයක් හැටියට මෙය තිබෙනවා. ආනයනිත උද්ධමනයක් රට තුළ ඇති වෙනවා. නිෂ්පාදන පිරිවැය වැඩි වෙනවා. අපි ඒ තත්ත්වය වළක්වා ගන්නට අවශ්‍යයි.

අපි ආණ්ඩුව හැටියට පසුගිය කාලය පුරාම මේ සම්බන්ධයෙන් විවිධ ක්‍රියාමාර්ග ගත්තා. වාහන ආනයනය තාවකාලිකව අධෛර්යවත් කිරීම සඳහා අපි යම් බදු ක්‍රමවේදයක් හඳුන්වා දුන්නා. ඊට අමතරව මේ තත්ත්වය කළමනාකරණය කර ගැනීම සඳහා අපට යම් යම් සීමා කිරීම් ප්‍රමාණයක් කරන්නට සිද්ධ වෙලා තිබෙනවා. අපි ඒ අර්ථයෙන් තමයි ඒක තේරුම් ගන්නට ඕනෑ. ආර්ථිකය හැකිළවීමක්, එහෙම නැත්නම් අපේ ආනයනකරුවන්, අපනයනකරුවන් අධෛර්යවත් කිරීමක් හෝ අපේ වෙළෙඳාම සීමා කිරීමක් හෝ නොවෙයි මේ සිදු කරන්නේ. මේ වෙලාවේ මේ තත්ත්වය කළමනාකරණය කර ගැනීම සඳහා රජය සහ මහ බැංකුව අනුගමනය කරන ක්‍රියාමාර්ගයක්, මේක. මම හිතන විධියට ඒ අර්ථයෙන් අරගෙන තමයි අපි මේකට සහයෝගය ලබා දීමට අවශ්‍ය වන්නේ. ඒ වාගේම හැම අපනයනකරුවෙකුටම වගකීමක් තිබෙනවා, රටේ පුරවැසියන්

[ගරු නිතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය]

අපහසුතාවට පත් කරන්නේ නැතුව ඩොලර් ඉපැයීම් - අපනයන ඉපැයීම් - රට තුළට ගෙනැල්ලා මේ කාලය තුළ රුපියල් බවට පරිවර්තනය කරන්න. එහෙම කළාම අපේ විදේශ විනිමය මත තිබෙන පීඩනය සැහෙන තරම් දුරට අඩු කර ගැනීමට අපට හැකි වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම කාරණා පිළිබඳව පැහැදිලි කරන ගමන්ම අපේ රටේ ණය තිරසරභාවය ගැන කථා කරන්නත් මම කැමැතියි. අද දවසේ ප්‍රශ්න කිහිපයක් මතු වුණා, ණය තිරසර නැහැ, අපේ ණය වැඩි වෙලා තිබෙනවා කියලා. මන්ත්‍රීවරු කිහිප දෙනෙකු ඒ ගැන කථා කළා. ඇත්තටම ලංකාවේ ණය ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවාද කියන කාරණය අපි සාකච්ඡා කරන්නට අවශ්‍යයි. මොකද, අපි ණය ගෙවා ගන්න බැරිව බංකොලොත්භාවයට පත් වුණු රටක්. ඒක නිසා ණය වැඩි වුණා කියන එක මේ වෙනකොට අපේ රටේ ජනතාවගේ මානසික තත්ත්වය තුළ ඉතාම භීතියක් ඇති කරන කාරණයක් බවට පත් වෙලා තිබෙනවා. නමුත්, absolutely අපේ ණය ප්‍රමාණය පිළිබඳව - ණය ඩොලර් බිලියන 96ක් තිබුණා, ඒක ඩොලර් බිලියන 100ක් වුණා කියන කාරණයෙන් විතරක් - ණය වැඩි වුණාද, ඒ ණය ආර්ථිකය මත ඇති කරන බර අඩු වැඩි වෙලාද කියන එක තීරණය කර ගැනීමට බැහැ. ණය තිරසාරද, නැද්ද කියන එක ගැන අපි බලන්නට ඕනෑ. ඒ කියන්නේ මේ ආර්ථිකයට ණය ගෙවීමේ හැකියාවක් තිබෙනවාද, අපේ ජනතාවගේ මූලික අවශ්‍යතා ඉෂ්ට කර ගනිමින් අපට ණය ගෙවීමේ හැකියාවක් තිබෙනවාද කියන එක තමයි ආර්ථිකයට අදාළව ණය සම්බන්ධව අපි බලන්න ඕනෑ කාරණය වන්නේ. මොකද, ණය ගන්න වෙනවා. ණය ප්‍රමාණය වැඩි වීමේ ප්‍රශ්නයක් තිබෙන්න පුළුවන්. නමුත් ණය මඟින් සිද්ධ කරන්නේ ආර්ථිකය ප්‍රසාරණය කිරීම නම්, වර්ධනය කිරීම නම්, ණය ගෙවීමේ හැකියාව වර්ධනය කිරීම නම් අපි ඒ ණය ප්‍රමාණය ප්‍රමාණාත්මකව වැඩිවීම කියන කාරණය ගැටලුවක් කරගන්න අවශ්‍ය නැහැ. ඒක සාපේක්ෂව තමයි අපි බලන්නට ඕනෑ. එහෙම බලන්න තමයි debt-to-GDP ratio එක තිබෙන්නේ. ඒ කියන්නේ දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව ණය කොපමණ ප්‍රමාණයක් තිබෙනවාද, එහෙම නැත්නම් මේ ආර්ථිකයට ණය දරා ගැනීමේ හැකියාවක් තිබෙනවාද කියන කාරණය ඒ තුළින් බලන්නට පුළුවන්.

2024 වසරේ debt-to-GDP ratio එක සහ 2025 වසරේ debt-to-GDP ratio එක සංසන්දනය - compare - කර බැලුවාම, 95.5ක සිට 91.6 දක්වා debt-to-GDP ratio එක, එහෙම නැත්නම් ණය තිරසරකරණය සම්බන්ධ දර්ශකය අඩු වෙලා තිබෙන බව පෙනී යනවා. ඒ කියන්නේ ලංකාවේ ණය බර, ආර්ථිකයට දරා ගැනීමට ඇති ණය බර අඩු වෙලා තිබෙනවා. ඒ වාගේම තමයි බාහිර ණය - external debt. ඒ කියන්නේ ඩොලර් වශයෙන් අපිට ගෙවීමට තිබෙන ණය ප්‍රමාණයත් 2024දී සියයට 55.7යි. ඒක 2025 වෙනකොට සියයට 50.4 දක්වා අඩු වෙලා තිබෙනවා.

අපි බලමු, ණය වැඩි වෙලා තිබෙනවා කියලා කියන පාර්ශ්ව රට පාලනය කරන කාලයේදී තත්ත්වය. 2015 සිට 2019 වෙනතුරු රට පාලනය කළ යහ පාලන රජය කාලයේ තමයි ලංකාවේ ණය අතිවිශාල ප්‍රමාණයක් වැඩි වෙච්ච කාලය. අපි ඒ කාලය බැලුවොත්, ඒ රජය පටන් ගන්නකොට දළ දේශීය නිෂ්පාදිතයේ ණය ප්‍රමාණය - debt-to-GDP ratio එක - සියයට 73යි. රජයේ කාලය අවසන් වනකොට ඒක සියයට 82ක් දක්වා වැඩිවීමක් වෙලා තිබුණා. මෙන්න මේ වාගේ නිශ්චිත දර්ශකවලින් තමයි ණය තිරසාර ද, නැද්ද කියන එක, ණය ගෙවීමට හැකියාව තිබෙනවාද, නැද්ද කියන එක සාකච්ඡා කර ගන්නට අවශ්‍ය. එහෙම නැතිව නිකම්ම numbers අත හැරියා කියලා මේ සම්පූර්ණ කතන්දරය, එහෙම නැත්නම් ඇත්තටම අපිට තිබෙන බලපෑම පැහැදිලි වෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය අවුරුද්ද තුළ අපේ රටේ ණය සේවනය කිරීම සඳහා පොලී වියදම - interest payment එක - අඩු කර ගැනීමේ හැකියාව රජයක් විධියට අපට තිබිලා තිබෙනවා කියන එක අපි මතක් කර ගන්නට ඕනෑ. ඒක මහ බැංකුවේ වාර්ෂික වාර්තාවලත් සඳහන් වෙනවා. රජය විසින්; භාණ්ඩාගාරය විසින් මුදල් සංචිතයක් නඩත්තු කරමින් පොලී අනුපාත පාලනය කිරීම හරහා මේකට ඉතා විශාල දායකත්වයක් - contribution එකක් - දැක්වුවා කියන එක මහ බැංකුවේ වාර්ෂික වාර්තාවේත් සඳහන් වෙනවා. ඒ නිසා ණය සම්බන්ධව ගත්තොත්, පසුගිය වර්ෂ එකහමාර තුළ අපි රටේ ණය බර අඩු කරලා තිබෙනවා. ණය සඳහා යන පිරිවැයත් - පොලී පිරිවැයත් - අපි රජයක් විධියට අඩු කරලා තිබෙනවා. ඒකේ තනිකර අනෙක් පැත්ත තමයි යහ පාලන රජය කාලයේ වුණේ. දරා ගන්න බැරි ප්‍රමාණයට රටේ ණය ප්‍රමාණය වැඩි වුණා. ණය සඳහා ගෙවන පිරිවැය ප්‍රමාණයත්, එහෙම නැත්නම් පොලී ප්‍රමාණයත් දරා ගත නොහැකි ලෙස වැඩි වුණා. ඒකට හොඳම උදාහරණය මේකයි. අපි ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර ණය අර ගත්තේ ඉතා ඉහළ පොලියට. වාණිජ වෙළෙඳ පොළෙන් ණය අරගෙන තමයි අවසානයේදී ලංකාවේ අපේ අය වැය හිඟය මූලනය කළේ. ඒ නිසා අපි ණය ගැන කථා කරද්දී වගකීම් සහගත වෙන්න ඕනෑ. මොකද, ලංකාවේ ණය වැඩි වෙලා නැහැ. ඇත්තමට රටට දරා ගත හැකි ප්‍රමාණයකට ණය අඩු වෙමින් යනවා. 2032 වන විට අපිට තිබුණු target එක සියයට 95යි. අපි දැනටමත් එතැනට ළඟා වෙලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මට කාලය ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි,

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.18]

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

විශේෂයෙන්ම අපේ රටේ මහ බැංකුව මඟින් ඉදිරිපත් කරපු විශේෂ රීති සහ ඒ හා සමානවම තවත් පනතක් යටතේ ගෙනෙන යෝජනා සම්මතය පිළිබඳව තමයි අද දිනයේ කථා කරන්නේ. අද විපක්ෂයේ ඉන්න, එහෙම නැත්නම් එදා බලයේ හිටපු ආණ්ඩුවලින් කරපු වැඩසටහන් සම්බන්ධව යම් විධියක ගැළපීම් කරමින් තමයි හැම තිස්සේම ආණ්ඩු පක්ෂය කථා කරන්නේ. අනාගතය පිළිබඳ දැන් සැලසුම ගැන තමයි අපි අහන්නේ. ඒ කියන්නේ වර්තමානය සහ අනාගතය සම්බන්ධයෙන් තිබෙන සැලසුම් පිළිබඳව කථා කරන්න කියලා තමයි අපි ඉල්ලන්නේ. ආණ්ඩුව මේ රට පාලනය කරන්නේ කොහොමද කියලා කියනවා නම්, අද හදිසි නීතිය දාලා තමයි ආණ්ඩුව මේ රට පාලනය කරන්නේ. හදිසි නීතිය අවශ්‍ය වෙලා තිබෙන්නේ ඇයි? රටේ ජනතාවට ආර්ථික වශයෙන් වෙලා තිබෙන ප්‍රශ්නවලට ජනතාව පාරට බහීද, වෘත්තිය සමිති පාරට බහීද, අනෙකුත් ආයතන පාරට බහීද කියන සැකය සහ බිය සියල්ල තමන්ගේ වගකීම් හැටියට අරගෙන ඒ වගකීම රටේ ජනතාවගේ පිට පටවලා ජනතාව බය කරගෙන තමයි මේ රට පාලනය කරන්නේ. ඒ නිසා පළමුවෙන්ම ඔබතුමන්ලා කරන කාර්යයේදී ඔබතුමන්ලාගේ අසමත්භාවය පෙන්වලා තිබෙනවා.

ඊළඟට අපි දැක්කා ඔබතුමන්ලා "දීර්ඝ කාලීන වැඩසටහන්, දීර්ඝ කාලීන වැඩසටහන් ගෙනෙනවා" කියලා කියනවා. දැන්

අවුරුදු දෙකක් ගිහිල්ලා ඉවරයි. ජනාධිපති ධුරයට තිබෙන්නේ තවත් අවුරුදු තුනයි. ඔක්කොම අවුරුදු පහයි නේ. එතකොට, දීර්ඝ කාලීනව කියලා අදහස් කරන්නේ අවුරුදු 10ද, 15ද, 20ද? ඔබතුමන්ලාට මේ අවුරුදු 5ට වඩා බලයේ ඉන්න පුළුවන්ද? එහෙම බලාපොරොත්තුවක් තිබෙනවාද? එහෙම සැලසුමක් තිබෙනවාද? දේශපාලන වශයෙන් එහෙම සැලසුමක් තිබෙන්න බැහැ. රටේ පරිපාලනය තුළ දීර්ඝ කාලීන වැඩසටහනකින් මේ රටේ ප්‍රශ්න විසඳන්න පුළුවන් කියන දේශපාලන වැඩසටහන් හදන්න බැහැ.

ආර්ථිකය ශක්තිමත් කරන, ආර්ථිකයට අවශ්‍ය මුදල් එකතු කරන ක්‍රමවේද තමුන්නාන්සේලාගේ සංවර්ධන යෝජනා තුළ තිබෙනවා කියලා අපි දකින්නේ නැහැ. අද වනකොට බදු එකතු කරලා ආණ්ඩුව නම් පොහොසත් වෙලා තිබෙනවා. හැබැයි, ජනතාව දුප්පත් වෙලා තිබෙනවා. ඒ වාගේම ව්‍යාපාරිකයා, කර්මාන්තකරුවා අද දුප්පත් වෙලා තිබෙනවා. එම නිසා තමයි ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ වූ රීති තුළින් අපනයන ක්ෂේත්‍රයට අදාළව ඩොලර් ගැන මේ අවස්ථාවේ සාකච්ඡා කරන්නේ. විශේෂයෙන්ම අපනයන ක්ෂේත්‍රයේ නියැළෙන අයගේ ඩොලර් අවශ්‍යතාව ගැන යම් විධියකට සැලකිල්ලක් දක්වලාද මේ වැඩේ කළේ කියලායි අපි අහන්නේ. අන්න ඒ ගැන අපට ගැටලුවක් තිබෙනවා. ඒ ගැනයි අපි කථා කරන්නේ. එහෙම නැතුව මේකෙන් බදු ගැහුවා කියන එක ගැන නොවෙයි අපි කථා කරන්නේ. විපක්ෂයේ හැම දෙනෙක්ම කිව්වේ මේ පිළිබඳව සවිස්තරාත්මකව තවදුරටත් හිතන්න කියලායි. කඩා වැටෙන ව්‍යාපාරිකයා ශක්තිමත් කරන්නේ කොහොමද කියන වැඩසටහන හදන එක ගැන තමුන්නාන්සේලා හිතන්න. ඒ වාගේම මම විශේෂයෙන් මතක් කරනවා, රටේ අනෙකුත් ප්‍රශ්න පිළිබඳවත් හිතන්න කියලා.

ධීවර ක්ෂේත්‍රය ගත්තාම පොඩි බෝට්ටු කර්මාන්තය, මහ බෝට්ටු කර්මාන්තය වාගේම අනෙකුත් ධීවර කර්මාන්තවල යෙදෙන අයටත් අද වන විට තෙල් මිල විශාල ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. මොකද, භූමිතෙල් මිල එදා තිබුණු තත්ත්වයට වඩා රුපියල් 100කට වඩා මේ වන විට ඉහළ ගිහිල්ලා තිබෙනවා. ඒ වාගේම ඩීසල් මිලත් අද වන විට විශාල වශයෙන් ඉහළ ගිහිල්ලා තිබෙනවා. එම නිසා අද ධීවරයාට කරගන්න බැරි තරමට තම කර්මාන්තය කඩා වැටිලා තිබෙනවා. ධීවරයාට සහනයක් දෙනවා කිය කියා දවසින් දවස මේ ආණ්ඩුව බොරු කියනවා. එම නිසා වහාම මේ බොරුව නවත්වා ධීවරයාට අවශ්‍ය ඒ තෙල් සහනාධාරය ලබා දීමේ වැඩසටහන ඉක්මනින් ක්‍රියාත්මක කරන්න කියලා අපි ඉල්ලනවා. නැත්නම් ධීවර කර්මාන්තය සම්පූර්ණයෙන්ම කඩා වැටෙනවා විතරක් නොවෙයි, ඒ ධීවර පවුල්වල සමාජයීය තත්ත්වය, එහෙම නැත්නම් ඒ පවුල්වලට ජීවත් වන්න අවශ්‍ය ඒ ශක්තිය නැති වනවා. එම නිසා කරුණාකරලා ධීවර ක්ෂේත්‍රය ගැන විශේෂයෙන් බලන්න කියලා ඔබතුමන්ලාගෙන් මම විශේෂ ඉල්ලීමක් කරනවා.

අද ධීවරයින් සියලුදෙනා ඔවුන්ගේ ගැටලු පිළිබඳව අපිත් එක්ක කථා කරනවා. ඒ කථා කරන හැම කෙනෙක්ම කියන්නේ ඒගොල්ලන්ට කර්මාන්තය කරගෙන යන්න බැහැ කියලායි. ඒ බොහෝදෙනෙක් අද බෝට්ටු බැඳලා තිබෙන්නේ. මහ බෝට්ටු තිබෙන අය ඒ ධීවර කර්මාන්තය නතර කරලා තිබෙනවා. ඔබතුමන්ලා සමීක්ෂණයක් කරලා හොයලා බලන්න, මොකක්ද මේ ක්‍රමය කියලා. ඉදිරි කාලය තුළ අපනයන ක්ෂේත්‍රයට බරපතළ විධියට බලපායි, මහ බෝට්ටු බැඳලා, එහෙම නැත්නම් ඒ මහ බෝට්ටු මාළු අල්ලන්නේ නැතුව ගියොත්. ඒ වාගේම පොඩි බෝට්ටුවලින් ඒ කර්මාන්තය කළේ නැත්නම් ලංකාව වටේම ඉන්න ධීවර ජනතාවගේ ආර්ථික තත්ත්වය කඩා වැටෙද්දි ඔවුන්ගේ සමාජයීය තත්ත්වයත් නිකම්ම කඩා වැටෙනවා. ඒ වාගේම ඒ පවුල්වල දරුවන්ගේ අධ්‍යාපනය ඇතුළු සියලු දේවල් කඩා වැටිලා ඒ සමාජය දුර්වල වනවා. ඔබතුමන්ලා හැම තිස්සේම රටක් හැටියට හිතලා රටේ වැඩ පිළිවෙළ සකස් කරද්දි මේ අංශ සියල්ල කොහොමද රැක ගන්නේ කියන එකත් විධිමත්ව සැලසුම් කරන්න.

අපි පොහොර ගැන කථා කරන කොට සංඛ්‍යාලේඛනවලින් මොනවා කිව්වත්, අද අනුරාධපුරයට, පොළොන්නරුවට ගිහිල්ලා ඒ ගොවීන්ට කථා කළාම දැනගන්න ලැබෙනවා, ඒ පොහොර සහනාධාරය දෙනවා කියපු වැඩසටහන නියමිත දවසේ කෙරිලා නැහැ, එහෙම නැත්නම් තවමත් ගොවීන්ට ඒ සහනාධාරය ලැබෙන්නේ නැහැ කියන එක. අවශ්‍ය වෙලාවට පොහොර ටික ලබා දෙන්න අවශ්‍ය වැඩ පිළිවෙළ මේ රජය හදලා නැහැ. එක පැත්තකින් ගොවියාට තමන්ගේ ජීවන තත්ත්වය නැති වනවා. ඒ විතරක් නොවෙයි. විශේෂයෙන්ම රටේ ආර්ථිකයට, එහෙම නැත්නම් රටේ පරිභෝජනය කරන ආහාර ටික හරි විධියට සකස් කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළේ අයිතිකරු හැටියට ඉන්න ගොවියාට ඒ වැඩ කටයුත්ත කරගන්න බැරිව ගියොත් රට තවත් පැත්තකින් කඩා වැටෙනවා.

අපේ සෞඛ්‍ය ක්ෂේත්‍රය ගත්තාම අද බෙහෙත් හිඟය කොච්චරද කියලා පෙනෙනවා. අපි වෛද්‍යවරුන් එක්ක කථා කළාම, රෝහල්වල කාර්ය මණ්ඩලයත් එක්ක කථා කළාම ඒ හැම තැනකම බරපතළ විධියේ බෙහෙත් හිඟයක් තිබෙන බව අහන්න ලැබෙනවා. අපි දැක්කා, SPC එකේ සභාපති සහ MD අස්වෙනවා. ඔවුන් අස් වන්නේ ඇයි? ඔවුන් දන්නවා, බෙහෙත් හිඟය ආවාට පස්සේ බරපතළ ප්‍රශ්නයකට ඔවුන්ට මුහුණ දෙන්න සිදු වනවා කියලා. හැබැයි, NMRA එකේ සභාපති - මේ බෙහෙත් හිඟයට විශේෂයෙන් වගකිව යුතු පුද්ගලයා - තවම ඔබතුමන්ලා තියාගෙන ඉන්නවා. මේකේ රහස මොකක්ද කියලා බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. මේ, බෙහෙත් ආනයනය කරන කණ්ඩායම් එක්ක තිබෙන වෙනත් සම්බන්ධතාවක්ද? එහෙම නැත්නම් ඉන්දියාව එක්ක ගහපු අලුත් ගිවිසුම් ටික ආරක්ෂා කරන වැඩ පිළිවෙළක්ද? ඒ සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබෙනවා. අපි මීට ඉස්සෙල්ලාත් SPC එක ගැන කිව්වා. දැන් තමයි SPC එකේ සභාපති අයින් වුණේ. ඇයි, NMRA එකේ සභාපතිව අයින් නොකරන්නේ? ඔහු එදා තිබුණු ආණ්ඩුවෙන් පත් කරපු කෙනෙක්. ඔබතුමන්ලා එදා තිබුණු ආණ්ඩුවලට ඇඟිල්ල දිගු කරනවා, එදා තිබුණු ආණ්ඩුවල ඇමතිවරුන්ට ඇඟිල්ල දිගු කරනවා. එදා තිබුණු ආණ්ඩුවල පරිපාලනයේ හිටපු නිලධාරින්ට ඇඟිල්ල දිගු කරනවා විතරක් නොවෙයි, ඒ අය වැරදිකරුවන් බවත් කියනවා. හැබැයි, එදා තිබුණු ආණ්ඩුව පත් කරපු NMRA එකේ සභාපතිව තවම තියාගෙන ඉන්නවා. එහි රහස මොකක්ද කියන එක අපි විශේෂයෙන් ඉදිරි කාලයේදී මේ පාර්ලිමේන්තුවට සමහර වාර්තා සභාගත කරමින් ඉදිරිපත් කරනවා. ඇමතිවරයාට තිබෙන්නේ ඒ කුණු ටික එතුමාගේ ඇඟේ දාගන්නේ නැතුව ඒකට අවශ්‍ය තොරතුරු හොයා බලා තීන්දු තීරණ ගන්න එක. ඔබතුමන්ලා මොන විධියේ සැලසුම් හැදුවත් අද ජනතාව අතර ඉන්නවා, එක වේලක් කාලා අනික් වේල් දෙක බඩගින්නේ සිටින පිරිසක්. එම නිසා කරුණාකරලා ඒ පිළිබඳවත් හරි විධියට සොයා බලා, හැම වෙලාවේම උද්ධච්ච විධියට හැසිරෙන්නේ නැතුව ජනතාවගේ පැත්තෙන් හිතලා වැඩ කටයුතු කරන්න කියලා අපි ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ජගත් මනුවර්ණ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.26]

**ගරු ජගත් මනුවර්ණ මහතා**
(மாண்புமிகு ஜகத் மனுவர்ண)
(The Hon. Jagath Manuwarna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා මීට සුළු මොහොතකට කලින් කරපු කථාවේදී කිව්වා, රට පුරා ඖෂධ හිඟයක් තිබෙනවා, ඒ තුළින් රෝගීන් දැඩි ලෙස පීඩාවට පත් වනවා කියලා. ඖෂධ හිඟයන් තිබුණු කාල වකවානු අපි දැක්කා. ඒකත් එක්ක නිලධාරින්ගේ සම්බන්ධයක් තිබෙනවා, අපි ඒ නිලධාරින් ආරක්ෂා කරනවා වාගේ බොරු බිල්ලෙක් මවන්න උත්සාහ කරනවාත් අපි දැක්කා. හැබැයි, අපි මේ රටේ පාලනය අතට ගන්න කලින්, ජාතික ජන බලවේගය මේ රටේ ආණ්ඩු බලයට පත් වෙන්න කලින් නම් එවැනි තත්ත්වයක් තිබුණා. නමුත් අපි විශ්වාසයෙන් යුතුව කියනවා, මේ වනකොට එහෙම දේවල් සිදු වන්නේ නැහැ කියලා. මේ වෙලාවේ අපි පුළුවන් තරම් උත්සාහ කරනවා, රාජ්‍ය නිලධාරින් තුළ තිබුණු එවැනි අකාර්යක්ෂමතා දුරු කර කාර්යක්ෂම සේවාවක් තුළින් තවදුරටත් මේ රටේ සමස්ත ජනතාවට සහන සපයන්න සහ ඔවුන්ගේ අවශ්‍යතා ඉෂ්ට කරන්න. කොහේ හෝ තැනක ඖෂධ හිඟයක් පවතිනවා නම්, ඒ පිළිබඳව අදාළ ආයතනවලට දැනුම් දෙන්න, එතකොට අදාළ නිලධාරින් ඒ සම්බන්ධයෙන් සොයා බලා කටයුතු කරාවි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සලේ වෙනුවෙන් පිටකොටුවේ සත්‍යග්‍රහයට වාඩි වුණු අය මීට ටික වෙලාවකට කලින් නැඟිටලා කියනවා, සත්‍යග්‍රහයට තිතක් නොවෙයි, කොමාවක් තැබුවා කියලා. කොමාවක් නොවෙයි, ඉරකි තිතකි, අහෝ ඛේදයකි! ඉරකි, තිතකි කියලා තමයි කියන්න වෙන්නේ. මොකද, අඛණ්ඩ සත්‍යග්‍රහයකට කියලා තමයි වාඩි වුණේ. වාඩි වුණාට තේරුමක් වුණේ නැහැ, මිනිස්සුන්ගෙන් ගුටි කන්න ඔන්න මෙන්න හිටියේ. මම දැක්කා, කවුද කෙනෙක් ඊයේත් ගහන්න ආවා, පෙරේදාත් ගහන්න ආවා, ඊට කලින් දවසේත් ගහන්න ආවා. කොහොම හරි තව දවස් දෙකක්, තුනක් එතැන වාඩි වෙලා හිටියා නම් පිටකොටුව 2022 ජූලි 9වෙනි දා තිබුණු තත්ත්වයට එහා තත්ත්වයකට පත් වනවා. දුවනකල් ගුටිකන්න වෙනවා.

මේ සභාව ගත්තොත්, මම හිටගෙන ඉන්න තැනින් වම් පැත්තේ ඉන්නවා, පාස්කු බෝම්බ ප්‍රහාරය ගැන කථා කරන පිරිසක්. මගේ දකුණු පැත්තේ ඉන්නවා, ඒ ගැන වචනයක්වත් කථා නොකරන පිරිසක්. මේ දෙකම අපට ගැටලුවක්. *[බාධා කිරීමක්]* මම දන්නවා, ඔබතුමන්ලා කථා කරන්නේත් නැහැ. අපට මේ දෙකම ගැටලුවක්. එක් පිරිසක් කථා නොකරන්නේ ඇයි? තව පිරිසක් මෙච්චර කෑ ගහන්නේ ඇයි? මේ කෑ ගැහිල්ල, මේ අදෝනාව මේ අය කරන්නේ ඇයි? අර කෙදිරිය පසුගිය දවස්වල අදෝනාවක් බවට පත් වුණානේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ කෙදිරිය අදෝනාවක් බවට පත් වුණේ කොහොමද? පසුගිය කාලයේ බුද්ධි අංශයේ හිටපු ලොක්කා වන තුවාන් සුරේෂ් සලේ දවස් 100කට ආසන්න කාලයක් රැඳවුම් භාරයේ සිටියා. නමුත් ඒ සම්බන්ධයෙන් කිසිදු හාහුවක් නැතුව - සද්ද නැතුව - බලාගෙන හිටියා, දැන් වෙන්න යන්නේ මොකක්ද කියලා. පාස්කු බෝම්බ ප්‍රහාරය සම්බන්ධයෙන් මීට කලින් කරපු පරීක්ෂණවලට වුණා වාගේම දෙයක් මේකටත් වෙයි, ඒ හින්දා භය වෙන්න දෙයක් නැහැ කියලා හිතාගෙන සිටියා. නමුත්, ගෝඨාභය රාජපක්ෂට විදෙස් ගමන් තහනමක් පැනෙව්වාට පස්සේ වැඩේ වරදින්න යන්නේ කියලා තේරුණා. ඔන්න එතකොට අර කෙදිරිය අදෝනාවක් බවට පත් වුණා. දවස් 100කට ආසන්න කාලයක් තුවාන් සුරේෂ් සලේ කෑවේ මොනවාද, ඔහුට මොනවාද වුණේ කියලා කිසිම හාහුවක් නැතුව හිටපු මිනිස්සු කෑකෝ ගහන්න පටන් ගත්තා. ඒගොල්ලන් ගිහිල්ලා පිටකොටුවේ වාඩිවෙලා හිටපු තක්කඩි සෙට් එකත් එක්ක එකට වාඩි වුණා. වාඩි වෙලා දවස් දෙකයි, තුනයි ගියේ, මිනිස්සු එළියට බැහැලා ඔවුන්ට ගහන්න ලැහැස්ති වුණා. තව දවසක්, දෙකක් හිටියා නම් වෙන සෙල්ලම බලාගන්න තිබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මම දැක්කා, ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමා පොඩි සිග්නල් එකක් දෙනවා. මේ අය පාස්කු බෝම්බ ප්‍රහාරය ගැන වචනයක් කථා කරන්නේ නැහැ. මේ මන්ත්‍රීවරුන් ගැන අපි ලජ්ජා වෙන්න ඕනෑ. මුස්ලිම් ජනතාව ඒ තරම් පීඩාවට පත් වුණු ලංකා ඉතිහාසයේ තවත් සිදුවීමක් නැහැ. පාස්කු බෝම්බ ප්‍රහාරය නිසා ලංකාවේ සමස්ත මුස්ලිම් ජනතාව විශාල පීඩනයකට මුහුණ දුන්නා. විශාල මානසික පීඩනයක් එක්ක තමයි ඔවුන්ට ජීවත් වෙන්න සිද්ධ වුණේ. මොකද, හිතාමතා සැලසුම් කරලා මේ රටේ සිංහල සහ මුස්ලිම් ජනතාව අතර වෛරයක් ඇති කරපු මේ සිදුවීම දේශපාලන වුවමනාවක් වෙනුවෙන් සිද්ධ කරපු දෙයක් බව අපි කරන පරීක්ෂණත් එක්ක, අපි කරන විමර්ශනත් එක්ක දැන් ඉතා හොඳින් පැහැදිලි වෙමින් යනවා. නමුත්, මේ වනකොට විපක්ෂයේ සිටින මුස්ලිම් මන්ත්‍රීවරුන් මේ සම්බන්ධයෙන් වචනයක් කථා කරන්නේ නැහැ. ලජ්ජයි.

මීට ටික වෙලාවකට කලින් රවුෆ් හකීම් මන්ත්‍රීතුමා කියනවා මම දැක්කා, "Channel 4" එකේ පළ වුණු ප්‍රභාකරන්ගේ පුතෙක් ගැන කථාවක්. කොහොමද, මේ වෙලාවේ ඒ කථාව මෙතැනට අදාළ වුණේ? ඒක ඒ කාලයේ ප්‍රභාකරන්ගේ පුතෙකුට වෙඩි තැබීමක් ගැන කථාවක්. මම කල්පනා කළා, හදිසියේ කරපු මේ කථාව මොකක්ද කියලා. මේක කිව්වේ ඇයි? "Channel 4" එකේ අසාද් මවුලානාගේ ප්‍රකාශය - speech එක - තමයි සුරේෂ් සලේ සම්බන්ධයෙන් අනෙකුත් තොරතුරු අනාවරණය කර ගන්න අද උසාවියට එක හේතුවක් බවට පත්වෙලා තිබෙන්නේ. මොකද, මේ අයට පාස්කු බෝම්බ ප්‍රහාරය සම්බන්ධයෙන් කරන විමර්ශනවලට විරුද්ධව කථා කරන්න බැහැ, සමස්ත මුස්ලිම් ජන සමාජයම බලාගෙන ඉන්නවා, මේ විමර්ශන ඉතාම හොඳින් ක්‍රියාත්මක වන ආකාරය. ඒ හින්දා ඒකට විරුද්ධව වචනයක්වත් කථා කරන්න බැහැ. කථා කළොත්, ඒ අය මුස්ලිම් ජන සමාජය තුළ අපකීර්තියට පත් වනවා. නමුත්, කොහොම හරි ඒකට වටෙන් ෂොට් එකක් දෙන්න ඕනෑය කියලා හිතුවා. අන්න, "Channel 4" එකේ ගිය video එක සොයා ගත්තා. "Channel 4" එකෙන් තමයි අසාද් මවුලානා සම්බන්ධ කාරණය එළියට ගෙනාවේ. ඒක නිසා එතැනින් ෂොට් එකක් දීලා වැඩේ පටන් ඕනෑය කියලා හිතුවා.

මොකද, හැමෝම ඉන්නේ එකම බෝට්ටුවේ. රාජපක්ෂලා වෙන්න පුළුවන්. දැන් ටිකකට කලින් චානක මාදුගොඩ මන්ත්‍රීතුමා කථා කළා. මේ, තරුණ මන්ත්‍රීවරු. ලජ්ජයි. තවමත් කොන්දක් නැහැ, තමන්ගේ නායකයන් කරපු දේවල් සම්බන්ධයෙන් හරියට විවේචනාත්මකව කථා කරන්න, ඒවා වැරදි නම් වැරදියි කියන්න. අදත් ඇවිල්ලා රාජපක්ෂලා වෙනුවෙන් මෙතැන නැඟිටලා කෑ ගැහුවා. විළිලජ්ජයි! මෙතැන ඉන්නවා, තවත් තරුණ මන්ත්‍රීවරු. පසුගිය දවස්වල අපි දැක්කා, සමස්ත විපක්ෂය එකතු වෙලා තිබෙනවා, මේ තිබෙන තත්ත්වයන්ට එරෙහිව නැඟී සිටින්න. ජාතිවාදියෝයි, මේ රට බංකොලොත් කරපු අයයි, හොරුයි, තක්කඩියි ඔක්කොම ටික - සියලු පක්ෂ - එකතු වෙලා එතැනට ගිහින් වාඩි වෙලා සාකච්ඡා කරනවා, මේ ආණ්ඩුවට ෂොට් එක දෙන්නේ කොහොමද කියලා. තරුණ මන්ත්‍රීවරු ඉන්නවා. මම ඒ අයට කියන්නේ ශිෂ්ට සම්පන්නව තමන්ගේ දේශපාලනය කරන්න, අර දේශපාලන හිඟන්නන්ගේ තැනට වැටෙන්න යන්න එපා කියන එකයි. අලුතින් මේ පාර්ලිමේන්තුවට පත් වෙලා ආපු අය තමන්ගේ නායකයාගෙන් ප්‍රශ්න කරන්න, "මොකක්ද ඔය කරන්නේ ලොක්කා?" කියලා. "ගිහිල්ලා අර ජාතිවාදියොත් එක්ක ඉන්න

ලජ්ජා නැද්ද?" කියලා අහන්න. විපක්ෂ නායකතුමා උදය ගම්මන්පිලගේ පොත භාර ගන්න එම උත්සවයට ගිහිල්ලා වාඩි වෙලා හිටියා. මොන ලජ්ජාවක්ද? අද පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් වචනයක්වත් කථා කරන්නේ නැහැ. මහ බැංකු වංචාව සම්බන්ධයෙන් අපි නැවත වතාවක් විමර්ශන කටයුතු ආරම්භ කරනවා. නමුත්, ඒ ගැන වචනයක්වත් කථා කරන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වනකොට මේ රටේ ජනතාව දීපු ජන වරමට යුක්තිය සහ සාධාරණය ඉෂ්ට වෙමින් පවතිනවා කියායි මම කියන්නේ. නමුත් මේක දිහා බලාගෙන ඉන්න බැරිව, මේවා සම්බන්ධයෙන් වචනයක් කථා කර ගන්න බැරිව මේ අය කසාය බීපු ගොළුවෝ වාගේ ඉන්නවා. "මීක්" කියන්නේ නැහැ, පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් හරි මහ බැංකු බැඳුම්කර වංචාව සම්බන්ධයෙන් හරි. ආර්ථිකය කඩාගෙන වැටෙනවා, බඩු මිල වැඩියි, තෙල් මිල වැඩියි වාගේ වෙන වෙන ඒවා ගැන කථා කරනවා. මේ රටේ ජනතාවට තේරෙන ටික මෙතැන වාඩි වෙලා ඉන්න අයට තේරෙන්නේ නැහැ. මුළු රටම ගිනි ජාලාවක්. ලෝකයේ තෙල් වෙළෙඳාමේ නිරත වෙලා ඉන්න රටවල් විශාල ප්‍රමාණයක් යුද්ධයක පැටලිලා ඉන්නවා. තෙල් ළිංවලට ගහනවා. හෝමුස් සමුද්‍ර සන්ධිය වහලා. ඒ නිසා ඉන්ධන ගෙනෙන්න බැහැ. මේ ප්‍රශ්න තිබියදී මේ රටේ මේ වාගේ තත්ත්වයක් ඇති වෙනවා තමයි. ඒකට මොකක්ද කරන්නේ? තෙල් මිල වැඩි වෙනවා. මේවා අපේ පාලනයෙන් තොරව සිද්ධ වෙන දේවල්. නමුත්, පවතින මේ අර්බුද හමුවේ මේ රට මේ ගාණටවත් පවත්වාගෙන යන්න පුළුවන්කම ලැබිලා තිබෙන්නේ අපි බලයේ ඉන්න හින්දායි. නැත්නම් මේ රටේ මිනිසුන්ට බඩගින්නේ මැරෙන්නයි වෙන්නේ.

අද මෙතැන කියනවා, මිනිසුන් බඩගින්නේ ඉන්නවා, බඩු මිල වැඩියි, යන්න එන්න විධියක් නැහැ කියලා. ඔය බයිලා කියන්න පුළුවන් වෙන කාට හරි. මොකද, 2022 වසර පහු කරලා ආපු මිනිස්සු මේ රටේ ඉන්නේ. 2022 ජූලි 09 කියලා දිනයක් මතක නැති මිනිස්සු, මේ. හිටපු මිනිසුන්ට ගහලා එළෙව්වේ. එහෙම ගහලා එළෙව්වේ නිකම් නොවෙයි, මිනිස්සු බඩගින්නේ තෙල් පෝලිම්වල, බෙහෙත් පෝලිම්වල මැරෙන්න යවපු නිසායි. නමුත්, අද මෙතැනට ඇවිල්ලා කියනවා, මිනිස්සු බඩගින්නේ ඉන්නවා කියලා. මිනිසුන්ට ප්‍රශ්නයක් නැහැ, ආණ්ඩුව ගැන; මිනිසුන්ට ආණ්ඩුව ගැන ප්‍රශ්නයක් නැහැ. නමුත් විපක්ෂය බලාගෙන ඉන්නවා, කොයි මොහොතක හරි මේ ආණ්ඩුවේ කකුලෙන් ඇදලා වට්ටන්න. හැබැයි, ඒකට මේ රටේ මිනිස්සු ඉඩ දෙන්නෙත් නැහැ කියන එක අපි පසුගිය දවස්වල දැක්කා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

පසුගිය දවස්වල පිටකොටුවේ පටන් ගත්ත සත්‍යාග්‍රහය ඉදිරියට තනි තනිව කොල්ලෝ කෙල්ලෝ ඇවිල්ලා ගහන්න පැන්නා, ඒ මිනිසුන්ට. ඒ, නිකම් නොවෙයි. ඒ ඉතිහාසය ඒ අයට මතක තිබෙන නිසා; ඒ ඉතිහාසයේ වේදනාව මතක තිබෙන නිසා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි දන්නවා, 2022 වසරේ මේ රටට මොකක්ද වුණේ කියලා. මේ රටේ මිනිසුන්ට මේ විපක්ෂයේ ඉන්න මිනිස්සු මොකක්ද කළේ කියන්න අපි දන්නවා. ඒ විතරක් නොවෙයි, අපටත් වඩා හොඳට මේ රටේ මිනිසුන්ට මතක තිබෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ විපක්ෂයේ වාඩි වෙලා අද ජනතාව වෙනුවෙන් කිඹුල් කඳුළු හලන මේ අය මොකක්ද කළේ කියන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝකයේ අර්බුදයක් තිබෙන අවස්ථාවක වුණත්, මේ සමස්ත රට බරපතළ ස්වාභාවික ව්‍යසනයකට මුහුණ දීලා පසු කම්පනයකින් යුතුව ජීවත් වන අවස්ථාවක වුණත් අපි මේ රටේ ජනතාවගේ සුබසිද්ධිය වෙනුවෙන් කළ හැකි සියලු දේවල් කරමින් ඉන්නවා කියන එක විශ්වාසයෙන් යුතුව මම කියනවා. පසුගිය දවස්වල "දිට්වා" සුළි කුණාටුව නිසා හානියට පත් වුණු ජනතාවට සලසපු සහන ගත්තොත්, මීට කලින් පැවැති ආණ්ඩුවක් තිබුණා නම් ඒවා හීන විතරයි. ආපදා තත්ත්වය හේතුවෙන් ගෙයක් සම්පූර්ණයෙන් හානි වුණා නම් රුපියල් ලක්ෂ 50ක වන්දියක් අපි ඒ අය වෙනුවෙන් ගෙවා තිබෙනවා. ඉතිහාසයේ කවදාද එහෙම මුදලක් ගෙව්වේ? ඉතිහාසයේ කවදාද එහෙම මුදලක් ගෙව්වේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? පාසල් දරුවන්ට, නිවාස අහිමි වූවන්ට, පූර්ණ ලෙස හානි වූ නිවාසවලට විතරක් නොවෙයි, අධි අවදානම් කලාපවල ජීවත් වන අයටත් අපි සහන ලබා දුන්නා. කොළොන්නාව පැත්තේ ගෙවල් 10,000කට විතර වන්දි දීලා නැහැ කියලා මේ සභාවේදී මන්ත්‍රීවරයෙක් කියනවා මම අහගෙන හිටියා. බොරු. මේ සභාවේ අපේ සහෝදර මන්ත්‍රීවරු ඉන්නවා. ඒ අය මේ ගැන පැහැදිලි කරයි. ඒ සියලු දෙනාට වන්දි ගෙවන්න කියලා අපි රජයේ නිලධාරින්ට උපදෙස් දීලා තිබෙනවා. කොතැනක හෝ වැරැද්දක් සිදු වෙලා තිබෙනවා නම් ඒ සම්බන්ධයෙන් අපට පැමිණිලි කරන්න, අපි ඒ සම්බන්ධයෙන් හොයා බලන්න ලැහැස්තියි. විශේෂයෙන්ම ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවල සභාපතිවරු විධියට මේ සභාවේ ඉන්න ගොඩක් මන්ත්‍රීවරු වැඩ කරනවා. කිසිදු දේශපාලන පක්ෂ භේදයකින් තොරව, තමන්ගේ සමාජ තත්ත්වය කුමක්ද කියන එක සම්බන්ධයෙන් නොසලකා හරිමින් ආපදාවට පත් ඒ හැම කෙනෙක් ගැනම අපි කටයුතු කරනවා. යම් කෙනෙක් ඒ ආපදාව නිසා අගතියට පත් වෙලා ඉන්නවා නම් ඔහුට පාට, පක්ෂ භේදයකින් තොරව අදාළ වන්දිය ලැබෙන්න සලස්වන්න. ඔහුගේ ජන ජීවිතය තිබුණු තැනින් අඩියක් හරි ඉහළට ඔසවා තබන්න අදාළ කටයුතු කරන්න කියලා අද වනකොට අපි නිලධාරින්ට උපදෙස් දෙමින් ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දහසක් බලාපොරොත්තු සහිතවයි මිනිස්සු ජාතික ජන බලවේගය ආණ්ඩුව බලයට ගෙනාවේ. ඒ බලාපොරොත්තු ඉෂ්ට කරන එක අපේ වගකීමක්. පාස්කු ඉරුදින ප්‍රහාරය සම්බන්ධයෙන් වෙන්න පුළුවන්, මහ බැංකු බැඳුම්කර වංචාව සම්බන්ධයෙන් සිදු කරන විමර්ශන වෙන්න පුළුවන්, අනෙකුත් සියලු දේවල් වෙන්න පුළුවන්; මේ සියල්ල ඉතාම හොඳින් ඉදිරියට යනවා. ඒ නිසා මේවා සම්බන්ධයෙන් මෙම ආණ්ඩුවේ ක්‍රියාවලිය දිහා විශ්වාසයෙන් යුතුව බලාගෙන ඉන්න කියන ආරාධනය මේ රටේ ජනතාවට කරමින්, මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ point of Order එක මොකක්ද, ගරු මන්ත්‍රීතුමා?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මම ඔබතුමාගේ අවධානයට යොමු කරනවා, ස්ථාවර නියෝග 82(2)(b). මගේ සහෝදරයා කිව්වා, "මොන රෙද්ද ද" කියලා. "මොන රෙද්ද ද" කියලා පාර්ලිමේන්තුවේ පාවිච්චි කරන්න පුළුවන්ද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? නැත්නම් ඒක හැන්සාඩ් වාර්තාවෙන් අයින් කරමු. මගේ සහෝදරයා කථා කළේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තුවට ගැළපෙන්නේ නැත්නම් අපි ඒ නුසුදුසු වචන අනිවාර්යයෙන්ම හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරනවා. එම නිසා ඔබතුමා ඒ ගැන මෙතැන ප්‍රශ්න කරන්න අවශ්‍ය වන්නේ නැහැ.

**ගරු ජගත් මනුවර්ණ මහතා**
(மாண்புமிகு ஜகத் மனுவர்ண)
(The Hon. Jagath Manuwarna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මේක විවාදයක් කර ගන්න එපා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ජගත් මනුවර්ණ මහතා**
(மாண்புமிகு ஜகத் மனுவர்ண)
(The Hon. Jagath Manuwarna)

මට ඒ ගැන උත්තර දෙන්න ඉඩ දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

හොඳයි, ඔබතුමාට කියන්න තිබෙන දේ කියන්න.

**ගරු ජගත් මනුවර්ණ මහතා**
(மாண்புமிகு ஜகத் மனுவர்ண)
(The Hon. Jagath Manuwarna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේකෙන් අදහස් වෙන්න පුළුවන් මම නුසුදුසු වචනයක් පාවිච්චි කළා කියලා. මගේ කථාව ඇතුළේ කිසිදු නුසුදුසු වචනයක් පාවිච්චි වුණේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ පාර්ලිමේන්තුවේ මීට වඩා අශිෂ්ට විධියට කථා කරන මන්ත්‍රීවරයෙක් තමයි මේ චෝදනාව කරන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඒ ගැන අපි සුදුසු පරිදි කටයුතු කරනවා කියන කාරණය මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.37]

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)

මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

දැන් මේ පාස්කු ඉරුදින ප්‍රහාරය පිළිබඳව අපි කථා කරන්නේ නැහැ කිව්වා නේ. මේ පාස්කු ඉරුදින ප්‍රහාරය නිකම් අකුණු ගහනකොට එළියට දමන යකඩ කැල්ලක් විධියට පාවිච්චි කරන අවස්ථාත් අපි දැක තිබෙනවා. එදා ගෝඨාභය රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයා ජනාධිපති අපේක්ෂක වශයෙන් මේක ප්‍රයෝජනයට ගත්තා; ජාතික ආරක්ෂාව පිළිබඳව මතයක් ගොඩනගන්න හැදුවා. ඒ විතරක් නොවෙයි, පසුගිය ජනාධිපතිවරණයේදී අනුර කුමාර දිසානායක මැතිතුමාගේ campaign එකේ එක කොටසක් වුණා, පාස්කු ඉරුදින ප්‍රහාරයේ වැරදිකරුවන් හොයනවා කියන එක. බලාගෙන යනකොට මේ දෙගොල්ලන්ම කරලා තිබෙන්නේ පාස්කු ඉරුදින ප්‍රහාරය දේශපාලන වාසියට යොදා ගන්න එකයි. අපි ඉතා පැහැදිලිව මේ කාරණය කියනවා. සමගි ජන බලවේගයේ මතය තමයි මේ පාස්කු ඉරුදින ප්‍රහාරය දේශපාලනීකරණය කරන්න එපා කියන එක. මෙතැනදී ඊට අදාළ වැරදිකරුවන් හොයන කටයුත්ත ස්වාධීනව, නිර්පාක්ෂිකව ඉටු කරන්න. ඒ සඳහා අපි සම්පූර්ණ සහයෝගය ලබා දෙනවා. ඒ ගැන කිසිම ගැටලුවක් නැහැ. වැරදිකරුවන් කවුද කියා හොයලා ඔවුන්ට නීතිය ක්‍රියාත්මක කරන්න. ඒ ගැන කිසිම විවාදයක් නැහැ. නමුත්, මේක දේශපාලන වාසියකට, නැත්නම් දේශපාලන වශයෙන් වෙන කටයුත්තකට යොදා ගන්න එක තමයි මෙතැන තිබෙන ගැටලුව. ඒ නිසා කරුණාකර එහෙම කරන්න එපා. මෙතැනදී කිසිසේත් දේශපාලන වාසියක් ලබා ගන්න අවශ්‍යතාවක් නැහැ. අපි කාටත් ඕනෑ මෙහි වැරදිකරුවන්ට දඬුවම් ලබා දීමයි. එතැනදී ඊබ්‍රාහිම් නානා මුදල් දුන්නා නම් ඒවා අමතක කරලා මේ ගැන කටයුතු කරන්නත් බැහැ. එතකොට ඊබ්‍රාහිම් නානා පිළිබඳවත් එක හා සමානව නීතිය ක්‍රියාත්මක කරන්න ඕනෑ. මෙතැනදී දේශපාලනීකරණයක් නැතුව ඒ කටයුත්ත සිදු විය යුතුයි කියන මතය තමයි සමගි ජන බලවේගය හැටියට අපට තිබෙන්නේ.

ඒ වාගේම සමහර අය කියනවා, රාජපක්ෂවරු මෙහෙම මෙහෙම හොරකම් කළා, රාජපක්ෂවරු බලය ගන්න මේ වාගේ දේවල් කළා කියලා. රාජපක්ෂවරුන්ට බලය ලබා ගන්න ඔවුන් වෙනුවෙන් පෙනී හිටියේ මේ සමගි ජන බලවේගයේ අපිද? නැහැ. සමගි ජන බලවේගයේ අය කවදාවත් රාජපක්ෂ කඳවුරේ වේදිකාවලට නැග්ගේ නැහැ; ඒ අය වෙනුවෙන් කථා කළේ නැහැ. මෙතැන ඉන්න ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධානීන් තමයි රාජපක්ෂවරු මේ රටේ ජනාධිපති කරන්න මූලිකත්වය ගෙන කටයුතු කළේ. රාජපක්ෂවරුන් වෙනුවෙන් සම්පූර්ණ මැතිවරණ කටයුතුවලට නායකත්වය ගත්තේ වෙන කවුරුවත් නොවෙයි, තමුන්නාන්සේලා. තමුන්නාන්සේලා විසින් රාජපක්ෂවරු මේ රටේ ජනාධිපති කරලා, මේ රටේ නායකයෝ කරලා අන්තිමට කියනවා, රාජපක්ෂවරු කරපු වැරදිවලට වෙන කවුරුවත් වග කියන්න ඕනෑ කියලා. ඒකට වෙන කවුරුවත් වග කියන්න ඕනෑ නැහැ. රාජපක්ෂවරු මේ රටට වැරදි කළා නම් එහි සම්පූර්ණ වගකීම භාර ගන්න ඕනෑ, ජනතා විමුක්ති පෙරමුණ. ජනතා විමුක්ති පෙරමුණේ අය වෙන අයට ඇඟිල්ල දිගු කරලා හරියන්නේ නැහැ. ඒ නිසා ඔබ කරුණාකර ඔබේ ඉතිහාසය අමතක කරන්න එපා. පැහැදිලිවම මේ රටේ රාජපක්ෂවරුන් බලයට ගෙන ඒමේ සම්පූර්ණ වගකීම ජනතා විමුක්ති පෙරමුණට භාරයි.

දැන් අපිට කියනවා, මේ "Rebuilding Sri Lanka" කියන fund එක ගැන වැඩිය කථා කරන්න එපාලු. අපි රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදී තර්ජනය කරලා නිලධාරින්ගෙන් ප්‍රශ්න ඇහුවාය කියනවා. නැහැ, "Rebuilding Sri Lanka" කියන fund එක නීත්‍යනුකූල කරන්න කියන එකයි අපි කියන්නේ. ඒකට කවුරුවත් බාධා කරන්නේ නැහැ. අද එක ගැටලුවක් තිබෙනවා. ඒ තමයි, "Rebuilding Sri Lanka" කියන fund එක නීත්‍යනුකූල නැති එක. එහෙම fund එකක් නැහැ කියලා කියනවා. එහෙම කියන්නේ මුදල් අමාත්‍යාංශයේ නිලධාරින්. අපි නොවෙයි.

ඒ විතරක් නොවෙයි. ඊටත් වඩා බරපතළ දෙයක් තිබෙනවා. ඒ තමයි, "දිට්වා" ව්‍යසනය වෙනුවෙන් මුදල් ආධාර අරගෙන සත පහක්වත් වියදම් කරලා නැහැ. මෙතැන මහ ලොකුවට පම්පෝරි

ගහනවා, "දිට්වා" ආපදාවේදී මෙච්චර දුන්නා, ටකරමක් ගියාමත් අච්චර දුන්නා කියලා. මේ මුදල්වලින් තවම සත පහක්වත් අරගෙන නැහැ. ඒ ව්‍යසනයට ගොදුරු වෙච්ච මිනිස්සු තවම කඳවුරුවල. මොනවාද මේ කියන විහිලු කථා? ඒ ප්‍රශ්නය විසඳන්න පෞද්ගලික අංශය උදව් කළා; අහිංසක ජනතාව උදව් කළා; සමහර දරුවෝ කැට කඩලායි මුදල් අරගෙන දුන්නේ. ඒ මුදල් ටික පාවිච්චි කරන්නේ නැත්තේ ඇයි? නීත්‍යනුකූලව මේ කටයුත්ත කරන්නේ නැත්තේ ඇයි? ඒ කටයුතු තවම කරලා නැහැ.

ඒ විතරක් නොවෙයි. තවමත් මේ රටේ ආර්ථික තත්ත්වය ගැන පම්පෝරි ගහනවා. අද වන විට මේ රටේ ජනතාවට ජීවත් වෙන්න බැහැ. අද ජීවන වියදම ඉහළ ගිහිල්ලා තිබෙන්නේ. මේගොල්ලන් කියනවා, මැදපෙරදිග සිදුවීම් නිසා තමයි මේ දේවල් සිදු වුණේ කියලා. මැදපෙරදිග සිදුවීමට කලින් තමයි මේ රටේ ආර්ථිකය කඩා වැටෙන්න පටන් ගත්තේ. තමුන්නාන්සේලා දැන් අවුරුදු දෙකක් තිස්සේ ආණ්ඩුව කරනවා. රුපියල් 290ට තිබුණු ඩොලර් එක දැන් රුපියල් 340ක් වෙලා තිබෙනවා. එතකොට මේක ඊයේ පෙරේදා වෙච්ච දෙයක් ද? නැහැ. මේක ක්‍රමානුකූලව ඇති වෙලා තිබෙන තත්ත්වයක්. අද මේ රටේ ආර්ථිකය ශක්තිමත් වීමේ fundamentals දිනෙන් දින, දිනෙන් දින ප්‍රපාතයට යනවා. අපනයනය කඩා වැටීගෙන යනවා. සංචාරකයන් එන ප්‍රමාණය අඩු වේගෙන යනවා. එතකොට මේක මැදපෙරදිග සිදුවීමෙන් විතරක් වෙච්ච දෙයක් නොවෙයි. මැදපෙරදිග සිදුවීමෙන් මේ ප්‍රශ්නය වැඩි වෙලා තිබෙනවා. ඒක ගැන විවාදයක් නැහැ. නමුත්, අද මේ රටේ ආර්ථිකය කළමනාකරණය කරන්න බැරි වෙලා තිබෙනවා. තමුන්නාන්සේලා බොරුවට කියනවා, මෙන්න මෙහෙම පෝලිම් තිබුණා කියලා. තමුන්නාන්සේලා ආණ්ඩුව බාර ගන්නකොට පෝලිම් යුගයක් තිබුණේ නැහැ. එතකොට යම් ස්ථාවරත්වයක් තිබුණා. ඒ ස්ථාවරත්වය දැන් කඩා වැටිලා තිබෙනවා. එක පැත්තකින් අපනයන අඩුවෙලා තිබෙනවා. ආනයන වියදම් වැඩිවෙලා තිබෙනවා. සංචාරකයන්ගේ පැමිණීම අඩු වෙලා තිබෙනවා. එතකොට මේ රටට ඩොලර් එන ප්‍රමාණය අඩු වෙනවා. ආනයන සඳහා අපේ රටින් වියදම් වන ඩොලර් ප්‍රමාණය වැඩියි.

ඒ විතරක් නොවෙයි, අද මැදපෙරදිග තත්ත්වයත් එක්ක අපේ රට තවත් බරපතළ තත්ත්වයකට යන්න පුළුවන්. විදෙස්ගත ශ්‍රමිකයින් අපට එවන ප්‍රේෂණ අවම තත්ත්වයකට පත් වුණොත් අපේ රට තවත් අර්බුදකාරී තත්ත්වයකට පත් වෙනවා. අද වන විට මේ රටේ ජනතාවට ජීවත් වෙන්න බැහැ. එක පැත්තකින් විදුලි බිල වැඩි වෙලා. තවත් පැත්තකින් ඉන්ධන මිල වැඩි වෙලා. ජීවන වියදම වැඩි වෙලා. මිනිස්සුන්ට ඒ වියදමට සමාන ආදායමක් නැහැ. ඒ නිසා තමුන්නාන්සේලා කරුණාකරලා මේ රට නිසි තැනකට ගෙනියන්න අවශ්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න. හැබැයි, මේ රටේ ජනතාව මීට වඩා වැඩි කාලයක් නම් ඉවසීමෙන් ඉන්න එකක් නැහැ. මේ තත්ත්වය පාලනය කළේ නැත්නම් තමුන්නාන්සේලාටත් වෙන්නේ පසුගිය ආණ්ඩුවට වෙච්ච දේම තමයි.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.45]

**ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)
கௌரவ தலைமைதாங்கும் அவர்களே, இந்த விவாதத்திலே நான் இரண்டு முக்கியமான விடயங்கள் தொடர்பில் சபையின் கவனத்தை ஈர்க்க விரும்புகின்றேன். ஒன்று, இனங்களுக்கிடையே காணப்படுகின்ற நல்லிணக்கம் - நல்லுறவு - பற்றியது. மற்றையது, இலங்கை நாட்டினுடைய பொருளாதாரம் பற்றியது. இலங்கை நாட்டினுடைய பொருளாதாரம் தொடர்பாகப் பேசுகின்றபோது, எனக்கு முன்னர் பேசிய உறுப்பினர் அவர்கள் "Rebuilding Sri Lanka" fundக்கு வழங்கப்பட்ட நிதி தவறாகப் பிரயோகிக்கப்பட்டதாக அல்லது காணாமற்போனதாக இங்கே சொன்னார். இது இலங்கையிலே வாழுகின்ற மக்களைப் பிழையான வழியில் திசை திருப்புகின்ற ஒரு நடவடிக்கையாகும். இந்த நிதியத்துக்கு, வெளிநாடுகளிலே வாழுகின்ற புலம்பெயர் மக்கள் தொடர்ச்சியாகப் பணத்தை வழங்கிப் பங்களிப்புச் செய்து வருகின்றார்கள். அவர்கள் இந்த நாட்டுக்குப் பணத்தை அனுப்பாமற் செய்வதற்காகவும் இங்குள்ள மக்களைத் திசை திருப்புவதற்காகவும் செய்யப்படுகின்ற ஒரு சதி நடவடிக்கையே இதுவென நான் சந்தேகப்படுகின்றேன்.

அண்மையில் வடக்கு மாகாணத்தின் கிளிநொச்சி மாவட்டத்தைச் சேர்ந்த rap பாடகன் சங்கீத்சன் என்பவர் கைது செய்யப்பட்டார். இது தொடர்பாகத் தமிழ் மக்கள் மத்தியிலும் தென்னிலங்கையிலும் பல்வேறு வாதப்பிரதிவாதங்கள் ஏற்பட்டன. எனவே, இது தொடர்பாக என்னுடைய கருத்துகளையும் நான் இங்கே முன்வைக்க விரும்புகின்றேன். எங்களுடைய மாண்புமிகு ஜனாதிபதி அவர்கள் மிகவும் தெளிவாகச் சொல்லியிருக்கின்றார், “இலங்கை நாட்டிலே மீண்டும் ஒரு யுத்த சூழலோ, விடுதலைப் புலிகள் அமைப்போ அல்லது அதுபோன்ற வேறு எந்த அமைப்புகளோ உருவாவதற்கு வாய்ப்பே இல்லை” என்று. அப்படியான சூழலில், சில பாடல்களை அல்லது கலை வெளிப்பாடுகளை மட்டுமே அடிப்படையாகக்கொண்டு, அவை ஆயுதக் கலாசாரத்தை மீண்டும் உருவாக்கும் என்று வாதிடுவது யதார்த்ததுக்குப் புறம்பான ஓர் அணுகுமுறை என்பதை நான் இங்கே சொல்ல விரும்புகின்றேன்.

ஏனென்றால், நான் நீண்டகாலமாக - 45 வருடங்களுக்கும் மேலாக - யாழ்ப்பாணத்திலும் வன்னியிலும் யுத்தம் நடைபெற்ற காலத்திலே வாழ்ந்தவன். எனக்கு 4 - 5 வயதாக இருந்த காலப்பகுதியிலிருந்து அப்படியான சூழலில்தான் நாங்கள் வளர்ந்தோம். வடக்கு, கிழக்கில் மட்டுமல்லாது, இலங்கை பூராவும் அப்படியான சூழல் நிலவிய காலத்தில்தான் நாங்கள் அங்கு இருந்திருக்கிறோம். அப்படி இருக்கின்றபோது, அந்தச் சிந்தனை மக்கள் மத்தியிலிருந்து மெல்ல மெல்ல நீங்குவதற்கான வேலைத்திட்டங்களை நாங்கள் முன்னெடுத்திருக்கின்றோம். அதாவது, கலை, இலக்கியங்கள், இசை என்பவை மக்களின் வரலாறு, நினைவுகள், உணர்வுகள் மற்றும் அனுபவங்கள் போன்றவற்றை வெளிப்படுத்துகின்ற சமூகப் பிரதிபலிப்புகளாகும். அவற்றைக் குற்றம் சாட்டுவதற்குப் பதிலாக, அவை தோன்றுவதற்கான சமூக மற்றும் அரசியல் பின்புலங்களைப் புரிந்துகொள்வது மிக முக்கியமானதாகும்.

தமிழ் மக்களுக்கு, குறிப்பாக வடக்கு, கிழக்கு மக்களுக்கு தீர்க்கப்படாத பல பிரச்சினைகள் காணப்படுகின்றன. குறிப்பாக, காணிப் பிரச்சினை, காணாமல் ஆக்கப்பட்டோர் தொடர்பான பிரச்சினை, அரசியல் அதிகாரப் பகிர்வு, பொருளாதார முன்னேற்றம், கல்வி மற்றும் வேலைவாய்ப்பு போன்ற பல விடயங்களில் நியாயமான தீர்வுகள் தேவைப்படுகின்றன. இவ்வாறான அடிப்படைப் பிரச்சினைகள் முழுமையாகத் தீர்க்கப்படாதவரை, மக்களின் உணர்வுகள், நினைவுகள் மற்றும் கலைகளூடான உணர்வு வெளிப்பாடுகள் தொடர்ந்தும் வெளிப்படுவது இயல்பான

[ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා]

ஒன்றுதான். எனவே, இந்த இடத்தில் நான் குறிப்பிட விரும்புவது என்னவென்றால், தேசிய மக்கள் சக்தி அரசாங்கமாகிய நாங்கள், நாட்டில் மீண்டும் ஓர் இன வன்முறையோ அல்லது யுத்தமோ ஏற்படாத வகையில் அனைத்து இனங்களையும் ஐக்கியப்படுத்தி, ஒன்றுபடுத்தி சுமுகமானதோர் அரசியல் சூழலையும் நல்லதோர் ஆட்சியையும் வழங்கி வருகின்றவேளையில், மக்களைக் குழப்புகின்ற, குறிப்பாக வடக்கு, கிழக்கில் வாழும் தமிழ் மக்களைக் குழப்புகின்ற அல்லது அவர்களைக் கிலேசப்படுத்துகின்ற நடவடிக்கையிலே யாருமே ஈடுபடக் கூடாது என்பதைத்தான். இனங்களுக்கிடையிலான நல்லிணக்கத்தையும் பரஸ்பர புரிதலையும் வலுப்படுத்தும் நோக்கத்திற்குப் பாதகமாக அமையும் வகையில், எந்தவொரு தரப்பினரும் தேவையற்ற சர்ச்சைகள் அல்லது உணர்ச்சித் தூண்டுதல்களை ஏற்படுத்தும் நடவடிக்கைகளில் ஈடுபடாமல், மக்களின் உண்மையான பிரச்சினைகளுக்குத் தீர்வு காணும் பணிகளில் கவனம் செலுத்துவது இன்றைய காலத்தின் தேவையாகும். அதுவே நிலையான சமாதானத்துக்கும் தேசிய ஒன்றுமைக்கும் வழிவகுக்கும்.

இன்று மத்திய கிழக்கு நாட்டில் ஏற்பட்ட யுத்தம் உலக நாடுகளை எவ்வாறு பாதித்திருக்கின்றது! உலகப் பொருளாதாரம் எவ்வாறு சிதைந்து போயிருக்கின்றது! மேலும், அது நம் நாட்டின் பொருளாதாரத்தில் எத்தகைய தாக்கத்தை ஏற்படுத்தியிருக்கின்றது என்பதையும் நாங்கள் காண்கிறோம். கடந்த காலங்களில் எங்களுடைய நாட்டில் ஏற்பட்ட தொடர்ச்சியான யுத்தங்களின் நேரடித் தாக்கங்கள் எங்களுடைய மக்களின் வாழ்வாதாரத்தை மிகக் கடுமையாகவும் மோசமாகவும் பாதித்துள்ளன. ஏற்கனவே குறிப்பாக வடக்கு, கிழக்கிலே வாழக்கூடிய தமிழ் மக்களுடைய மனங்களிலே காணப்படுகின்ற காயங்களை ஆற்றவேண்டிய தேவையும் எங்களுக்கு இருக்கின்றது. எனவேதான், அனைத்து மக்களும் சமமாக வாழக்கூடிய நடவடிக்கைகள் முன்னெடுக்கப்பட வேண்டுமென்ற எனது கருத்தினை இந்த விவாதத்தின்மூலம் நான் இந்த இடத்திலே முன்வைக்கின்றேன்.

அதேபோன்று, 2022ஆம் ஆண்டில் எமது நாடு எதிர்கொண்ட பொருளாதார நெருக்கடியை இந்தச் சபையில் உள்ள எவரும் மறக்க முடியாது. எரிபொருள் நிலையங்கள் முன்பாக கிலோமீற்றர் கணக்கில் நீண்டிருந்த வரிசைகள் காணப்பட்டன. மருந்துகளுக்குப் பற்றாக்குறை ஏற்பட்டது; மின்வெட்டுகள் அன்றாட வாழ்க்கையைப் பாதித்தன; தொழில்கள் முடங்கிப் போயின; மாணவர்களின் கல்வி பாதிக்கப்பட்டது; நாட்டின் பொருளாதார அமைப்பு கடுமையான அதிர்ச்சிக்குள்ளானது. அந்த நெருக்கடியின் அடிப்படைக் காரணம் என்னவென்று கேட்கின்றேன். நாட்டுக்குத் தேவையான வெளிநாட்டு நாணயம் போதியளவு கிடைக்காத ஒரு நிலை காணப்பட்டது. ஒரு நாடு எரிபொருள், மருந்து, இயந்திரங்கள், மூலப்பொருட்கள் போன்றவற்றை இறக்குமதி செய்வதற்கு வெளிநாட்டு நாணயம் தேவைப்படுகின்றது. ஆனால், நாட்டுக்கு வரவேண்டிய வெளிநாட்டு நாணயம் பொருளாதார அமைப்புக்குள் வராதபோது, நாடு முழுவதும் பாதிப்பை எதிர்கொள்ள வேண்டிய நிலை உருவாகின்றது. அதனால்தான், இன்று ஏற்றுமதிமூலம் சம்பாதிக்கப்படும் வெளிநாட்டு நாணய வருவாய், நாட்டின் பொருளாதார அமைப்புக்குள் மீண்டும் வருவதை உறுதிப்படுத்தும் நடவடிக்கைகளை நாம் மேற்கொண்டு வருகின்றோம்.

இந்த விதிமுறையின்படி ஏற்றுமதியாளர்கள் பெற்ற வெளிநாட்டு நாணயத்தை உடனடியாக முழுமையாக ரூபாயாக மாற்ற வேண்டும் என்று நாங்கள் சொல்லவில்லை. மாறாக, அவர்களது சட்டபூர்வமான மற்றும் வணிகத் தேவைகளுக்காக அந்த வெளிநாட்டு நாணயத்தைப் பயன்படுத்துவதற்கான முழுமையான வாய்ப்பை இது அவர்களுக்கு வழங்குகின்றது. ஏற்றுமதி வணிகச் செலவுகள், வெளிநாட்டுக் கடன் திரும்பிச் செலுத்துதல், கடன் சேவைச் செலவுகள், வெளிநாட்டு ஊழியர்களின் சம்பளங்கள், வெளிநாட்டு முதலீட்டாளர்களுக்கான கொடுப்பனவுகள், வணிகப் பயணச் செலவுகள் மற்றும் சட்டப்படி அனுமதிக்கப்பட்ட பிற செலவுகள் என அனைத்தையும் அவர்கள் மேற்கொள்ள முடியும். இந்தச் செலவுகளை மேற்கொண்ட பின்னர் மீதமிருக்கும் தொகை மட்டுமே நாட்டின் வங்கி அமைப்புக்குள் வரவேண்டுமென்று கூறப்படுகின்றது. அதாவது, இந்த விதிமுறை கட்டுப்பாட்டை அல்ல, சமநிலையை உருவாக்குகின்றது.

இந்த விடயத்தைச் சாதாரண மக்களும் புரிந்துகொள்ளும் வகையில் ஓர் உதாரணத்தின்மூலம் நான் விளக்க விரும்புகின்றேன். ஒரு குடும்பத்தில் தந்தை அல்லது தாய் மாதம் 2 இலட்சம் ரூபாய் வருமானம் பெறுவதாக வைத்துக்கொண்டால், அந்த வருமானத்தின் பெரும்பகுதியை வீட்டுக்குக் கொண்டுவராமல் வேறு இடத்தில் வைத்துவிட்டால் என்ன நடக்கும்? வீட்டுச் செலவுகளைச் செய்ய முடியாது, பிள்ளைகளின் கல்விச் செலவுகளைச் செய்ய முடியாது. மின்சாரக் கட்டணம், தண்ணீர்க் கட்டணம், வங்கிக் கடன் என்பனவற்றைச் செலுத்த முடியாது. அந்தக் குடும்பம் சிரமத்தைச் சந்திக்கும். அதேபோல், ஒரு நாட்டுக்கு வெளிநாட்டு நாணய வருமானம் பொருளாதார அமைப்புக்குள் வர வேண்டும். அப்பொழுதுதான் அந்த நாட்டின் பொருளாதார இயந்திரம் சரியாக இயங்கும். எனவே, தேசிய மக்கள் சக்தியின் பொருளாதாரக் கொள்கை மிகவும் தெளிவானது. A strong economy must benefit all citizens, not a few privileged. அதாவது, வலுவான பொருளாதாரம் சிலருக்கு மட்டுமானதாயன்றி அனைத்து மக்களுக்கும் பயனளிக்க வேண்டும்.

நாங்கள் தனியார் துறைக்கு எதிரானவர்கள் அல்லர்; நாங்கள் முதலீட்டாளர்களுக்கு எதிரானவர்கள் அல்லர்; நாங்கள் தொழில்முனைவோருக்கு எதிரானவர்கள் அல்லர். ஆனால், நாட்டின் வளங்களின் பலன் சிலநேரம் ஓரிடத்தில் மட்டுமே குவிந்து, பொதுமக்கள்மீது அதன் சுமை விழும் பொருளாதார முறைமைக்கு எதிரானவர்கள். எனவேதான், இந்த விடயத்தில் இலங்கையினுடைய பொருளாதாரத்தை நீண்டு நிலைத்து நிற்கக்கூடிய அளவுக்கு வளர்க்க வேண்டிய தேவை எங்களுக்கு இருக்கின்றது. அதேபோன்றுதான் இனங்களுக்கிடையிலான சமத்துவத்தைப் பேணவேண்டிய தேவை இருக்கின்றது. அந்த வகையிலேதான் எங்களுடைய அரசாங்கம் தமிழ் மக்களுக்கோ அல்லது ஏனைய இனங்களுக்கோ எந்தவிதத்திலும் இடைஞ்சலை ஏற்படுத்தாது அனைவரையும் அரவணைத்துச் செல்லுகின்றது. வடக்கு, கிழக்கிலே வாழ்கின்ற தமிழ் மக்கள் தொடர்பில், குறிப்பாக சங்கீத்சனுடைய கைது தொடர்பில் சரியான அணுகுமுறையை நாங்கள் மேற்கொள்வோம். அந்த விடயத்தில் எங்களுடைய அரசாங்கம் ஒருபோதும் பிழைவிடாது என்று கூறி, இந்த வாய்ப்பை வழங்கிய உங்களுக்கு நன்றி தெரிவித்து, விடை பெற்றுக் கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.53]

**ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இளையதம்பி சிறிநாத்)
(The Hon. (Dr.) Elayathamby Srinath)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களுக்கு வணக்கத்தையும், இலங்கை மத்திய வங்கிச் சட்டத்தின்கீழ், ஏற்றுமதிகள்மூலம் நாட்டுக்குக் கிடைக்கின்ற டொலர் வருமானத்தை ஒழுங்குபடுத்துகின்றமை தொடர்பான இன்றைய தின விவாதத்தில் கலந்துகொள்வதையிட்டு எனது மகிழ்ச்சியையும் முதலில் தெரிவித்துக் கொள்கின்றேன். அதேநேரத்தில், இந்த நாட்டின் பொருளாதார நிலைமை, இங்கு பல விடயங்கள் ஆளுங்கட்சி, எதிர்க்கட்சியினால் விவாதிக்கப்படுகின்ற அளவுக்கு என்ன மாதிரியான நிலையில் இருக்கின்றது என்பதைப் பார்க்கவேண்டிய தேவை எங்களுக்கு இருக்கின்றது. நாட்டில் ஒரு பக்கம் பணவீக்கம் அதிகரித்துக் கொண்டிருக்கின்றது; அடுத்த பக்கம் டொலரின் விலை அதிகரித்துக் கொண்டிருக்கின்றது. நாட்டில் நாணயத்தின் சுழற்சி ஒரு நெருக்கடியான சூழலில் மாறிக்கொண்டிருக் கின்றது. மத்திய கிழக்கில் ஏற்பட்டுள்ள யுத்தம் இதற்குக் காரணமாகக் கூறப்பட்டாலும், எமது நாட்டின் பொருளாதாரத்தை நிலைநிறுத்துவற்கான திட்டங்கள் ஒழுங்குபடுத்தப்பட வேண்டும் என்பதுதான் எமது எதிர்பார்ப்பாக இருக்கின்றது. 2022இல் ஏற்பட்ட பொருளாதார நெருக்கடி போன்று மீண்டும் ஏற்பட்டுவிடக் கூடாது. உண்மையில் அந்த வரிசை யுகத்தை மக்கள் சந்திக்கின்ற ஒரு நெருக்கடியான நிலை ஏற்பட்டுவிடக் கூடாது என்ற எதிர்பார்ப்பு இருக்கின்றது.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! අද දින විවාදයේ වැඩ කටයුතු අවසන් වන තෙක් කාලය දීර්ඝ කර ගැනීමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කථාව කරගෙන යන්න.

**ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இளையதம்பி சிறிநாத்)
(The Hon. (Dr.) Elayathamby Srinath)

குறிப்பாக, வட கிழக்கில் இருக்கின்ற மக்கள் நீண்ட காலமாக இனப் பிரச்சினையிலே சிக்குண்டு மிக நொந்துபோய் இருக்கின்றார்கள். அதற்குப் பின்பு ஏற்பட்ட பொருளாதார நெருக்கடியினால் அவர்களுடைய வாழ்க்கையின் இயல்புநிலை பாதிக்கப்பட்டிருந்தது. இவ்வாறான ஒரு சூழ்நிலை மீண்டும் வந்துவிடாமல் அதற்குரிய திட்டத்தை அரசாங்கம் கொண்டுசெல்ல வேண்டும். கடந்த கால ஆட்சியை விமர்சிப்பதை விடுத்து, நீங்கள் ஒரு தீர்க்கமான திட்டத்தை முன்வைப்பதன்மூலம் இந்த நாட்டை எதிர்காலத்தில் பொருளாதார வலுவுள்ள நாடாக மாற்றமடைய வைக்க வேண்டுமென நாங்கள் எதிர்பார்க்கின்றோம்.

இன்று எமது மட்டக்களப்புப் பிரதேசம் சார்பாகப் பல விடயங்களைச் சொல்லவேண்டிய தேவை இருக்கின்றது. நெல் உற்பத்தியில் பாரிய பங்களிப்புச் செய்கின்ற மட்டக்களப்பு மாவட்டத்தில் விவசாயிகள் பாரிய நெருக்கடிகளைச் சந்தித்துக்கொண்டு இருக்கின்றார்கள். ஒரு கிலோகிராம் நெல்லுக்கான உற்பத்திச் செலவாக 125 ரூபாயை அவர்கள் எதிர்கொள்ளவேண்டி இருக்கின்றது. அதன் அடிப்படையில், 66 கிலோகிராம் எடையுள்ள ஒரு மூடை நெல்லுக்கான உற்பத்திச் செலவாக 8,000 ரூபாய்க்கும் மேற்பட்ட தொகையை அவர்கள் எதிர்கொள்ளவேண்டி இருப்பதால், பாரிய நட்டத்தைச் சந்திக்கவேண்டிய சூழ்நிலை இருக்கின்றது. மட்டக்களப்புப் பிரதேசமானது, அடுத்த அடுத்த மாதங்களில் இடைப்போக அறுவடை மற்றும் பெரும்போக அறுவடையைச் சந்திக்க இருக்கின்றது. எனவே, நெல்லுக்கான உத்தரவாத விலையை அரசு மிக விரைவாக நிர்ணயம் செய்ய வேண்டும். இல்லாவிட்டால், விவசாயிகள் பாரிய நெருக்கடியையும் நட்டத்தையும் சந்திக்கவேண்டிய ஒரு நிலை ஏற்படும். நாட்டில் உற்பத்தியைப் பாதுகாக்க வேண்டிய பாரிய பொறுப்பு அரசாங்கத்துக்கு இருக்கின்றது. பொருளாதார நிலைமை நெருக்கமடைந்து வருகின்ற இந்தக் காலப்பகுதியில் விவசாயிகள் பாதிக்கப்படும்பொழுது, அது நாட்டின் பொருளாதாரத்தை வலுவாகப் பாதிக்கும். எனவே, அரசும் விவசாயத்துக்குப் பொறுப்பான அமைச்சும் இணைந்து, மிக விரைவாக நெல்லுக்கான உத்தரவாத விலையை நிர்ணயிக்க வேண்டும். ஒரு கிலோகிராமுக்கு 150 ரூபாவுக்கு மேல் விலையை நிர்ணயித்து, விவசாயிகளைப் பாதுகாக்க வேண்டுமென நான் இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன்.

மட்டக்களப்பு மாவட்டத்தில் மயிலத்தமடு - மாதவனையைச் சேர்ந்த கால்நடை வளர்ப்பாளர்களால் மேற்கொள்ளப்பட்டு வருகின்ற மேய்ச்சல்தரை பிரச்சினை தொடர்பான போராட்டம் ஆயிரம் நாட்களை நெருங்கிக் கொண்டு இருக்கின்றது. அதற்கான நிலம் விடுவிக்கப் படுமென கடந்த மாவட்ட அபிவிருத்திக் குழுக் கூட்டத்திலும் சனாதிபதி அவர்கள் உறுதியளித்திருந்தார். அது தொடர்பான செயற்பாடுகள் மிக மந்தகதியிலே நடந்துகொண்டு இருக்கின்றன. எனவே, அந்த மேய்ச்சல் தரையை விடுவிப் பதற்குரிய உறுதியான நடவடிக்கைகளை மிக விரைவாக எடுத்து, விவசாயிகளையும் கால்நடை வளர்ப்பாளர்களையும் பாதுகாப்பதன்மூலம் எமது மாவட்டத்தின் பொருளாதாரத் தைப் பாதுகாக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

இன்று வடக்கு, கிழக்கைச் சேர்ந்த அரச தரப்பு, எதிர்த்தரப்பு உறுப்பினர்கள் அனைவரும் கூறிய விடயத்தை நானும் வேண்டுகோளாக விடுக்க விரும்புகின்றேன். அதாவது, எங்களுடைய கிளிநொச்சி மாவட்டத்தைச் சேர்ந்த சொல்லிசைப் பாடகர் கணேஸ்குமார் சங்கீத்சன் அவர்களின் விடுதலை தொடர்பாக இந்த அரசு மனிதநேயத்தோடும் நியாயத்தோடும் நடந்துகொள்ள வேண்டும். நாங்கள் காலங்காலமாக அவசரகாலச் சட்டத்துக்கும் பயங்கரவாதத் தடைச் சட்டத்துக்கும் எதிர்ப்புத் தெரிவித்து வருகின்றோம். ஏனெனில், இந்தச் சட்டங்களின் ஊடாக பல அப்பாவி இளைஞர்களும் அப்பாவி மக்களும் பாதிக்கப்பட்டுக்கொண்டு இருக்கிறார்கள். கடந்த யுத்த காலத்தில் எவ்வாறு வடக்கு, கிழக்கு தமிழ் மக்கள் பாதிக்கப்பட்டார்களோ, அவ்வாறான ஒரு சூழ்நிலையை அவர்கள் உணரக்கூடிய மாதிரியான ஒரு நிலை மீண்டும் இருக்கக் கூடாது. அவர்களுடைய கருத்துச் சுதந்திரம், கலைத்திறனை வெளிப்படுத்துகின்ற சுதந்திரம் என்பவற்றைப் பாதுகாக்க வேண்டிய பொறுப்பு இந்த அரசுக்கு இருக்கின்றது. இவ்வாறான விடயங்களில் அரசு நிதானமாகவும் நீதியாகவும் நடந்துகொள்ள வேண்டும். அந்தப் பாடகரை உடனடியாக விடுதலை செய்வதற்குரிய ஏற்பாடு களைச் செய்வதன்மூலம் அரசு தமிழ் மக்களுக்கான

[ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා]

நியாயமான ஒரு வெளிப்பாட்டைக் கொண்டுவர வேண்டு மெனக் கேட்டுக் கொள்கின்றேன்.

இன்று இலங்கையின் பொருளாதாரம் சம்பந்தமாகப் பலர் பேசினார்கள். இலங்கையின் பொருளாதாரச் செயற்பாடு ஒரு குறுகிய காலச் செயற்பாடு அல்ல. இந்த நாட்டில் அனைத்து மக்களுக்குமான நிரந்தர அரசியல் தீர்வொன்றை வழங்கினால் நாட்டின் பொருளாதாரம் ஸ்திரமடையும். தமிழ் மக்களுக்கான நீதியும் நியாயமும் நிலைநாட்டப்பட வேண்டுமெனக் கூறி, எனது உரையை முடித்துக் கொள்கின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු චන්දිම හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.00]

**ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு சந்திம ஹெட்டிஆரச்சி)
(The Hon. Chandima Hettiaratchi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂ වැදගත්කමකින් යුතු පනතකට අදාළ රීති සම්පාදනය කරන, ඒ පිළිබඳව විවාද කරන අද දවසේ මම කැමැතියි ඇත්තටම 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත ප්‍රකාරව අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට නැවත ගෙන්වා ගැනීම සඳහා වෙච්ච මේ රීති සංශෝධනය පිළිබඳව කථා කරන්න, ඒ සඳහා විශේෂ අවධානයක් යොමු කරන්න. ඇත්තටම මෙහි ඉතිහාසය ගත්තොත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1953 අංක 24 දරන විනිමය පාලන පනත යටතේ 1973දී මේ අවශ්‍යතාව මතු කරලා, 1993 දක්වා ඒක පැවතුණා. ඊට පස්සේ 1994දී IMF 8 වැනි වගන්තිය පිළිගැනීමෙන් පස්සේ විදේශ මුදල් ලෙස හෝ රුපියල් ලෙස විදේශ බැංකුවල මේ විදේශ විනිමය පවත්වා ගන්න හැකියාව ලබා දීලා තිබුණා. ඊට පස්සේ 2016දී දින 90ක් දක්වා ඒ කාල සීමාව වෙනස් කළා. ඊට පස්සේ දින 120ක් ඇතුළත මේ මුදල් රටට ගෙනෙන්න ඕනෑ කියලා නැවත කිව්වා. නැවත වතාවක් 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ, 2019 ඔක්තෝබර් මාසයේ ගෙනා රෙගුලාසි හරහා ඒ කාලය දින 180ක් කළා. දැන් අපි මේ මොකක්ද කරන්න හදන්නේ? අපි කරන්න හදන්නේ, විදේශ විනිමය රට තුළට ගෙන ඒමේ කාලය අඩු කරන එක. ඉස්සර තිබුණා දින 100ක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. දැන් අපි ඒක දින 40ක් කරනවා. ලොකු දෙයක් නොවෙයි, දින 60කින් අඩු කරලා තිබෙනවා. දැන් ඉස්සරට වඩා පොඩි ඉක්මනක් සහිතව රට ඇතුළට ඩොලර් ටික, විදේශ විනිමය ටික ගෙනෙන්න ඕනෑ. ඒක තමයි අපේ ඉලක්කය. උදාහරණයක් හැටියට කිව්වොත්, ජූනි 1වැනි දා වෙනකොට ආදායමක් - විදේශ විනිමය - ඉපැයුවා නම්, ජූලි 10 වෙනකොට ඒ මුදල් රට ඇතුළට ගෙනෙන්නට ඕනෑ. ඒක නිකම්ම ගෙනැල්ලා රුපියල්වලට පරිවර්තනය කරන්න කියලා කියනවාත් නොවෙයි මේ. මේ ගැසට් එකේත් බොහොම පැහැදිලිව තිබෙන හැටියට අනුමත, අවසරලත් ගෙවීම් ප්‍රමාණයක් තිබෙනවා ඒ පුද්ගලයන්ට කරන්නට. ඩොලර්වලින් පඩි ගෙවනවා නම්, ගෙවන්න ණය තිබෙනවා නම්, ඒ අනුමත කරපු ඒවා ගෙවන්න පුළුවන්. ඒවාත් කළාට පස්සේ residual එක, එහෙම නැත්නම් ඉතිරි මුදල ගෙනැල්ලා තමයි මේ රටේදී රුපියල් බවට පරිවර්තනය කරන්නේ.

ඇත්තටම අපි මේ කරමින් ඉන්න එකේ මූලික හරය මොකක්ද? මේකෙන් කරන්නේ අපි ආනයනකරු, අපනයනකරු, පාරිභෝගිකයා කියලා එක එක්කෙනා විශේෂ කරලා ආරක්ෂා කරන්නේ නැතුව, සමස්තයක් ලෙස සාර්ව ආර්ථිකමය වශයෙන් - macroeconomically - රට දිහා බලලා ඒ සියලුදෙනා ආරක්ෂා කිරීමයි. ඒ පදනම මත පිහිටලා ගන්න තීන්දුවක් තමයි මේ. සරලවම කිව්වොත්, රට ඇතුළේ ඩොලර් සංචිත ප්‍රමාණය, රට ඇතුළේ විදේශ සංචිත ප්‍රමාණය ඉහළ නංවා ගන්න කරන වැඩක් මේක. මේක හොඳ නැද්ද? ඒක අත්‍යවශ්‍යයි. මොකද ඒක අත්‍යවශ්‍ය වෙන්නේ? ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුව මේ විනිමය අනුපාත, කම්පන අවශෝෂණ උපකරණයක් - shock absorber එකක් - විධියට පාවිච්චි කරන්නේ නැතුව, රටේ තිබුණු විනිමය සංචිත යොදා ගනිමින්, කෘත්‍රිමව පාලනය කරලා අවසානයේදී මේ රට විනාශ මුඛයට ඇදගෙන ගියා.

අපේ ඩොලර් සංචිත ටික ඉවර කළා. දැන් අපි ඉතාම පැහැදිලිව අපේ විනිමය අනුපාත shock absorber එකක් විධියට, එහෙම නැත්නම් ආරක්ෂක උපාය මාර්ගයක් විධියට පාවිච්චි කරමින් අපේ රටේ ආර්ථිකයට ඇතිවන බාහිර බලපෑම් නිසා සිදුවන චලනයන් නිසි පරිදි හසුරුවා ගනිමින් කටයුතු කරන්න තමයි මේ කටයුතු කරමින් ඉන්නේ. ස්ථාවරභාවය - stability එක - තමයි ආර්ථික වර්ධනයේ, economic growth එකේ පදනම වෙන්නේ. අන්න ඒ මූලික න්‍යායේ ඉඳන් තමයි අපි කටයුතු කරමින් ඉන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා මේ සභාවේදී කථා කළා, අපේ ජනාධිපතිතුමා මැයි මාසයේ 13වැනි දා IMF කළමනාකාර අධ්‍යක්ෂතුමිය වෙත යවපු ලිපිය ගැන. මම කැමැතියි, ඒ ලිපියේ තිබෙන එක කොටසක් උපුටා දක්වන්න:

> "Macroeconomic stability has been restored. The economy has grown robustly at 5 per cent y/y in 2024 and 2025. Foreign reserves have strengthened significantly to over 3 months of imports. Price stability has been maintained since mid-2023. Our multi-year revenue-based fiscal adjustment has more than doubled tax collections and delivered primary surpluses for three consecutive years. Debt restructuring has delivered significant debt relief and put public debt on a sustainable path."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ මිත්‍රයා, මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා කිව්වේ නැහැ ඒ ලියුමේ තිබුණු මේ කොටස. එතුමාට කියන්න අමතක වුණා, 2024-2025 වර්ෂ දෙක සැසඳුවාම සියයට 5ක ආර්ථික වර්ධනයක් අපි අත්පත් කර ගත්තා කියලා. අපේ මිත්‍රයා ඒක කිව්වේ නැහැ. ලංකාවට භාණ්ඩ ආනයනය කරන්න, රටේ මිනිස්සුන්ට කන්න අඳින්න දෙන්න, තෙල් ටික ගේන්න, කිරිපිටි ටික ගේන්න සල්ලි නැති කරපු රටේ, ඉදිරි මාස තුනකට අවශ්‍ය සංචිත ගොඩනගලා තිබෙනවා කියලා මගේ මිත්‍රයා කිව්වේ නැහැ. ඒක අමතක කරලා වෙන එකක් තමයි කිව්වේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු විපක්ෂ නායකතුමා කථා කරන වෙලාවේ මම පොඩ්ඩක් කොනිත්ත ගත්තා; මම හීනයක් දකිනවාද කියලා කල්පනා කළා. එක්කෝ එතුමා වෙන රටක, සමාන්තර ලෝකයක වෙන ශ්‍රී ලංකාවක විපක්ෂ නායකවරයෙක්. එතුමා කිව්වා, මේ ආණ්ඩුව බදු ප්‍රතිශත ඉහළ නංවලා කියලා. බදු ප්‍රතිශත ඉහළ නංවලා බදු ගහලා බදු ගහලා භාණ්ඩාගාරය පුරවලා කිව්වා. පට්ටපල් බොරු. මේ ආණ්ඩුව බදු ප්‍රතිශත ඉහළ නංවලා නැහැ. මට තේරෙන්නේ නැහැ, ගරු විපක්ෂ නායකතුමා වැදගත් මහත්මයෙකු විධියට ඇයි මේ වාගේ බොරුවක් මේ සභාවේ කියන්නේ කියලා. මට හිතාගන්න බැහැ, එතුමා ඒ වාගේ ප්‍රකාශයක් කළේ ඇයි කියලා. මම ඇත්තටම හිතාගෙන හිටියේ නඩු නිසා බේබි මල්ලි සැලේ කියලා. දැන් බලාගෙන ගියාම විපක්ෂ නායකතුමාත් සැලේ; ආණ්ඩුවට බියෙන් සැලේ. අපරාදේ. එතුමා එහෙම වෙන්න ඕනෑ නැහැ. ආර්ථිකය

ශක්තිමත් කරගෙන ආණ්ඩුවත් ජනාධිපතිතුමාත් යන ගමන නිසා තමයි මේ බිය වෙලා ඉන්නේ. මම ගරු විපක්ෂ නායකතුමාට මේක කියන්න ඕනෑ. ඔබතුමන්ලා හදපු governance issue එක, පාලනයේ තිබෙන අර්බුදය තමයි අපි මේ නිවැරදි කරමින් ඉන්නේ. විනයක් නැති රටක්, හොරකම ඉහවහා ගිය රටක්, විනාශ වුණු රටක් තමයි අපට මේ ගොඩනඟන්න වෙලා තිබෙන්නේ. ඒකට ලොකු කාලයක් ගතවෙන එක ගැන අපට ගැටලුවක් තිබෙනවා. රටේ ආර්ථිකය දැවැන්ත අර්බුදයක තිබෙන්නේ කියලා රවී කරුණානායක මන්ත්‍රීතුමා ලොකු බිල්ලෙක් මවන්න හැදුවා. එහෙම කරන්න හොඳ නැහැ. එතුමා, ගරු කටයුතු මන්ත්‍රීවරයෙකු විධියට එතුමාගේ දැනුම පාවිච්චි කරලා මීට වඩා රටේ ප්‍රගමනය වෙනුවෙන් ඒ දැනුම ලබා දෙන්න ඕනෑ. නමුත් එතුමා බිල්ලෙක් මවන්න හදනවා. තවත් මන්ත්‍රීවරයෙක් කිව්වා, රුපියල අවප්‍රමාණ වෙනකොට ඩොලර් ණය තොගය වැඩිවෙනවා කියලා. පට්ටපල් බොරු; කෙබර. මේවා තමයි විපක්ෂය මේ රටට කියමින් ඉන්නේ. ඒ විතරක් නොවෙයි. අපේ හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමාත් කිව්වා, අපේ ආණ්ඩුවේ අසමත්කම නිසා දැන් හදිසි නීතිය දමලා අපි රට පාලනය කරනවා කියලා. ඒ ගැන අපි කනගාටුවෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு சந்திம ஹெட்டிஆரச்சி)
(The Hon. Chandima Hettiaratchi)
මම අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

කවුද එහෙම කියන්නේ? විපක්ෂයේ ඔබතුමන්ලා පාලනයේ ඉන්නකොට මාධ්‍යවේදීන් මර්දනය කරලා, මාධ්‍යවේදීන් මරලා, අඩු කඩලා, රටින් පිටුවහල් කළා. ඒ කණ්ඩායම තමයි අපට මේවා කියන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අයට දරා ගන්න බැරි වෛරයක් තිබෙනවා. සාමාන්‍ය මිනිස්සු බලය ගත්ත එක දරාගන්න බැරිව, ඒ පීඩනය දරා ගන්න බැරිව මේගොල්ලෝ පිච්චි පිච්චි ඉන්නේ. ඒ නිසා, "හීන තිබුණාට කෝටියක්, අතේ නෑ එක රුපියලක්" කියනවා වාගේ "හීන තිබුණාට කෝටියක්, විපක්ෂෙට නැහැ වාසියක්."

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.09]

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දිනයේ සාකච්ඡා කරන විෂයයන් දෙක අතරින් අත්‍යවශ්‍ය මහජන සේවා පනත යටතේ වන යෝජනා සම්මතය පිළිබඳව තමයි මම කරුණු කාරණා ඉදිරිපත් කරන්නේ. මේ පිළිබඳව කථා කරන අවස්ථාවලදී අපි නිතරම කියපු දෙයක් තමයි, පසුගියදා ඇති වුණු මහා සුළි කුණාටුවෙන් වාගේම දැනට පවතින ලෝක අර්බුදය හේතුවෙන් ජන ජීවිතයට ඇති වන පීඩාවන් මෙන්ම ඉදිරියේ දී අපේ ජන ජීවිතය පවත්වාගෙන යාමේ දී ඇතිවිය හැකි බාධාවන් වළක්වා ගැනීම සඳහා යම් ක්‍රමවේදයකට අනුව කටයුතු කිරීම සඳහා තමයි අත්‍යවශ්‍ය සේවා විධිමත් කිරීමට අවශ්‍ය වෙන්නේ කියන එක. විශේෂයෙන්ම ජලය, විදුලිය, ඉන්ධන, සෞඛ්‍ය සේවා, ආහාර, පොදු ප්‍රවාහනය ආදිය මහජනතාවගේ සුබසිද්ධිය තකා නිසියාකාරව, නොකඩවා පවත්වා ගෙන යා යුතුයි. සාමාන්‍යයෙන් ආපදාවක් ඇති වුණාට පස්සේ මහා විනාශයක් ඇති වෙනවා. ඒකේ ප්‍රතිඵලයක් හැටියට තමයි අපි මේ විශේෂ ක්‍රමවේද යොදා ගන්නේ. මේ යෝජනා සම්මතය තුළින් එම අත්‍යවශ්‍ය සේවා නිසි පරිදි කිසිම අඩුපාඩුවක් නැතිව කරගන්න අවශ්‍ය ප්‍රතිපාදන ලබා දෙනවා.

බොහෝ බාධක, අභියෝග හමුවේ තමයි අපි මේ කටයුතු සිද්ධ කරන්නේ. ඒ සඳහා අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයෙක් පත් වෙනවා. ඔහුට විශේෂ බලතල ලබා දෙනවා. මොකද, දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ සිට බිම් මට්ටමේ සිටින ග්‍රාම නිලධාරීන් දක්වා වූ නිලධාරීන්ගෙන්, අනෙකුත් රාජ්‍ය ව්‍යුහයෙන්, රාජ්‍ය තන්ත්‍රයෙන් පීඩාවට පත් මහජනතාව වෙනුවෙන් ඔවුන්ගේ අවශ්‍යතා සඳහා ඒ අත්‍යවශ්‍ය සේවා නොකඩවා ලබා දීම තමයි මේකේ අරමුණ වෙන්නේ. ඒ වාගේම පීඩාවට පත් ජනතාව ඉක්මනින් යථා තත්ත්වයට පත් කිරීම තමයි අපේ අරමුණ වෙන්නේ. අපි අත්‍යවශ්‍ය සේවා නොකඩවා, නිසියාකාරව පවත්වා ගත්තේ නැත්නම් ආර්ථික වශයෙන් විශාල ප්‍රශ්න ගණනාවකට මුල පුරනවා. විශේෂයෙන්ම අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ඒ රෙගුලාසි හා හැම ක්ෂේත්‍රයකටම තිබෙන ප්‍රතිපාදන භාවිත කර තමයි අවශ්‍ය කටයුතු සිද්ධ කරන්නේ. මේක සෑම ක්ෂේත්‍රයකම, සෑම අත්‍යවශ්‍ය සේවාවකටම සම්බන්ධීකරණය කර ගැනීම ඉතාම වැදගත්. අපි පත්තරවලින්, එහෙම නැත්නම් ලිපි ලේඛනවලින්, චක්‍රලේඛවලින් මොන විධියේ දේවල් රෙගුලාසි හැටියට ලබා දී තිබුණත්, ප්‍රායෝගික වශයෙන් ඒ ගම්මානවල ඇති වෙලා තිබිච්ච තත්ත්වය නිසියාකාරව පාලනය කිරීම සඳහා එම රාජ්‍ය නිලධාරීන්ට ස්වාධීනව කටයුතු කරන්න අපි අවස්ථාව සලසා දිය යුතුයි. ඒ සඳහා මේ ප්‍රවේශයන්, එහෙම නැත්නම් ප්‍රතිපාදන ඉතාම වැදගත් වෙනවා. මෙහිදී අපේ රජයට - ආණ්ඩුවට - විශේෂ වැඩ පිළිවෙළක් තිබෙනවා; විශේෂ සැලැස්මක් තිබෙනවා. හදිසි අවස්ථාවකදී වුණත් අපේ විශේෂ සැලසුමක් තිබෙනවා. ඒ සැලසුම් මාලාවන් එකට අරගෙන තමයි අපි මේ කටයුතු සිද්ධ කරන්නේ. එතකොට "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති මාලාවේම තිබෙනවා, අපි කටයුතු කළ යුතු ආකාරය. දූරදර්ශී නුවණින්, දැක්මක් ඇතිව ඒ හැම ක්ෂේත්‍රයකම සැලසුම් හදාගෙන කටයුතු කළ නිසාවෙන් තමයි අපි මෙතෙක් කල් ඔරොත්තු දීගෙන රටක් හැටියට ඉදිරියට යන්නේ.

විශේෂයෙන්ම මේ අවස්ථාවේදී මම කියන්න ඕනෑ, අපේ විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරයෙක් "Rebuilding Sri Lanka" අරමුදල ගැන පළ කළ අදහසක් පිළිබඳව. "ඒක නීත්‍යනුකූල නැහැ. ඒක විගණනය කරන්න බැහැ" කියලා කිව්වා. මම දන්න විධියට රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති විසින්ම විගණකාධිපතිට කථා කරලා තොරතුරු අරගෙන තහවුරු කරගෙන තිබෙනවා, මේක නීත්‍යනුකූලයි, විගණනයටත් භාජන කරන්න පුළුවන් කියලා. අපි රජය - ආණ්ඩුව - හැටියට මූල්‍ය කටයුතුවලට, එහෙම නැත්නම් විගණන කටයුතුවලට විශේෂයෙන් අපේ අවධානය යොමු කරනවා. අපි මහජනතාවට වග කිවයුතුයි. එකතු කරන හැම සතයක්ම, මුදලක්ම වෙනුවෙන් මහජනයාට අපි වගවිය යුතුයි, වගකිව යුතුයි කියන මතයේ තමයි අපි ඉන්නේ. ඒ නිසා ආවාට ගියාට එහෙම තොරතුරු කථා කළාට කිසිම වැඩක් වෙන්නේ නැහැ. මොකද, අපි ඒ සම්බන්ධයෙන් ඉතාම හොඳින් කටයුතු කර තිබෙනවා.

[ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා]

ඒ වාගේම රණවිරුවා මූලික කරගෙන මතයක් ගොඩනගන්න හදනවා, රණවිරුවා දඩයම් කරනවා කියලා. ඔය කවුරු මොනවා කථා කළත්, රණවිරුවා ගැන කථා කරන්න මටත් විශේෂයෙන් අයිතියක් තියෙනවා. මොකද, ඒ සේවයේ මමත් අවුරුදු 36ක් කටයුතු කරපු නිසා. ඒ නිසා ඔය ඉන්න අයට රණවිරුවා ගැන කියන්න කොහෙත්ම දැනුමක් නැහැ. අපි දන්නේ රණවිරුවෙක් ගැන විතරක් නොවෙයි. අවුරුදු ගාණකට කලින් ඇති වෙච්ච ඒ කර්තව්‍යයේදී මේ රට වෙනුවෙන් රණවිරුවා ඒ මහා ශ්‍රේෂ්ඨ විරෝදාර කටයුත්තට මුහුණ දීපු හැටි අපි දන්නවා. ඒ නිසා එම ක්ෂේත්‍රයේ, එහෙම නැත්නම් හමුදාවේ රණවිරුවාගේ වෘත්තීමයභාවයට, ඔවුන්ගේ තිබෙන හැකියාවන්වලට නිග්‍රහ කිරීම සුදුසු නැහැ. එදා විරුවෙක් වෙන්න පුළුවන්. නමුත් රණවිරුවා කියලා මොනම හෝ අපරාධයක්, වංචාවක්, දූෂණයක් කළොත්, ඒ රණවිරුවාට විරුද්ධව සිවිල් නීතිය ක්‍රියාත්මක විය යුතුයි. ඔහු සැකකරුවෙක් වුණොත්, ඒ පරීක්ෂණ කටයුතු කරලා, ඒවා විශ්ලේෂණය කරලා ඒ රණවිරුවා උසාවියට - අධිකරණයට - ඉදිරිපත් කරන්න පුළුවන්. එහෙම නැතුව ඒ මුවාවෙන් අපරාධයක් කළොත් හෝ කළත්, ඉතිහාසයේ ඔහු රණවිරුවෙක් කියලා ඒක සැලකිල්ලට ගෙන නිදහස් කරන්නවත්, එහෙම නැත්නම් ඒ පරීක්ෂණවලින් ඉවත් කරන්නවත් අපේ ව්‍යවස්ථාවේ හෝ නීති සංග්‍රහයේ නීතියක් නැහැ. ඒ නිසා ඒකෙන් ගැලවීමක් හෝ නිදහස්වීමක් නැහැ. ඒ නිසා තමන් රණවිරුවෙක් හැටියට, නැත්නම් හමුදා සේවයේ කටයුතු කරලා ඊට පස්සේ තමන්ට විරුද්ධව චෝදනාවක් එනවා නම්, ඒවාට මුහුණ දෙමින් පිළිතුරු දිය යුතුයි. මම ඇමතිවරයෙක් හැටියට කටයුතු කළත් පාස්කු ප්‍රහාරය සම්බන්ධව මගෙනුත් ප්‍රශ්න කළා. මටත් එන්න කිව්වා. මමත් CID එකට ගිහිල්ලා පැය පහමාරක් මගෙන් අහපු ප්‍රශ්නවලට පිළිතුරු දුන්නා. මම කථා කරලා, ඒවා ඉදිරිපත් කරලා ආවා. ඒක තමයි තමන්ගේ තිබෙන පිරිසිදුභාවය. තමන් රාජකාරි කරපු කාලය තුළදී ඒ අණදීම් කටයුතු නිවැරදිව කරන එක තමයි තමන්ගේ වගකීම.

තමන් කරපු නැති දෙයක් සම්බන්ධයෙන් තමන්ට විරුද්ධව චෝදනා කරනවා නම්, අධිකරණයට ගිහිල්ලා අධිකරණයේ සොය පතන්න අයිතිය තිබෙනවා. ඒක නිසා ආවාට ගියාට කථා කරලා වැඩක් නැහැ. ඒ වාගේම pavement එකක් උඩට ගිහිල්ලා අට්ටාල ගහගෙන කෑ ගහලා වැඩකුත් නැහැ. දැන් අපට තොරතුරු ලැබුණා, ඒ අට්ටාල ඔක්කෝම ගලවාගෙන යනවා කියලා. මොකද, ඒගොල්ලන්ට තේරෙන්න ඇති නිකම් කෑ ගහලා තේරුමක් නැහැ කියන එක. අපි රජයක් හැටියට, ආණ්ඩුවක් හැටියට නීතිය පැත්තෙන් කරන පරීක්ෂණ කටයුතුවලට අත ගහන්න යන්නේ නැහැ. මෙතැන ඉන්න මේ අපේ කිසිම ඇමතිවරයෙක්, මන්ත්‍රීවරයෙක් ඒ කටයුතුවලට අත ගහන්න යන්නේ නැහැ. නිදහසේ, ස්වාධීනව කටයුතු කරන්න ඒ පරීක්ෂණ දෙපාර්තමේන්තුවලට අපි ඉඩ දීලා තිබෙනවා. එම පරීක්ෂණවල ප්‍රතිඵල, එහෙම නැත්නම් ඒවායෙන් තහවුරු වන තොරතුරු මාධ්‍යයට නිකුත් කරනකොට තමයි ඒ කවුරුත් කලබල වෙලා තිබෙන්නේ. නමුත් කලබල වෙන්න දෙයක් නැහැ. තමන් නිර්දෝෂියි නම්, තමන් ඒක කරලා නැත්නම්, අපේ රටේ තිබෙන නීතිය අනුව පොලීසියට හරි අධිකරණයට හරි ගිහිල්ලා, තමන් නිර්දෝෂයි කියලා කරුණු ඉදිරිපත් කිරීම තමයි කරන්න තිබෙන්නේ. ඒ අනුව අපි කොහේද සිටින්නේ, අපි මොනවාද කළ යුත්තේ, අපි කොහොමද කටයුතු කළ යුත්තේ කියලා අපි දැනගත යුතුයි.

පාස්කු ප්‍රහාරයේ වින්දිතයන් 278ක් ඉන්නවා. ඒ වාගේම 500 ගණනක් ඉතාම අසරණ තත්ත්වයට පත් වෙලා සිටිනවා. ඒ ගොඩක් කට්ටිය ආබාධිත වෙලා සිටිනවා. ඒ වාගේම තුවාල වෙච්ච අය ඉන්නවා. ඔවුන්ට සාධාරණයක් ඉෂ්ට කළ යුතුයි. රජයක් හැටියට අපේ වගකීම තමයි ස්වාධීනව ඒ අධිකරණ කටයුතු සිද්ධ කරලා දීම හා ඒවාට පහසුකම් සැලසීම, ඒ වාගේම ඔවුන්ට නිදහසේ ස්වාධීනව ඒ කටයුතු කර ගැනීමට අපේ ප්‍රවේශය ලබා දීමට කටයුතු කිරීම. ඒවාත් සියල්ල සැලකිල්ලට ගෙන අද අපේ විෂය පථයේ තිබෙන අත්‍යවශ්‍ය සේවා පනත යටතේ වන යෝජනා සම්මතය තවත් මාසයකින් දීර්ඝ කර ගැනීම අපේ ඉදිරි වැඩකටයුතු සඳහා ඉතාම අත්‍යවශ්‍ය බව ප්‍රකාශ කරමින්, මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## අත්‍යවශ්‍ය මහජන සේවා පනත: යෝජනා සම්මතය
## அத்தியாவசிய பொதுச் சேவைகள் சட்டம்: தீர்மானம்
## ESSENTIAL PUBLIC SERVICES ACT: RESOLUTION

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "1979 අංක 61 දරන අත්‍යවශ්‍ය මහජන සේවා පනතේ 2 වන වගන්තිය ප්‍රකාරව ජනාධිපතිවරයා වෙත පැවරී ඇති බලතල අනුව, 2026 මැයි 28 දිනැති අංක 2490/07 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ හා එහි උපලේඛනයෙහි පළ කරනු ලැබ, 2026.06.09 දින ඉදිරිපත් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඒ අනුව අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සහ 2 යථා පරිදි සම්මත වූ බව ප්‍රකාශ කරමි.

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු අමිල ප්‍රසාද් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

## සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ගැටලු
சுகாதாரத்துறையிலுள்ள பிரச்சினைகள்
ISSUES IN HEALTH SECTOR

[අ.භා. 5.20]

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"මෙරට නිදහස් සෞඛ්‍ය සේවාව යනු, රටේ ජනතාව භුක්ති විඳින වරප්‍රසාදයක් මෙන්ම අත්‍යවශ්‍ය සේවාවකි. ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවාව ජාත්‍යන්තරයේ පවා ඇගැයීමකට ලක්ව තිබූ පසුබිමක වර්තමානය වන විට නිදහස් සෞඛ්‍ය සේවාව පිළිබඳව උද්ගතව ඇත්තේ සතුටු විය නොහැකි තත්ත්වයකි. එවැනි පසුබිමක සෞඛ්‍ය ක්ෂේත්‍රය මුහුණ දී ඇති පහත කරුණු පිළිබඳව මේ ගරු සභාවේ අවධානය යොමු කිරීමට අපේක්ෂා කරමි.

01. රෝහල් පද්ධතිය තුළ පවතින වෛද්‍යවරුන්ගේ හා හෙද හෙදියන්ගේ හිඟය සෞඛ්‍ය ක්ෂේත්‍රය කාර්යක්ෂමව සහ සුමටව පවත්වාගෙන යාමට බාධාවක් වී ඇති බැවින් දැනට විවිධ හේතු මත රට හැර ගොස් සිටින හා සේවයෙන් ඉවත් වූ වෛද්‍යවරුන් යළිත් සේවයට එක්කර ගැනීම.

02. රෝහල්වල පවතින ඖෂධ හිඟයට සාර්ථක විසඳුමක් ලබා දීම.

03. ඔසුසල් ආශ්‍රිතව ප්‍රමාණවත් සුදුසුකම් ලත් ඖෂධවේදීන් නොමැතිවීම මත එම ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා විධිමත් ක්‍රියාමාර්ගයක් සැකසීම.

04. වත්මන් මාලිමා රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් ප්‍රාථමික වෛද්‍ය මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමේ වැඩ පිළිවෙළ අපේක්ෂිත ප්‍රතිඵල අත්කර නොගැනීමට හේතු විමසා බැලීම.

05. රෝහල්වල සේවක පුරප්පාඩු පිරවීමේදී තෝරාගත් පිරිසකට පමණක් අවස්ථාව ලබා දීම වෙනුවට සියලුම ඉල්ලුම්කරුවන්ට ඒ සඳහා වෙනසකින් තොරව සුදුසුකම් මත අවස්ථාව සලසා දීම.

එබැවින්, සෞඛ්‍ය ක්ෂේත්‍රය කාර්යක්ෂමව සහ උපරිම සේවාවක් ලෙස පවත්වාගෙන යාම සඳහා උක්ත කරුණු පිළිබඳව මේ ගරු සභාවේ අවධානය යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පිළිබඳව විශේෂයෙන්ම මා අදහස් දක්වන්න හිතුවේ, ලංකාවේ විවිධ ප්‍රදේශවලට අපි යන විට, ඒ ප්‍රදේශවල රෝහල් ආශ්‍රිතව මේ සේවක පුරප්පාඩු බරපතළ ලෙස දකින්න තිබෙන නිසායි. උදාහරණයක් හැටියට ගත්තොත්, අනුරාධපුර ශික්ෂණ රෝහලේ වෛද්‍යවරුන් 37කගේ හිඟයක් තිබෙනවා. ඒ වාගේම අනුරාධපුර දිස්ත්‍රික්කයේ පමණක් රෝහල් 9ක වෛද්‍යවරුන්ගේ හිඟයක් පවතිනවා. ආණ්ඩුවේ මූලික අවධානය යොමු කළ යුතුව පවතින්නේ, මේ වෛද්‍යවරුන්ගේ හිඟයට හේතු මොනවාද කියන එක පිළිබඳවයි. ඒ පිළිබඳව සොයා බැලීමේදී අපට දැනගන්න ලැබුණා, රෝහල් පද්ධතිවල වාට්ටු සංකීර්ණ අලුතින් ඉදිවනකොට, අලුත් ඒකක - units - එනකොට, ඒ රෝහලේ ඉන්න වෛද්‍යවරුන්ම ඒවාට යොමු කරන විට, පෙර රාජකාරි කරපු අය ඒ තැන්වලින් ඉවත් කළාම ඒ ස්ථානවල පුරප්පාඩු ඇති වන බව. මේ සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතු මූලික ප්‍රශ්නය තමයි, මේ රටේ රෝහල් පද්ධතියේ සිටිය යුතු සම්පූර්ණ වෛද්‍යවරුන් සහ හෙද හෙදියන් සංඛ්‍යාව, එහෙමත් නැත්නම් දැනට සිටින සංඛ්‍යාව පිළිබඳව යාවත්කාලීන සමීක්ෂණයක් මේ ආණ්ඩුව යටතේ ගෙවුණු වසර දෙකක කාල සීමාව තුළ සිද්ධ වුණාද කියන එක.

ඊළඟ කාරණය තමයි, වෛද්‍යවරුන්ගේ පහසුකම් ප්‍රමාණවත් නොවීම. ඒ හේතුකොටගෙන තමයි, බොහෝ විට ඔවුන් රට හැර යන්නේ. හෙද හෙදියනුත් එහෙම තමයි. උදාහරණයක් ගත්තොත්, කාලයක සිට වෛද්‍යවරුන්ට ලබා දෙන වාහන පර්මිට් එක දැන් නවත්වා තිබෙනවා. ඒක රජයේ තීරණයක්. ඒකට අපි එකඟයි. ඒ රජයේ තීරණයට එකඟ වන අතරතුර, මේ ප්‍රවාහන ප්‍රශ්නයට ඉන්ධන දීමනාවක් ලබා දීම හෝ ප්‍රවාහන දීමනාවක් ලබා දීම වාගේ ප්‍රායෝගික වැඩ පිළිවෙළකට තවම මේ ආණ්ඩුව අවධානය යොමු කරලා නැහැ. හැබැයි, මේ ආණ්ඩුව මූල්‍ය ප්‍රශ්නයක් නොමැති ආණ්ඩුවක්. ඒක තමයි වැදගත්ම දේ. මූල්‍ය ප්‍රශ්නයක් තිබෙනවා නම්, ඒක එහෙම කරන්න බැරි වෙන්න පුළුවන්. නමුත්, මෙහෙම වුණාම විදෙස්ගතව ඉන්න මේ ක්ෂේත්‍රයට සම්බන්ධ අය යළි මේ රටට එන්නේ නැහැ. විශාල මුදලක් වියදම් කරලා තමයි, මේ වෛද්‍යවරුන් හා හෙද හෙදියන් අපි බිහි කරන්නේ. අපේ රට ඇතුළේ පුරප්පාඩු පවතින විට ඒ අය වෙනත් රටවල සේවය කරන නිසා, ඒ අයව ගෙන්වා ගැනීම සඳහා වූ වැඩ පිළිවෙළක් අමාත්‍යාංශයේ නිලධාරි මට්ටමින්, සුමටව සිද්ධ වන්නේ නැහැ කියන චෝදනාවත් මගේ පැත්තෙන් රජයට ඉදිරිපත් කරනවා. ඒ කියන්නේ රාජ්‍ය සේවකයින්ට, අමාත්‍යාංශ නිලධාරින්ට. අවුරුදු ගණනාවක ඉඳලා මේ ප්‍රශ්නය නිසා රෝහල් පද්ධතියේ පැවති පුරප්පාඩු මේ ආණ්ඩුව යටතේ තවම සම්පූර්ණ වෙලා නැහැ කියන එකත් මේ වෙලාවේ මම කියන්න ඕනෑ. ඒක මේ ආණ්ඩුවට පෙර ආණ්ඩුවල ඉඳන්ම, economic crisis එකේ ඉඳන්ම තිබුණු තත්ත්වයක්.

ඊළඟ කාරණය මෙයයි. දැනට සිටින වෛද්‍යවරුන් සංඛ්‍යාව ප්‍රමාණවත් නැත්නම් අපට මෙන්න මේ දෙය කරන්න පුළුවන්. උසස් පෙළ විභාගය ළඟදී පැවැත්වෙනවා, ඒ උසස් පෙළ විභාගයෙන් පස්සේ වෛද්‍ය පීඨ වෙත බඳවා ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි කරන්න, බඳවා ගන්නා හෙද හෙදියන් සංඛ්‍යාව ඉහළ නංවන්න. මා දන්නා තරමින් ආණ්ඩුව පැත්තෙන් මේ වනතුරු ඒ සම්බන්ධව අවධානය යොමු කර නැහැ. ඒ නිසා ආණ්ඩුවේ වගකීම තමයි, වෛද්‍ය පීඨ වැඩි කිරීම, වෛද්‍ය පීඨවල ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි කිරීම, ඒවාට අවශ්‍ය පහසුකම් සැලසීම. මෙන්න මේ කාරණා පිළිබඳව රජයේ අවධානය යොමු කරවීමත් අද දවසේ ගෙන එන මේ යෝජනාවේ එක අරමුණක් වනවා.

පසුගිය දවස්වල ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ විශේෂඥ වෛද්‍යවරියක් operation එකකට අවශ්‍ය උපාංග පිටතින් ගෙන්න ගත්තා කියලා යම් ප්‍රශ්නයකට මුහුණ දුන්නා. එහි වර්තමාන තත්ත්වය මොකක්ද? මේ වනකොට ඒ වෙනුවෙන් ආණ්ඩුව අරගෙන තිබෙන ක්‍රියාමාර්ගය මොකක්ද? මම ඒවා අහන්න හේතුව තමයි, බොහෝ විට විශේෂ operationsවලට ඕනෑ කරන වෛද්‍ය උපාංගවල හිඟයක් තිබෙන බව රෝහල්වලින් දැනගන්න ලැබීම. හැබැයි මේ ගරු කටයුතු ආයතනය ඇතුළේ ගරු මන්ත්‍රීවරයෙක් අද දවසේ කියනවා, මේ ආණ්ඩුව යටතේ එහෙම ප්‍රශ්නයක් නැහැ, බෙහෙත් සහ උපාංගවල හිඟයක් නැහැ කියලා. එහෙම නම් අපට කියන්න තිබෙන්නේ, මේ තමයි ආණ්ඩුවට දෙන්න පුළුවන් ප්‍රමාණය කියලායි. ආණ්ඩුව කියනවා නම් හිඟයක් නැහැ කියලා, රටේ ජනතාවට අපට කියන්න තිබෙන දේ තමයි, මේ තමයි ආණ්ඩුවට දෙන්න පුළුවන් ප්‍රමාණය, ඔය ටික තමයි ඉස්පිරිතාලවල තිබෙන්නේ, ඔයිට වඩා දෙයක් ආණ්ඩුවට දෙන්න බැහැ කියන එක. පුළුවන් ටික දීලා තිබෙනවා, ඔයිට අමතර ටික පෞද්ගලිකව අරගන්න කියන එකයි කියන්නේ. ඕක කෙළින්ම කිව්වොත් ඒ අය ඒකට ලැහැස්ති වනවා.

හැබැයි එතැන ඊළඟට එන ප්‍රශ්නය තමයි, පෞද්ගලික ආයතන, එහෙම නැත්නම් මේ රෝහල් උපාංග සහ බෙහෙත් අලෙවි කරන තැන්වලත් - ෆාමසිවලත් - බරපතළ අර්බුද රාශියක් පැවතීම. ඒ තමයි මේ වනකොට ඩොලරයේ මිල ඉහළ යෑමත්

[ගරු අමිල ප්‍රසාද් මහතා]

සමහ සමහර සමාගම් ලංකාවට බෙහෙත් එවන්නේ නැතිවීම. ඒ, ඔවුන්ට පාඩු නිසා. එම නිසා ඒකට අවශ්‍ය මිල වැඩිවීම ඉල්ලා තිබෙනවා, නමුත් ආණ්ඩුව පැත්තෙන් ඊට අවශ්‍ය අවසරය ලබා දීලා නැහැ. ඒකත් සාධාරණ ඉල්ලීමක්.

ඊට අමතරව එන තවත් ප්‍රශ්නයක් තිබෙනවා. මම දැක්කා ඇමතිවරයාම කියනවා, ලංකාවේ ෆාමසි 4,800ක් තිබෙන බව. හැබැයි 2,700 ගාණකට පමණයි අවසර දීලා තිබෙන්නේ. තව 2,000කට ආසන්න ප්‍රමාණයක් අවසර ගන්න අපේක්ෂාවෙන් ඉන්නවා. නමුත් ඒ සඳහා ප්‍රමාණවත් ඖෂධවේදීන් නැහැ. එහෙම නම් ඖෂධවේදීන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් ගොඩනහා ගන්නා තුරු මේ ෆාමසි පද්ධතිය සාර්ථකව පවත්වාගෙන යන්න කුමක්ද මේ ආණ්ඩුව ගන්නා ක්‍රියාමාර්ගය කියලා අපි මේ සභාව තුළදී ප්‍රශ්න කරන්න කැමැතියි සහ ඒ සම්බන්ධව යම් අදහසක් දැනගන්න කැමැතියි.

ඊළඟ කාරණය මෙයයි. පසුගිය දවස්වල රෝහල් පද්ධතියට සුළු සේවකයින් බඳවා ගැනීම සඳහා පුවත් පත් දැන්වීම් පළ කර තිබුණා. ඒකේ ලකුණු ලබා දීමේ පටිපාටියකුත් තිබුණා. මට තොරතුරු දැනගන්න ලැබුණා, interview එකට ආවොත් ලකුණු 5ක් දෙනවා, ඒ ලකුණු 5ත් එකතු වෙලා තමයි තෝරා ගන්න සංඛ්‍යාව තීරණය වෙන්නේ, හැබැයි ඒ සියලුදෙනා interviewsවලට කැඳවා නැහැ කියලා. එහෙම වුණාම අයදුම්කරුවන්ගෙන් බහුතරයකට ඒ අවස්ථාව අහිමි වනවා. තෝරා ගත් පිරිසක් පමණක් interviewsවලට පැමිණීම හරහා තව පිරිසකගේ අයිතිවාසිකම් කඩ වනවා. ඒ කියන්නේ ඒක හිතාමතා සිද්ධ වන දෙයක්ද, එහෙම නැත්නම් අමාත්‍යවරයා හෝ අමාත්‍යාංශය නොදැන නිලධාරි මට්ටමෙන් සිද්ධ වන දෙයක්ද, එහෙමත් නැත්නම් අමාත්‍යාංශයටත්, ඇමතිවරයාටත් අමතරව පිටස්තර පාර්ශ්වයක් විසින් රාජ්‍යය ඇතුළේ මේ වාගේ දේවල් කරනවාද කියන එක පිළිබඳව ආණ්ඩුවේ අදහස මම දැනගන්න කැමැතියි. ඒ වාගේම ඒ පිළිබඳව ආණ්ඩුවේ අවධානය යොමු කරවන්නත් මා කැමැතියි.

අපේ හිටපු අමාත්‍ය ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා විසින් නිර්මාණය කළ, ඉතා සාර්ථකව ක්‍රියාත්මක වන "සුව සැරිය" ගිලන් රථ සේවාවට අවුරුදු 10ක් සම්පූර්ණ වනවා, ලබන මාසයට. මම දැනුත් ඒ පිළිබඳව කථා කරමින් සිටියේ. හැබැයි පළමුවෙනි වතාවට මේ සුව සැරිය ගිලන් රථ සේවාවේ යෙදෙන අය තමන්ගේ පහසුකම් සම්බන්ධව සහ රාජකාරිය හරියට කරගෙන යන්න බැහැ කියන එක මත පාරට ඇවිල්ලා උද්ඝෝෂණය කරනවා මම දැක්කා. ඒ අයගේ යම් ඉල්ලීම් ප්‍රමාණයක් තිබෙනවා. ඒ පිළිබඳවත් ආණ්ඩුවේ අවධානය යොමු කරවන්න මා කැමැතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සුළු මොහොතකින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

2026 වසරේ වැටුප් වැඩිවීම මේ වනතුරු ලබා නොදීම, "අශ්වසුමනනා"  වැනි රක්ෂණ ක්‍රමයක් හරහා වසරකට සරිලන නිසි රක්ෂණාවරණයක් ලබා නොදීම, නිසි නිල ඇඳුම් සහ හැඳුනුම්පත් ලබා නොදීම, පළි ගැනීම් නැවැත්වීම, සිවිල් පරිපාලනයක් ස්ථාපිත කිරීම, විධිමත් මාරුවීම් ක්‍රමවේදයක් සැකසීම, පද්ධතිය යථා තත්ත්වයට පත් කිරීම, කල් ඉකුත් නොවූ වෛද්‍ය උපකරණ නිසි පරිදි සැපයීම, වාහන නැවැත්වීම සහ සේවකයින්ට සනීපාරක්ෂක අවස්ථා ලබා දීම කියන කරුණු පිළිබඳව රජයේ අවධානය යොමු කරවන්න කියලා සුවසැරිය සේවක එකමුතුව විසින් කියා තිබෙනවා.

අවසාන වශයෙන් මට කියන්න තිබෙන්නේ මෙයයි. නිදහස් සෞඛ්‍ය සේවය සාර්ථකව පවත්වාගෙන යන්න ගෙවුණු අවුරුදු 76 ඇතුළේ පැවති රජයන් විසින් විශාල කාර්යභාරයක් මිනිසුන්ගේ බදු මුදල්වලින් කරලා තිබෙනවා. මේ ආණ්ඩුවටත් ඒක කාර්යක්ෂමව කරගෙන යෑමේ වගකීම පැවරෙනවා. ඒ වගකීම වඩා හොඳින් ඉෂ්ට කරන්න ආණ්ඩුවට යෝජනා කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
යෝජනාව ස්ථිර කිරීම, ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

[පි.ව. 5.29]

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! சுகாதாரத் துறையில் காணப்படும் குறைபாடுகள் தொடர்பாக கௌரவ அமில பிரசாத் அவர்களால் கொண்டுவரப்பட்ட இந்த ஒத்திவைப்புப் பிரேரணையை நான் வழிமொழிகின்றேன்.

இன்றைய ஒத்திவைப்புவேளை விவாதத்தில், குறிப்பாக புத்தளம் வைத்தியசாலையின் நிலைமைகள் பற்றிய குறிப்புடன் எனது உரையை ஆரம்பிக்கலாமென்று நினைக்கின்றேன். எங்களுடைய மதிப்புக்குரிய சுகாதார பிரதி அமைச்சர் ஹங்சக விஜேமுனி ஐயா அவர்களே, புத்தளம் வைத்தியசாலை ward ஒன்றில் அனுமதிக்கப்பட்டிருந்த முஸ்லிம் கர்ப்பிணித் தாய் ஒருவர், நின்ற நிலையிலேயே குழந்தையை பிரசவித்திருக்கின்றார் என்பதைத் தாங்கள் அறிவீர்களா? என்பது எனக்குத் தெரியாது. இங்குள்ள முஸ்லிம் பாராளுமன்ற உறுப்பினர்கள் எவரும் இதுவரை இதுகுறித்துப் பேசவில்லை. இவ்வாறு ஒரு ward இல் ஒரு கர்ப்பிணித் தாய் நின்ற நிலையில் குழந்தையைப் பெற்றெடுத்த சம்பவம் தொடர்பிலும் அது தொடர்பில் என்ன inquiry நடத்தப்பட்டது என்பது தொடர்பிலும் உங்களுடைய பதிலை எதிர்பார்க்கின்றேன்.

அதேபோன்று மட்டக்களப்பு வைத்தியசாலையில், මම එය සිංහලෙන් කියන්නම්. Akkaraipattu Hospital එකේ MS කෙනෙක් නැහැ. Nintavur Hospital එකේ MS කෙනෙක් නැහැ. Kalmunai Hospital එකේ MS කෙනෙක් නැහැ. දැන් Batticaloa Teaching Hospital එකේ ඉන්න Director retire වෙන්න

යන්නේ. එම නිසා Deputy RD තමයි ඒ hospitals තුනේම වැඩ බලන්නේ. ඒ මදිවාට එතැන ඉන්න අනුෂිකා කියන Deputy Director කොළඹට transfer එකක් ඉල්ලනවා. ඔබතුමන්ලාට Batticaloa පෙනෙන්නේ නැද්ද, උතුරේ Jaffna පෙනෙන්නේ නැද්ද, පුත්තලම පෙනෙන්නේ නැද්ද කියලා මම දන්නේ නැහැ.

මම තව කාරණයක් කියන්න කැමැතියි. මම එය දෙමළෙන් කියන්නම්. කලවමේ කියන්නම්. මොකද, කලවම් කළ රට නේ.

யாழ்ப்பாணம் போதனா வைத்திசாலையில் பணியாற்றும் சுகாதாரத் தொண்டர்கள் 170 பேருக்கு நியமனம் வழங்குவது தொடர்பில் அவர்களை நான் கூட்டிவந்து சுகாதார அமைச்சருடனும் கதைத்திருந்தேன். ஆனால், நேற்று முன்தினம் அவர்களை வீதியில் விட்டிருப்பதை நான் பார்த்தேன். எவ்வளவு மனச்சாட்சியற்ற ஒரு செயலை நீங்கள் செய்திருக்கின்றீர்கள் என்று சற்று யோசித்துப் பாருங்கள்! அது சம்பந்தமாக அந்த 170 பேருக்கும் கொடுக்கப்பட்ட உத்தரவாதத்தை எப்போது நிறைவேற்றுவீர்கள் என்பதை இங்கு சொல்லவேண்டுமென்று எதிர்பார்க்கிறேன்.

இரண்டாவது விடயம், யாழ்ப்பாணம் போதனா வைத்தியசாலையின் drugstore தீப்பற்றி எரிந்தது உங்களுக்குத் தெரியும். கடந்த 10 - 15 வருடங்களாக அங்குள்ள drugsஐ Northern Hospitalக்கு டாக்டர் கிருஷாந்தி மற்றும் டாக்டர் சத்தியமூர்த்தி ஆகியோர் கொண்டுசென்று கொடுக்கின்றார்கள் என்று நான் தொடர்ச்சியாகக் கத்திக் கத்திச் சொன்னபோதும் நீங்கள் நம்பவில்லை. கடைசியாக 'சுவஸ்தா'ஐச் செயற்படுத்தப் போகும் நேரத்தில்தான் drugs storeஐ எரித்திருக்கின்றார்கள். CCTV camera அனைத்தும் ஒரு கிழமைக்கு முன்பிருந்தே இயங்கவில்லை என்று நிறுத்தி வைத்திருக்கின்றார்கள். உங்களுடைய CID என்ன செய்கின்றது என்று எனக்குத் தெரியவில்லை ஐயா!

அத்துடன், தெல்லிப்பளை வைத்தியசாலையில் appointment இன்றிக் கடமையாற்றும் கிருஷாந்தி என்ற டாக்டருக்கு எதிராகவும் அவர் முறையற்ற வழிகளில் காசு சேர்த்தமைக்கு எதிராகவும் உரிய நடவடிக்கை எடுக்குமாறு சனாதிபதி செயலகத்தினூடாகச் சுகாதார அமைச்சுக்கு கடிதம் ஒன்று அனுப்பப்பட்டுள்ளது. நீங்கள் விசாரணையை ஆரம்பித்திருக்கின்றீர்கள்; எனினும் அது மிக மெதுவாக நடைபெறுகிறது. இந்த விடயங்கள் தொடர்பாக CIDஇலும் முறைப்பாடு செய்யப்பட்டுள்ளது. எங்களுடைய கௌரவ பிரதமர் அவர்கள் கூறியிருந்தார், அதற்குரிய நடவடிக்கை எடுக்கப்படும் என்று. அதையும் நீங்கள் செய்வீர்கள் என்று எதிர்பார்க்கின்றேன். வடக்கு மாகாணத்தில் இப்படி எத்தனையோ பிரச்சினைகள் இருக்கின்றன.

அதைவிட, மாஞ்சோலை வைத்தியசாலையில் ஒரு குழந்தை உயிரிழந்தது. அதனுடைய post-mortem reportகூட இன்றுவரை கிடைக்கவில்லை. எனக்கு இந்த சுகாதார அமைச்சின் மீதும், கௌரவ சுகாதார அமைச்சர் மற்றும் கௌரவ பிரதி அமைச்சர் மீதும் மிகப்பெரிய நம்பிக்கை இருக்கிறது.

මම එය සිංහලෙන් කියන්නම්; කලවමේ කියන්නම්. ඔබතුමන්ලා යටතේ වැඩ කරන නිලධාරින් ගැන ඔබතුමන්ලා දැනුවත් වෙන්න ඕනෑ. ඔන්න, Director General of Health Services - DGHS - ලියුමක් ගහනවා, කපිල වන්ද්‍රසේනගේ මරණය පිළිබඳව සැකයක් තිබෙනවා කියලා. ඔබතුමන්ලා ඒවා බලන්නේ නැද්ද? DGHS කලින් වැඩ කළේ කාටද? දැන් ඉන්න DGHS, අසේල ගුණවර්ධන කලින් හිටියේ Kalubowila Hospital එකේ Director හැටියට. ඔහු කොහොමද එක පාරටම ආවේ, DGHS වෙලා? DGHSලාට appointments දෙන්නේ කැබිනට් මණ්ඩලයෙන්. කරුණාකරලා 2014.10.11 Gazette Extraordinary එක අරගෙන බලන්න. Cabinet approval එකෙන් පත් කරන්නේ. මතක තබා ගන්න, ඔබතුමන්ලාගේ ආණ්ඩුව වැටෙනවා නම් වැටෙන්නේ අන්න අර DGHS වාගේ පොරක් එහෙම නැත්නම් අර College of Medical Administrators of Sri Lanka - CMAS - එකේ අනුෂිකා ජයතිලක වාගේ පොරවල් නිසායි. ඒ අය තමයි ඔබතුමන්ලා බිමට දාන්නේ. බලන්නකෝ, Batticaloaවල doctorsලා, MSලා නැහැ. Hospitals තුනක MSලා නැහැ. Director retire වෙන්න යනවා. Senior administration post එකක් call කරලා තිබෙනවා. පොඩ්ඩක් ඒවා ගැන හිතලා බලන්න. ඔබතුමන්ලාගේ ආයතනවල වැඩ කරන නිලධාරින් ගැන පොඩ්ඩක් දැනුවත් වෙන්න.

මට ගොඩක් කාරණා කියන්න තිබෙනවා. නමුත්, මම ඒවා කියන්න කැමැති නැහැ. හැබැයි, මම එක ඉල්ලීමක් කරනවා. උතුරේ ගබඩා සම්පූර්ණයෙන්ම පුච්චපු එක ගැන ඔබතුමන්ලා inquiry එකක් කරලා තිබුණා නම් කරුණාකරලා ඒ ගැන පාර්ලිමේන්තුවට කියන්න. මට ඒ ගැන තොරතුරක් දෙන්න පුළුවන්. මේක අර කන්ටේනර් 323 කථාව වාගේ නොවෙයි. ඒ hospital එකේ බඩු අරගෙන ගිය විධිය ගැන මට කෙළින්ම තොරතුරක් දෙන්න පුළුවන්. Northern Provinceවල hospital එකට "SWASTHA" හඳුන්වා දීලා කොච්චර කාලයක්ද? මම පේරාදෙණියේ හිටපු කාලයේ තමයි "SWASTHA" හඳුන්වා දුන්නේ. අපිම තමයි ඒක කර ගත්තේ. මම තමයි MO (Planning), Peradeniya Teaching Hospital එකේ. අපි Peradeniya Teaching Hospital එකේ තමයි sample hospital එකක් විධියට එය කළේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මම අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

"SWASTHA" තවම උතුරේ ක්‍රියාත්මක කරලා නැහැ. MSD එකේ කට්ටිය බඩු ගණන් කරන්න එනකොට ගබඩා පුච්චලා. බිලියන ගණනක් වටිනා බඩු කොච්චර නැති වුණාද? බැරි වෙලා හරි මම සිගරැට් එකක් බීලා පාර්ලිමේන්තුව පිච්චුණා නම්, ඊට වඩා මම හිතන්නේ හානියක් මේ ගබඩා පිච්චුණු එකෙන් සිදු වෙලා තිබෙනවා. කරුණාකරලා ඒකට උත්තර දෙන්න. කරුණාකරලා ඇමතිවරුයි, නියෝජ්‍ය ඇමතිවරුයි දැනගන්න ඔබතුමන්ලා යටතේ වැඩ කරන මිනිසුන් කොහොමද වැඩ කරන්නේ කියලා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 3ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.34]

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි. ඇත්තවශයෙන්ම මේ යෝජනාව ඉදිරිපත් කිරීම ගැන අපේ ගරු අමිල ප්‍රසාද් තරුණ මන්ත්‍රීතුමාටත් මම ස්තුතිවන්ත වෙනවා.

இன்று primary healthcare சம்பந்தமாக எல்லா இடங்களிலும் பிரச்சினைகள் காணப்படுகின்றதென நான் நம்புகின்றேன். முக்கியமாக, சாய்ந்தமருது Divisional Hospitalஇல் தற்பொழுது 2 வைத்தியர்களுக்கான வெற்றிடம் நிலவுகின்றது. அதை நிரப்புவதற்கு எந்த நடவடிக்கையும் எடுக்கப்படவில்லை. இதற்கு முக்கிய காரணம் என்னவென்றால், மிகத் திறமையாகச் செயற்பட்டு வந்த அந்த வைத்தியசாலையின் அபிவிருத்திக் குழுவானது, திடீரென இந்த அரசாங்கத்திலுள்ள ஒருசில பாராளுமன்ற உறுப்பினர்களின் தேவையின் அடிப்படையில் அரசியல்மயப் படுத்தப்பட்டு, கல்முனை வடக்கு வைத்தியசாலையில் இருக்கின்ற தமக்குத் தேவையான ஒருவரை அந்த வைத்தியசாலையின் அபிவிருத்திக் குழுவின் தலைவராக நியமித்திருப்பதுதான். இப்பொழுது அங்கே அரசியல் செய்யப்படுகின்றது. மிகவும் மனவருத்தத்துக்குரிய விடயம் என்னவென்றால், அரசியல் மயப்படுத்தப்பட்ட அந்தக் கடிதத்தை கௌரவ அமைச்சர் அவர்களுடைய கவனத்துக்கு சரியாகக் கொண்டுவராமல், அவருடைய கையொப்பம் ஊடாக ஏற்கெனவே இருக்கின்ற ஆளுநரால் அங்கீகரிக்கப்பட்ட அந்த அபிவிருத்திக் குழுவை அரசியல் செய்வதற்காக மாற்றி இருப்பதுதான். இதன் ஒரு வெளிப்பாடாகத்தான் தற்பொழுது அங்கு நிலவுகின்ற வெற்றிடங்களை நிரப்ப முடியாமல் உள்ளது. அதுமாத்திரமல்ல, அந்த வைத்தியசாலை திறம்படச் செயற்பட முடியாத நிலையும் ஏற்பட்டிருக்கிறது. I think that is something that the Hon. Minister must take serious note of.

Hon. Presiding Member, there is something called the "Manual for the Management of Primary Medical Care Units" and it speaks especially about community participation in the management of the hospital. So, it is in that context that Hospital Development Committees are established. When a Hospital Development Committee is established, it is very important - it is also the tradition and the accepted thing so far - that the Head of that hospital becomes the President of that Committee. That particular Member of Parliament did not like that person heading that Committee and he is trying to bring his own person and put him there. That is the sole intention. We would have heard such things under the previous Government. So, I was surprised that this particular Government, which is very keen on changing the system, has followed that same system.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
I am going to wind up, Sir.

Therefore, I beg the Hon. Minister to look into this matter. - *[Interruption.]* Sir, tell the Hon. Member not to disturb me. This is the Debate on the Adjournment Motion and he has no business to disturb me. His indecent behaviour should absolutely be stopped! I beg the Hon. Minister to go into this matter and give us relief.

Thank you very much.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.38]

**ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சந்தருவன் மதரசிங்ஹ)
(The Hon. (Dr.) Sandaruwan Madarasinghe)
මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බෙහෙවින්ම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මීට අවුරුදු එකහමාරකට විතර කලින් අපි මේ රට භාර ගත් වෙලාවේ තිබුණේ දියුණු සෞඛ්‍ය පද්ධතියක් නොවෙයි. රට බිඳ වැටිලා තිබුණා වාගේම සෞඛ්‍ය පද්ධතියත් බිඳ වැටිලා තිබුණේ. ඒ නිසා අපට අභියෝග රැසක් මැදින් තමයි මේ සෞඛ්‍ය පද්ධතිය ඉහළට ගැනීම කරන්න වෙන්නේ. විශේෂයෙන්ම අපි දස අවුරුදු සැලැස්මක් ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වනවා. සෞඛ්‍ය සම්බන්ධයෙන් මානව සම්පත දියුණු කරන්නේ කොහොමද, භෞතික සම්පත් දියුණු කරන්නේ කොහොමද, ලෝකයේ අලුත් තාක්ෂණය අපේ සෞඛ්‍ය පද්ධතිය ඇතුළට ගෙනෙන්නේ කොහොමද, ඒ වාගේම disease pattern එක කොහොමද වෙනස් වෙන්නේ, දේශගුණික තත්ත්වයන් එක්ක සෞඛ්‍ය පද්ධතිය යාවත්කාලීන කර ගන්න ඕනෑ කොහොමද කියන කාරණා සියල්ල සැලකිල්ලට ගෙන තමයි ආණ්ඩුව විධියට අපි වැඩ කටයුතු කරමින් යන්නේ.

අපි විශේෂ අවධානයක් යොමු කළා, රෝහල් කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන්. මම ඒ සම්බන්ධයෙන් කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න කැමැතියි. ඒ අනුව අපි රජය විධියට cadre revision එකක් මේ වනකොට කරගෙන යනවා. එහිදී අපි බලාපොරොත්තු වනවා, දැනට විවිධ ඒකක රෝහල්වලට එකතු වීමත් එක්ක කාර්ය මණ්ඩල ප්‍රමාණය - cadre එක - වැඩි කර ගන්න. ඒ සඳහා අවශ්‍ය ප්‍රමාණය විද්‍යාත්මකව සැලකිල්ලට ගෙන එය නිර්ණය කරලා, ඒ ප්‍රමාණය රෝහල්වලට බෙදා ලබා දෙන්නත් අපි බලාපොරොත්තු වනවා.

විශේෂයෙන් වෛද්‍යවරුන් ගත්තොත්, දැනට 22,000කට ආසන්න වෛද්‍යවරුන් ප්‍රමාණයක් තමයි රෝහල්වල කාර්ය මණ්ඩලය විධියට කටයුතු කරන්නේ. මේ අවුරුදු එකහමාරකට ආසන්න කාලය තුළ පශ්චාත් සීමාවාසික පත්වීම් ලද වෛද්‍යවරුන් 2,171ක් ඉන්නවා. ඒ වාගේම පත්වීම් ලබන්න බලාපොරොත්තුවෙන් වෛද්‍යවරුන් 1,432කුත්, සීමාවාසික වෛද්‍යවරුන් විධියට දැනට 2,159කුත්, සීමාවාසික පත්වීම් ලැබීමට බලාපොරොත්තුවෙන් 2,371කුත් ඉන්නවා. මේ ආදී වශයෙන් ගත්තාම 8,000කට ආසන්න වෛද්‍යවරුන් සංඛ්‍යාවක් මේ අවුරුදු එකහමාර තුළ අපි රෝහල් පද්ධතියට එකතු කර තිබෙනවා. ඒ කියන්නේ, 22,000ක්, 23,000ක් විතර ඉන්න මුළු වෛද්‍යවරු සංඛ්‍යාවෙන් තුනෙන් එකකට වඩා වැඩි ප්‍රමාණයක් අපි රෝහල් පද්ධතියට මේ අවුරුදු එකහමාරක වාගේ කාලය ඇතුළත එකතු කර තිබෙනවා.

ඒ වාගේම වෛද්‍ය විද්‍යාලවලට බඳවා ගනු ලබන වෛද්‍යවරුන් සංඛ්‍යාව වසරෙන් වසර - ඇත්තටම අඩු වෙනවා නොවෙයි - වැඩි කරගෙන තමයි යන්නේ. එමෙන්ම අපට විශේෂඥ වෛද්‍යවරුන් 3,200කට ආසන්න ප්‍රමාණයක් අවශ්‍යයි. දැනට 2,500ක පමණ සංඛ්‍යාවක් සේවයේ නිරත වෙලා ඉන්නවා. තවත් 1,000කට ආසන්න සංඛ්‍යාවක් ඔවුන්ගේ පුහුණුව අවසන් කරලා සේවයට එකතු වෙන්න නියමිතයි. එතකොට මේ හිඟය ඉදිරියේදී අපට මඟ හරවා ගන්න පුළුවන්.

ඒ වාගේම මේකට තාවකාලික පිළියමක් වශයෙන් වෛද්‍යවරු විශ්‍රාම යන සීමාව වයස අවුරුදු 63 දක්වා අපි දීර්ඝ කර තිබෙනවා. ඒ වාගේම රජය වශයෙන් අපි කටයුතු කරමින් ඉන්නවා, අලුතින් එකතු වන විශේෂඥ වෛද්‍යවරුන් දැනට පුරප්පාඩු සහිත රෝහල්වලට යොමු කර ගැනීම සඳහා.

ඒ වාගේම හෙද නිලධාරීන් ගත්තොත්, රජය වශයෙන් 2025-2029 කාලය ඇතුළත 13,600ක පමණ ප්‍රමාණයක් හෙදියන් වශයෙන් හෙද සේවයට බඳවා ගන්න සැලසුම් කරමින් ඉන්නවා. දැනට අපි interviews සඳහා කැඳවා තිබෙනවා, 3,000ක් පමණ. ඒ වාගේම හෙද විද්‍යාලවල තවත් 7,500ක් පමණ පුහුණුව ලබමින් ඉන්නවා. මේ විධියට අපි බලාපොරොත්තු වනවා, කාර්ය මණ්ඩලවල හිඟයක් පවතිනවා නම් ඒ හිඟය මඟ හරවා ගැනීමට.

මෙහිදී විශේෂයෙන් අවධානය යොමු කර තිබුණා, සේවකයන් බඳවා ගැනීමේදී රජය බලපෑම් කරනවාද කියන එක සම්බන්ධව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂ නායකතුමා ඒ කාලයේ ගස් යටට ගිහිල්ලා "උස නම් සිකියුරිටි - මිටි නම් කම්කරු" කියලා විද්‍යාත්මක පදනමකින් තමන්ගේ පක්ෂයට වැඩ කරපු අය තනතුරු සඳහා බඳවා ගත්තා අපට මතකයි. අන්තර්ජාලයේ සමහර වීඩියෝ පළ වෙලා තිබුණා, "ඔයා polling booth එකට ගියාද, ඔයා මගේ meetings සංවිධානය කළාද?" කියලා අහන. එහෙම අහලා තමයි රජයේ රස්සා සඳහා පිරිස බඳවා ගැනීම කළේ. නමුත්, අපි සම්පූර්ණයෙන් ඒ ක්‍රමවේදයට පරිබාහිරව තමයි කටයුතු කරන්නේ. සාමාන්‍යයෙන් අපි applications දාන ඔක්කෝම interview එකට ගෙන්වන්නේ නැහැ. ඒ applicationsවලිනුත් යම් පිරිසක් තෝරා ගැනීමට ලක් කරනවා. එහෙම තෝරා ගැනීමකට ලක් කරපු පිරිසක් interview එකට ගෙන්වලා, ඒකෙනුත් සුදුසුම පිරිස තමයි අපි මොන තනතුරට බඳවා ගත්තත් බඳවා ගන්නේ. විශේෂයෙන් මේ දවස්වල කාර්ය සහායක පුරප්පාඩු සඳහා 2,000කට ආසන්න ප්‍රමාණයක් බඳවා ගන්නවා. අපි ඒ applications දාපු අයගෙන් සුදුසුම පිරිස මිසක්, එහෙම නැතිව උසද, මිටිද, මොන පක්ෂයේද, අපිට වැඩ කළාද, අපේ meetings සංවිධානය කළාද කියලා බලලා බඳවා ගැනීමක් සිද්ධ කරන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට ඖෂධවල තත්ත්වය ගත්තොත්, අපි බලයට පත් වෙන මොහොත වනකොට රට ඇතුළේ ඖෂධවල විශාල හිඟයක් තිබුණා. වැඩි දෙයක් නොවෙයි, අපට ගෙන්වන ඖෂධ ප්‍රමාණය ගබඩා කරගන්න ගබඩා පහසුකම්වත් තිබුණේ නැහැ. ඒ වාගේම අපේ ඖෂධ පර්යන්තය වෙත ප්‍රවාහනය කරන්න ප්‍රවාහන පහසුකම් හරියට තිබුණේ නැහැ. ඉතින්, අපට විශාල අභියෝගයක් තිබෙනවා. ඖෂධ හිඟය මඟ හරවා ගැනීම, ගුණාත්මක ඖෂධ ගෙන්වා ගැනීම, ඒවා ගබඩා කරගැනීම, ඒවා රෝහල් සඳහා ප්‍රවාහනය කිරීම ඇතුළු සියලු දේ සඳහා අපි මේ වෙනකොට කටයුතු කරමින් ඉන්නවා. අපි හිතනවා, මේ සැලසුම් ඔස්සේ යනකොට සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ තත්ත්වය, ඖෂධවල තත්ත්වය, රෝහල්වල තත්ත්වය වාගේම රටේ සෞඛ්‍ය තත්ත්වය දැන් පවතින තත්ත්වයට වඩා ක්‍රම ක්‍රමයෙන් උඩට ගෙනැල්ලා ලෝකයේ දියුණු සෞඛ්‍ය සේවාවක් ඇති රටක් බවට ලංකාව පත් කරන්න මේ රජයට හැකි වෙයි කියලා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (වෛද්‍ය) හංසක විජේමුණි නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.44]

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Hansaka Wijemuni - Deputy Minister of Health)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කළ යෝජනාව තුළින් මෙවැනි ප්‍රශ්නාවලියක් ඉදිරිපත් කිරීම ගැන ගරු අමිල ප්‍රසාද් මන්ත්‍රීතුමාට මම ස්තුතිවන්ත වෙනවා. එතුමා ප්‍රශ්න ගණනාවක් අහලා තිබුණා.

මම මුලින්ම කියන්න ඕනෑ health system එක කියන්නේ බොහොම පරිස්සමින් ගොඩනහා ගන්න ඕනෑ සහ මඟ පෙන්වන්න ඕනෑ ක්ෂේත්‍රයක් බව. අපි සම්පූර්ණයෙන්ම විද්‍යාත්මක පදනමකින් තමයි ඒකට අවතීර්ණ වෙන්නේ සහ පවත්වාගෙන යන්නේ. අමාත්‍යාංශය විධියට අපට වැඩකටයුතු කරගෙන යාමට දස අවුරුදු සැලැස්මක් තිබෙනවා. ඒ සැලැස්ම ක්‍රියාත්මක කර ගැනීම සඳහා අපට Strategic Plan එකක් හදලා තිබෙනවා. ඒ Strategic Plan එක ඇතුළේ තමයි අපි වැඩ කරගෙන යන්නේ. එහෙම වැඩ කරගෙන යනකොට සෞඛ්‍ය කියලා කියන්නේ නිකම්ම නිකම් බිල්ඩින් හදන කටයුත්තක් නොවෙයි, එහෙමත් නැත්නම් රෝගීන්ට බෙහෙත් දෙන එකක් නොවෙයි. ඒක ඇතුළේ ලොකු සංකල්ප ප්‍රමාණයක් තිබෙනවා. රෝග වළක්වා ගැනීමේ ඉඳලා, රෝගයක් ඇති වෙලා ඉතාම අසාධ්‍ය තත්ත්වයට පත් වෙච්ච රෝගියාට අවශ්‍ය පහසුකම් සැලසීමේ ඉඳලා, එයින් පසු තත්ත්වයන් පවා කළමනාකරණය කිරීමට අවශ්‍ය වටපිටාව සැකසීම තමයි සෞඛ්‍ය අමාත්‍යාංශය විධියට අපේ වගකීම වන්නේ. අපි ලොකු range එකක වැඩ කරනවා.

රෝහල් පද්ධතිය ගත්තොත්, ඒ තුළ අපට plan එකක් තිබෙනවා, මේ අවුරුදු පහ තුළ මේකේ බිල්ඩින් හැදෙන්නේ කොහොමද, මේකට බඳවා ගැනීම් කරන්නේ කොහොමද, මේකට අවශ්‍ය උපකරණ සකසන්නේ කොහොමද කියලා. මේ සියල්ල අතර යම් අන්තර් කළමනාකරණයක් සහිතවයි අපි මේ ඔක්කෝම plan කරමින් යන්නේ. ඒ වාගේම ඔබතුමන්ලා දන්නවා, ඉතිහාසයේ වෙන් කරපු වැඩිම මුදල් ප්‍රමාණය අපි සෞඛ්‍ය අංශය වෙනුවෙන් වෙන් කර තිබෙන බව.

අපේ මන්ත්‍රීතුමා ඉදිරිපත් කළා, වෛද්‍යවරුන්ගේ හිඟයක් තිබෙනවා, ඒ වාගේම nursesලාගේ හිඟයක් තිබෙනවා කියලා. ඔව්. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සිටින සියලුම කාර්ය මණ්ඩලවල හිඟයක් තිබෙනවා. ඒ හිඟය එක සැරේට මතු වෙච්ච කාරණයක් නොවෙයි. ඒක කාලයක් තිස්සේ ක්‍රම ක්‍රමයෙන් වර්ධනය වෙච්ච තත්ත්වයක්. එහෙම තත්ත්වයක් වර්ධනය වෙන්නේ අපේ සෞඛ්‍ය පද්ධතිය ප්‍රසාරණය වුණේ පොදු, විධිමත් සංවර්ධිත සැලැස්මකට අනුව නොවන නිසා. එම නිසා නොයෙකුත් ආකාරයේ අඩු පාඩු තිබෙනවා.

වෛද්‍යවරුන් ගත්තොත්, දැනට 22,623ක් ඉන්නවා. 2025 සහ 2026 අවුරුදු ඉවර වෙනකොට නවක වෛද්‍යවරු 8,133ක් බඳවා ගැනීමට නියමිතව තිබෙනවා. එතකොට දැනට සිටින

[ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා]

වෛද්‍යවරුන්ගේ ගණනින් තුනෙන් එකක් අපි නැවත බඳවා ගන්නවා. මම හිතන විධියට, දැන් හොඳටම පැහැදිලියි, කොහොමද තත්ත්වය කියලා.

ඒ වාගේම හෙද හෙදියන් ගත්තොත්, 40,000ක් ඉන්නවා. අපි plan කරලා තිබෙනවා, තව 13,000ක් බඳවා ගන්න. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ඉන්න වෛද්‍යවරුන් සහ හෙදියන් කියන අය වාගේම අපට අවශ්‍ය අනෙකුත් තාක්ෂණික ශිල්පීන් ගත්තොත්, ඒ අය අපි අද හිතලා හෙට ගිහිල්ලා කොහෙන්වත් ගන්න පුළුවන් පිරිසක් නොවෙයි. එම නිසා ඒ අය වඩාත් සැලසුම් සහගතව අපි බිහි කළ යුතුව තිබෙනවා. දළ වශයෙන් ගත්තොත්, දැනට වෛද්‍යවරුන් අවුරුද්දකට 2,500ක වාගේ ප්‍රමාණයක් අපේ system එකට එකතු වෙනවා. ඒ තුළ වෛද්‍යවරුන්ගේ හිඟය අපිට බොහොම මැතකදීම පියවා ගන්න පුළුවන් බව අපට පෙනෙනවා. නමුත් අපි වෛද්‍යවරු බඳවා ගැනීම දිගින් දිගටම කරනවා. ඊකට හේතුව ප්‍රමාණාත්මක සේවයක් වාගේම සේවයේ ගුණාත්මකභාවය ගැනත් අපි දැඩි අවධානය යොමු කර තිබීමයි. ඒ නිසා වෛද්‍යවරු බඳවා ගැනීම දිගටම කරගෙන යැමෙන් අපි බලාපොරොත්තු වෙනවා, මේ සේවය ප්‍රමාණාත්මක සහ ගුණාත්මක සේවයක් බවට පරිවර්තනය කරගන්න.

ඒ වාගේම, අනෙකුත් සියලු කාර්ය මණ්ඩලවලත් හිඟයක් තිබෙනවා. ඒ හිඟය පියවා ගැනීම සඳහාත් අපි පැහැදිලි වැඩ පිළිවෙළක් තුළ කටයුතු කරගෙන යනවා. මේකෙදි වෛද්‍යවරුන් කොච්චර ඕනෑද, nursesලා කොච්චර ඕනෑද, අනෙකුත් කාර්ය මණ්ඩලය කොච්චර ඕනෑද කියන එක තීරණය කරන්නේ ඒ අවශ්‍ය cadre revision එකක් කරලා. නමුත් අවාසනාවකට වාගේ, අපේ තිබ්බ cadre revisions ගොඩක් අසාර්ථක වෙලා තිබෙනවා. ඒක නිසා අපි සෞඛ්‍ය අමාත්‍යාංශය, මුදල් අමාත්‍යාංශය සහ අනෙකුත් සියලු ආයතන එකතු කරලා කමිටුවක් පත් කරලා මේ cadre revision එක විද්‍යාත්මක පදනමක් ඇතුව ගොඩනැඟීම සඳහා වූ පුළුල් සාකච්ඡාවක් කරගෙන යනවා. දැන් එය අවසන් අදියරේ තිබෙන්නේ. තව මාසයක් ඇතුළත අපිට හරියටම බලන්න පුළුවන්, එක් එක් වසරවල මේ මේ රෝහල්වලට කොච්චර cadre එකක් ඕනෑද කියන එක.

ඖෂධ සම්බන්ධව ගත්තොත්, මම හිතන විධියට, දැනට ඖෂධ හිඟයක් ගැන ලංකාවේ බොහොම අඩුවෙන් තමයි කථා වෙන්නේ. මොකද, ඖෂධ සම්බන්ධව වූ බොහෝ කාරණා අපි විසඳලා තිබෙනවා. නමුත් අපි දන්නවා, යම් යම් හිඟවීම් ඇති වෙන්න පුළුවන් කියලා. ඒක ලෝකයේ ඕනෑම තැනක වෙන්න පුළුවන් එකක්. ඒ වාගේම, supply chainsවල ප්‍රශ්න ඇති වෙන්න පුළුවන්. නමුත් ඒ අවස්ථාවලට මුහුණ දෙන්නේ කොහොමද කියන එක අපි සාකච්ඡා කරමින් තිබෙනවා. අපි ඒකට අවශ්‍ය විසඳුම් සොයමින් ඉන්නවා. ඒ වාගේම, ඖෂධ මිලදී ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂම කර ගැනීම සඳහා අපි ආසියානු සංවර්ධන බැංකුවේ ආධාර ඇතුව විධිමත් නව වැඩ පිළිවෙළක් සකසා තිබෙනවා. ඒ සාකච්ඡාවත් අවසන් අදියරේ තමයි තිබෙන්නේ. ඒ වාගේම, මේ සියලු ආයතන අන්තර් සම්බන්ධීකරණය කරගන්න, ඒක digitalize කරන්න, ඒවා අතර සම්බන්ධතා දියුණු කරගන්න අවශ්‍ය වැඩ පිළිවෙළ අපි ක්‍රියාත්මක කර තිබෙනවා. ඒ වාගේම, අපි ඖෂධ සමාලෝචන කමිටුව හැම සතියකට සැරයක්ම අපේ අමාත්‍යාංශයේ පවත්වනවා. මේ මොහොතෙත් ඒක පැවැත්වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඖෂධ සම්බන්ධව වූ ගැටලු විසඳීම සඳහා අපි තාක්ෂණය උපරිම වශයෙන් යොදා ගන්නවා. අපි "ස්වස්ථ" පරිගණක පද්ධතිය - "SWASTHA" software එක - යොදාගෙන සියලු රෝහල් ආවරණය කරමින් යනවා. අර්චුනා මන්ත්‍රීතුමා කියපු විධියට තව දේවල් අපිට කරන්න තිබෙනවා. මොකද, සමහරු systemsවලට පොඩ්ඩක් කැමැති නැහැ. නමුත් අපි අනිවාර්යයෙන්ම ඒක කරනවා. ඒ වාගේම, ඒක දැනට hospitalsවල drugstore level එකේ තිබෙන්නේ. අපි ඒක එතැනින් පහළට ගේනවා. එසේ ගෙනැල්ලා වාට්ටු මට්ටමේ සහ OPD මට්ටමේ systemවලට ඒක දානවා. ඒ නිසා ලංකාවේ ඕනෑ කෙනෙකුට අපේ රටේ තිබෙන drugs, නැති drugs ගැන බොහොම විනිවිදභාවයකින් බලන්න පුළුවන්.

ඊළඟට, අපි බෙහෙත් මිලදී ගැනීම සඳහා සහ ශල්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා ඉතිහාසයේ වෙන් කරපු දැවැන්තම මුදල වෙන් කර තිබෙනවා. ඒක රුපියල් බිලියන 185ක මුදලක්. ඒ වාගේම, බාහිර ෆාමසිවල ඖෂධවේදීන් සම්බන්ධ ප්‍රශ්නයක් තිබෙනවා. විශේෂයෙන්ම සමහර ෆාමසි හිමිකරුවන් විසින් ඒක කියනවා. නමුත් අපේ ගණනය කිරීම් අනුව දැනට රැකියාවක් නොකරන උපාධිධාරි සහ ඩිප්ලෝමාධාරි pharmacistsලා 600ත්, 700ත් අතර ප්‍රමාණයක් අපේ ලංකාවේ ඉන්නවා. ඒ නිසා ඒ ෆාමසිවලට අපි කියනවා, ඔවුන්ගේ සේවය ලබාගන්න; උපාධිධාරින්ගේ සේවය ලබාගන්න, ඩිප්ලෝමාධාරින්ගේ සේවය ලබාගන්න කියලා. ඒ වාගේම, අපි ඩිප්ලෝමාධාරින් තව තව වැඩි කිරීම සඳහාත්, උපාධිධාරින් තව තව වැඩි කිරීම සඳහාත් ක්‍රමවේද යොදා තිබෙනවා. විශේෂයෙන්ම ඩිප්ලෝමාධාරින් බඳවා ගැනීමේ විභාගයේ ප්‍රශ්න තිබෙනවා. මොකද, ඒකේ failure rate එක හොඳටම වැඩියි. ඒක අඩු කිරීම සඳහා අපි විකල්ප ක්‍රම යෝජනා කර තිබෙනවා. ඒක බොහෝදුරට මේ අවුරුද්දේ ඉඳලා ක්‍රියාත්මක වේවි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி)
(The Hon. (Dr.) Hansaka Wijemuni)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඊළඟට, ප්‍රාථමික වෛද්‍ය මධ්‍යස්ථානවල ප්‍රගතිය ගත්තොත්, අපි දැනට "ආරෝග්‍යා" මධ්‍යස්ථාන පිහිටුවා ගෙන ගියත් ඒවායේ ප්‍රගතිය එහෙම බලන්න බැහැ. මොකද, අඩුම ගණනේ තව මධ්‍යස්ථාන 500ක්, 600ක්වත් පටන් ගත්තාට පසුව තමයි අපට ඒවායේ ප්‍රගතිය බලන්න පුළුවන් වන්නේ. නමුත් ඒවායේ ප්‍රගතිය මේ level එකේදී බැලීම සඳහා අවශ්‍ය tools අපි හදලා තිබෙනවා. ඒ අනුව අපි ප්‍රගතිය බලාගෙන යනවා. නමුත් අපි මේ අවස්ථාවේ කියන්න සතුටුයි, අප අපේක්ෂිත වූ targetsවලට එම මධ්‍යස්ථාන පැමිණ තිබෙන බව.

ඒ වාගේම සේවක පුරප්පාඩු ගැනත් කථා කළ යුතුයි. කවුරුත් දන්නවා, කොහොමද මෙච්චර කල් සෞඛ්‍ය අමාත්‍යාංශයට බඳවා ගැනීම් කළේ කියලා. එක කාලයක් බඳවා ගත්තා, පොළොන්නරුවෙන්; එක කාලයක් බඳවා ගත්තා, කළුතරින්; එක කාලයක් බඳවා ගත්තා, රත්නපුරෙන්. ඒ මිනිසුන්ට ගම්වලට transfers දෙන එක තමයි අපට දැන් තිබෙන ලොකුම ප්‍රශ්නය. අපි එහෙම කරලා නැහැ. අපි ලංකාවේ පළමුවැනි වතාවට කනිෂ්ඨ සේවකයන් බඳවා ගැනීම සඳහා ගැසට් එකක් නිකුත් කළා. මෙච්චර කල් මොකක්ද කළේ? අමාත්‍යාංශය ඉස්සරහ කොළ කෑල්ලක ලියලා ගැහුවා, "සේවකයන් බඳවා ගනු ලැබේ" කියලා. මන්ත්‍රීවරුන්ගේ list එකට නොවෙයි, ඇමතිවරයාගේ list එකට

විතරයි ගත්තේ. අඩු ගණනේ නියෝජ්‍ය ඇමතිවරයාගේ list එකටවත් ගත්තේ නැහැ. එහෙම තමයි පත්වීම් දුන්නේ. මේ වතාවේ අපි තමයි දිස්ත්‍රික්ක මට්ටමින් පත්වීම් දෙන්නේ. ඒ වාගේම, අපේ කිසිදු ආකාරයේ සම්බන්ධතාවක් නැතුවයි එම පත්වීම් දෙන්නේ. නමුත් ගරු මන්ත්‍රීතුමනි, හැමෝම interviewවලට කැඳවන්න බැරි ප්‍රශ්නයක් තිබෙනවා. අපට බඳවා ගන්න පුළුවන් 1,900යි. නමුත් applications 102,000ක් ඇවිල්ලා තිබෙනවා. මේකේ නොයෙකුත් ආකාරයේ අඩුපාඩු තිබෙන්න පුළුවන්. අපිත් අධීක්ෂණය කරමින් යනවා, මේකේ මොකක් හරි අඩුපාඩුවක් සිද්ධ වෙනවාද කියලා. නමුත් අපේ listsවලට බඳවා ගැනීමක් එතැනදී සිද්ධ වන්නේ නැහැ. ඒ වාගේම, රෝහල් කමිටු ගැනත් ගරු මන්ත්‍රීතුමා කිව්වා. රෝහල් කමිටු පත් කිරීම සම්පූර්ණයෙන්ම නීත්‍යනුකූල ක්‍රියාවලියක් තුළ සිදු වෙන්නේ. නමුත් එහි යම් අසාධාරණයක් වෙලා තිබෙනවා නම් අපට ඒ ගැන සලකා බලන්න පුළුවන්. ඒ වාගේම ප්‍රදේශයේ ජනතාව කියනවා නම්, යම්කිසි කෙනෙකු රෝහල් කමිටුව තුළ ඉන්න ඕනෑ කියලා, අපට ඒ පිළිබඳවත් සලකා බලන්න පුළුවන්.

ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමා කියපු, යාපනය රෝහලේ drugstore එක ගිනි ගැනීම ඉතාම serious තත්ත්වයක්. එය digitalize කරන වෙලාවේ නම් ඒක වුණේ, ඒක ඊටත් වඩා serious තත්ත්වයක්. එතුමා පෞද්ගලිකවම අමාත්‍යාංශයට ඇවිල්ලා ඒ ගැන පැමිණිලි කළා. මම ඒ වෙලාවේම පරීක්ෂණයක් ඉල්ලුවා. අපි එහි ප්‍රගතිය පුළුවන් තරම් ඉක්මනට බලාපොරොත්තු වෙනවා.

අවසාන වශයෙන් කියන්න තිබෙන්නේ, සෞඛ්‍ය අමාත්‍යාංශය විධියට අපි වඩාත් විධිමත්, වඩාත් සංවිධානාත්මක ගමනක් යන බවයි. ඒ වාගේම ඒ සංවිධානාත්මක ගමන කොයි තරම් සාර්ථකද කියන එක හැම වෙලාවේම අපේ toolsවලින් අපි මනිනවා. අපි හිතනවා, රටක් විධියට වඩාත් හොඳ සෞඛ්‍ය සේවයක් ලබා දීමට අවශ්‍ය සියලුම පියවර ගන්න අපට පුළුවන් වෙයි කියලා. ඒ වාගේම ඒ සඳහා යන ගමනේදී ඔබතුමන්ලාගේ සියලු ආකාරයේ ධනාත්මක, සෘණාත්මක ප්‍රතිචාර අපට ගොඩක් වැදගත් වෙනවා.

බොහොම ස්තුතියි, මට මේ අවස්ථාව ලබා දුන්නාට. *[බාධා කිරීමක්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමිල ප්‍රසාද් මන්ත්‍රීතුමාට විනාඩියක කාලයක් ලබා දෙනවා.

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම ස්තුතියි.

ඇත්තටම අද දවසේ මා විසින් ඉදිරිපත් කරන ලද මෙම යෝජනාවට අදාළව ලැබුණු පිළිතුරු අතර 8,000ක වෛද්‍යවරුන් ප්‍රමාණයක් බඳවා ගැනීමක් ගැන සඳහන් වෙනවා. එය ඉතාම සතුටුදායකයි. ඒ වාගේම තමයි මා පෙර සඳහන් කළ ආකාරයට වසර පහකට, හයකට, හතකට කලියෙන් උසස් පෙළ විභාගය සමත් වුණු දරුවන් තමයි මේ ආකාරයට පුහුණුවීම් ලබා බැඳුණේ. ඒ අනුව 8,000ක විතර ප්‍රමාණයක් අලුතින් එකතු වෙනවා කියන්නේ මීට අවුරුදු පහහයකට කලින් පැවැති ඒ ආණ්ඩු මේ වෙනුවෙන් ක්‍රියාත්මක වෙලා තිබෙනවා කියන එකයි.

මා ඉදිරිපත් කළ තවත් යෝජනාවක් තමයි, උසස් පෙළ විභාගය සමත් වන්නන් අතරින් වෛද්‍ය පීඨ වෙත බඳවා ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි කරන්න, බඳවා ගන්නා හෙද හෙදියන් සංඛ්‍යාව ඉහළ නංවන්න කියන එක. ඒ පිළිබඳවත් ආණ්ඩුවේ අවධානය යළි යොමු කරන්න කියා මම කියනවා. ඊළඟට, විදේශගතව ඉන්න අය ලංකාවට ගෙන්වා ගැනීම සඳහා අමාත්‍යාංශය පැත්තෙන්, නිලධාරින්ගේ පැත්තෙන් සිද්ධ වන කාර්යය ප්‍රමාණවත් නැහැ කියන කාරණයට හරිහමන් පිළිතුරක් ලැබුණේ නැහැ. ඒ පිළිබඳවත් ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේ අවධානය යොමු කරන්න කියා මා කියනවා.

ප්‍රාථමික වෛද්‍ය මධ්‍යස්ථානවල කාර්යභාරය ඉතාම සාර්ථකව සිද්ධ වෙනවා. නමුත් ඒවාට ප්‍රමාණවත් පහසුකම් ලැබී නැහැ කියන කාරණයත් යළි මතක් කරමින්, අද දවසේ මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිය පළ කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා, ඒ සම්බන්ධව යමක් ප්‍රකාශ කරනවාද?

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி)
(The Hon. (Dr.) Hansaka Wijemuni)
ඔව්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එහෙම නම්, ඔබතුමාටත් විනාඩියක කාලයක් දෙන්නම්.

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி)
(The Hon. (Dr.) Hansaka Wijemuni)
ඇත්තටම ගරු මන්ත්‍රීතුමනි, ප්‍රාථමික වෛද්‍ය මධ්‍යස්ථාන සම්බන්ධයෙන් plan එකක් ඇතුවයි අපි කටයුතු කරගෙන යන්නේ. අපේ plan එකට අනුව අපි ස්ථාපිත කළ යුතු සංඛ්‍යාව 2,000ක්. නමුත් අප තවම 41යි ස්ථාපිත කර තිබෙන්නේ. අපි මේ අවුරුද්ද ඇතුළත බලාපොරොත්තු වෙනවා, 300ක ප්‍රමාණයක් ස්ථාපිත කරන්න. ඒත් එක්කම අපට අර tools ටික හරියටම දමා බලන්න පුළුවන්. තවම තිබෙන්නේ මධ්‍යස්ථාන බොහොම පොඩි සංඛ්‍යාවක් නිසා ප්‍රගතිය මනින්න හොඳම වෙලාව මෙය නොවෙයි. නමුත් දැනට අපේ පද්ධතියේ තිබෙන නොයෙකුත් ආකාරයේ gaps ටික පියවා ගන්න අපට පුළුවන් වේවි.

ඒ වාගේම දළ වශයෙන් ගත්තොත් දැනට නවක වෛද්‍යවරුන් ලංකාවේ universitiesවලින් 2,000ක් සහ foreign universitiesවලින් 500ක් වාගේ ප්‍රමාණයක් පද්ධතියට එකතු වෙමින් පවතිනවා.

බොහොම ස්තුතියි.

***එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුණෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 5.58ට, 2026 ජුනි 11වන බ්‍රහස්පතින්දා පූ.භා. 9.30වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 5.58க்கு, பாராளுமன்றம் 2026 யூன் 11, வியாழக்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 5.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 5.58 p.m. until 9.30 a.m. on Thursday, 11th June, 2026.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.